# සිව්වැනි කොටස

# සිව්වැනි කොටස

## මහ බැංකුවේ සහ ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල<br>වැඩ කටයුතු හා මෙහෙයුම්වලට අදාළ 2005 සම්මත කරන ලද<br>ප්‍රධාන නීති අණපනත්


| | | පිටුව |
|---|---|---|
| 1. | 2005 අංක 1 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව (ආනුෂංගික විධිවිධාන) පනත | I |
| 2. | 2005 අංක 2 දරන බැංකු (සංශෝධන) පනත | III |
| 3. | 2005 අංක 5 දරන මුදල් පනත | XXV |
| 4. | 2005 අංක 6 දරන එකතුකළ අගය මත බදු (සංශෝධන) පනත | XXXI |
| 5. | 2005 අංක 7 දරන මුදල් (සංශෝධන) පනත | XXXVII |
| 6. | 2005 අංක 8 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත | XLI |
| 7. | 2005 අංක 24 දරන කල්බදු මූල්‍යකරණ (සංශෝධන පනත) | LV |
| 8. | 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත | LVII |
| 9. | 2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනත | LXII |
| 10. | 2005 අංක 39 දරන විසර්ජන පනත | LXXXII |

## 2005 අංක 1 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව (ආනුෂංගික විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 2005 පෙබරවාරි මස 07 වන දින]

ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව පොදු සමාගමක් ලෙස ලියාපදිංචි කිරීමට ආනුෂංගික විධිවිධාන සැලැස්වීම සඳහා සහ ඊ හා සම්බන්ධ හෝ ඊට ප්‍රාසංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

1. මේ පනත 2005 අංක 1 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව (ආනුෂංගික විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 1979 අංක 2 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකු පනත, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නිශ්චිතව නියම කරනු ලැබිය හැකි (මෙහි මින් ඉදිරියට "නිශ්චිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක සිට පරිච්ඡින්න කරනු ලැබිය යුතු ය. එම දිනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වන ව්‍යවස්ථාව යටතේ මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් ලෙස කථානායකවරයා විසින් සහතික කරනු ලබන දිනයේ සිට මාස හයකට වඩා පසු නොවන දිනයක් විය යුතු ය.

3. (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමෙන් පසු කවර හෝ වේලාවක, අමාත්‍යවරයා විසින්, සිය විධානයේ නිශ්චිතව සඳහන් කරන නාමයෙන් 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව පොදු සමාගමක් ලෙස ලියාපදිංචි කරන මෙන් නියම කරන විධානයක් ද සමග, මුදල් මණ්ඩලය විසින් යථා පරිදි අනුමත කරනු ලැබූ සාංගමික සංස්ථාපත්‍රයක් සහ සාංගමික ව්‍යවස්ථාවලියක්, අමාත්‍යවරයා විසින් සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) 1982 අංක 17 දරන සමාගම් පනතේ කුමක් සඳහන්ව තිබුණ ද, (1) වන උපවගන්තිය යටතේ විධානයක් ලැබුණු විට, සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින්—

(අ) ඉහත කී පනතේ 15 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සංස්ථාගත කිරීමේ සහතිකයක්, (1) වන උපවගන්තිය යටතේ වූ විධානයේ නිශ්චිතව දැක්වෙන නාමයෙන් නිකුත් කළ යුතු ය ; තවද

(ආ) ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුවේ ව්‍යාපාර කටයුතු භාරගෙන ක්‍රියාකාරීව කර ගෙන යාම සඳහා, (මෙහි මින් මතු "සමාගම" යනුවෙන් සඳහන් කරනු ලබන) (1) වන උපවගන්තිය යටතේ වූ විධානයේ නිශ්චිතව දැක්වෙන නාමයෙන් පොදු සමාගමක්, නියමිත දිනයේ සිට සංස්ථාගත කළ බව ප්‍රකාශ කරන නියමයක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

4. 1979 අංක 2 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකු පනතේ 2 වන වගන්තියෙන් පිහිටුවන ලද ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුවේ ව්‍යාපාරය, නිශ්චිත දිනයේ සිට බලපවත්වන පරිදි, 3 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ පළ කරනු ලැබූ නියමයේ සඳහන් සමාගම වෙත පරම වශයෙන් සතු වන්නේ ය.

5. 1979 අංක 2 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකු පනත, මේ පනතේ 2 වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි ඉවත් කරනු ලැබූ විට—

(අ) නිශ්චිත දිනයට පෙරාතුව ම දිනයේ දී ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුවේ පැවති කොටස් ප්‍රාග්ධනය, නිශ්චිත දිනයේ දී සමාගමේ කොටස් ප්‍රාග්ධනය ලෙස සැලකිය යුතු ය ;

(ආ) නිශ්චිත දිනයට පෙරාතුව ම දිනයේ දී ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුවේ කොටස් හිමියන්ව සිටි සියලු තැනැත්තන් නිශ්චිත දිනයේ දී සමාගමේ කොටස් හිමියන් ලෙස සැලකිය යුතු අතර, එම කොටස් හිමියන් විසින් සමාගමෙහි දරනු ලබන කොටස් සංඛ්‍යාව, නිශ්චිත දිනයට පෙරාතුව ම දිනයේ දී ඔවුන් විසින් බැංකුවෙහි දරන ලද කොටස් සංඛ්‍යාව ම විය යුතු ය. බැංකුව විසින් නිකුත් කරන ලද කොටස් සහතික, සමාගම විසින් නිකුත් කරනු ලැබ ඇත්තාක් සේ කියවා තේරුම් ගත යුතු ය ;

(ඇ) නිශ්චිත දිනයට පෙරාතුව ම දිනයේ දී ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුවෙහි ධූර දැරූ සියලු නිලධරයන් සහ සේවකයන් නිශ්චිත දිනයේ සිට බලපවත්වන පරිදි සමාගමේ සේවා නියුක්තයන් ලෙස සලකනු ලැබිය යුතු අතර, නිශ්චිත දිනයට පෙරාතුව ම දිනයේ දී බැංකුව යටතේ ඔවුන් විසින් භුක්ති විඳින ලද නියමයන්ට හා කොන්දේසිවලට අඩු වාසිදායක නොවන නියමයන් හා කොන්දේසි මත එම නිලධරයන් හා සේවකයන් තවදුරටත් ධූර දැරිය යුතු ය ;

(ඈ) නිශ්චිත දිනයට පෙරාතුව ම දිනයේ දී පැවතියා වූ හෝ බලාත්මක වූ ද, බැංකුව පාර්ශ්වකරුවකු වූ හෝ බැංකුවේ වාසියට වූ ද ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුවේ සියලු කොන්ත්‍රාත්, ඔප්පු, බැඳුම්කර, ගිවිසුම්, ඇපකර, ඇටෝර්නි බලපත්‍ර, නෛතික නියෝජිතත්ව ප්‍රදාන සහ කවර හෝ ස්වභාවයක වූ වෙනත් සාධන පත්‍ර අවස්ථාවෝචිත පරිදි සමාගම ඇතුළත් වූ නැතහොත් සමාගමේ වාසියට දෙන ලද කොන්ත්‍රාත්, ඔප්පු, බැඳුම්කර, ගිවිසුම්, ඇපකර, ඇටෝර්නි බලපත්‍ර, නෛතික නියෝජිතත්ව ප්‍රදාන සහ කවර හෝ ස්වභාවයක වූ නෛතික සාධන පත්‍ර ලෙස, නිශ්චිත දිනයේ සිට සලකනු ලැබිය යුතු ය ;

(ඉ) ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව විසින් බැංකු පනතේ කාර්ය සඳහා හෝ අන්‍යාකාරව, නිශ්චිත දිනයට පෙරාතුව ම දිනයේ දී පවත්වාගෙන එන ලද සියලු සංචිත, නිශ්චිත දිනයේ සිට බලපවත්වන පරිදි සමාගමේ සංචිත ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ඊ) ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව විසින් හෝ ඊට විරුද්ධව හෝ පවරන ලදුව නිශ්චිත දිනයට පෙරාතුව ම දිනයේ දී අවසන්නොවී පැවති කවර හෝ ස්වභාවයක වූ සියලු නඩු හා නඩු කටයුතු, නිශ්චිත දිනයේ සිට සමාගම විසින් හෝ සමාගමට විරුද්ධව පවරනු ලැබූ නඩු හා නඩු කටයුතු ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව ඒවා පවත්වාගෙන යා යුතු ය ;

(උ) බැංකුව විසින් පිහිටුවනු ලදුව, නිශ්චිත දිනයකට පෙරාතුව ම දිනයේ දී බලාත්මකව පැවති ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුවේ අර්ථ සාධක අරමුදල, ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුවේ විශ්‍රාම වැටුප් අරමුදල සහ ජාතික සංවර්ධන බැංකු සේවක කොටස් සඳහා මනාපය පළ කිරීමේ යෝජනා ක්‍රමය, නිශ්චිත දිනයේ සිට, සමාගම විසින් පිහිටුවනු ලැබූ පිළිවෙලින් අර්ථ සාධක අරමුදල, විශ්‍රාම වැටුප් අරමුදල සහ මනාපය පළ කිරීමේ යෝජනා ක්‍රමය ලෙස සැලකිය යුතු ය ;

(ඌ) නිශ්චිත දිනයට පෙරාතුව ම දිනයේ දී ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුවට අදාළව පැවති සියලු බදු බැර කිරීම්, ආපසු ගෙවීම්, පාඩු, අනුග්‍රහ, සහන, ප්‍රතිලාභ සහ බැරකම්, සමාගමේ බදු බැර කිරීම්, ආපසු ගෙවීම්, පාඩු, අනුග්‍රහ, සහන, ප්‍රතිලාභ සහ බැරකම් ලෙස නිශ්චිත දිනයේ සිට සලකනු ලැබිය යුතු ය;

(එ) කවර හෝ අධිකරණයක් විසින් යම් නඩුවක දී හෝ නඩු කටයුත්තකට ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුවට පක්ෂව හෝ එරෙහිව සටහන් කරන ලද සියලු නඩු තීන්දු, තීන්දු ප්‍රකාශ හෝ ආඥා, සමාගමට පක්ෂව හෝ එරෙහිව සටහන් කරනු ලැබූ නඩුතීන්දු, තීන්දු ප්‍රකාශ හෝ ආඥා ලෙස, නිශ්චිත දිනයේ සිට බලපවත්වන පරිදි සලකනු ලැබිය යුතු ය.

6. 1979 අංක 2 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකු පනත, මේ පනතේ 2 වන වගන්තිය මගින් පරිච්ඡින්න කරනු ලැබුව ද, 1979 අංක 2 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකු පනතේ 30 වන වගන්තියේ (2), (3), (4), (5) සහ (6) වන උපවගන්තිවල විධිවිධාන, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ඒ වගන්තියට අනුව ඇපවන ලද ණය මුදල් සම්පූර්ණයෙන් බේරුම් කරන තෙක් සහ ඒ දක්වා පමණක්, ඒ වගන්තිය කිසිවිටෙක පරිච්ඡින්න නොකරන ලද සේ, නිශ්චිත දිනයේ සිට සහ ඉන් පසුව තවදුරටත් ක්‍රියාත්මකව සහ නීතිය අනුව පූර්ණ බලපෑමෙන් සහ උපයෝජ්‍යතාවෙන් යුක්ත විය යුතු ය; ඊට වැඩිදුරටත් බල නොපෑ යුතු ය. නිශ්චිත දිනයට පෙරාතුව ම පැවති සහ ඉහත දැන්වුණු පරිදි නිශ්චිත දිනයට පෙරාතුව ම ඇපවන ලද සෑම ණය මුදලක්ම, එසේ ඇපවූ එම ණය මුදල්, සමාගම ලබාගත් ණය මුදල් වූවාක් සේ නිශ්චිත දිනයේ පටන් තවදුරටත් පැවතිය යුතුය.

7. නිශ්චිත දිනයේ දී සිට බලාත්මක වන පරිදි, යම් පනතක, නියෝගයක, නිවේදනයක, කොන්ත්‍රාත්තුවක, සාධන පත්‍රයක, වාර්තාවක, කොටස් සහතිකයක, ලේඛනයක, ඔප්පුවක, බැඳුම්කරයක, ගිවිසුමක, ඇපකරයක, ඇටෝර්නි බලපත්‍රයක, නෛතික නියෝජිතත්ව ප්‍රදානයක සහ කවර වූ හෝ ස්වභාවයක වූ වෙනත් සාධන පත්‍රයක ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව පිළිබඳව ඇති සෑම සඳහනක් ම, මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම උචිත හෝ අවශ්‍ය කවර අවස්ථාවක වුව ද සමාගම පිළිබඳ සඳහනක් ලෙස සැලකිය යුතු අතර, 3 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ විධානයේ නිශ්චිතව දැක්වෙන සමාගමේ නම, බැංකුවේ නම වෙනුවට ඇතුළත් කිරීම උචිත හෝ අවශ්‍ය කවර අවස්ථාවක වුව ද එසේ ඇතුළත් කළ යුතු ය.

8. (1) බලපත්‍රලත් විශේෂිත බැංකුවක් වශයෙන් සමාගම යටත්ව නොසිටි, බලපත්‍රලත් වාණිජ බැංකුවක් හා සම්බන්ධව අදාළ වන, 1988 අංක 30 දරන බැංකු පනතේ සහ (422 වන අධිකාරය වූ) මුදල් නීති පනතේ විධිවිධානවලට, (මෙහි මින් මතු "අනුකූලවීමේ කාලසීමාව" යනුවෙන් සඳහන් කරනු ලබන) නිශ්චිත කාලසීමාවක් ඇතුළත අනුකූල වීමට සමාගමට සහාය වීම සඳහා අවශ්‍ය යයි මුදල් මණ්ඩලය සලකන රීති, මුදල් මණ්ඩලය විසින් සාදනු ලැබිය හැකි ය :

එසේ වුව ද, අනුකූල වීමේ කාලසීමාව ඇතුළත සමාගමට අදාළ නොවන බවට පත් කිරීමට අවශ්‍යතාක් දුරට, බැංකු පනතේ සහ මුදල් නීති පනතේ ඉහත සඳහන් නියමයන් අන්තර්ගත විධිවිධාන සමාගමට අදාළ නොවිය යුතු ය.

(2) මුදල් මණ්ඩලය විසින් සාදනු ලබන සෑම රීතියක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළකරනු ලැබූ දින සිට හෝ නියෝගවල නිශ්චිතව නියම කරනු ලැබිය හැකි යම් පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

9. (1) බැංකුවේ ව්‍යාපාරය 3 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව සමාගම වෙත සතු කර දීම පහසුකරවීමේ කාර්යය සඳහා, අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර එසේ පළකරනු ලැබූ දිනයේ සිට හෝ නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම, පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා හැකිතාක් ඉක්මනින් පාර්ලිමේන්තුව හමුවට ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරන ලද සේ සැලකිය යුතු නමුත් ඒ නියෝගය යටතේ කලින් කරනු ලැබූ කිසිවකට ඉන් අගතියක් නොවිය යුතු ය.

(4) එම නියෝගයේ අනනුමතයේ දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

10. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

11. පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ පනතේ කාර්ය සඳහා—

"සමාගම" යන්නෙන්, 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) වන ඡේදය යටතේ පළ කරන ලද නියමයේ සඳහන් සමාගම අදහස් වේ ;

"ව්‍යාපාරය" යන්නට—

(අ) නිශ්චිත දිනයේ දී ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව විසින් බලපත්‍රලත් විශේෂිත බැංකුවක් වශයෙන් කරගෙන යන ලද ව්‍යාපාරය ද ;

(ආ) නිශ්චිත දිනයේ දී ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුවේ (මුදල් ශේෂ, සංචිත අරමුදල්, ආයෝජන සහ තැන්පතු ද ඇතුළුව) සියලු නිශ්චල හා චංචල දේපළ ද ;

(ඇ) නිශ්චිත දිනයේ දී ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුවේ තැන්පතු හා සම්භාව්‍ය බැරකම් ඇතුළුව සියලු බැරකම් ද ;

(ඈ) මුදල් මණ්ඩලය විසින්, බැංකු පනතේ 76අ වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව වෙත නිකුත් කළ බලපත්‍රය ද ඇතුළුව, නිශ්චිත දිනයේ දී ඉහත සඳහන් ව්‍යාපාරයේ හෝ එම ව්‍යාපාරයෙන් සහ නිශ්චිත දිනයේ දී පැවති හිමිකාරකම් හා බැරකම් වලින් උද්ගතවන සියලු අයිතිවාසිකම්, බලතල, වරප්‍රසාද, අධිකාර, බැඳීම්, යුතුකම් සහ ස්වාර්ථ සම්බන්ධතා ද ;

(ඉ) නිශ්චිත දිනයේ දී ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුවේ හෝ බැංකුවේ යම් දේපළවලට අනුබද්ධ සියලු පොත්පත්, ගිණුම් සහ ලේඛන ද ,

ඇතුළත් වේ.

"බැංකු පනත"යන්නෙන්, වරින් වර සංශෝධිත පරිදි වූ 1988 අංක 30 දරන බැංකු පනත අදහස් වේ ;

"ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව" යන්නෙන්, 1979 අංක 2 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකු පනත මගින් පිහිටුවන ලද ජාතික සංවර්ධන බැංකුව අදහස් වේ.

## 2005 අංක 2 දරන බැංකු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2005 පෙබරවාරි මස 10 වන දින]

1988 අංක 30 දරන බැංකු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

1. මේ පනත 2005 අංක 2 දරන බැංකු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 අංක 30 දරන බැංකු පනතේ 2 වන වගන්තිය එහි (3) වන උපවගන්තියේ "මේ පනතේ විධිවිධාන" යන වචන වෙනුවට "මේ කොටසේ විධිවිධාන" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය එහි (2) වන, (3) වන, (4) වන සහ (5) වන උපවගන්ති ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(2) බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයකටම —

(අ) බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාමේ අරමුණින් පිහිටුවනු ලබන සමාගමක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී—

(i) එහි සාංගමික සංස්ථාපත්‍ර කෙටුම්පතේ, ඒ සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ හෝ එහි ව්‍යවස්ථා කෙටුම්පතේ හෝ එය පිහිටුවීම හා සම්බන්ධ වෙනත් යම් ලියවිල්ලක හෝ පිටපතක් ;

(ii) යෝජිත අධ්‍යක්ෂවරුන්ගේ සහ ප්‍රධාන විධායක නිලධරයා හඳුනාගෙන ඇත්නම් ඒ නිලධරයාගේ ද නම්, ලිපිනයන්, රැකියාවන් සහ සුදුසුකම් ඇතුළත් ප්‍රකාශයක් ;

(ආ) ඉල්ලුම් පත්‍රයේ දිනයට පෙරාතුව පිහිටුවනු ලැබූ සහ බැංකු කටයුතු ආරම්භ කිරීමට අදහස් කරන සමාගමක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී—

(i) යෝජිත සංශෝධන ඇත්නම් එකී සංශෝධන ද සමග ඒ සමාගමේ සාංගමික සංස්ථා පත්‍රයේ, සාංගමික ව්‍යවස්ථාවලියේ හෝ එහි ව්‍යවස්ථාවේ හෝ, එහි පිහිටුවීම හා සම්බන්ධ වෙනත් ලියවිල්ලක හෝ පිටපතක් ;

(ii) සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ සහ නම් කරනු ලැබීමට හෝ පත් කරනු ලැබීමට යෝජිත සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ සහ ප්‍රධාන විධායක නිලධරයාගේ නම්, ලිපිනයන්, රැකියාවන් සහ සුදුසුකම් ඇතුළත් ප්‍රකාශයක් ;

(iii) ඉහතින් වූ අවුරුදු තුන සඳහා වූ සමාගමේ විගණනය කරන ලද ශේෂ පත්‍රයේ සහ සමාගමේ ලාභාලාභ ගිණුමේ පිටපතක් ;

(ඇ) ශ්‍රී ලංකාවෙන් බැහැර සංස්ථාගත කරන ලද සමාගමක් හෝ සංස්ථාවක් විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, (ආ) ඡේදයේ දක්වා ඇති ලියවිලිවලට අමතරව, —

(i) ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර කටයුතු කරගෙන යාමේ දී හෝ ඒ සම්බන්ධයෙන් උපචිත වන්නා වූ සියලු බැඳීම් ආවරණය කිරීමට අවශ්‍ය විය හැකි අරමුදල් මහ බැංකුව විසින් ඉල්ලා සිටි විට ලැබීමට සලස්වන බව සඳහන් කරමින් අවස්ථාවෝචිත පරිදි ඒ සමාගමේ හෝ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මතයකින් සහතික කරනු ලැබූ ලිඛිත පොරොන්දුවක් ; සහ

(ii) මුදල් මණ්ඩලය මගින් තීරණය කරනු ලැබිය හැකි තොරතුරු ඇතුළත් ඒ සමාගම හෝ සංස්ථාව සංස්ථාගත කරන ලද රටේ නියාමන අධිකාරියේ වාර්තාවක්,

අමුණා තිබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලුම් පත්‍රයක් මුදල් මණ්ඩලය වෙත ලැබුණු විට, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින්, අවශ්‍ය යයි එකී අධ්‍යක්ෂවරයා විසින් සලකනු ලබන අවස්ථාවක, බලපත්‍රයක් දිය යුතු ද නැද්ද යන්න තීරණය කිරීම සඳහා, සලකනු ලබන වෙනත් ලේඛන හෝ විස්තර මුදල් මණ්ඩලය වෙත සපයන ලෙස ඉල්ලුම්කරුට නියම කරනු ලැබිය හැකි ය.

(4) (1), (2) සහ (3) වන උපවගන්ති යටතේ මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන ලේඛන, තොරතුරු සහ විස්තර සලකා බැලීමේ දී සහ මුදල් මණ්ඩලය විසින් අවශ්‍ය යයි සලකනු ලබන වැඩිදුර විමර්ශන කිරීමෙන් පසුව ප්‍රතිපත්තියක් වශයෙන් ඉල්ලුම් පත්‍රය අනුමත කරන ලැබිය හැකි බවට මුදල් මණ්ඩලය සෑහීමට පත්වන අවස්ථාවක මුදල් මණ්ඩලය විසින් ඉල්ලුම්කරුට තාවකාලික අනුමත ලිපියක් නිකුත් කරනු ලැබිය හැකි ය. තාවකාලික අනුමත ලිපිය ලැබීමේ දී 5 වන වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කිරීමට පෙර ගනු ලැබිය යුතු, ලිපියෙහි නිශ්චිතව දක්වා ඇති අවශ්‍ය මූලික පියවර සියල්ල ඉල්ලුම්කරු විසින් ගනු ලැබිය යුතු ය.

(5) (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද තාවකාලික අනුමත ලිපිය, ඒ ලිපියේ දක්වා ඇති කාලසීමාව සඳහා වලංගු විය යුතු ය. කෙසේ වුව ද ඒ කාලසීමාව ඒ ලිපිය නිකුත් කිරීමේ දිනයේ සිට මාස දොළහක කාලසීමාවක් නොඉක්මවිය යුතු අතර එම වලංගු කාලසීමාව, විශේෂිත අවස්ථාවල දී මුදල් මණ්ඩලය විසින් පමණක් ලිඛිතව දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(6) මුදල් මණ්ඩලය විසින් (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද සෑම තාවකාලික අනුමත කිරීමේ ලිපියක ද, (5) වන උපවගන්තිය යටතේ එවැනි ලිපියක වලංගු කාලසීමාව දීර්ඝ කරනු ලබන යම් සන්නිවේදනයක ද, එවැනි ලිපියක් (7) වන උපවගන්තිය යටතේ ඉල්ලා අස්කර ගැනීමක් සිදු වූ අවස්ථාවක එකී ඉල්ලා අස්කර ගැනීමේ පිටපතක් ද සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත යවනු ලැබීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(7) (4) වන උපවගන්තිය යටතේ තාවකාලික අනුමත ලිපියක් නිකුත් කරන ලද්දේ යම් සමාගමක් හෝ බැංකු ව්‍යාපාර කටයුතු කර ගෙන යාමේ අරමුණෙන් පිහිටුවීමට අදහස් කරනු ලබන (මෙහි මින් මතු "යෝජිත සමාගම" යනුවෙන් හඳුන්වනු ලබන) යම් සමාගමක් වෙත ද, එම සමාගම හෝ යෝජිත සමාගම වෙත එසේ තාවකාලික අනුමත කිරීමේ ලිපියක් නිකුත් කිරීම මගින්, එම සමාගම වෙත හෝ යෝජිත සමාගම වෙත 5 වන වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කිරීමට මුදල් මණ්ඩලය බැඳී නොසිටින අතර, මුදල් මණ්ඩලය විසින් (10) වන උපවගන්තිය යටතේ කරනු ලබන පරීක්ෂණ පදනම් කොට, ඒ ලිපිය ඉල්ලා අස්කර ගැනීම හෝ 5 වන වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කිරීමෙන් වැළකී සිටීම එය විසින් පහත සඳහන් එක් හේතුවක් හෝ හේතු කිහිපයක් මත කරනු ලැබිය හැකි ය :—

(අ) සමාගම හෝ යෝජිත සමාගම වෙත බලපත්‍රයක් නිකුත් කරනු ලැබීමට ඇති යෝග්‍යතාව පිළිබඳව මුදල් මණ්ඩලය විසින් සෑහීමට පත් නොවීම ;

(ආ) තාවකාලික අනුමත ලිපියේ දක්වා ඇති කොන්දේසි අනුව කටයුතු නොකිරීම ;

(ඈ) සමාගම හෝ යෝජිත සමාගම බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා මේ පනත යටතේ අවශ්‍ය කරනු ලබන යම් නියමයන් අනුව කටයුතු නොකිරීම ;

(ඇ) බලපත්‍රයක් සඳහා වූ යම් ඉල්ලුම් පත්‍රයක අඩංගු යම් තොරතුරක් හෝ ඒ හා සම්බන්ධයෙන් සමාගම හෝ යෝජිත සමාගම විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි සහගත බවට සොයා ගනු ලැබීම ; හෝ

(ඉ) මුදල් මණ්ඩලයේ මතය අනුව, 5 වන වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කිරීම අත්හිටුවීම සාධාරණීය කරන්නා වූ ප්‍රමාණවත් වැදගත් වෙනස්කම් රටෙහි ආර්ථිකමය සහ බැංකු කටයුතු ආශ්‍රිත පරිසරයෙහි ඇතිවීම :

කෙසේ වුව ද (4) වන උපවගන්තිය යටතේ ඉල්ලුම්කරුවකු හට නිකුත් කරන ලද තාවකාලික අනුමත ලිපියක් මුදල් මණ්ඩලය විසින් මේ උපවගන්තියේ විධිවිධාන යටතේ ඉවත්කර ගැනීමට පෙර හෝ ඉල්ලුම්කරුට බලපත්‍රයක් නිකුත් කිරීමෙන් වැළකී සිටීම සඳහා මේ උපවගන්තිය යටතේ තීරණයක් ගැනීමට පෙර, එසේ බලපත්‍රය ඉවත් කර ගැනීමට හෝ බලපත්‍රය නිකුත් කිරීමෙන් වැළකී සිටීමට ප්‍රමාණවත් හේතු සඳහන් කරමින් මුදල් මණ්ඩලය විසින් ඉල්ලුම්කරුට ලිඛිත දැන්වීමක් දිය යුතු අතර ඒ සම්බන්ධයෙන් ඔහුට ඇහුම්කන් දෙනු ලැබීමට අවස්ථාවක් ද ලබා දිය යුතු ය.

(8) (4) වන උපවගන්තිය යටතේ තාවකාලික අනුමත කිරීමේ ලිපිය නිකුත් කරනු ලැබ ඇත්තේ යම් සමාගමක් හෝ යෝජිත සමාගමක් සම්බන්ධයෙන් ද ඒ සමාගම හෝ යෝජිත සමාගම විසින් 5 වන වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කිරීමට පෙර බැංකු ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීම නොකරනු ලැබිය යුතු අතර බලපත්‍රය නිකුත් කිරීමට පෙර ඒ සමාගම හෝ යෝජිත සමාගම විසින් නිකුත් කරනු ලබන සෑම වෙළෙඳ දැන්වීමක, විස්තර පත්‍රිකාවක, දැන්වීමක හෝ වෙනත් ප්‍රකාශනයක, තමා හට බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාමට පනත යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ නොමැති බව නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය.

(9) 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ පිහිටුවන ලද සහ සංස්ථාපනය කරන ලද සමාගමක්,—

(අ) ඒ සමාගම පොදු සමාගමක් වන්නේ නම් මිස ;

(ආ) මේ පනතේ අර්ථ නිරූපණය කර ඇති පරිදි බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාම තම මූලික පරමාර්ථය ලෙස සමාගමේ සාංගමික සංස්ථා පත්‍රයේ දක්වා ඇත්නම් මිස ; සහ

(ඇ) සමාගම විසින් පවත්වා ගෙන යනු ලැබිය හැකි වෙනත් ආකාරයක ව්‍යාපාර කටයුතු ඇත්නම් එකී කටයුතු සමාගමේ සාංගමික සංස්ථා පත්‍රය මගින්, මේ පනතේ II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති යම් හෝ සියලුම ආකාරයක ව්‍යාපාරික කටයුතුවලට සීමාකර ඇත්නම් මිස,

එම සමාගමට 5 වන වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් නොකරනු ලැබිය යුතු ය.

(10) (අ) මුදල් මණ්ඩලය විසින්, 5 වන වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කිරීමට පෙරාතුව කවර හෝ වේලාවක දී, ශ්‍රී ලංකාවේ බැංකු කටයුතු පිළිබඳ අවශ්‍යතා ඇතුළුව ජාතික ආර්ථිකයේ යහපත සැලකිල්ලට ගනිමින් එකී බලපත්‍රය නිකුත් කරනු ලැබීම සඳහා සමාගමේ හෝ යෝජිත සමාගමේ යෝග්‍යතාව පිළිබඳව සෑහීමට පත්වීමට අවශ්‍ය යයි මණ්ඩලය විසින් සලකනු ලැබිය හැකි පරීක්ෂණ පවත්වනු ලැබිය හැකි ය.

(ආ) (අ) ඡේදය යටතේ පවත්වනු ලබන පරීක්ෂණයක දී, මුදල් මණ්ඩලය විසින් සමාගමේ හෝ යෝජිත සමාගමේ යෝග්‍යතාවට අදාළ ඕනෑම කාරණයක් පිළිබඳව සහ විශේෂයෙන් ම—

(i) ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කරනු ලැබූ ලේඛන සහ විස්තරවල වලංගුභාවය සහ පිළිගත හැකි බව ;

(ii) සමාගමේ හෝ යෝජිත සමාගමේ මූල්‍යමය තත්ත්වය සහ ඉතිහාසය ;

(iii) මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි, විධායක කාර්යයන් ඉටු කරනු ලබන, අවස්ථාවෝචිත පරිදි සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ, ප්‍රධාන විධායක නිලධරයාගේ සහ වෙනත් එවැනි නිලධරයන්ගේ හෝ යෝජිත සමාගමේ එවැනි ධුරයන් සඳහා බඳවා ගැනීමට යෝජනා කරන ලද තැනැත්තන්ගේ මූල්‍යමය ස්ථාවරය, පළපුරුද්ද සහ යෝග්‍යතාව ;

(iv) සමාගමේ ප්‍රාග්ධනයේ ප්‍රමාණවත් බව හෝ යෝජිත සමාගම වෙනුවෙන් ඉල්ලුම්කරු විසින් සපයන ලද තොරතුරු මත, යෝජිත සමාගමට ප්‍රමාණවත් ප්‍රාග්ධනය ලබාගැනීමේ හැකියාව ;

(v) සමාගම හෝ යෝජිත සමාගම විසින් ශ්‍රී ලංකාවේ දී කරනු ලබන එම සමාගමේ කටයුතුවල දී උපචිත වන්නා වූ සියලු බැඳීම් සහ වගකීම් ආවරණය කිරීමට සහ මේ පනතේ විධිවිධාන පිළිපැදීමට සමාගමට හෝ යෝජිත සමාගමට ඇති හැකියාව ;

(vi) මේ පනත යටතේ බලපත්‍රයක් සඳහා ඉදිරිපත් කරනු ලැබූ ඉල්ලුම් පත්‍රයක් හා සම්බන්ධව මේ පනතේ විධිවිධාන හෝ පනත යටතේ දෙනු ලබන යම් විධානයක් ඉල්ලුම්කරු විසින් පිළිපදිනු ලැබීම

පිළිබඳව මණ්ඩලය සෑහීමට පත් කරන ලෙස එකී සමාගමට හෝ යෝජිත සමාගමට නියම කරනු ලැබිය හැකි ය.

(11) පනත යටතේ බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයක හෝ ඒ සම්බන්ධව ඉදිරිපත් කරනු ලබන වෙනත් ලේඛනයක නැතහොත් සමාගම වෙත හෝ යෝජිත සමාගම වෙත මේ පනත යටතේ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ඒ සමාගමේ හෝ යෝජිත සමාගමේ යෝග්‍යතාව සාක්ෂාත් කර ගැනීම සඳහා පවත්වනු ලබන යම් පරීක්ෂණයක් හෝ විමර්ශනයක් අතරතුර දී, යම් වැදගත් කාරණයක් සම්බන්ධයෙන් තමාගේ දැනුම අනුව සාවද්‍ය වූ හෝ නොමග යවන සුළු වූ හෝ තොරතුරු හෝ විස්තර ඉදිරිපත් කරනු ලබන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.”.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

“බලපත්‍රය නිකුත් කිරීම.පාර

5\. (1) සමාගමකට හෝ යෝජිත සමාගමකට බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි බවට මුදල් මණ්ඩලය සෑහීමට පත් වන අවස්ථාවක දී, මුදල් මණ්ඩලය වි සින් පනවනු ලැබිය හැකි නියම හා කොන්දේසිවලට යටත්ව ශ්‍රී ලංකාව තුළ බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා මුදල් මණ්ඩලය විසින් අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව ඒ බැංකුවට බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක—

(අ) ඒ බලපත්‍රය මගින් බලය දෙනු ලබන්නේ දේශීය බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා ද, නැතහොත් අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා ද එසේත් නැතහොත් එකී දෙවර්ගයේ ම බැංකු කටයුතු කරගෙන යාම සඳහා ද යන වග ;

(ආ) බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලැබිය හැකි ස්ථානය, ස්ථාන හෝ ප්‍රදේශය ; සහ

(ඇ) බලපත්‍රය නිකුත් කරනු ලබන්නේ කවර නියම හා කොන්දේසිවලට යටත්ව ද එකී නියම සහ කොන්දේසි, නිශ්චිතව දැක්විය යුතු ය.

(3) සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් ම, (1) වන උපවගන්තිය යටතේ එම බැංකුව වෙත නිකුත් කරන ලද බලපත්‍රයේ පිටපතක් ඒ බැංකුව විසින් ශ්‍රී ලංකාවේ ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලබන ප්‍රධාන ස්ථානයේ සහ එහි එක් එක් ශාඛාවන්හි ප්‍රකටව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කළ යුතු ය.”.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

“බලපත්‍රලාභී වාණිජ බැංකුවකට නිකුත් කරන ලද බලපත්‍රයක් අවලංගු කිරීමේ දැන්වීම.

9\. (1) යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක්—

(අ) ඒ බැංකුව වෙත 5 වන වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කිරීමෙන් මාස නවයක් ඇතුළත ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමට අපොහොසත් වී ඇති බවට ; හෝ

(ආ) එම බැංකුව විසින් උපචිත කරගනු ලැබූ යම් ණයක් ඒ ණය ගෙවිය යුතු බවට යෙදුනු අවස්ථාවේ ගෙවීමට අපොහොසත්ව ඇති බවට ; හෝ

(ඇ) ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුවට විරුද්ධව පෙත්සමක් හෝ සහනයක් පතා නඩු කටයුත්තක් පවරනු ලැබ ඇති බවට සහ බංකොලොත්භාවය පිළිබඳ නීතියක් හෝ ණයකරුවන්ට සහන සැලසීම සඳහා වූ හෝ ණයකරුවන්ට අදාළ වූ හෝ වෙනත් යම් නීතියක් යටතේ, ඒ බැංකුව වෙනුවෙන් ඈවරකරුවකු හෝ ලැබුම්කරුවකු පත් කිරීමට යෙදී ඇති බවට ; හෝ

(ඈ) බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාම අවසන් කරන ලද බවට ; හෝ

(ඉ) මේ පනතේ විධිවිධාන හෝ පනත යටතේ වූ යම් විධාන, නියෝග හෝ වෙනත් නියමයන් උල්ලංඝනය කර ඇති බවට; හෝ

(ඊ) මණ්ඩලය වෙත සාවද්‍ය, නොමග යවන සුළු හෝ වැරදි සහගත තොරතුරු හෝ ලියකියවිලි සපයා ඇති බව හෝ යෝජිත සමාගමක් සම්බන්ධයෙන් වන විට, ඒ සමාගම සඳහා බලපත්‍රය ඉල්ලුම්කරන්නා විසින්, එකී ඉල්ලුම් පත්‍රය සම්බන්ධ එවැනි සාවද්‍ය, නොමග යවන සුළු හෝ වැරදි සහගත තොරතුරු හෝ ලියකියවිලි සපයා ඇති බවට ; හෝ

(උ) ඒ බැංකුවේ තැන්පත්කරුවන්ගේ සුභසිද්ධියට හානිකර අයුරින් ඒ බැංකුව විසින් තම ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලැබ ඇති බවට හෝ කරගෙන යනු ලබන බවට,

මුදල් මණ්ඩලය සෑහීමට පත් වූ අවස්ථාවක මුදල් මණ්ඩලය විසින් ඒ බැංකුව වෙත නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු කරන බවට දැන්වීමක් කිරීම කරනු ලැබිය හැකි අතර ඒ දැන්වීම බලපත්‍රලාභී වාණිජ බැංකුවට දන්වා යවනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අවලංගු කරන බවට වූ දැන්වීමට විරුද්ධව ඒ දැන්වීම දැනුම් දුන් දිනයේ සිට දින දාහතරක් ඇතුළත 5 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රය එසේ අවලංගු නොකළ යුත්තේ මන්දැයි හේතු දක්වමින් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් ලියවිල්ලකින් මුදල් මණ්ඩලය වෙත විරෝධතා ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ විරෝධතා ඉදිරිපත් කිරීම සඳහා වූ අවසාන දින සිට දින තිහක් ඇතුළත සහ ඒ උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද විරෝධතා ඇත්නම් ඒ විරෝධතා සලකා බැලීමෙන් පසු සහ බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් සිය විරෝධතාවලට පක්ෂව කරනු ලබන ඉදිරිපත් කිරීම්වලට ඇහුම්කන් දීමෙන් පසු, (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීම කොන්දේසි සහිතව හෝ රහිතව ඉල්ලා අස්කර ගැනීම හෝ බලපත්‍රලාභී වාණිජ බැංකුව වෙත නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු කිරීම මුදල් මණ්ඩලය විසින් කරනු ලැබිය හැකි අතර ඒ බව ඒ අනුව බැංකුව වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ කරන ලද දැන්වීමක් ඉල්ලා අස්කර ගැනීම කොන්දේසි මත සිදු කිරීමට හෝ බැංකුවේ බලපත්‍රය අවලංගු කිරීමට හෝ (3) වන උපවගන්තිය යටතේ මුදල් මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයකින් අතෘප්තියට පත් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් ඒ උපවගන්තිය යටතේ දෙන ලද දැනුම් දීමක් තමා වෙත ලැබීමේ දින සිට දින දාහතරක් ඇතුළත ඒ තීරණයට එරෙහිව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය.

(5) මේ වගන්තිය යටතේ අභියාචනවලට අදාළව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව යටතේ රීති සාදනු ලබන තුරු, අභියාචනාධිකරණය වෙත පරිශෝධන ආකාරයෙන් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් ඇසීම සඳහා එකී ව්‍යවස්ථාව යටතේ සාදන ලද රීති, මේ වගන්තිය යටතේ කරනු ලබන සෑම අභියාචනයකට ම අදාළ විය යුතු ය.

(6) (4) වන උපවගන්තිය යටතේ අභියාචනාධිකරණය වෙත කරන ලද අභියාචනයක් සම්බන්ධයෙන්, ඒ අභියාචනය කරන ලද්දේ යම් තීරණයකට විරුද්ධව ද, ඒ තීරණය ස්ථිර කිරීම, ප්‍රතිවර්තනය කිරීම, මඳක් වෙනස් කිරීම හෝ එය අවලංගු කිරීම අභියාචනාධිකරණය විසින් කරනු ලැබිය හැකි අතර, යුක්තිය ඉටුවීම පිණිස අවශ්‍ය වෙනත් යම් ආඥාවක් කිරීම ද ඒ අභියාචනාධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

(7) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරනු ලැබූ යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවකට එම බැංකුව සංස්ථාගත කරනු ලැබූ රටෙහි ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට එම බැංකුවට තිබූ බලපත්‍රය හෝ අධිකාරය ඒ රටේ උචිත අධිකාරිය විසින් හෝ නියාමන මණ්ඩලය විසින් අවලංගු කර හෝ ඉල්ලා අස්කරගෙන ඇති බවට මුදල් මණ්ඩලය සෑහීමට පත්වන අවස්ථාවක, (1) වන උපවගන්තියට අගතියක් නොමැතිව, මුදල් මණ්ඩලය විසින් මේ කොටස යටතේ බැංකුව වෙත නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු කරනු ලැබිය හැකි අතර ඒ අනුව බැංකුවට දැනුම් දෙනු ලැබිය යුතු ය.

(8) (අ) (3) වන උපවගන්තිය යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක බලපත්‍රය අවලංගු කිරීම—

(i) අභියාචනයක් ඉදිරිපත් කිරීම සඳහා වන කාලසීමාව අවසානවීමේ දී (4) වන උපවගන්තිය යටතේ එවැනි අවලංගු කිරීමකට එරෙහිව බැංකුව විසින් අභියාචනයක් ඉදිරිපත් නොකරන අවස්ථාවක ; හෝ

(ii) ඒ අවලංගු කිරීමට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක අවස්ථාවෝචිත පරිදි ශ්‍රේෂ්ඨාධිකරණය හෝ අභියාචනාධිකරණය විසින් මුදල් මණ්ඩලයේ තීරණය ස්ථිර කිරීමේ දී,

බලාත්මක විය යුතු ය.

(ආ) (7) වන උපවගන්තිය යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක බලපත්‍රය අවලංගු කිරීමක්, ඒ උපවගන්තිය යටතේ දැන්වීම බැංකුව වෙත ලැබීමේ දින සිට බලාත්මක විය යුතු ය.

(9) බලපත්‍රලාභී වාණිජ බැංකුවක බලපත්‍රය අවලංගුවීමක් (8) (අ) හෝ (8) (ආ) උපවගන්තිය යටතේ බලාත්මක වී ඇති අවස්ථාවක මුදල් මණ්ඩලය විසින් හැකිතාක් ඉක්මණින් ඒ බලපත්‍රය අවලංගුවීම පිළිබඳ දැන්වීම සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් ගැසට් පත්‍රයෙහි එක් වරක් සහ ශ්‍රී ලංකාවෙහි බෙදා හරිනු ලබන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි දිනපතා පුවත්පතක එක් වරක් බැගින් ද පළ කරනු ලැබිය යුතු ය.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය, ඒ වගන්තියේ (2), (3) හා (4) වන වගන්ති ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(2) තත්කාලයෙහි බලපවත්නා යම් ලිඛිත නීතියකින් හෝ ඒ යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරන ලද හෝ පිහිටුවන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක බලපත්‍රය අවලංගු කිරීම 9(8) (අ) වගන්තිය යටතේ බලාත්මක වී ඇති අවස්ථාවක, ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුව අනිවාර්යයෙන් ගණන් බේරා වසා දැමීම සඳහා නඩු කටයුතු මේ පනතේ VIII වන කොටසේ විධිවිධානවලට අනුකූලව ආරම්භ කරනු ලැබිය යුතු ය.

(3) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක බලපත්‍රය අවලංගු කිරීම 9(8) (අ) වගන්තිය හෝ 9(8) (ආ) වගන්තිය යටතේ බලාත්මක වී ඇති අවස්ථාවක, 3(2) (ඇ) වගන්තිය යටතේ එකී බැංකුව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති ලිඛිත පොරොන්දුව ඉටු කරමින් ඒ පොරොන්දුව බලාත්මක කිරීම පිණිස අවශ්‍ය විය හැකි පියවර ගන්නා ලෙසත් ශ්‍රී ලංකාව තුළ සහ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් කරගෙන යන ව්‍යාපාර කටයුතු මේ පනතේ VIII වන කොටසේ

විධිවිධානවලට අනුකූලව වසා දමන ලෙසත් බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් ඒ බැංකුවේ ප්‍රධාන කාර්යාලය වෙත නොපමාව දැනුම් දිය යුතු ය.

(4) 9 වන වගන්තියේ විධිවිධාන හෝ තත්කාලයෙහි බලපවත්නා වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවල කුමක් සඳහන් වුවද මුදල් මණ්ඩලය විසින් 9(1) වගන්තියේ (අ) සිට (උ) ඡේදය දක්වා ඡේදවල සඳහන් යම් අවස්ථාවක දී, බලපත්‍රලාභී වාණිජ බැංකුව වෙත නිකුත් කරන ලද බලපත්‍රය 9 වන වගන්තියට අනුකූලව අවලංගු කිරීමට කටයුතු නොකොට පහත සඳහන් පියවරවලින් එක් පියවරක් හෝ ඊට වැඩි ගණනක් ගනු ලැබිය හැකි ය :—

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම අත්හිටුවන ලෙස සහ, ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරන ලද හෝ පිහිටුවන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සම්බන්ධයෙන් වන විට, මුදල් මණ්ඩලය විසින් නියම කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව, නිශ්චිතව දක්වනු ලැබිය හැකි කාලයක් සඳහා වහාම ශ්‍රී ලංකාවෙන් බැහැර ස්වකීය ව්‍යාපාර කටයුතු අත්හිටුවන ලෙස ද එම බැංකුවට විධාන කරමින් නියම කළ හැකි ය :

එසේ වුවද, එසේ අත්හිටුවීමට පෙර, එකී බැංකුවේ ව්‍යාපාර කටයුතු අත්හිටුවීමට මුදල් මණ්ඩලය ගත් තීරණය පිළිබඳ ලිඛිත දැන්වීමක් ඒ තීරණය සඳහා හේතු ද ඒ සමග දක්වමින් එකී බලපත්‍රලාභී වාණිජ බැංකුව වෙත දෙනු ලැබිය යුතු ය. එම දැන්වීමේ නිශ්චිතව දක්වා තිබිය යුතු පරිදි වැඩකරන දින තුන කට නොඅඩු කාලයක් ඇතුළත ලිඛිතව හෝ වාචිකව එකී කාරණය පිළිබඳ ඇහුම්කන් දෙනු ලැබීමට බැංකුවට අවස්ථාවක් ද දෙනු ලැබිය යුතු ය ;

(ආ) (අ) ඡේදය යටතේ ව්‍යාපාර කටයුතු අත්හිටුවන ලෙසට නියම කරනු ලැබ ඇති බලපත්‍රලාභී වාණිජ බැංකුවේ සියලු පොත්, වාර්තා සහ වත්කම් බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා වෙත භාර දෙන ලෙසට එකී වාණිජ බැංකුවට නියම කළ හැකි ය ;

(ඇ) බලපත්‍රලාභී වාණිජ බැංකුවක ව්‍යාපාර කටයුතුවලට අදාළව අවශ්‍ය යයි මණ්ඩලය සලකන යම් ක්‍රියා මාර්ගයන් වහාම ගන්නා ලෙස හෝ එසේ ක්‍රියා මාර්ගයක් ගැනීමෙන් වහාම වැළකී සිටින ලෙස නැතහොත් එසේ අවශ්‍ය යයි මණ්ඩලය සලකන යම් ක්‍රියාවක් හෝ දෙය වහාම ඉටු කිරීමට හෝ ඉටු කිරීමෙන් වැළකී සිටීමට ඒ වාණිජ බැංකුවට නියම කළ හැකි ය ;

(ඈ) එකී බැංකුවේ ව්‍යාපාර කටයුතු නිසි ලෙස පවත්වාගෙන යාම සම්බන්ධව ඒ බැංකුවට උපදෙස් දීම සඳහා නිසි සහ සුදුසු තැනැත්තකු පත් කරමින් නියමයක් කළ හැකි ය ;

(ඉ) බලපත්‍රලාභී වාණිජ බැංකුවේ යම් අධ්‍යක්ෂවරයකු, කළමනාකාරවරයකු හෝ පාලකයකු එකී බැංකුවේ හෝ ඒ බැංකුවට අදාල කර්තව්‍යය කර ගෙන යාම වළක්වමින් නියමයක් කිරීම සහ ඒ බැංකුවේ හෝ බැංකුවට අදාළ එවැනි කර්තව්‍යය කර ගෙන යාම සඳහා සුදුසු සහ නිසි තැනැත්තන් පත් කිරීම කළ හැකි ය ;

(ඊ) ඒ බැංකුවේ ව්‍යාපාර කටයුතුවල පාලනය මුදල් මණ්ඩලය විසින් භාර ගැනීම සඳහා සහ එකී ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා නැතහොත් ඒ බැංකුවේ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා එසේ භාර ගන්නා ලද පාලනය වෙනත් තැනැත්තකු වෙත පැවරීම සඳහා නියමයක් කළ හැකි ය ;

(උ) ඒ බැංකුවේ ප්‍රාග්ධනය වැඩිකිරීම සඳහා කටයුතු පිළියෙල කිරීමෙන් හෝ එහි අධ්‍යක්ෂ මණ්ඩලය නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමෙන් හෝ එකී පියවර දෙකම ගැනීමෙන් හෝ ඒ බැංකුව ප්‍රතිසංවිධානය කිරීමට නියම කළ හැකි ය;

(ඌ) ඒ බැංකුව සමග ඒකාබද්ධ වීමට කැමැත්ත දක්වන වෙනත් යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සමග ඒකාබද්ධ කිරීම සඳහා අවශ්‍ය වැඩපිළිවෙල සකස් කිරීමට නියම කළ හැකි ය ; සහ

(එ) බලපත්‍රලාභී වාණිජ බැංකුවේ ව්‍යාපාර කටයුතු තත්කාර්ය සඳහා කැමැත්ත ප්‍රකාශ කරන වෙනත් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් වෙත පවරමින් නියමයක් කළ හැකි අතර ව්‍යාපාර කටයුතු පවරනු ලැබුවේ යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවකින් ද ඒ බැංකුව ගෙවීම පැහැර හැර ඇති බැංකුවක් ලෙස ද ව්‍යාපාර කටයුතු පවරනු ලැබුවේ යම් බැංකුවක් වෙත ද එම බැංකුව අත්කර ගැනීමේ බැංකුවක් ලෙස ද සලකා VIIඅ කොටසේ විධිවිධාන ඒ පැවරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය :

එසේ වුව ද 9 වන වගන්තිය යටතේ පසුව කටයුතු කිරීම බැංකු ක්‍රමයෙහි යහපත උදෙසා අවශ්‍ය බව මුදල් මණ්ඩලයේ මතය වන අවස්ථාවක මේ වගන්තිය යටතේ ගනු ලබන යම් පියවරක් මගින්, 9 වන වගන්තිය යටතේ පසුව ක්‍රියා කිරීමෙන් මුදල් මණ්ඩලය වළක්වනු නොලැබිය යුතු ය.

(5) (4) වන උපවගන්තිය යටතේ ගන්නා ලද යම් පියවරක් ලිඛිත දැන්වීමක් මගින් බලපත්‍රලාභී වාණිජ බැංකුව වෙත සහ (4) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ සඳහන් යම් අධ්‍යක්ෂවරයකුට, කළමනාකාරවරයකුට හෝ පාලකවරයකුට, දැනුම් දිය යුතු අතර එවැනි දැන්වීමක් ලැබීමේ දින සිට හෝ ඒ දැන්වීමේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි වෙනත් යම් දිනයක සිට එම පියවර බලාත්මක විය යුතු ය.".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි (1) වන උපවගන්තියේ —

(i) එහි (ඇ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඇ) බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් වෙනත් බලපත්‍රලාභී වාණිජ බැංකුවක හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක හෝ වෙනත් බලපත්‍රලාභී වාණිජ බැංකුවක යම් ශාඛාවක හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක යම් ශාඛාවක, ව්‍යාපාර කටයුතු හෝ ව්‍යාපාර කටයුතු වලින් කොටසක් අත්පත්කර ගැනීම සඳහා ද ;" ;

(ii) එහි (ඈ) ඡේදය ඉවත් කිරීමෙන් සහ (ඉ) ඡේදය (ඈ) ඡේදය ලෙස නැවත අක්ෂර යෙදීමෙන් ; සහ

(iii) ඒ උපවගන්තියේ නැවත අක්ෂර යෙදූ (ඈ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :—

"(ඉ) බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ එහි ශාඛාවක් වෙනත් යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් සමග එක්කිරීම හෝ ඒකාබද්ධ කිරීම සඳහා ද" ;

(2) එහි (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් :—

"(1අ) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ අත්පත්කර ගැනීමකට හෝ (1) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ එක් කිරීමකට හෝ ඒකාබද්ධ කිරීමකට අනුමැතිය ලබාගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක—

(අ) අවස්ථාවෝචිත පරිදි ඒ අත්පත් කරගැනීමේ, එක්කිරීමේ හෝ ඒකාබද්ධ කිරීමේ ස්වභාවය පිළිබඳ ප්‍රකාශයක් ;

(ආ) අවස්ථාවෝචිත පරිදි අත්පත් කර ගැනීම හෝ එක් කිරීම හෝ ඒකාබද්ධ කිරීම කරනු ලබන්නේ යම් යෝජිත ගිවිසුමක් යටතේ ද එවැනි ගිවිසුමක් තිබේ නම් ඒ ගිවිසුමේ පිටපතක් ; සහ

(ඇ) නියම කරනු ලැබිය හැකි වෙනත් එවැනි විස්තර සහ ලේඛන,

ඇතුළත් විය යුතු ය.

(1ආ) එවැනි අත්පත්කර ගැනීමක් හෝ එක් කිරීමක් හෝ ඒකාබද්ධ කිරීමක් සුරක්ෂිත, මනා, සහ ස්ථාවර බැංකු ක්‍රමයක් සහ බැංකු කර්මාන්තයෙහි පවත්නා සාධාරණ වෙළෙඳපොල තරගය ද වැඩිදියුණු කිරීමෙහි ලා ඉවහල් වන බවට මුදල් මණ්ඩලය සෑහීමට පත් වන්නේ නම් මිස (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය හෝ (ඉ) ඡේදය හෝ යටතේ හෝ (1ඇ) උපවගන්තිය යටතේ අනුමැතියක් නොදිය යුතු ය. (1ඇ) උපවගන්තිය යටතේ කරනු ලබන අත්පත් කරගැනීමක් සඳහා අනුමැතිය දෙන විටක අවස්ථාවෝචිත පරිදි ඒ පුද්ගලයා හෝ ඒ සංස්ථාපිත මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් නිසි සහ සුදුසු තැනැත්තන් ද යන්න නිශ්චය කිරීමේ දී මුදල් මණ්ඩලය විසින් 42 වන වගන්තියේ (2) වන උපවගන්තියේ දක්වා ඇති උපමාන උපයෝගී කොට ගත යුතු ය.

(1ඇ) (අ) පුද්ගලයකු, හවුල් ව්‍යාපාරයක් හෝ සංස්ථාපිත මණ්ඩලයක් විසින් කෙලින්ම හෝ වක්‍රාකාරයෙන් හෝ නාමිකයකු මගින් හෝ වෙනත් යම් පුද්ගලයකු, හවුල් ව්‍යාපාරයක් හෝ සංස්ථාපිත මණ්ඩලයක් සමග සහ චින්තනයෙන් ක්‍රියා කරමින් හෝ යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරන ලද හෝ පිහිටුවන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක වැදගත් අයිතිවාසිකමක් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව දෙනු ලබන මුදල් මණ්ඩලයේ පූර්ව ලිඛිත අනුමැතිය නොමැතිව අත්පත්කර නොගත යුතු ය.

(ආ) මේ වගන්තියේ (2) වන උපවගන්තියේ ව්‍යාප්තියට හානියක් නොමැතිව, මේ උපවගන්තියේ (අ) ඡේදය යටතේ අනුමැතිය මුදල් මණ්ඩලය විසින් උචිත යයි සලකනු ලබන නියම සහ කොන්දේසිවලට යටත්ව දෙනු ලැබිය හැකි ය ;

(ඇ) බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින්, (අ) ඡේදයේ විධිවිධාන උල්ලංඝනය කරනු ලබන යම් පුද්ගලයකුගේ, හවුල් ව්‍යාපාරයක, සංස්ථාපිත මණ්ඩලයක හෝ නාමිකයකුගේ නම, බැංකු කොටස් දරන්නකු ලෙස බැංකු සාමාජිකයන්ගේ ලේඛනයේ ඇතුළත් නොකළ යුතු ය ;

මේ උපවගන්තියේ කාර්යය සඳහා "සහචින්තනයෙන් ක්‍රියා කිරීම" යන්නෙන්, යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක පාලනය ලබා ගැනීමට හෝ සහබද්ධ කරගැනීම පිණිස එම වාණිජ බැංකුවේ වැදගත් අයිතිවාසිකමක් ලබා ගැනීමෙහි ලා ක්‍රියාකාරී ලෙස සහයෝගය දැක්වීම පිණිස එකඟත්වයකට (විධිමත් හෝ අවිධිමත්) අනුකූලව ක්‍රියා කිරීම අදහස් වන අතර "වැදගත් අයිතිවාසිකමක්" යන්නෙන්, යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක ඡන්දය පාවිච්චි කිරීමේ අයිතිය ලබා දෙන එහි නිකුත් කරන ලද ප්‍රාග්ධනයෙන් සියයට දහයට වැඩි ප්‍රමාණයක් දැරීම අදහස් වේ.".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය, එහි (1) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(1) යම් තැනැත්තකු මේ පනතේ විධිවිධාන උල්ලංඝනය කරමින් බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යන බව විශ්වාස කිරීමට මහ බැංකුවේ අධිපතිවරයාට සාධාරණ හේතු ඇති අවස්ථාවක දී, ඒ තැනැත්තා මේ පනතේ විධිවිධාන වලින් යම් විධිවිධානයක්

කඩකර ඇත්තේ ද හෝ කඩ කරන්නේ ද හෝ යන්න සාක්ෂාත් කර ගැනීමේ කාර්ය සඳහා ඒ තැනැත්තාගේ පොත්, ගිණුම් සහ වාර්තා පරීක්ෂා කර බලන ලෙස මහ බැංකුවේ අධිපතිවරයා විසින් බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාට හෝ මහ බැංකුවේ වෙනත් යම් නිලධරයකුට විධාන කරනු ලැබිය හැකි ය.".

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් හැර අන් කිසිම සමාගමක් විසින්, මුදල් මණ්ඩලයේ පූර්ව ලිඛිත අනුමැතිය ලබාගෙන මිස, එහි නාමේ හෝ එහි විස්තර කිරීමෙහි කොටසක් වශයෙන් "බැංකුව", "බැංකුකරු" හෝ "බැංකු කටයුතු" යන වචන හෝ ඒවායේ යම් ව්‍යුත්පන්නයක් හෝ එහි අන්වක්ෂීරිකරණ හෝ පාවිච්චි කිරීම හෝ ඒවාට සමාන වචන වෙනත් භාෂාවකින් පාවිච්චි කිරීම හෝ නොකළ යුතු අතර, කිසිම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ඉහත කී වචන වලින් යටත් පිරිසෙයින් එක වචනයක්වත් ස්වකීය නාමේ කොටසක් ලෙස භාවිත කරන්නේ නම් මිස, ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන නොයා යුතු ය :

එසේ වුව ද ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරනු ලැබුවා වූ ද, ස්වකීය නාමෙහි කවර හෝ භාෂාවකින් "බැංකුව", "බැංකුකරු" හෝ "බැංකු කටයුතු" යන වචන යොදා නොමැති වූ ද, බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් ස්වකීය නාමෙහි මෙම වචන අත්හැර තිබීම නොතකා ශ්‍රී ලංකාවෙහි ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යනු ලැබිය හැකි ය.".

(2) එහි (3) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(3) මේ වගන්තියේ කිසිවක් —

(අ) මේ පනතේ විධිවිධානවලට හෝ එකී විධිවිධාන යටතේ දෙන ලද යම් විධානයන්ට අනුකූලව පිහිටුවනු ලැබූ බලපත්‍රලාභී වාණිජ බැංකුවක හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක පාලිත සමාගමක් ;

(ආ) සිය අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම සඳහා ඇති කරන ලද, බලපත්‍රලාභී වාණිජ බැංකුවල හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල යම් සංගමයක් ;

(ඇ) මුදල් නීති පනතේ 127 වන වගන්තියේ අර්ථානුකූලව බැංකු ආයතනයක් වන්නා වූ යම් ආයතනයක හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක හෝ සේවා නියුක්තිකයන් වන සේවකයන්ගේ සංගමයක් හෝ ඒකරාශීවීමක් වන්නා වූ, (138 වන අධිකාරය වූ) වෘත්තීය සමිති ආඥාපනත යටතේ ලියාපදිංචි කළ වෘත්තීය සමිතියක් ;

(ඈ) මුදල් නීති පනතේ 127 වන වගන්තියේ " බැංකු ව්‍යාපාර ආයතනය " යන යෙදුමේ අර්ථ නිරූපණයෙහි (ආ) ඡේදය හෝ (ඇ) ඡේදය ප්‍රකාරව බැංකු ආයතනයක් වන්නා වූ අනුයෝජිත ආයතනයක්, ආයතනයක්, තැනැත්තෙක් හෝ පුද්ගල කණ්ඩායමක් ;

(ඉ) 3 වන වගන්තිය හෝ 76 ආ වගන්තිය යටතේ නිකුත් කරන ලද තාවකාලික අනුමත ලිපියේ වලංගු කාලය ඇතුළත සමාගමක නම සංස්ථාගත කිරීමේ හෝ වෙනස් කිරීමේ කාර්ය සඳහා (1) වන උපවගන්තිය යටතේ සීමාකර ඇති ආකාරයට වචන පාවිච්චි කිරීමක් ;

(ඊ) ශ්‍රී ලංකාවෙන් බැහැර සංස්ථාගත කරන ලද හෝ පිහිටුවන ලද වාණිජ බැංකුවක නියෝජිත කාර්යාලයක්,

සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය. ".

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 17අ වගන්තියේ (2) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (ඈ) ඡේදයේ " අත්කර ගැනීම හෝ දැරීම" යන වචන වෙනුවට " අත්කර ගැනීම හෝ දැරීම ;" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) එහි (ඈ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඉ) මුදල් මණ්ඩලය විසින් බලය දෙනු ලබන ආයෝජන.".

11. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 21 වන වගන්තිය එහි (1) වන උපවගන්තියෙහි " මහ බැංකුවට සහ කොටස් හිමියන්ට ඇති බැරකම් " යන වචන යෙදී ඇති සෑම අවස්ථාවක ම ඒ වෙනුවට "මහ බැංකුවට, කොටස් හිමියන්ට සහ බේරුම් කළ නොහැකි ණය සාධන පත්‍ර දරන්නන්ට ඇති බැරකම් සහ ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් නිකුත් කරන ලද හෝ ඇපවන ලද භාණ්ඩාගාර බිල්පත්වලට හෝ සුරැකුම්පත්වලට අදාළ නැවත මිල දී ගැනීමේ ගිවිසුම් මත හෝ මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන වෙනත් වත්කම් මත ඒ බැංකුවේ බැරකම් " යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ "අක්වෙරළ බැංකු ව්‍යාපාර කරගෙන යාමට" යන වචන වෙනුවට "76ඈ වගන්තිය යටතේ බලය පවරනු ලැබ ඇත්නම් මිස, අක්වෙරළ බැංකු ව්‍යාපාර කරගෙන යාමට" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය, එහි (අ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(අ) අනේවාසිකයකුගෙන් යම් නම්කළ විදේශ ව්‍යවහාර මුදල් වලින් ඉතිරි කිරීමේ තැන්පතු, කාලීන සහ ඉල්ලීම පිට ආපසු ගෙවන තැන්පතු භාර ගැනීම. එසේ වුව ද කාලීන තැන්පතු සම්බන්ධයෙන් වන විට, එවැනි තැන්පතු ඇමරිකා එක්සත් ජනපද ඩොලර් දස දහසකට හෝ වෙනත් යම් නම්කළ විදේශ ව්‍යවහාර මුදල් වලින් ඊට සමාන මුදලකට හෝ මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ඊට වැඩි මුදලකට හෝ අඩු නොවිය යුතු ය. එසේ වුව ද අක්වෙරළ ඒකකයක පවත්වාගෙන යනු ලබන යම් ගිණුමක අරමුදල් චෙක්පත් වලින් ආපසු ලබාගත නොහැකි විය යුතු ය ;".

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය එහි (2) වන උපවගන්තියේ (ඊ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(ඊ) මුදල් සංසරණ ප්‍රකාශයක් ;".

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"ශේෂ පත්‍රය සහ ලාභ අලාභ ගිණුම ප්‍රකාශයට පත්කිරීම.

38. (1) යම් ලිඛිත නීතියක් මගින් හෝ යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරන ලද හෝ පිහිටුවන ලද සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් ම එහි මුදල් වර්ෂය පියවා මාස පහක් ඇතුළත ස්වකීය අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු ඇතුළුව ශ්‍රී ලංකාව ඇතුළත සහ ඉන් බැහැර ස්වකීය ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් ඒ මුදල් වර්ෂය අවසානයට වූ විගණනය කරන ලද ශේෂ පත්‍රය සහ ඒ මුදල් වර්ෂය සඳහා වූ එහි ලාභ

අලාභ ගිණුම බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා වෙත යවනු ලැබීම සහ ශ්‍රී ලංකාව තුළ බෙදා හරිනු ලබන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි දිනපතා පුවත්පතක එම කාලය තුළ යටත් පිරිසෙයින් එක් වරක් පළ කරනු ලැබීම කළයුතු අතර එළඹෙන අවුරුද්දේ ශේෂ පත්‍රය සහ ලාභ අලාභ ගිණුම පිළියෙල කොට ප්‍රදර්ශනය කරන තෙක් ඒවා එහි ව්‍යාපාර කටයුතු කරන එක් එක් ස්ථානයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

(2) ශ්‍රී ලංකාවෙන් බැහැර සංස්ථාගත කරන ලද සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් ම එහි මුදල් වර්ෂය පියවා මාස පහක් ඇතුළත ඒ බැංකුවේ අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු ද ඇතුළුව එය ශ්‍රී ලංකාව තුළ කරගෙන යනු ලබන ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් එහි මුදල් වර්ෂය අවසානයට වූ ශේෂ පත්‍රය සහ ඒ මුදල් වර්ෂය සඳහා වූ එහි ලාභ අලාභ ගිණුම බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා වෙත යැවිය යුතු අතර, එම ශේෂ පත්‍රය සහ එහි ලාභ අලාභ ගිණුම, ශ්‍රී ලංකාවෙහි බෙදා හරිනු ලබන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි දිනපතා පුවත්පතක යටත් පිරිසෙයින් එක් වරක් හෝ අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලැබිය හැකි කාලයක් ඇතුළත පළ කරනු ලැබිය යුතු ය ; තව ද, එළඹෙන අවුරුද්දේ ශේෂ පත්‍රය සහ ලාභ අලාභ ගිණුම පිළියෙල කොට ප්‍රදර්ශනය කරනු ලබන තෙක් ඉහත කී ශේෂ පත්‍රය සහ ලාභ අලාභ ගිණුම එහි ව්‍යාපාරික කටයුතු කරන එක් එක් ස්ථානයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

(3) මුදල් මණ්ඩලය විසින්, යම් හෙළිකිරීම්වලට සම්බන්ධ නියමයන් ද ඇතුළුව මේ කොටසෙහි සඳහන් කරන ලද ශේෂ පත්‍ර සහ ලාභ අලාභ ගිණුමෙහි ආකෘතිය නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි අතර, එසේ ආකෘතිය නිශ්චිතව සඳහන් කොට ඇති අවස්ථාවක, සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක ම ශේෂ පත්‍රය සහ ලාභ අලාභ ගිණුම, එසේ නිශ්චිතව සඳහන් කරනු ලැබූ ආකෘතියෙහි පිළියෙල කරනු ලැබිය යුතු ය.

(4) සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් ම සිය මුදල් වර්ෂය පියවා මාස හයක් ඇතුළත, එහි එළඹෙන මුදල් වර්ෂය සඳහා ඒකාබද්ධ ශේෂ පත්‍රය පිළියෙල කොට ප්‍රදර්ශනය කරන තෙක් ඒ වාණිජ බැංකුවේ සහ එහි පාලිත සමාගම්වල සහ එහි ආශ්‍රිත සමාගම්වල ද කටයුතුවල තත්ත්වය සඳහන් කරමින් ඒ මුදල් වර්ෂය අවසානය තෙක් වූ ඒකාබද්ධ ශේෂ පත්‍රය ඒ බැංකුවේ එක් එක් ව්‍යාපාරික ස්ථානයෙහි ප්‍රකටව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තියේ (4) වන උපවගන්තියේ කාර්ය සඳහා යම් සමාගමක් බලපත්‍රලාභී වාණිජ බැංකුවක පාලිත සමාගමක් ද නැතහොත් ආශ්‍රිත සමාගමක් ද යන්න තීරණය කිරීමේ දී, අවස්ථාවෝචිත පරිදි 17 වන වගන්තියේ (3) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධාන සහ 46 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධාන අදාළ විය යුතු ය.".

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"අධ්‍යක්ෂවරයකු ලෙස පත්කරනු ලැබීමට හෝ තෝරා පත්කරනු ලැබීමට නුසුදුසුවීම.

42. (1) යම් තැනැත්තකු බලපත්‍රලාභී වාණිජ බැංකුවක අධ්‍යක්ෂවරයකු ලෙස ධූර දැරීමට සුදුසු හා නිසි තැනැත්තකු වන්නේ නම් මිස සහ මේ පනතේ වෙනත් යම් විධිවිධානයක් මගින් හෝ වෙනත් යම් ලිඛිත නීතියක් මගින් හෝ ඔහු එසේ ධූර දැරීම වළක්වනු නොලබන්නේ නම් මිස, ඒ තැනැත්තා එම බලපත්‍රලාභී වාණිජ බැංකුවේ අධ්‍යක්ෂවරයකු ලෙස පත් කිරීම, තෝරා පත්කර ගැනීම හෝ නම් කරනු ලැබීම නැතහොත් ඒ බැංකුවේ අධ්‍යක්ෂවරයකු ලෙස තවදුරටත් කටයුතු කිරීම නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා යම් තැනැත්තකු සුදුසු හා නිසි තැනැත්තකු වන්නේ ද යන්න තීරණය කිරීමේ දී පහත සඳහන් කාරණා වලින් එකක් හෝ ඊට වැඩි ගණනක් පිළිබඳව සැලකිල්ල දැක්විය යුතු ය :—

(අ) ඒ තැනැත්තා ට බැංකු කටයුතු, මූල්‍ය කටයුතු, ව්‍යාපාරික කටයුතු, පරිපාලන කටයුතු හෝ වෙනත් යම් අදාළ විෂයයක් පිළිබඳ ශාස්ත්‍රීය හෝ වෘත්තීයමය සුදුසුකම් හෝ කාර්ය සාධක අත්දැකීම් ඇති බව ;

(ආ) ඒ තැනැත්තා වංචාවක්, රැවටීමක්, වංක ක්‍රියාවක් හෝ වෙනත් යම් නුසුදුසු ක්‍රියාවක් සංයුක්තවන යම් ක්‍රියාවක් සිදුකර ඇති හෝ සිදු කිරීමෙහි ලා සම්බන්ධ වී ඇති බවට, නීතිය මගින් ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක පිහිටුවන ලද යම් පාලන අධිකාරියක් හෝ අධීක්ෂණ අධිකාරියක්, වෘත්තීයමය සංගමයක්, යම් පරීක්ෂණ කොමිෂන් සභාවක්, විනිශ්චය අධිකාරියක් හෝ වෙනත් මණ්ඩලයක් විසින් තීරණය කරනු ලැබ නොමැති බව;

(ඇ) ඒ තැනැත්තා, යම් වංචාවක්, රැවටීමක්, වංක ක්‍රියාවක් හෝ වෙනත් සමාන අපරාධ ක්‍රියාවක් සම්බන්ධයෙන් වූ චෝදනාවක් පිළිබඳ දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසු, නීතිය මගින් පිහිටුවන ලද යම් පාලන අධිකාරියක්, අධීක්ෂණ අධිකාරියක්, වෘත්තීයමය සංගමයක්, පරීක්ෂණ කොමිෂන් සභාවක්, විනිශ්චය අධිකාරියක් හෝ වෙනත් මණ්ඩලයක් විසින් පවත්වනු ලබන විමර්ශනයකට හෝ පරීක්ෂණයකට ශ්‍රී ලංකාවේ දී හෝ යම් විදේශ රටක දී භාජන වී නොමැති බව ;

(ඈ) මූල්‍ය කළමනාකරණයට අදාළව සිදුකරන ලද අපරාධයක් හෝ චරිත දූෂණාත්මක වරදක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ හෝ විදේශයක යම් අධිකරණයක් විසින් එම තැනැත්තා වරදකරු කරනු ලැබ නොමැති බව ;

(ඉ) ඒ තැනැත්තා ශ්‍රී ලංකාවේ දී හෝ විදේශ රටක දී බුන්වත් භාවයෙන් නිදහස් කරනු නොලැබූ තැනැත්තකු නොවන බව හෝ බංකොලොත්-භාවයට පත් තැනැත්තකු බවට ප්‍රකාශ කරනු ලැබ නොමැති බව ;

(ඊ) ඒ තැනැත්තා ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක නිසි බලයලත් යම් අධිකරණයක් විසින් ප්‍රකාශයට පත් කරන ලද යම් නඩු තීන්දුවක් හෝ ආඥාවක් අනුව ක්‍රියා කිරීම හෝ ණය මුදලක් ආපසු ගෙවීම පැහැර හැර නොමැති බව ;

(උ) ඒ තැනැත්තා සිහිවිකල් තැනැත්තකු බවට ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක බලයලත් අධිකරණයක් විසින් ප්‍රකාශයට පත් කරනු ලැබ නොමැති බව ;

(ඌ) ඒ තැනැත්තා යම් පාලන අධිකාරියක් හෝ අධීක්ෂණ අධිකාරියක් මගින්, ශ්‍රී ලංකාවේ හෝ යම් විදේශ රටක යම් බැංකුවක හෝ මූල්‍ය ආයතනයක හෝ සංස්ථාගත මණ්ඩලයක අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායක නිලධරයකු හෝ වෙනත් නිලධරයකු වශයෙන් සේවය කිරීමෙන් නෙරපනු ලැබ නොමැති බව හෝ එම සේවය අත්හිටුවනු ලැබ නොමැති බව ;

(එ) (i) බලපත්‍රය අත්හිටුවනු ලැබ ඇති හෝ අවලංගු කරනු ලැබ ඇති හෝ

(ii) ගණන් බේරා වසා ඇති හෝ ගණන් බේරා වසා දමනු ලබන හෝ අනිවාර්යයෙන් ඈවර කරනු ලබන,

ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක යම් බැංකුවක හෝ මූල්‍ය ආයතනයක එම තැනැත්තා අධ්‍යක්ෂවරයකු වශයෙන් හෝ ප්‍රධාන විධායක නිලධරයා වශයෙන් හෝ සේවය කොට නොමැති බව හෝ වෙනත් යම් වගකිවයුතු තනතුරක් දරා නොමැති බව.

(3) (අ) බලපත්‍රලාභී වාණිජ බැංකුවක අධ්‍යක්ෂවරයකු හෝ සේවානියුක්තිකයකු වෙනත් බලපත්‍රලාභී වාණිජ බැංකුවක හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක අධ්‍යක්ෂවරයකු ලෙස පත්කිරීම, තෝරා පත්කර ගැනීම හෝ නම් කිරීම එකී වෙනත් බලපත්‍රලාභී වාණිජ බැංකුව හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුව, මුලින් කී බලපත්‍රලාභී වාණිජ බැංකුවේ පාලිත සමාගමක් හෝ ආශ්‍රිත සමාගමක් වන්නේ නම් මිස නොකළ යුතු ය.

(ආ) බලපත්‍රලාභී වාණිජ බැංකුවක සේවා නියුක්තිකයකු පහත සඳහන් කොන්දේසිවලට යටත්ව එම බැංකුවේ අධ්‍යක්ෂවරයකු වශයෙන් පත් කිරීම, තෝරා පත් කර ගැනීම හෝ නම් කිරීම කළහැකි වන්නේ ය :–

(i) (මෙහි මින් මතු " විධායක අධ්‍යක්ෂවරුන් " යනුවෙන් හඳුන්වනු ලබන) අධ්‍යක්ෂවරුන් වශයෙන් පත් කරනු ලබන, තෝරා පත් කර ගනු ලබන හෝ නම් කරනු ලබන, සේවා නියුක්තිකයන්ගේ සංඛ්‍යාව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්ගේ සංඛ්‍යාවෙහි තුනෙන් එකට වඩා වැඩි නොවිය යුතු ය ;

(ii) සේවා නියුක්තිකයන් විධායක අධ්‍යක්ෂවරුන් ලෙස පත්කරනු ලබන, තෝරා පත්කර ගනු ලබන හෝ නම් කරනු ලබන අවස්ථාවක, ඔවුන්ගෙන් එක් අයකු බැංකුවේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු අතර, අනෙකුත් තැනැත්තන් 44අ වගන්තියේ කාර්යය සඳහා තීරණය කරනු ලැබිය හැකි පරිදි විධායක කාර්ය ඉටු කරන නිලධරයන් විය යුතු ය ;

(iii) බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් රැස්වීමකට පැමිණ සිටින අධ්‍යක්ෂවරුන්ගෙන් භාගයකට වැඩි සංඛ්‍යාවක් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වන්නේ නම් මිස, ඒ රැස්වීමේ ගණපූරණය සඳහා නියමිත අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව පැමිණ සිටිය ද, එකී අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම විධිමත් ලෙස සංස්ථාපනය වූ රැස්වීමක් නොවන්නේ ය.

(4) සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් ම බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකෘති පත්‍රයක –

(අ) යම් තැනැත්තකු බැංකුවේ අධ්‍යක්ෂවරයකු ලෙස පත් කරනු ලැබීමට, තෝරා පත්කර ගනු ලැබීමට හෝ නම් කරනු ලැබීමට පෙර අවස්ථාවෝචිත පරිදි එසේ පත් කරනු ලැබීමට, තෝරා පත්කර ගනු ලැබීමට හෝ නම් කරනු ලැබීමට යෝජිත එක් එක් තැනැත්තාගේ ;

(ආ) යම් තැනැත්තකු බැංකුවේ අධ්‍යක්ෂවරයකු ලෙස පත් කරනු ලැබීමෙන්, තෝරා පත්කර ගනු ලැබීමෙන් හෝ නම් කරනු ලැබීමෙන් පසු අවස්ථාවෝචිත පරිදි එසේ පත්කර ගැනීමේ, තෝරා පත්කර ගැනීමේ හෝ නම් කිරීමේ දින සිට දින පහළොවක් ඇතුළත ඒ එක් එක් තැනැත්තාගේ ;

(ඇ) බැංකුවේ යම් අධ්‍යක්ෂවරයකු සුදුසු හා නිසි තැනැත්තකු නොවන බවට හෝ එම අධ්‍යක්ෂවරයා අධ්‍යක්ෂවරයකු ලෙස ධූර දැරීමට අත්‍යාකාරයකට නුසුදුස්සකු වන අවස්ථාවක, ඒ බව හෝ බැංකුවට දැන ගැනීමට ලැබුණු දින සිට දින පහළොවක් ඇතුළත ඒ එක් එක් තැනැත්තාගේ,

නම, ලිපිනය සහ රැකියාව බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා වෙත දැනුම් දිය යුතු ය.

(5) බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින්, (1), (2) සහ (3) උපවගන්තිවල සඳහන් කරුණු සැලකිල්ලට ගෙන (4) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් තැනැත්තා බලපත්‍රලාභී වාණිජ බැංකුවේ අධ්‍යක්ෂවරයකු ලෙස අවස්ථාවෝචිත පරිදි පත් කිරීම, තෝරා පත්කර ගැනීම හෝ නම් කිරීම අනුමත කරනු ලැබිය හැකි ය ; නැතහොත් අනුමත කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය. තව ද එම උපවගන්තිය යටතේ එම තැනැත්තාගේ නම ඉදිරිපත් කිරීමෙන් පසු දින තිහක් ඇතුළත බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් එසේ අනුමත කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම සඳහා හේතු ඉදිරිපත් කරමින් ඒ බව බැංකුව වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය. එම දැන්වීම අදාළවන තැනැත්තාට ඒ පිළිබඳව දැනුම්දීම බැංකුවේ කාර්යය වන්නේ ය.

(6) අදාළ බැංකුවේ අධ්‍යක්ෂවරයකු ලෙස තමා පත් කරන ලෙසට, තෝරා පත්කර ගන්නා ලෙසට හෝ නම් කරන ලෙසට ඉදිරිපත් කරන ලද යෝජනාව බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් (5) වන උපවගන්තිය යටතේ ප්‍රතික්ෂේප කිරීම නිසා අතෘප්තියට පත් තැනැත්තකු විසින් (5) වන උපවගන්තිය යටතේ බැංකුව විසින් තමා වෙත එවන ලද දැනුම් දීම ලැබීමෙන් දින දාහතරක් ඇතුළත, එම ප්‍රතික්ෂේප කිරීමට එරෙහිව ලිඛිත විරෝධතා මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. එම ලිඛිත විරෝධතා ලැබීමේ දී මුදල් මණ්ඩලය විසින් එම විරෝධතා ලැබීමෙන් දින තිහක් ඉකුත් වීමට පෙර, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාගේ දැනුම්දීමේ සඳහන් හේතු සාධක ද, අතෘප්තියට පත් පාර්ශ්වයේ විරෝධතා ද සහ මණ්ඩලයේ මතය පරිදි විමසා බැලිය යුතු වෙනත් යම් කාරණා ද සැලකිල්ලට ගැනීමෙන් පසු බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් කරන ලද ප්‍රතික්ෂේප කිරීම ස්ථිර කරමින් හෝ, එම තැනැත්තා අදාළ බැංකුවේ අධ්‍යක්ෂවරයකු ලෙස අවස්ථාවෝචිත පරිදි පත් කරන ලෙසට, තෝරා පත්කර ගන්නා ලෙසට හෝ නම් කරන ලෙසට ඉදිරිපත් කරනු ලැබූ යෝජනාව අනුමත කරමින් මුදල් මණ්ඩලය විසින් තීරණයක් කරනු ලැබිය යුතු ය.

(7) යම් තැනැත්තකුගේ පත්වීම, තෝරා පත්කර ගැනීම හෝ නම් කිරීම (5) වන උපවගන්තිය යටතේ හෝ (6) වන උපවගන්තිය යටතේ අනුමත කරනු ලැබ නැති අවස්ථාවක, බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් එකී තැනැත්තා එහි අධ්‍යක්ෂවරයකු ලෙස අවස්ථාවෝචිත පරිදි පත් කිරීම, තෝරා පත් කිරීම හෝ නම් කරනු ලැබීම නොකළ යුතු ය :

එසේ වුව ද, (5) වන උපවගන්තිය යටතේ අනුමැතිය සඳහා බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා වෙත නම ඉදිරිපත් කරනු ලැබ ඇති යම් තැනැත්තකු, ඒ උපවගන්තිය යටතේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාගේ තීරණය දැනුම් දීමට පෙර කවර හෝ වේලාවක බැංකුවේ අධ්‍යක්ෂවරයකු ලෙස අවස්ථාවෝචිත පරිදි පත් කිරීම, තෝරා පත්කර ගැනීම හෝ නම් කරනු ලැබීම කරනු ලැබිය හැකි නමුත් ඒ උපවගන්තිය යටතේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් ඒ අනුමැතිය ලබා දීම ප්‍රතික්ෂේප

කරමින් ඒ අනුව බැංකුව වෙත දැනුම් දෙන අවස්ථාවක සහ ඒ අනුව බැංකුව විසින් ඒ තැනැත්තාට දැනුම් දුන් අවස්ථාවක, ඒ දැන්වීම බැංකුව වෙතින් ලැබීමේ දී, (6) වන උපවගන්තිය යටතේ මුදල් මණ්ඩලය විසින් කරනු ලබන යම් තීරණයකට යටත්ව ඒ තැනැත්තා එම බැංකුවේ අධ්‍යක්ෂවරයකු ලෙස ධුර දැරීම වහාම අවසන් වන්නේ ය.

(8) බලපත්‍රලාභී වාණිජ බැංකුවක අධ්‍යක්ෂවරයකු ලෙස අවස්ථාවෝචිත පරිදි පත්කර ගනු ලැබූ, තෝරා පත්කර ගනු ලැබූ හෝ නම් කරනු ලැබූ තැනැත්තකු සුදුසු හා නිසි තැනැත්තකු නොවන බවට හෝ ඒ පත්කිරීමට, තෝරා පත්කිරීමට හෝ නම් කිරීමට ඒ තැනැත්තා අන්‍යාකාරයෙන් නුසුදුසු බවට නැතහොත් ඒ තැනැත්තා බලපත්‍රලාභී වාණිජ බැංකුවක අධ්‍යක්ෂවරයකු ලෙස තෝරා පත් කිරීම, පත් කිරීම හෝ නම් කිරීම මගින් (3) වන උපවගන්තිය හෝ (7) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝණය කරන බවට බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් (1), (2) සහ (3) වන උපවගන්තිවල කරුණු සැලකිල්ලට ගෙන සෑහීමට පත්වනු ලබන කවර හෝ අවස්ථාවක එම අධ්‍යක්ෂවරයා විසින් මුදල් මණ්ඩලය වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය. මුදල් මණ්ඩලය විසින් වාර්තාව සහ ස්වකීය මතය අනුව විභාග කළයුතු වෙනත් යම් කරුණු සැලකිල්ලට ගැනීමෙන් පසු ඒ තැනැත්තා සුදුසු හා නිසි තැනැත්තකු නොවන බවට නැතහොත් ඒ තැනැත්තා තෝරා පත් කිරීම, පත් කිරීම හෝ නම් කරනු ලැබීම (3) වන උපවගන්තිය හෝ (7) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන බවට, මුදල් මණ්ඩලය සෑහීමට පත් වන්නේ නම්, එම මණ්ඩලය විසින් —

(අ) එම තැනැත්තා, විධානයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි කාලසීමාව ඇතුළත අධ්‍යක්ෂ ධුරයෙන් ඉවත් කරන ලෙස ලිඛිතව බැංකුව වෙත විධාන කළ හැකි ය. තව ද ඒ විධානයෙහි ඒ සඳහා හේතු දැක්විය යුතු ය ; සහ

(ආ) ඒ විධානය යටතේ ඉවත් කිරීමට නියමිත තැනැත්තාට ඒ විධානය පිළිබඳව ලිඛිතව දැනුම් දිය යුතු අතර, ඒ විධානයේ පිටපතක් ඒ දැන්වීමට අමුණා යැවිය යුතු ය.

තව ද බැංකුව විසින් විධානයේ සඳහන් කාලසීමාව ඇතුළත ඒ තැනැත්තා අධ්‍යක්ෂ ධුරයෙන් ඉවත් කරනු ලැබිය යුතු අතර, එම ධුරයෙන් ඉවත් කිරීම පිළිබඳව ඒ තැනැත්තා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය. ; තව ද බැංකුව විසින් ඒ ඉවත් කිරීම පිළිබඳව බැංකුවේ කොටස් හිමියන්ට සහ සමාගම් රෙජිස්ට්‍රාර්වරයාට දැනුම් දීමට අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු ය ; (අ) ඡේදය යටතේ දෙන ලද විධානයකට අනුකූලව අධ්‍යක්ෂවරයකු ඉවත් කිරීම, වෙනයම් ලිඛිත නීතියක විධිවිධානවල හෝ බැංකුවේ සංගමික ව්‍යවස්ථාවලියේ කුමක් සඳහන් වුව ද බැංකුව විසින් දෙන ලද ඉවත් කිරීමේ දැන්වීම අධ්‍යක්ෂවරයා වෙත ලැබීමේ දින සිට බලාත්මක විය යුතු ය.

(9) (8) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ දෙන ලද යම් විධානයකට අනුකූලව ඒ විධානයේ සඳහන් කාලසීමාව තුළ ක්‍රියා කිරීම පැහැර හරින යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සහ (8) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ දැන්වීමක් ලැබී එම අධ්‍යක්ෂ ධුරයේ අඛණ්ඩව කටයුතු කරන අධ්‍යක්ෂවරයකු වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයක දී එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන්ලක්ෂයක දඩයකට ඔහු යටත් විය යුතු අතර,—

(අ) බැංකුව සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමෙන් පසු ඒ විධානයට අනුකූලව ක්‍රියා කිරීම බැංකුව විසින් පැහැර හරිනු ලබන එක් එක් දිනය සඳහා එක් දිනකට රුපියල් එක් ලක්ෂය බැගින් තවදුරටත් වූ දඩයකට ද ;

(ආ) බැංකුවේ අධ්‍යක්ෂවරයකු සම්බන්ධයෙන් වන විට එසේ වරදකරු කරනු ලැබීමෙන් පසු අධ්‍යක්ෂවරයා ලෙස අඛණ්ඩව කටයුතු කරන එක් එක් දිනය සඳහා එක් දිනකට රුපියල් එක් ලක්ෂය බැගින් තවදුරටත් වූ දඩයකට ද, යටත් විය යුතු ය.

(10) (8) වන උපවගන්තිය යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක අධ්‍යක්ෂ ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් එසේ ඉවත් කිරීමට එරෙහිව මුදල් මණ්ඩලය වෙත ලිඛිතව අභියාචනය කළහැකි අතර, මුදල් මණ්ඩලය විසින් අභියාචනය සලකා බැලීමෙන් පසුව එසේ ඉවත් කිරීම ස්ථිර කරනු ලැබිය හැකි ය. ; නැතහොත් එම බැංකුවේ අධ්‍යක්ෂවරයකු ලෙස ඔහු කලින් දැරූ ධුරයට නැවත පත් කිරීම සඳහා බැංකුව වෙත අලුත් විධානයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(11) මේ පනත හැර වෙනත් යම් ලිඛිත නීතියක් මගින් යම් තැනැත්තකු ඒ තැනැත්තා දරන ධුරය ප්‍රකාරව බලපත්‍රලාභී වාණිජ බැංකුවක අධ්‍යක්ෂවරයකු ලෙස පත් කිරීම සඳහා විධිවිධාන සලසා ඇති අවස්ථාවක මේ වගන්තියේ ඉහතින් ම වූ විධිවිධාන ඒ තැනැත්තා ඒ බැංකුවේ අධ්‍යක්ෂවරයකු ලෙස පත් කිරීම සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

(12) අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්වලට බැංකුවේ කටයුතු කළමනාකරණය කිරීම අධීක්ෂණය කිරීම ද ඇතුළත් වේ.”.

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 44අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය.

"ප්‍රධාන විධායක නිලධරයන් සහ විධායක නිලධරයන්.

44අ. (1) බලපත්‍රලාභී වාණිජ බැංකුවක ප්‍රධාන විධායක නිලධරයා ද, විධායක කටයුතු ඉටුකරන්නා වූ වෙනත් යම් නිලධරයන් ද මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි සුදුසු හා නිසි තැනැත්තන් විය යුතු අතර, ප්‍රධාන විධායක නිලධරයා සහ විධායක කටයුතු ඉටු කරන වෙනත් නිලධරයන් සුදුසු සහ නිසි තැනැත්තන් ද යන්න තීරණය කිරීම සම්බන්ධයෙන් 42 (2) වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස්කම් සහිතව අදාළ විය යුතු ය.

(2) 42 වන වගන්තියේ, (5), (6), (8), (9) සහ (10) වන උපවගන්තිවල විධිවිධාන බලපත්‍රලාභී වාණිජ බැංකුවක අධ්‍යක්ෂවරයකුට සහ ඒ තැනැත්තා අධ්‍යක්ෂවරයා වන බලපත්‍රලාභී වාණිජ බැංකුවට අදාළ වන්නේ යම් සේ ද, එසේ ම එම විධිවිධාන මේ වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් ප්‍රධාන විධායක නිලධරයාට සහ විධායක කටයුතු ඉටුකරන නිලධරයන්ට ද එම විධායක නිලධරයා හෝ විධායක කටයුතු ඉටු කරන නිලධරයා සේවයේ නියුක්තව සිටින බලපත්‍රලාභී වාණිජ බැංකුවට ද අදාළ විය යුතු ය.".

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාගේ බලතල.

45. (1) බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින්—

(අ) සිය ව්‍යාපාරික කටයුතු කිරීමේ දී එහි මුදල් තැන්පත්කරුවන් කෙරෙහි වූ ඒ බැංකුවේ බැඳීම් වලට හානියක් සිදුවිය හැකි හෝ ඒ බැඳීම් ඉටුකිරීමට ඒ බැංකුවට නොහැකි කරවන ප්‍රතිඵලයක් ඇති විය හැකි, අනාරක්ෂිත හෝ අස්ථිර ක්‍රියාවලියක නිරතව සිටින බවට; හෝ

(ආ) මේ පනතේ විධිවිධාන හෝ මේ පනත යටතේ සාදන ලද හෝ දෙන ලද යම් නියෝගයක්, විධානයක්, නියමයක් හෝ වෙනත් නියම කිරීමක් කඩ කොට ඇති බවට හෝ ඉටු කිරීම පැහැර හැර ඇති බවට නැතහොත් බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාගේ මතය අනුව බැංකු කටයුතුවලට හෝ මූල්‍යමය කටයුතු වලට සම්බන්ධ වෙනත් යම් ලිඛිත නීතියක් කඩ කොට ඇති බවට හෝ ඉටුකිරීම පැහැරහැර ඇති බවට,

බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා සෑහීමට පත්වන අවස්ථාවක, තත් නියමයෙහි නිශ්චිතව දක්වනු ලැබිය හැකි කාලයක් ඇතුළත,—

(i) එවැනි යම් ක්‍රියාවලියක හෝ කඩකිරීමක හෝ පැහැර හැරීමක යෙදීම නතර කරන ලෙස හෝ යෙදීමෙන් වළකින ලෙස ;

(ii) මේ පනතේ විධිවිධානවලට හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට නැතහොත් මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයකට, විධානයකට, නියමයකට හෝ වෙනත් නියම කිරීමකට අනුකූලව ක්‍රියාකරන ලෙස ;

(iii) එවැනි ක්‍රියාවලියක හෝ කඩකිරීමක හෝ පැහැර හැරීමක ප්‍රතිඵලයක් වශයෙන් ඇතිවන තත්ත්වයන් නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා ලෙස,

විධාන කරමින් (2) වන උපවගන්තියට යටත්ව, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් නියමයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද නියමය—

(අ) එකී බලපත්‍රලාභී වාණිජ බැංකුව නිරතව සිටින අනාරක්ෂිත සහ අස්ථිර ක්‍රියාවලිය හෝ කඩ කරනු ලැබූ හෝ පැහැර හරිනු ලැබූ, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන, මේ පනත යටතේ සාදන ලද හෝ දෙන ලද නියෝගය, විධානය, නියමය හෝ නියම කිරීම නිශ්චිතව දැක්විය යුතු ය ;

(ආ) බලපත්‍රලාභී වාණිජ බැංකුව වෙත පෞද්ගලිකව ම භාර දිය යුතු ය, නැතහොත් ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය ;

(ඇ) (3) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලැබූ අභියාචනයක කුමක් සඳහන් වුව ද, මුදල් මණ්ඩලය විසින් අන්‍යාකාරයකින් විධාන කරන්නේ නම් මිස, ඒ නියමය බලපත්‍රලාභී වාණිජ බැංකුව වෙත භාර දීමේ දින සිට බලාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද නියමයකින් අතෘප්තියට පත් යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් ඒ නියමය භාර දුන් දිනයෙන් දින තිහක් ඉකුත්වීමට පෙර මුදල් මණ්ඩලය වෙත අභියාචනයක් කරනු ලැබිය හැකි අතර, ඒ අභියාචනය ලැබුණු දිනයෙන් දින තිහක් ඇතුළත මුදල් මණ්ඩලය විසින් ඒ නියමය ස්ථිර කිරීම, වෙනස් කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය යුතු ය.

(4) 9 වන වගන්තියේ විධිවිධානවලට අගතියක් නොමැතිව සහ (3) වන උපවගන්තිය යටතේ මුදල් මණ්ඩලය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීම නොතකා, (1) වන උපවගන්තිය යටතේ වූ නියමයක සඳහන් කාලසීමාව ඇතුළත ඒ නියමයට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින යම් වාණිජ බැංකුවක්, මේ පනත යටතේ වරදකට වරදකරුවකු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබීමේ දී, රුපියල් දස ලක්ෂයක දඩයකට සහ වරදකරු කරනු ලැබීමෙන් පසු ඒ නියමයට අනුකූලව ක්‍රියා නොකරන එක් එක් දිනය වෙනුවෙන් දිනකට රුපියල් ලක්ෂය බැගින් වැඩිදුර දඩයකට ද ඔහු යටත් විය යුතු ය. එසේ වුව ද (3) වන උපවගන්තිය යටතේ අභියාචනයක් ඉදිරිපත් කොට ඇති අවස්ථාවක, මුදල් මණ්ඩලයේ තීරණය බලපත්‍රලාභී වාණිජ බැංකුව වෙත දැනුම් දෙන තුරු එම කරුණ සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට නඩු නොපවරනු ලැබිය යුතු ය.".

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) බැංකු ක්‍රමය ස්ථිර තත්ත්වයෙන් පවත්වා ගැනීම සහතිකවීම සඳහා මුදල් මණ්ඩලය විසින් බලපත්‍රලාභී වාණිජ බැංකුවලට හෝ ඒ සඳහා ලිඛිතව හේතු දක්වමින් බලපත්‍රලාභී වාණිජ බැංකු එකකට හෝ වැඩි සංඛ්‍යාවකට ඒ බැංකුවේ හෝ බැංකුවල ව්‍යාපාර කටයුතුවල යම් අංශයක් පවත්වාගෙන යා යුතු ආකාරය සම්බන්ධයෙන් විධාන දෙනු ලැබිය හැකි අතර, ඉහතින් වූ කරුණුවලට අගතියක් නොමැතිව පහත දැක්වෙන කරුණු නිශ්චිතව දක්වමින් ඒ සම්බන්ධයෙන් ද එය අවශ්‍ය යයි සලකනු ලබන විධාන දෙනු ලැබිය හැකි ය.—

(අ) එකී බැංකුව විසින් සලසනු ලැබිය හැකි හෝ නොලැබිය හැකි අත්තිකාරම් පංතිය හෝ පංති ;

(ආ) සුරක්ෂිත අත්තිකාරම් සම්බන්ධයෙන් පවත්වාගෙන යා යුතු සීමාවන් ;

(ඇ) බලපත්‍රලාභී වාණිජ බැංකුවක කොටස් සහ ස්කන්ධ ප්‍රාග්ධනය, සංචිත සහ තැන්පතු ගැන ද වෙනත් අදාළ කරුණු ද සැලකිල්ලට ගැනීමේ දී එකී බැංකුව විසින් —

(i) යම් එක් සමාගමකට, රාජ්‍ය සංස්ථාවකට, වෙළෙඳ ආයතනයකට, පුද්ගලයන්ගේ සංගමයකට හෝ පුද්ගලයකුට ;

(ii) එකතුවක් වශයෙන්—

(අ) පුද්ගලයකුට ඔහුගේ සමීප ඥාතියකුට හෝ ඔහු සැලෙන සම්බන්ධතාවක් දරන සමාගමකට හෝ වෙළෙඳ ආයතනයකට ; හෝ

(ආ) සමාගමක් සහ පහත සඳහන් එකක් හෝ ඊට වැඩි ගණනකට—

(අඅ) එහි පාලිත සමාගමකට ;

(ආආ) එහි පාලක සමාගමකට ;

(ඇඇ) එහි ආශ්‍රිත සමාගමකට ;

(ඇඇ) එහි පාලක සමාගමේ පාලිත සමාගමකට ; හෝ

(ඉඉ) ඒ සමාගම හෝ එහි පාලිත හෝ පාලක සමාගමක් හෝ එහි පාලක සමාගමේ පාලිත සමාගමක් සැලෙන සම්බන්ධතාවක් දරන සමාගමකට,

සැලසිය හැකි අනුග්‍රහවල උපරිමය ;

(ඈ) ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක කොටස් ප්‍රාග්ධනයෙන්—

(i) සමාගමක්, සංස්ථාගත කරන ලද මණ්ඩලයක් හෝ පුද්ගලයකු විසින් ;

(ii) (අ) සමාගමක් සහ පහත සඳහන් එකක් හෝ ඊට වැඩි ගණනක් විසින්, එනම්—

(අඅ) එහි පාලිත සමාගමක් ;

(ආආ) එහි පාලක සමාගමක් ;

(ඇඇ) එහි පාලක සමාගමේ පාලිත සමාගමක් ;

(ඇඇ) ඒ සමාගම, එහි පාලිත සමාගම, එහි පාලක සමාගම හෝ ඒ පාලක සමාගමේ පාලිත සමාගමක් සැලෙන සම්බන්ධතාවක් දරන්නේ යම් සමාගමක ද එවැනි සමාගමක් ; හෝ

(ආ) පුද්ගලයකු සහ පහත සඳහන් එකක් හෝ ඊට වැඩි ගණනක් විසින් ;

එනම්—

(අඅ) ඔහුගේ සමීප ඥාතියකු ;

(ආආ) ඔහු හෝ ඔහුගේ සමීප ඥාතියා සැලෙන සම්බන්ධතාවක් දරන සමාගමක් ;

(ඇඇ) ඒ සමාගමේ පාලිත සමාගමක් ;

(ඈඈ) ඒ සමාගමේ පාලක සමාගමක් ;

(ඉඉ) ඒ සමාගමේ පාලක සමාගමේ පාලිත සමාගමක් ;

(ඊඊ) ඒ සමාගම හෝ එහි පාලිත සමාගම හෝ එහි පාලක සමාගම හෝ එහි පාලක සමාගමේ පාලිත සමාගමක සැලෙන සම්බන්ධතාවක් දරනු ලබන යම් සමාගමක් ; හෝ

(උඋ) ඒ පුද්ගලයා හෝ ඔහුගේ සමීප ඥාතියා සැලෙන සම්බන්ධතාවක් දරන්නා වූ ද සමාගමක් නොවන්නා වූ ද සංස්ථාගත කරන ලද මණ්ඩලයක් ; හෝ

(ඇ) අවස්ථාවෝචිත පරිදි පුද්ගලයකු හෝ සමාගමක් කෙළින්ම හෝ අන්‍යාකාරයකින් සැලෙන සම්බන්ධතාවක් දරනු ලබන්නේ යම් සමාගම්වල ද ඒ එක් එක් සමාගමක් විසින්,

එකතුව දරනු ලැබිය හැකි කොටස් ප්‍රාග්ධනයේ උපරිම ප්‍රතිශතය.

මේ පනතේ කාර්ය සඳහා යම් සමාගමක කොටස් වලින් සියයට විස්සකට අඩු නොවන්නා වූ ද සියයට පනහකට වැඩි නොවන්නා වූ ද කොටස් ප්‍රමාණයක් වෙනත් සමාගමක් විසින් දරනු ලබන අවස්ථාවක දී ඒ සමාගම එකී වෙනත් සමාගමේ "ආශ්‍රිත සමාගමක්" ලෙස සලකනු ලැබිය යුතු ය.".

(2) එහි (4) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (2), (3). (4) සහ (5) වන උපවගන්ති ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්ති ආදේශ කිරීමෙන් :—

"(2) කිසිදු බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් ස්වකීය කොටස් මිල දී ගැනීම සඳහා අනුග්‍රහ ප්‍රදානය නොකළ යුතු අතර —

(අ) එහිම කොටස් ; හෝ

(ආ) එහි සැලෙන සම්බන්ධතාවක් දරන සමාගම්වල කොටස් ; හෝ

(ඇ) (ආ) ඡේදයේ සඳහන් කරන ලද සමාගම් විසින් සැලෙන සම්බන්ධතාවක් දරනු ලබන සමාගම්වල කොටස් හෝ,

ඇපයට තබාගෙන අනුග්‍රහ ප්‍රදානය කිරීම ද නොකළ යුතු ය :

එසේ වුවද බලපත්‍රලාභී වාණිජ බැංකුවක සේවා නියුක්තයන් විසින් දරනු ලැබීම පිණිස හෝ ඔවුන්ගේ ප්‍රතිලාභය සඳහා භාරකරුවන් විසින් මිල දී ගැනීමක් වශයෙන් හෝ දායක මුදල් ගෙවීමක් වශයෙන්, එම බලපත්‍රලාභී වාණිජ බැංකුවේ සම්පූර්ණ වශයෙන් ගෙවන ලද කොටස් මිල දී ගැනීම සඳහා හෝ එකී කොටස් සඳහා දායක මුදල් ගෙවීම් වශයෙන් හෝ බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් තත් කාලයේ බලපවත්නා යම් යෝජනා ක්‍රමයකට අනුකූලව මුදල් සැපයීම තහනම් කිරීමක් මේ වගන්තියේ සඳහන් කිසිවක් මගින් සිදු කෙරෙන්නේ යයි තේරුම් නොගත යුතු ය :

එසේම තවදුරටත්, එසේ සපයන ලද මුදල් ප්‍රමාණවල සහ අයවිය යුතුව පවතින එවැනි අනුග්‍රහවල මුල් මුදල් ප්‍රමාණයේ එකතුව, යම් එක වරක දී, බැංකුවේ දායක වූ සහ ගෙවා නිමි මුළු නාමමාත්‍ර කොටස් ප්‍රාග්ධන මුදලෙන් සියයට දහයකට සමාන මුදල හෝ බැංකුවේ අපචය නොවූ ප්‍රාග්ධන අරමුදලින් සියයට දහයකට සමාන මුදල යන මෙයින් වඩා වැඩි මුදල් ප්‍රමාණය ඉක්මවා නොයා යුතු ය.

(3) බලපත්‍රලාභී වාණිජ බැංකුවක අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වන්නා වූ අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවක් විසින් (අදාළ අධ්‍යක්ෂවරයා හැර) අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමක දී එම අනුග්‍රහවලට කැමති බවට ඡන්දය දීමෙන් අනුමත කරනු ලැබුවේ නම් මිස සහ, ක්‍රෙඩිට් කාඩ් පතක් නිකුත් කිරීමෙන් අනුග්‍රහ සලසනු නො ලබන විටක මුදල් මණ්ඩලය විසින් කලින් කල අනුමත කරනු ලැබිය හැකි පරිදි ඇපයකින් එම අනුග්‍රහය සුරක්ෂිත කරනු ලැබුවේ නම් ද මිස, බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් අධ්‍යක්ෂවරයකුට හෝ එම අධ්‍යක්ෂවරයාගේ සමීප ඥාතිවරයකුට කවර හෝ අනුග්‍රහයක් ප්‍රදානය නොකළ යුතු ය.

(4) බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් අධ්‍යක්ෂවරයකුට හෝ ඒ අධ්‍යක්ෂවරයාගේ සමීප ඥාතිවරයකුට සලසනු ලබන අනුග්‍රහය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් මුදල් මණ්ඩලය විසින් කලින් කල අනුමත කරනු ලැබිය හැකි සීමාව නොඉක්මවිය යුතු ය.

(5) මුදල් මණ්ඩලය විසින් කලින් කල අනුමත කරනු ලැබිය හැකි පරිදි ඇප මගින් සුරක්ෂිත කරනු ලබන්නේ නම් මිස සහ ඒ අනුග්‍රහය බලපත්‍රලාභී වාණිජ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වන්නා වූ අධ්‍යක්ෂවරු සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවක් විසින් (අදාළ අධ්‍යක්ෂවරයා හැර) අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමක දී ඒ අනුග්‍රහයට කැමැත්ත ප්‍රකාශ කරමින් ඡන්දය දීමෙන් ඒ අනුග්‍රහය අනුමත කරනු ලබන්නේ නම් ද මිස, අධ්‍යක්ෂවරයකු ලෙස පත් කරනු ලැබූ දිනයට පෙර හෝ පසුව අත්කර ගනු ලැබූ සැහෙන සම්බන්ධතාවක් ඒ අධ්‍යක්ෂවරයා විසින් දරනු ලබන යම් ව්‍යාපාරයකට ඒ වාණිජ බැංකුව විසින් කවර හෝ අනුග්‍රහයක් සලසනු නොලැබිය යුතු ය.";

(2) ඒ වගන්තියේ (11) සහ (11අ) උපවගන්ති ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්ති ආදේශ කිරීමෙන් : —

"(11) (3) උපවගන්තිය හෝ (5) වන උපවගන්තිය යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් ප්‍රදානය කරන ලද යම් අනුග්‍රහයක් හෝ එවැනි අනුග්‍රහයක යම් කොටසක් හෝ ඒ මත අයවිය යුතු යම් පොලියක්, මුදල් මණ්ඩලයේ පූර්ණ අනුමතිය නොමැතිව ප්‍රේෂණය නොකළ යුතු අතර එවැනි අනුමතිය නොමැතිව කරන ලද යම් ප්‍රේෂණය කිරීමක් ශූන්‍ය සහ බලරහිත විය යුතු ය.

(11අ) යම් මුදල් වර්ෂයක් තුළ දී (3) වන උපවගන්තිය හෝ (5) වන උපවගන්තිය යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් යම් අනුග්‍රහයක් ප්‍රදානය කරනු ලබන අවස්ථාවක දී ඒ අනුග්‍රහය ඒ මුදල් වර්ෂය සඳහා වන ගිණුම්වල සහ ඒ අනුග්‍රහය සම්පූර්ණයෙන් ම ගෙවා නිම කරන තුරු ඊට පසුව එළඹෙන සෑම මුදල් වර්ෂයක් සඳහා ම වන ගිණුම්වල ද හෙළි කරනු ලැබිය යුතු ය.".

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය ඒ වගන්තියෙහි "මුදල් මණ්ඩලය" යන වචන වෙනුවට "බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තිය එහි (1) වන උපවගන්තිය ලෙස නැවත අංක කිරීමෙන් ;

(2) නැවත අංක කරනු ලැබූ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(2) බලපත්‍රලාභී වාණිජ බැංකුවක් අනිවාර්යයෙන් ගණන් බේරා වසා දැමීමක දී ඈවරකරුවකුගේ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමට අදාළව තමන්ට සහාය වීමේ කාර්ය සඳහා වෘත්තීය සුදුසුකම් ඇති පුද්ගලයකුගේ සහාය ලබා ගැනීම බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් කළහැකි වන්නේ ය".

23. ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(1) මෙහි පහත දක්වනු ලැබ ඇති ඉල්ලීම්, එසේ දක්වනු ලැබ ඇති අනුපිළිවෙලට, බලපත්‍රලාභී වාණිජ බැංකුවේ පොදු වත්කම්වලට එරෙහිව ප්‍රමුඛතාව ලබන්නේ ය :—

(අ) ගණන් බේරා වසා දැමීමේ දී ඈවරකරුට උපචිත වූ අත්‍යවශ්‍ය සහ සාධාරණ වියදම් ;

(ආ) ගණන් බේරා වසා දැමීමේ කටයුතු ආරම්භ කිරීමට පෙරාතුව ම වූ මාස තුනක කාලය සඳහා බැංකුවේ නිලධරයන්ගේ සහ සේවානියුක්තිකයන්ගේ වේතන සහ වැටුප් ;

(ඇ) ආණ්ඩුවට සහ පළාත් පාලන ආයතනවලට බලපත්‍රලාභී වාණිජ බැංකුවෙන් අයවිය යුතු බදු, අයබදු සහ තැන්පතු ;

(ඈ) මහබැංකුවට ගෙවිය යුතු ගාස්තු සහ තක්සේරු මුදල් ;

(ඉ) කවර හෝ ගිණුමක් සම්බන්ධයෙන් රුපියල් විසිදහසක උපරිම සීමාවකට යටත්ව, බලපත්‍රලාභී වාණිජ බැංකුවක යම් ගිණුමක තැන්පත් කරන ලද අරමුදල් මත උපචිත වූ පොලිය ද සමග එකී අරමුදල් ;

(ඊ) ඒ මත උපචිත වූ යම් පොලියක් ඇත්නම් එකී පොලිය ද සමග වෙනත් තැන්පතු.".

24. ප්‍රධාන ප්‍රඥප්තියේ 76අ වගන්තිය, එහි (5) වන උපවගන්තියෙහි "කොටස් හා ස්කන්ධ ප්‍රාග්ධනය" යන යෙදුමේ අර්ථකථනයෙහි, "ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය." යන වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"ඊට දී ඇති අර්ථයම තිබිය යුතු අතර, වාණිජ බැංකුවකට කර ඇති සඳහනක්, බලපත්‍රලාභී විශේෂිත බැංකුවකට කරන ලද සඳහනක් ලෙස සලකනු ලැබිය යුතු ය.".

25. ප්‍රධාන ප්‍රඥප්තියේ 76ආ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීම.

76ආ. 3 වන වගන්තියේ විධිවිධාන 1 වන කොටස යටතේ වූ බලපත්‍රයක් සඳහා කරන ලද ඉල්ලීමක් සම්බන්ධයෙන් අදාළ කර ගත් පරිදිම අවශ්‍ය වෙනස් කිරීම් සහිතව මේ කොටස යටතේ බලපත්‍රයක් සඳහා කරනු ලැබූ ඉල්ලීමක් සම්බන්ධයෙන් ද අදාළ කර ගත යුතු අතර, ඒ කාර්යය සඳහා ඒ වගන්තියේ "බැංකු ව්‍යාපාර කටයුතු" වලට කරන ලද යම් සඳහනක් මුදල් තැන්පතු භාරගැනීමේ සහ ඒ මුදල් ආයෝජනය කිරීම සහ ණයට දීමේ ව්‍යාපාර සම්බන්ධයෙන් කරන ලද සඳහනක් ලෙස සලකනු ලැබිය යුතු අතර, 5 වන වගන්තියට කරන ලද යම් සඳහනක් 76ඇ. වගන්තියට කරන ලද සඳහනක් ලෙස සලකනු ලැබිය යුතු ය.".

26. ප්‍රධාන ප්‍රඥප්තියේ 76ඇ වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"බලපත්‍ර නිකුත් කිරීම.

76ඇ. 5 වන වගන්තියේ විධිවිධාන, 1 වන කොටස යටතේ වූ බලපත්‍රයක් නිකුත් කිරීමක් සම්බන්ධයෙන් අදාළ කර ගත් පරිදි ම අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ කොටස යටතේ බලපත්‍රයක් නිකුත් කිරීම සම්බන්ධයෙන් ද අදාළ කර ගත යුතු අතර, ඒ කාර්යය සඳහා ඒ වගන්තියේ "බැංකු ව්‍යාපාර කටයුතු" වලට කරන ලද යම් සඳහනක්, මුදල් තැන්පතු භාරගැනීමේ සහ ඒ මුදල් ආයෝජනය කිරීම සහ ණයට දීමේ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් කරන ලද සඳහනක් ලෙස සලකනු ලැබිය යුතු ය.".

27. ප්‍රධාන ප්‍රඥප්තියේ 76ඈ වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් කරගෙන යනු ලැබිය හැකි ව්‍යාපාර විධි සහ වාර්ෂික බලපත්‍ර ගාස්තු ගෙවීම.

76ඈ. (1) මේ කොටස යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති යම් සමාගමක් "බලපත්‍රලාභී විශේෂිත බැංකුවක්" වශයෙන් සඳහන් කරනු ලැබිය යුතු ය.

(2) බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින්, බලපත්‍රයේ ප්‍රකාශිතව ම නියම කරනු ලැබ ඇති හෝ යම් ලිඛිත නීතියකින් නැතහොත් ඒ යටතේ පනවනු ලැබිය හැකි සීමා කිරීම්වලට යටත්ව මේ පනතේ IV වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති විධිවල ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලැබිය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින්, 82 වන වගන්තිය යටතේ සාදන ලද නියෝග වලින් නියම කරන ලද නියමයන් සපුරාලන බලපත්‍රලාභී විශේෂිත බැංකුවකට මුදල් මණ්ඩලය විසින් බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් සඳහා සම්පාදනය කරන ලද අක් වෙරළ බැංකු ගනුදෙනු ක්‍රමයකට අනුකූලව අක් වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා මුදල් මණ්ඩලය විසින් බලය දෙනු ලැබිය හැකි අතර, බලපත්‍රලාභී විශේෂිත බැංකුවකට අක් වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු කර ගෙන යාම සඳහා බලය දී ඇති අවස්ථාවක, IV වන කොටසේ විධිවිධාන, ඒවා බලපත්‍රලාභී වාණිජ බැංකුවට අදාළ කර ගත් පරිදි ම අවශ්‍ය වෙනස් කිරීම් සහිතව බලපත්‍රලාභී විශේෂිත බැංකුවට ද අදාළ කර ගනු ලැබිය යුතු ය.

(4) බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින්, මුදල් මණ්ඩලයේ පූර්ව ලිඛිත අනුමතය ඇතිව මිස, බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති ස්ථානයක් නොවන, වෙනත් කිසිම ස්ථානයක දී එහි ව්‍යාපාර කටයුතු කරගෙන යාම නොකළ යුතු ය.

(5) මේ කොටස යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරී බලය යටතේ ව්‍යාපාර කටයුතු කර ගෙන යන බලපත්‍රලාභී විශේෂිත බැංකුවක්, 1988 අංක 78 දරන මූල්‍ය සමාගම් පනතේ 2 වන වගන්තිය උල්ලංඝනය වන පරිදි ක්‍රියා නොකරන සේ සලකනු ලැබිය යුතු ය.

(6) සෑම බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් ම, මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් මහ බැංකුවට ගෙවනු ලැබිය යුතු අතර, මුදල් මණ්ඩලය විසින් විවිධ වර්ගවල බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා විවිධ බලපත්‍ර ගාස්තු තීරණය කරනු ලැබිය හැකි ය.".

28. ප්‍රධාන ප්‍රඥප්තියේ 76ඊ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :–

"බලපත්‍රලාභී විශේෂිත බැංකුවක බලපත්‍රයක් අවලංගු කිරීම.

76ඊ (1) 9 වන වගන්තියේ විධිවිධාන බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සම්බන්ධයෙන් අදාළ කර ගත් පරිදි ම, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් සම්බන්ධයෙන් ද අදාළ කර ගනු ලැබිය යුතු අතර, එකී කාර්යය සඳහා, ඒ වගන්තියේ බලපත්‍රලාභී වාණිජ බැංකුවකට කර ඇති යම් සඳහනක් බලපත්‍රලාභී විශේෂිත බැංකුවකට ද කරන ලද සඳහනක් ලෙස සලකනු ලැබිය යුතු ය ; එහි 5 වන වගන්තියට අදාළව කර ඇති යම් සඳහන් කිරීමක් 76ඇ. වගන්තියට කරන ලද සඳහන් කිරීමක් වශයෙන් සලකනු ලැබිය යුතු ය ; තව ද එහි බැංකු ව්‍යාපාර කටයුතුවලට කරන ලද යම් සඳහන් කිරීමක් මුදල් තැන්පතු භාරගැනීමේ සහ ඒ මුදල් ආයෝජනය කිරීම සහ ණයට දීමේ ව්‍යාපාරයකට කරන ලද සඳහනක් ලෙස සලකනු ලැබිය යුතු ය." ;

(2) (1) වන උපවගන්තියේ අඩංගු කිසිවකින් 76(ක) වගන්තියෙන් මුදල් මණ්ඩලය වෙත හෝ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා වෙත පවරා දෙන ලද බලතලවලට කිසිම ආකාරයක බලපෑමක් නොවිය යුතු ය.".

**29.** ප්‍රධාන ප්‍රඥප්තියේ 76ඌ වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :–

"V වන සහ VI වන කොටස් බලපත්‍රලාභී විශේෂිත බැංකුවකට අදාළ විය යුතු බව.

76ඌ. මේ පනතේ V වන සහ VI වන කොටස්වල විධිවිධාන බලපත්‍රලාභී වාණිජ බැංකුවකට අදාළ වන පරිදිම අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් සම්බන්ධයෙන් ද අදාළ විය යුතු ය.

**30.** ප්‍රධාන ප්‍රඥප්තියේ 76ජ වගන්තිය එහි (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

(1) එහි (ට) (ii) (ආ) (උ) යන උපවාක්‍යාංශයට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවාක්‍යාංශය ඇතුළත් කිරීමෙන් :–

"(ඌ) අවස්ථාවෝචිත පරිදි පුද්ගලයකු හෝ සමාගමක් කෙලින්ම හෝ අනායාකාරයෙන් යම් එක් එක් සමාගම්වල සැලෙන සම්බන්ධතාවක් හෝ වැදගත් කළමනාකරණ සම්බන්ධතාවක් දරන්නේ ද එවැනි සමාගම් ;";

(2) එහි (ත) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :–

"(ද) ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරනු ලැබූ හෝ පිහිටුවනු ලැබූ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක ප්‍රාග්ධනයට විදේශීය සහභාගීත්වයේ සීමාව.".

**31.** ප්‍රධාන ප්‍රඥප්තියේ 76ඔ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :–

"බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් අනාරක්ෂිත ක්‍රියාවලියක් අනුගමනය කරන අවස්ථාවක බලපැවැත්වෙන ක්‍රියා පරිපාටිය.

76ඔ. 45 වන වගන්තියේ විධිවිධාන බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සම්බන්ධයෙන් ඒවා අදාළ කර ගත් පරිදි ම අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් සම්බන්ධයෙන් ද අදාළ කර ගනු ලැබිය යුතු අතර, ඒ කාර්යය සඳහා ඒ වගන්තියේ බලපත්‍රලාභී වාණිජ බැංකුවකට කරන ලද යම් සඳහනක් බලපත්‍රලාභී විශේෂිත බැංකුවකට කරන ලද සඳහනක් වශයෙන් බලපවත්වනු ලැබිය යුතු ය.".

**32.** ප්‍රධාන ප්‍රඥප්තියේ 76ක වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

(1) එම වගන්තියේ (3) වන උපවගන්තියෙහි :–

(අ) "දින හැටක්" යන වචන වෙනුවට "මාස හයක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) එහි (ආ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :–

"(ආ) ඒ බලපත්‍රලාභී විශේෂිත බැංකුවට නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු කිරීම සහ, –

(i) එම බැංකුව යම් ලිඛිත නීතියකින් හෝ ඒ යටතේ ශ්‍රී ලංකාව තුළ දී සංස්ථාගත කරනු ලැබ හෝ පිහිටුවනු ලැබ ඇති අවස්ථාවක, බැංකුව අනිවාර්යයෙන් ගණන් බේරා වසා දැමීම ආරම්භ කළ යුතු අතර, ඒ ගණන් බේරා වසා දැමීම සම්බන්ධයෙන් VIII වන කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ කරගනු ලැබිය යුතු ය ;

(ii) බැංකුවක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සංස්ථාගත කරනු ලැබූ අවස්ථාවක, 76අ වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් යටතේ බලයලත් ව්‍යාපාර කටයුතු අනිවාර්යයෙන් වසා දමනු ලැබිය යුතු අතර, එහි කටයුතු ගණන් බේරා වසා දැමිය යුතු අතරම, ඒ අනිවාර්ය වසා දැමීම සඳහා VIII වන කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ කරගනු ලැබිය යුතු ය.".

(2) එහි (4) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් :–

"(4) ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරනු ලැබූ හෝ පිහිටුවනු ලැබූ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දමනු ලැබිය හැකි අතර, එවැනි ගණන් බේරා වසා දැමීමේ කාර්යය සම්බන්ධයෙන් VIII වන කොටසේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ කරගනු ලැබිය යුතු ය ;

(5) ශ්‍රී ලංකාවෙන් බැහැර සංස්ථාගත කරනු ලැබූ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් 76අ වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් යටතේ බලය දී ඇති, එහි ව්‍යාපාරික කටයුතු, ස්වේච්ඡාවෙන් වසා දමනු ලැබිය හැකි අතර, ඒ වසා දැමීම සම්බන්ධයෙන් VIII වන කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ කර ගනු ලැබිය යුතු ය.".

**33**. ප්‍රධාන ප්‍රඥප්තියේ 76ග වගන්තිය, එහි (1) වන උපවගන්තියේ, "76ක වගන්තියේ" යන වචනවල සිට "මණ්ඩලය විසින්" යන්න දක්වා ඇති සියලු වචන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

"බලපත්‍රලාභී විශේෂිත බැංකුවක ව්‍යාපාර කටයුතු 76(ක) වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අත්හිටවනු ලැබ ඇති අවස්ථාවක;"

**34**. ප්‍රධාන ප්‍රඥප්තියේ 77 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :–

"රහස්‍යභාවය ප්‍රකාශ කිරීම.

77 (1) යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක ව්‍යාපාර කටයුතුවල සේවයේ නියුක්තව සිටින්නා වූ සෑම අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු, නිලධරයකු හෝ වෙනත් යම් තැනැත්තකු, එම බැංකුවේ සියලු ගනුදෙනු සම්බන්ධයෙන් ද, ගනුදෙනුකරුවන් සම්බන්ධයෙන් ද යම් තැනැත්තකුගේ ගිණුම්වල තත්ත්වය සම්බන්ධයෙන් ද හා ඒ හා සම්බන්ධිත සියලු කාරණ සම්බන්ධයෙන් ද ඒකාන්ත රහස්‍යභාවය රැකිය යුතු අතර, එවැනි යම් කාරණ ––

(අ) (i) අධිකරණයකින් ; හෝ

(ii) තත් කාරණය අදාළ වන තැනැත්තා විසින් ඉල්ලා සිටින අවස්ථාවක ;

(ආ) අධ්‍යක්ෂවරයාගේ, කළමනාකාරවරයාගේ, නිලධරයාගේ හෝ වෙනත් තැනැත්තාගේ කාර්ය ඉටු කිරීම පිණිස ; හෝ

(ඇ) මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක යම් විධිවිධාන ඉටු කිරීමක දී,

හැර අනාවරණය නොකළ යුතු ය.

(2) යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක ව්‍යාපාර කටයුතුවල සේවයේ නියුක්තව සිටින්නා වූ සෑම අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු, නිලධරයකු හෝ වෙනත් යම් තැනැත්තකු, සිය කාර්යයන්හි නියැලීම ආරම්භ කිරීමට මත්තෙන්, (1) වන උපවගන්තියට අනුකූලව ඒකාන්ත රහස්‍යභාවය රැකීමට තමා පොරොන්දුවන බවට ප්‍රකාශයක් අත්සන් කළ යුතු ය.

(3) යම් බැංකුවක්, වෙනත් බැංකුවක් විසින් ඉල්ලා සිටි විට, තම ගනුදෙනුකරුවකුට අදාළ මතයක් හෝ විමර්ශනයක් සම්ප්‍රදායික බැංකු භාවිතයන්ට අනුකූලව එකී වෙනත් බැංකුවට සද්භාවයෙන් සැපයීම (1) වන සහ (2) වන උපවගන්තියේ විධිවිධාන මගින් තහනම් නොකරනු ලැබිය යුතු ය. ".

**35**. ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තියේ "මුදල් මණ්ඩලයේ යම් සාමාජිකයකුට" යන වචන වෙනුවට "මුදල් මණ්ඩලයට හෝ මුදල් මණ්ඩලයේ යම් සාමාජිකයකුට" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**36**. ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :–

"වැරදි.

79. (1) මේ පනතේ 2 වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ, 3 වන වගන්තියේ (11) වන උපවගන්තිය යටතේ, 14 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ, 33 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ, 41 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ හෝ 47 වන වගන්තියේ (12) වන උපවගන්තිය යටතේ කිසියම් වරදක් සිදු කරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් මිලියනයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු තුනකට වැඩි නොවන කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(2) මේ පනතේ 16 වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්තිවල, 17 වන වගන්තියේ (1) වන උපවගන්තියේ හෝ 77 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී, රුපියල් මිලියනයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු තුනකට වැඩි නොවන කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(3) ඉහත (1) වන උපවගන්තියේ හෝ (2) වන උපවගන්තියේ සඳහන් කරන ලද වරදක් හැර, වෙන අන් වරදක් මේ පනත යටතේ සිදුකරන යම් තැනැත්තකු මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු

විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී, මේ පනතෙහි අන්‍යාකාර දඬුවමක් සඳහා විධිවිධාන සලස්වා ඇත්තේ නම් මිස රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩයකට හෝ මාස දහඅටකට වැඩි නොවන කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(4) (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති විධිවිධාන හෝ වරදක් සංස්ථාපනය වන අන්‍යාකාර විධිවිධාන හෝ හැර මේ පනතේ යම් විධි විධානයක් හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියමයක්, විධානයක්, රීතියක් හෝ නියෝගයක් කඩ කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩයකට හෝ මාස දහඅටකට වැඩි නොවන කාල සීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(5) 77 වන වගන්තියේ විධිවිධාන කඩකිරීම සම්බන්ධයෙන් (2) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකුට විරුද්ධව වූ යම් නඩු කටයුත්තක දී, ඒ තැනැත්තා විසින් ඔහුගේ කාර්ය සාධනයෙහි ලා හෝ යම් නෛතික නියමයක් යටතේ හෝ ක්‍රියා කරන බවට විශ්වාස කරමින් සද්භාවයෙන් ඔහු ක්‍රියා කළ බව ඔප්පු කිරීම ඒ තැනැත්තා වෙනුවෙන් විත්තිවාචකයක් විය යුත්තේ ය.

(6) මේ පනත යටතේ වරදක් සම්බන්ධයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුවක හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක අධ්‍යක්ෂවරයකුට, කළමනාකරුවකුට, නිලධරයකුට හෝ සේවානියුක්තයකුට විරුද්ධව වූ යම් නඩු කටයුත්තක දී, ඒ අධ්‍යක්ෂවරයාගේ, කළමනාකරුගේ, නිලධරයාගේ හෝ සේවානියුක්තයාගේ දැනුමක් නොමැතිව ඒ වරද කරන ලද බව හෝ ඒ වරද කිරීම වැළැක්වීම සඳහා ඒ අධ්‍යක්ෂවරයා, කළමනාකාරවරයා, නිලධරයා හෝ සේවා නියුක්තයා විසින් නිසි සියලු උද්යෝගයෙන් ක්‍රියා කළ බව තහවුරු කිරීම ඒ අධ්‍යක්ෂවරයා, කළමනාකාරවරයා, නිලධරයා හෝ සේවානියුක්තයා වෙනුවෙන් විත්තිවාචකයක් විය යුතු ය.".

**37.** ප්‍රධාන ප්‍රඥප්තියේ 79අ වගන්තිය එහි (1) වන උපවගන්තියේ "රුපියල් දෙලක්ෂ පනස් දහසකට නොවැඩි" යන වචන වෙනුවට "රුපියල් මිලියන එකකට නොවැඩි" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**38.** ප්‍රධාන ප්‍රඥප්තියේ 83ආ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 83ඇ. වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :-

"සමහර යෝජනා ක්‍රම පැවැත්වීම තහනම් කිරීම.

83ඇ. (1) මුදලින් හෝ මූල්‍ය වටිනාකමකින් දායකවීමට හෝ මුදල් හෝ මූල්‍ය වටිනාකමක් ගෙවීමට සහභාගිකරුවකුට නියම කරනු ලබන සහ, සහභාගිකරුවකු විසින් උපයනු ලබන ප්‍රතිලාභ –

(අ) එම යෝජනා ක්‍රමයේ සහභාගිකරුවන්ගේ සංඛ්‍යාවෙහි වැඩිවීම මත ; හෝ

(ආ) එම යෝජනා ක්‍රමයේ සහභාගිකරුවන් විසින් ගෙවා ඇති දායක මුදල් වැඩිවීම මත,

ප්‍රධාන වශයෙන් තීරණය වන්නා වූ යෝජනා ක්‍රමයක් කිසිම තැනැත්තකු විසින් කෙලින්ම හෝ අන්‍යාකාරයකින් ආරම්භ කිරීම, අර්පණය කිරීම, ප්‍රවර්ධනය කිරීම, ප්‍රචාරය කිරීම, පැවැත්වීම, මුදල් සැපයීම, කළමනාකරණය කිරීම හෝ විධාන කිරීම නොකළ යුතු ය.

මේ උපවගන්තියේ කාර්යය සඳහා –

"මුදල්" යන්නෙන් ශ්‍රී ලංකාව විසින් හෝ විදේශීය ආණ්ඩුවක් විසින් නිකුත් කරනු ලබන, පිහිටුවනු ලබන, බලය දෙනු ලබන හෝ භාවිත කරනු ලබන මූල්‍ය ඒකකයක් හෝ හුවමාරු කිරීමේ මාධ්‍යයක් අදහස් වේ ;

"මූල්‍ය වටිනාකම" යන්නෙන් මුදල්වලින් බේරුම් කළ හැකි වන හෝ එසේ නොවන හුවමාරු කිරීමේ මාධ්‍යයක් අදහස් වන අතර ඊට, ගබඩාකර ඇති වටිනාකම, ගෙවීමේ සාධන පත්‍ර හෝ ගිණුමට බැර කිරීම යන විධි ද ඇතුළත් වන අතර, රන් කාසි සහ රන් පිණ්ඩයන් ද ඇතුළත් වේ.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩ කරන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී ඔහු අවුරුදු තුනකට නොවැඩි කාලයක් සඳහා දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් මිලියන එකක් නොඉක්මවන දඩයකට හෝ එම බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය. වරද සිදු කරන ලද්දේ සිතාමතාම හෝ දැන දැනම

නැතහොත් එම ක්‍රියාව මගින් වෙනත් යම් තැනැත්තකුට අලාභයක් හෝ හානියක් සිදුවන බව දැන දැනම වන අවස්ථාවක ඔහු අවුරුදු තුනකට නොඅඩු සහ අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා බරපතළ වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් මිලියන දෙකක් හෝ එම යෝජනා ක්‍රමයේ සහභාගී කරුවන්ගෙන් ලබාගත් බවට හෙළි වූන හෝ හෙළි කරන ලද එකතු මුදලේ දෙගුණයක වටිනාකමින් යුත් ශ්‍රී ලංකා මුදල් යන දෙකෙන් වඩා වැඩි මුදලට සමාන දඩයකට ද ඔහු යටත් විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කර ඇති බවට හෝ උල්ලංඝනය කිරීමට ඉඩ ඇති බවට තොරතුරු ලැබී ඇති අවස්ථාවක, මහ බැංකුවේ අධිපතිවරයා විසින් තත්කාර්ය සඳහා බලය දෙනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධරයකු විසින්, එම කරුණ සම්බන්ධයෙන් විමර්ශනයක් පැවැත්විය යුතු ය.මේ වගන්තිය යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමේදී බලයලත් නිලධරයා විසින් (1) වන උපවගන්තියේ විධිවිධාන යම් තැනැත්තකු විසින් කඩ කර තිබේ ද නැතහොත් කඩ කිරීමට ඉඩ තිබේ ද යන කරුණ දැන ගැනීමේ කාර්ය සඳහා –

(අ) (1) වන උපවගන්තියේ සඳහන් වරද සිදු කිරීමට අදාළ යම් ක්‍රියා සිදු වෙමින් පවතින බවට හෝ එම ක්‍රියාවන්ට අදාළ යම් පොත් පත් හෝ වෙනත් වාර්තා හෝ ලේඛන එම ස්ථානයේ තබා ඇති බවට හෝ පවත්වාගෙන යන බවට විශ්වාස කිරීමට හේතු ඇති අවස්ථාවක, එම නිලධරයා විසින් එම පරිශ්‍රයට ඇතුළු වී එය පරීක්ෂා කළ හැකි ය ;

(ආ) වැඩිදුර තොරතුරු හෝ ලේඛන කැඳවනු ලැබිය හැකි ය ;

(ඇ) විද්‍යුත් ආකාරයෙන් පවත්වාගෙන යන වාර්තා හෝ පරිගණක ආධාරයෙන් සකස් කරන ලද අනුපත් ඇතුළු යම් ලේඛන, පොත්පත් හෝ වාර්තා පරීක්ෂා කරනු ලැබිය හැකි ය ;

(ඈ) යම් ලේඛනයක, පොත්පත්වල හෝ වාර්තාවල හෝ පරිගණක ආධාරයෙන් සකස් කරන ලද අනුපත් හෝ එවායේ යම් කොටසක පිටපත් ලබා ගත හැකි ය.

(4) මේ වගන්තිය යටතේ තම බලතල ක්‍රියාත්මක කිරීමේ දී බලයලත් නිලධරයාට අවහිර කරන හෝ ප්‍රතිරෝධය පාන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(5) තමන් දන්නා යම් තොරතුරක් ඉදිරිපත් කිරීමට හෝ ඉහත කී ක්‍රියාවන්ට අදාළ වූ ද තම භාරයේ ඇත්තා වූ ද පොත්පත් හෝ වෙනත් වාර්තා හෝ ලේඛන හෝ පරිගණක ආධාරයෙන් සකස් කරන ලද අනුපත් හෝ ඉදිරිපත් කිරීමට අපොහොසත් වන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ යම් වරදක් සඳහා වූ නඩු පැවරීමක දී එම ක්‍රියාවට අදාළ වූ පොත්පත්වල හෝ වෙනත් වාර්තාවල හෝ ලේඛනවල හෝ පරිගණක ආධාරයෙන් ලබාගත් අනුපත්වල හෝ උධෘතයන් සාක්ෂි වශයෙන් ආවේශ්‍ය විය යුතු අතර, ඒවා එම ලේඛනවල සඳහන් කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

(7) (3) වන උපවගන්තිය යටතේ පවත්වනු ලබන විමර්ශනයක් අතරතුර දී ලබාගත් යම් තොරතුරු, ලේඛන, පොත්පත්, වාර්තා හෝ පරිගණක ආධාරයෙන් ලබාගත් අනුපත් ශ්‍රී ලංකා මහබැංකුව විසින් නීතිය ක්‍රියාත්මක කිරීමේ බලධරයන් වෙත ලබා දිය යුතු අතර (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝණය කිරීම සඳහා යම් තැනැත්තකුට එරෙහිව නඩු පැවරීමේ දී එම බලධරයන්ට සහාය ලබාදිය යුතු ය.

(8) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවනු ලැබූ කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ මහාධිකරණය වෙත පොලිස් පරීක්ෂකවරයකුගේ නිලයට වඩා ඉහළ නිලයක පොලිස් නිලධරයකු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් මත සහ (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝණය කිරීම සඳහා යම් තැනැත්තකුට එරෙහිව බැලූබැල්මට පෙනෙන නඩුවක් ඇති බවට එම අධිකරණය සෑහීමට පත් වීමෙන් පසු, (1) වන උපවගන්තියේ නිශ්චිතව දැක්වෙන යම් ක්‍රියාවක් සිදුකිරීම වරදකරුට තහනම් කරමින් ඔහුට එරෙහිව ඒකපාර්ශ්වික ආඥාවක් එම අධිකරණය විසින් නිකුත් කරනු ලැබිය යුතු ය.

(9) (8) උපවගන්තිය යටතේ ආඥාවක් කරනු ලැබුවේ යම් තැනැත්තකු වෙත ද එම තැනැත්තා විසින් හෝ එම ආඥාව අහිතකර ලෙස බලපාන වෙනත් යම් තැනැත්තකු විසින් තත් කාර්යය සඳහා කරනු ලබන ඉල්ලීමක් මත, මහාධිකරණය විසින් අවශ්‍ය යයි සලකනු ලබන සියලුම පාර්ශ්වයන්ගෙන් කරුණු විභාග කිරීමෙන් පසු, ඉල්ලුම්කරුගේ නීත්‍යානුකූල ව්‍යාපාර කටයුතුවලට හෝ නීත්‍යානුකූල අයිතිවාසිකම්වලට අනවශ්‍ය අලාභයක් සිදුවීම වැළැක්වීම සඳහා එම ආඥාව ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ තහනම් කරන ලද ක්‍රියාවකට අවසර දීම අවශ්‍ය බවට මහාධිකරණය සෑහීමට පත්වන්නේ නම්, එම අධිකරණය විසින් (8) වන උපවගන්තිය යටතේ කරන ලද ආඥාව ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ (8) උපවගන්තිය යටතේ තහනම් කරන ලද යම් ක්‍රියාවක් කොන්දේසි සහිතව හෝ කොන්දේසි රහිතව අවසර දීම හෝ කළ හැකි ය.".

**39.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

**40.** ප්‍රධාන ප්‍රඥප්තියේ 86 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) "අනුග්‍රහය" යන යෙදුමේ අර්ථ කථනය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :-

"අනුග්‍රහය" යන්නෙන්, සම්භාව්‍ය වගකීමක් පිළිගැනීම පිණිස වූ බැඳීමක් ඇතුළුව, මුදල් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි යම් ණයක්, අයිරාවක් හෝ අත්තිකාරමක් හෝ එවැනි වෙනත් පහසුකමක් හෝ සම්භාව්‍ය වගකීම් පිළිගැනීම පිණිස වූ බැඳීමක් ඇතුළුව, මුදල් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි යම් ණයක්, අයිරාවක් හෝ අත්තිකාරමක් හෝ එවැනි වෙනත් පහසුකමක් ප්‍රදානය කිරීමට වූ යම් බැඳීමක් අදහස් වේ.";

(ආ) එහි 'ප්‍රාග්ධන අරමුදල්' යන යෙදුමේ අර්ථ කථනයේ (ආ) ඡේදය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ආ) බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් සම්බන්ධයෙන් වූ විට, 76ඒ වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ වූ විධානයන්ට අනුව පවත්වාගෙන යනු ලබන කොටස් හා ස්කන්ධ ප්‍රාග්ධනය සහ සංචිත අරමුදල් අදහස් වන අතර, නිශ්චිත කාර්යයන් සඳහා වෙන්කර ඇති අරමුදල් හැර වෙනත් සංචිත ද ඊට ඇතුළත් වන්නේ ය ;";

(ඇ) "සමාගම" යන යෙදුමේ අර්ථ කථනය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :-

"සමාගම" යන්නෙන්, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ පිහිටුවන ලද සහ ලියාපදිංචි කරන ලද සමාගමක් සහ ශ්‍රී ලංකාව ඇතුළත හෝ ඉන් බැහැරව සංස්ථාගත කරන ලද වෙනත් යම් සමාගමක් අදහස් වේ. ";

(ඈ) "බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා" යන යෙදුමේ අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ කථනය ඇතුළත් කිරීමෙන්:-

"තැන්පතුව" යන්නට, ඉල්ලා සිටි විටෙක හෝ යම් මතු දිනයක දී නැතහොත් ගෙවීම කරන තැනැත්තා සහ ගෙවීම් භාරගන්නා තැනැත්තා විසින් හෝ ඒ තැනැත්තන් වෙනුවෙන් එකඟ වූ අවස්ථාවන් මත පොලියක් හෝ අධි මිලක් සහිතව හෝ රහිතව, එය ආපසු ගෙවනු ලබන්නේ කවර නියමයන් යටතේ ද ඒ නියමයන් මත, ව්‍යාපාරයක් ලෙස යම් තැනැත්තකුගෙන් භාරගනු ලබන මුදලක් ඇතුළත් වේ. එසේ වුව ද මුදල් භාරගන්නා තැනැත්තා, සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවල කොටසක් ලෙස මුදල් ණයට දෙන තැනැත්තකු හෝ එසේ භාර ගන්නා ලද මුදල් ප්‍රයෝජනයට ගැනීමට හෝ එහි අර්ථලාභය ලැබීමට තුන්වන පාර්ශ්වයකට ඉඩ සලසන තැනැත්තකු හෝ විය යුතු අතර, තැන්පතුව යන්නට (II) වන උපලේඛනයේ (ම) ඡේදයෙන් සහ IV වන උපලේඛනයේ (ගග) ඡේදයෙන් විධිවිධාන සපයා ඇති පරිදි භාරගත් යම් මුදලක් ද ඇතුළත් වේ." ;

(ඉ) "සැහෙන සම්බන්ධතාවක් " යන යෙදුමේ අර්ථ කථනය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :-

(අ) සමාගමක් සම්බන්ධයෙන් වන විට, ඒ සමාගමේ ගෙවා නිමි ප්‍රාග්ධනයෙන් සියයට දහයක් ඉක්මවන්නා වූ ගෙවා නිමි අගයෙන් යුත් කොටස් කෙරෙහි වෙනත් සමාගමක් හෝ පුද්ගලයෙක් හෝ ඔහුගේ සමීප ඥාතියකු විසින් තනි තනිව හෝ එක්ව වැඩදායී සම්බන්ධතාවයක් දැරීම හෝ ඒ සමාගම වෙනුවෙන් යම් පුද්ගලයකු හෝ ඔහුගේ සමීප ඥාතියකු විසින් හෝ වෙනත් සමාගමක් විසින් හෝ, ඒ සමාගමේ ගෙවා නිමි ප්‍රාග්ධනයෙන් සියයට දහයකට නොඅඩු මුදල් ප්‍රමාණයකට දෙන ලද ඒ සමාගම මෙනුවෙන් වූ ඇපයක් හෝ හානි පූරණයක් පැවතීම අදහස් වේ." ;

(ආ) ව්‍යාපාර ආයතනයක් සම්බන්ධයෙන් වන විට, පුද්ගලයකු හෝ ඔහුගේ සමීප ඥාතියකු විසින් තනි තනිව හෝ එක්ව ඒ ව්‍යාපාර ආයතනයෙහි දරනු ලබන, එකී ව්‍යාපාර ආයතනයේ සියලු හවුල්කරුවන් විසින් දායක වූ මුළු ප්‍රාග්ධනයෙන් සියයට දහයකට වැඩි වූ ප්‍රමාණයක් නියෝජනය කෙරෙන වැඩදායී සම්බන්ධතාවක් හෝ පුද්ගලයකු හෝ ඔහුගේ කලත්‍රයා, මව හෝ පියා හෝ, දරුවකු විසින් ඒ ව්‍යාපාර ආයතනය වෙනුවෙන් එහි ගෙවා නිමි ප්‍රාග්ධනයෙන් සියයට දහයකට අඩු නොවූ ප්‍රමාණයක් සඳහා දෙන ලද ඇපයක් හෝ හානි පූරණයක් පැවතීම අදහස් වේ.".

**41.** ප්‍රධාන ප්‍රඥප්තියේ II වන උපලේඛනය, එහි (බ) ඡේදයට ඉක්බිතව ම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(ම) යම් මුදලක්, බැංකුවේ ව්‍යාපාර කටයුත්තක් සම්බන්ධයෙන් ආයෝජනය කිරීම පිණිස, එම මුදල ලබා ගන්නේ කවරකුගෙන් ද ඒ තැනැත්තා සමග ව්‍යාපාරයේ ලාභ හෝ පාඩු, මුදල් ලබාගත් අවස්ථාවේ දී නිශ්චය කර ගනු ලැබූ ආකාරයට බෙදා ගැනීමේ පදනම මත කවර වූ ආකාරයකට හෝ කවර වූ විධික්‍රමයකට යම් නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා යම් තැනැත්තකුගෙන් ලබා ගැනීම ;

(ය) යම් භාණ්ඩවල ගැනුම්කරුවන් විසින් ඒ භාණ්ඩ සහ ඒ භාණ්ඩවල සැපයුම්කරුවන් නිශ්චිතව දක්වා තිබිය යුතු බවට ද සහ ඒ භාණ්ඩ ගැනුම්කරුට විකුණනු ලබන මිල සහ ප්‍රමාද වී ගෙවීමේ නියමයන්, එකී භාණ්ඩ ගැනුම්කරුට විකිණීම සඳහා

මිලට ගැනීමට බැංකුව විසින් ගැනුම්කරු සමග එකහවන වේලාවේ දී නිශ්චය කොට තිබිය යුතු බවට ද යටත් ව, මිල දී ගත් වහාම විකිණීම සඳහා ප්‍රමාද වී ගෙවීමේ නියමයන් මත භාණ්ඩ මිලට ගැනීම.".

42. ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ උපලේඛනයේ (ගග) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ගග) යම් මුදලක්, බැංකුවේ ව්‍යාපාර කටයුත්තක් සම්බන්ධයෙන් ආයෝජනය කිරීම පිණිස, එම මුදල ලබාගන්නේ කවරකුගෙන් ද ඒ තැනැත්තා සමග එම ව්‍යාපාරයේ ලාභ හෝ පාඩු, මුදල් ලබාගත් අවස්ථාවේ දී නිශ්චය කරගනු ලැබූ ආකාරයට බෙදා ගැනීමේ පදනම මත, කවර වූ ආකාරයට හෝ කවර වූ විධි ක්‍රමයකට යම් නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා යම් තැනැත්තකුගෙන් ලබා ගැනීම.";

(ආ) ඒ උපලේඛනයේ අවසානයට පහත දැක්වෙන ඡේද එකතු කිරීමෙන් :—

"(චච) යම් භාණ්ඩවල ගැනුම්කරු විසින් ඒ භාණ්ඩ සහ ඒ භාණ්ඩවල සැපයුම්කරුවන් නිශ්චිතව දක්වා තිබිය යුතු බවට ද සහ ඒ භාණ්ඩ ගැනුම්කරුට විකුණනු ලබන මිල සහ ප්‍රමාද වී ගෙවීම් නියමයන්, එකී භාණ්ඩ ගැනුම්කරුට විකිණීම සඳහා මිලට ගැනීම බැංකුව විසින් ගැනුම්කරු සමග එකහවන වේලාවේ දී නිශ්චය කොට තිබිය යුතු බවට ද යටත්ව, මිල දී ගත් වහාම විකිණීම සඳහා ප්‍රමාද වී ගෙවීමේ නියමයන් මත, භාණ්ඩ මිලට ගැනීම ;

(ජජ) බලපත්‍රලාභී විශේෂිත බැංකුවකට නියැලීම සඳහා මුදල් මණ්ඩලය විසින් බලය දෙනු ලැබිය හැකි වෙනත් යම් ව්‍යාපාර කටයුතු.".

43. 1995 අංක 33 දරන පනතින් සහ මේ පනතින් සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන සහ ඒ ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට නියමිත වූ යම් අධිකාරියක් පිහිටුවනු ලැබූ වේ යම් ලිඛිත නීතියක් මගින් හෝ යම් ලිඛිත නීතියක් යටතේ ද, එවැනි යම් ලිඛිත නීතියක විධිවිධාන ද අතර ගැටුමක් තිබුන ද, ඒ ලිඛිත නීතිය යටතේ ආරම්භ කරන ලද සහ ආරම්භ කිරීමට බලාපොරොත්තු වන සහ මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට සම්පූර්ණ කොට නොමැති සියලු ක්‍රියා, තීරණ හෝ කටයුතු, ප්‍රධාන ප්‍රඥප්තියට ඒ සංශෝධන කරනු ලැබ නොමැති පරිදි සම්පූර්ණ කොට, කර ගෙන යනු ලැබිය හැකි ය.

## 2005 අංක 5 දරන මුදල් පනත

[සහතිකය සටහන් කළේ 2005 මාර්තු මස 30 වන දින]

**2005 අයවැය යෝජනාවලට ආනුෂංගික වන ඇතැම් බදු පැනවීම සඳහා ද ; ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි**

1. මේ පනත 2005 අංක 5 දරන මුදල් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

I වන කොටස

**සමාජ වගකීම් බද්ද පැනවීම**

2. මේ පනතේ 1 වන උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති ප්‍රඥප්තිවල විධිවිධාන ප්‍රකාරව අයකළ හැකි සියළු බදු සහ අයකිරීම් මත සියයට 0.25 අනුප්‍රමාණයකට 2005 ජනවාරි මස 01 වන දිනයෙන් ආරම්භ වන වර්ෂයේ සිට සහ ඉන්පසු සෑම වර්ෂයක් සඳහාම බලපවත්වන පරිදි මේ පනතේ විධිවිධානවලට යටත්ව සමාජ වගකීම් බද්ද යනුවෙන් හඳුන්වනු ලබන බද්දක් පනවනු ලැබිය යුතු ය. සමාජ වගකීම් බද්ද වශයෙන් එසේ එකතු කරගනු ලබන අරමුදල් ආණ්ඩුව විසින් අනුමත කරනු ලබන ළමයින් සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම හා සම්බන්ධ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා දරනු ලබන යම් වියදමක් පියවීම සඳහා වියදම් කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන යටතේ අයකරනු ලබන ආදායම් බද්ද මත මේ පනතේ මේ කොටසේ විධිවිධාන ප්‍රකාරව සමාජ වගකීම් බද්ද පැනවීම 2005 අප්‍රේල් මස 1 දින සිට බලාත්මක විය යුතු ය.

3. මේ පනතේ 1 වන උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති ප්‍රඥප්ති පරිපාලනය කරන අදාළ බලධරයන් විසින් එම බදු මුදල් හෝ අයකිරීම් ගෙවන අවස්ථාවේ දී 2 වන වගන්තිය ප්‍රකාර එකතු කරගත යුතු සමාජ වගකීම් බද්ද එකතු කරගනු ලැබිය යුතු අතර, එම කාර්ය සඳහා ක්‍රියාත්මක කරනු ලබන විශේෂ ගිණුමකට එම මුදල් බැර කරනු ලැබිය යුතු ය : අදාළ බලධරයන් විසින් එම මුදල් එකතු කරගත් දින සිට දින පහළොවක් ඇතුළත එසේ එකතු කරගනු ලැබූ මුදල රජයේ අරමුදලට යවනු ලැබිය යුතු ය.

4. මේ පනතේ උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති අදාළ ප්‍රඥප්තිවල විධිවිධාන ප්‍රකාරව අදාළ බලධරයන් විසින් එකතු කරගනු ලැබිය හැකි සමාජ වගකීම් බද්දට අදාළව එම බලධරයන් විසින් එකතු කරගනු ලබන සියලු මුදල් පිළිබඳ වාර්තා පළමුවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රඥප්ති පරිපාලනය කරන සෑම අදාළ බලධරයකු විසින් ම පවත්වා ගෙන යා යුතු ය.

5. (1) 2 වන වගන්තිය ප්‍රකාරව සමාජ වගකීම් බද්දේ මුළු ප්‍රමාණය ගෙවීමට අපොහොසත් වන්නා වූ ද, මේ පනතේ මේ කොටසේ විධිවිධාන අදාළ වන්නා වූ ද, යම් තැනැත්තකු පැහැර හරින්නකු වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ පැහැර හරින්නා සංස්ථාගත මණ්ඩලයක් වන අවස්ථාවක, ඒ සංස්ථාගත මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා, යම් අධ්‍යක්ෂවරයකු හෝ ප්‍රධාන නිලධරයා මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා පැහැර හරින්නකු වශයෙන් සලකනු ලැබිය යුතු ය. තව ද ඒ බද්ද, අයවිය යුතු දින හෝ ඊට පෙර නොගෙවා පැහැර හරිනු ලැබූ බද්දක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) පැහැර හරින්නා සමාජ වගකීම් බද්දට අමතරව–

(අ) 2 වන වගන්තිය යටතේ බද්ද ගෙවිය යුතු දින පටන් එක් මසක් පසු වූ කාල පරිච්ඡේදයක් හෝ ඉන් යම් කොටසක් සඳහා අයවිය යුතු පැහැර හරින ලද බදු මුදලින් සියයට දහය බැගින් ; සහ

(ආ) (අ) ඡේදයේ නිශ්චිතව සඳහන් කරන ලද බද්ද ගෙවිය යුතු දින පටන් එක් මසක් පසු වූ කාල පරිච්ඡේදයක් හෝ ඉන් යම් කොටසක් සඳහා අයවිය යුතු පැහැර හරින ලද බදු මුදලින් සියයට දෙක බැගින්,

ගණන් බලනු ලබන අධිභාරයක් ගෙවීමට ද යටත් විය යුතු අතර, ඒ අධිභාරය මේ පනතේ පළමුවන උපලේඛනයෙහි නිශ්චිතව දැක්වෙන ප්‍රඥප්ති පරිපාලනය කරන අදාළ බලධරයන් විසින් එකතු කරනු ලැබිය යුතු ය.

(3) මාස තුනකට වැඩි කාල පරිච්ඡේදයක් පැහැර හැර ඇති සමාජ වගකීම් බද්ද හෝ එහි කොටසක් සහ ඒ මත එකතු වූ අධිභාර මුදල ද සමග මෙහි මින් මතු සඳහන් කරනු ලබන ආකාරයට අයකර ගැනීම සඳහා 1 වන උපලේඛනයෙහි සඳහන් ප්‍රඥප්ති පරිපාලනය කරන අදාළ බලධරයන් ක්‍රියා කළ යුතු ය.

(4) පැහැර හැර ඇති සමාජ වගකීම් බද්ද සහ ඒ මත එකතු වූ අධිභාර මුදල ද අයකර ගැනීමට පියවර කිසිවක් ගැනීමට සති තුනකට පෙරාතුව මේ වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පැහැර හැර ඇති සමාජ වගකීම් බදු මුදල සහ ඒ මත එකතු වූ අධිභාර මුදල ද අයකර ගැනීම සඳහා නඩු පැවරීමට අදහස් කරන බව පැහැර හරින්නා වෙත දැනුම් දෙමින් 1 වන උපලේඛනයේ සඳහන් ප්‍රඥප්ති පරිපාලනය කරන බලධාරීන් විසින් පැහැර හරින්නා වෙත දැන්වීමක් නිකුත් කිරීමට සලස්වනු ලැබිය යුතු ය.

(5) 1 වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ප්‍රඥප්ති පරිපාලනය කරන අදාළ බලධරයන් විසින් (4) උපවගන්තිය ප්‍රකාරව පැහැර හරින්නා වෙත දැන්වීම් නිකුත් කරනු ලැබ ඒ දැන්වීමේ සඳහන් සති තුනක කාල පරිච්ඡේදය ඉකුත් වී ඇති නමුත්, අධිභාරය සමග පැහැර හැර ඇති මුදල නොගෙවනු ලැබ ඇති අවස්ථාවක, පැහැර හරින්නා වාසය කරන්නා වූ හෝ ව්‍යාපාරය කරගෙන යන්නා වූ හෝ කොට්ඨාසය සම්බන්ධයෙන් අධිකරණ බලය ඇත්තා වූ මහෙස්ත්‍රාත්වරයා වෙත පැහැර හරින්නාගේ නම සහ ලිපිනය සහ පැහැර හැර ඇති මුළු මුදල ඇතුළත් සහතිකයක් මේ වගන්තිය මගින් නියමිත ගෙවීම් කිරීම, එසේ නම් කරන ලද තැනැත්තා විසින් පැහැර හැර ඇති බවට වූ ප්‍රකාශයක් ද සමග පළමුවන උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ප්‍රඥප්ති පරිපාලනය කරන අදාළ බලධරයන් විසින් නිකුත් කරනු ලැබිය යුතු ය. පැහැර හරින්නා සංස්ථාගත මණ්ඩලයක් වන අවස්ථාවක, ඒ සංස්ථාගත මණ්ඩලයේ සභාපතිගේ, අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ සෑම අධ්‍යක්ෂවරයකුගේ ම නම සහතිකයේ ඇතුළත් විය යුතු ය.

(6) (5) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ සහතිකය ලැබුන විට, නියම කරනු ලැබිය යුතු යම් දිනයක තමා ඉදිරියේ පෙනීසිට පැහැර හරින ලද සමාජ වගකීම් බද්ද හෝ එහි කොටසක් සහ ඒ මත එකතු වූ අධිභාරය ද අයකර ගැනීම සඳහා ඔහුට විරුද්ධව නීත්‍යානුකූලව කටයුතු නොකළ යුත්තේ මන්දැයි හේතු දක්වන ලෙසට නියම කරමින්, මහෙස්ත්‍රාත්වරයා විසින් පැහැර හරින්නා වෙත සිතාසි නිකුත් කරනු ලැබිය යුතු ය. දක්වන ලද හේතුව, නොගෙවීමට හේතුව පැහැදිලි කිරීම සඳහා ප්‍රමාණවත් නොවේ යයි මහෙස්ත්‍රාත්වරයාට පෙනී යන අවස්ථාවක, මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ බව සටහන් කර ගැනීමෙන් පසුව පැහැර හරින ලද සමාජ වගකීම් බද්ද සහ ඒ මත එකතු වූ අධිභාරය ද මහෙස්ත්‍රාත්වරයා විසින් පනවන ලද දඩයක් සේ සලකා පැහැර හරින්නාගෙන් අයකර ගැනීම සඳහා ආඥා කරනු ලැබිය යුතු ය. එසේ අයකර ගනු ලැබූ මුදල් පළමුවන උපලේඛනයේ සඳහන් ප්‍රඥප්ති පරිපාලනය කරන අදාළ බලධරයන් වෙත ප්‍රේෂණය කර එකී මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

6. (1) මේ පනතේ මේ කොටසේ විධිවිධාන සියලු කාර්ය සඳහා 2005 ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) 2005 ජනවාරි මස 01 වන දිනයෙන් ආරම්භ වී මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයෙන් අවසන් වන කාලසීමාව ඇතුළත පනතේ මේ කොටස ප්‍රකාරව පළමුවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රඥප්ති පරිපාලනය කරන අදාළ බලධරයන් විසින් යම් මුදලක් එකතු කරගනු ලැබ ඇති යම් අවස්ථාවක, එසේ එකතු කර ගනු ලැබූ සමාජ වගකීම් බද්ද වලංගු ලෙස එකතු කර ගනු ලැබ ඇති බවට සලකනු ලැබිය යුතු අතර, ඉහත කී බද්ද එකතුකර ගැනීම සම්බන්ධයෙන් අදාළ බලධරයන්ට එරෙහිව යම් සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු ලැබිය හැකිවීමේ වගකීමෙන් ඔවුන් නිදහස් කරනු ලැබේ.

## II වන කොටස

### කොටස් ගනුදෙනු බද්ද පැනවීම

7. 2005 ජනවාරි මස 01 වන දිනයෙන් ආරම්භ වන වර්ෂය සහ ඉන්පසුව එළඹෙන සෑම වර්ෂයක් සඳහා ම, කොටස් වෙළඳපලක් මගින් පවත්වාගෙන යනු ලබන සෑම කොටස් වෙළඳාම් ගනුදෙනුවක ම පිරිවැය මත සෑම මිල දී ගන්නකුගෙන් සහ විකුණුම්කරුවකුගෙන් සියයට 0.2 ක අනුපාතයකට කොටස් ගනුදෙනු බද්ද නම් වූ බද්දක් පනවනු ලැබිය යුතු ය.

8. එසේ පනවනු ලබන කොටස් ගනුදෙනු බද්ද එම කොටස් ගනුදෙනුව බේරුම් කිරීම සඳහා වගකිවයුතු අවස්ථාවෝචිත පරිදි අදාළ කොටස් තැරැව්කරු විසින්, කොටස් වෙළෙන්දා විසින් හෝ භාරකාර බැංකුව විසින්, එකතු කරගනු ලැබිය යුතු ය. 7 වන වගන්තිය ප්‍රකාරව එසේ අයකර ගනු ලබන කොටස් ගනුදෙනු බද්ද අවස්ථාවෝචිත පරිදි අදාළ කොටස් තැරැව්කරු විසින්, කොටස් වෙළෙන්දා විසින් හෝ භාරකාර බැංකුව විසින් එම කොටස් ගනුදෙනුව බේරුම් කරන අවස්ථාවේ දී කොටස් ගනුදෙනුව සිදු වූ කොටස් වෙළඳපලට ගෙවනු ලැබිය යුතු ය. එසේ එකතු කරගනු ලබන බද්ද කොටස් වෙළඳපල මගින් එසේ බේරුම් කිරීමේ දින සිට වැඩ කරන දින තුනක් ඇතුළත කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

9. සෑම මසකම අවසාන දින සිට දින පහළොවක් ඇතුළත කොටස් ගනුදෙනු බද්ද කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කරනු ලැබ ඇත්තේ සම්පූර්ණ පිරිවැටුමක් සම්බන්ධයෙන් ද එම සම්පූර්ණ පිරිවැටුම පෙන්නුම් කරන මාසික ප්‍රකාශයක් කොටස් වෙළෙඳපල විසින් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

10. (1) මේ පනතේ මේ කොටසේ විධිවිධාන අදාළ වන්නා වූ ද, 7 වන වගන්තිය සහ 8 වන වගන්තිය ප්‍රකාරව කොටස් ගනුදෙනු බද්ද සම්පූර්ණයෙන් ගෙවීම පැහැර හැර ඇත්තා වූ ද, අවස්ථාවෝචිත පරිදි යම් කොටස් තැරැව්කරුවකු, කොටස් වෙළෙන්දෙකු හෝ භාරකාර බැංකුවක්, පැහැර හරින්නකු වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ පැහැර හරින්නා සංස්ථාගත මණ්ඩලයක් වන අවස්ථාවක, ඒ සංස්ථාගත මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා, සෑම අධ්‍යක්ෂවරයකු ම හෝ ප්‍රධාන නිලධරයා මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා පැහැර හරින්නකු වශයෙන් සලකනු ලැබිය යුතු ය. තව ද ඒ බද්ද, අයවිය යුතු දින හෝ ඊට පෙර නොගෙවා පැහැර හරිනු ලැබූ බද්දක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) පැහැර හරින්නා කොටස් ගනුදෙනු බද්දට අමතරව—

(අ) 8 වන වගන්තිය යටතේ බද්ද ගෙවිය යුතු දින පටන් එක් මසක් පසු වූ කාල පරිච්ඡේදයක් හෝ ඉන් යම් කොටසක් සඳහා අයවිය යුතු පැහැර හරින ලද බදු මුදලින් සියයට දහය බැගින් ; සහ

(ආ) (අ) ඡේදයේ නිශ්චිතව සඳහන් කරන ලද බද්ද ගෙවිය යුතු දින පටන් එක් මසක් පසු වූ කාල පරිච්ඡේදයක් හෝ ඉන් යම් කොටසක් සඳහා අයවිය යුතු පැහැර හරින ලද බදු මුදලින් සියයට දෙක බැගින්,

ගණන් බලනු ලබන අධිභාරයක් ගෙවීමට ද යටත් විය යුතු අතර, ඒ අධිභාරය කොමසාරිස් ජනරාල්වරයා විසින් එකතු කරනු ලැබිය යුතු ය.

(3) මාස තුනකට වැඩි කාලපරිච්ඡේදයක් පැහැර හැර ඇති කොටස් ගනුදෙනු බද්ද හෝ එහි කොටසක් සහ ඒ මත එකතු වූ අධිභාර මුදල ද සමග මෙහි මින් මතු සඳහන් කරනු ලබන ආකාරයට අයකර ගැනීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා ක්‍රියා කළ යුතු ය.

(4) පැහැර හැර ඇති කොටස් ගනුදෙනු බද්ද සහ ඒ මත එකතු වූ අධිභාර මුදල ද අයකර ගැනීමට පියවර කිසිවක් ගැනීමට සති තුනකට පෙරාතුව මේ වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පැහැර හැර ඇති කොටස් ගනුදෙනු බදු මුදල සහ ඒ මත එකතු වූ අධිභාර මුදල ද අයකර ගැනීම සඳහා නඩු පැවරීමට අදහස් කරන බව පැහැර හරින්නා වෙත දැනුම් දෙමින් කොමසාරිස් ජනරාල්වරයා විසින් පැහැර හරින්නා වෙත දැන්වීමක් නිකුත් කිරීමට සලස්වනු ලැබිය යුතු ය.

(5) කොමසාරිස් ජනරාල්වරයා විසින් (4) වන උපවගන්තිය ප්‍රකාරව පැහැර හරින්නා වෙත දැන්වීම් නිකුත් කරනු ලැබ ඒ දැන්වීමේ සඳහන් සති තුනක කාල පරිච්ඡේදය ඉකුත් වී ඇති නමුත්, අධිභාරය සමග පැහැර හැර ඇති මුදල සහ ඒ මත

උපචිත වී ඇති අධිභාරය නොගෙවනු ලැබ ඇති අවස්ථාවක, පැහැර හරින්නා වාසය කරන්නා වූ ව්‍යාපාරය කරගෙන යන්නා වූ හෝ කොට්ඨාසය සම්බන්ධයෙන් අධිකරණ බලය ඇත්තා වූ මහෙස්ත්‍රාත්වරයා වෙත පැහැර හරින්නාගේ නම සහ ලිපිනය සහ පැහැර හැර ඇති මුළු මුදල ඇතුළත් සහතිකයක් මේ වගන්තිය මගින් නියමිත ගෙවීම් කිරීම, එසේ නම් කරන ලද තැනැත්තා විසින් පැහැර හැර ඇති බවට වූ ප්‍රකාශයක් ද සමග කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලැබිය යුතු ය. පැහැර හරින්නා සංස්ථාගත මණ්ඩලයක් වන අවස්ථාවක, ඒ සංස්ථාගත මණ්ඩලයේ සභාපතිවරයාගේ, සෑම අධ්‍යක්ෂවරයකුගේ ම හෝ ප්‍රධාන නිලධරයාගේ නම සහතිකයේ ඇතුළත් විය යුතු ය.

(6) (5) වන උප වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ සහතිකය ලැබුණු විට නියම කරනු ලැබිය යුතු යම් දිනයක තමා ඉදිරියේ පෙනී සිට පැහැර හරින ලද කොටස් ගනුදෙනු බද්ද හෝ එහි කොටසක් සහ ඒ මත එකතු වූ අධිභාරය ද අයකර ගැනීම සඳහා ඔහුට විරුද්ධව නීත්‍යානුකූලව කටයුතු නොකළ යුත්තේ මන්දැයි හේතු දක්වන ලෙසට නියම කරමින්, මහෙස්ත්‍රාත්වරයා විසින් පැහැර හරින්නා වෙත සිතාසි නිකුත් කරනු ලැබිය යුතු ය. දක්වන ලද හේතුව, නොගෙවීමට හේතුව පැහැදිලි කිරීම් සඳහා ප්‍රමාණවත් නොවේ යයි මහෙස්ත්‍රාත්වරයාට පෙනී යන අවස්ථාවක, මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ බව සටහන් කර ගැනීමෙන් පසුව පැහැර හරින ලද කොටස් ගනුදෙනු බද්ද සහ ඒ මත එකතු වූ අධිභාරය ද මහෙස්ත්‍රාත්වරයා විසින් පනවන ලද දඩයක් සේ සලකා පැහැර හරින්නාගෙන් අයකර ගැනීම සඳහා ආඥා කරනු ලැබිය යුතු ය. එසේ අය කර ගනු ලැබූ මුදල් කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කර එකී මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

11. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ මේ කොටසේ–

"කොමසාරිස් ජනරාල්" යන්නෙන් 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත ප්‍රකාරව පත් කරන ලද දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා අදහස් වේ ;

"භාරකාර බැංකුව" යන්නෙන් කොටස් ගනුදෙනු සම්බන්ධයෙන් භාරකාර සේවා සපයනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍ර ලබා දී ඇති යම් බැංකුවක් අදහස් වේ ;

"කොටස් තැරැව්කරු" යන්නෙන්, කොමිස් මුදලක් සඳහා ආයෝජකයන් වෙනුවෙන් සුරැකුම්පත් මිල දී ගැනීමේ හෝ විකිණීමේ ව්‍යාපාරයේ යෙදී සිටින යම් පුද්ගලයකු හෝ පුද්ගල මණ්ඩලයක් අදහස් වේ ;

"කොටස් වෙළෙන්දා" යන්නෙන් සුරැකුම්පත් මිල දී ගැනීමේ හෝ විකිණීමේ ව්‍යාපාරයේ නැතහොත් සුරැකුම්පත් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ හෝ වෙළෙඳාම් කිරීමේ නියැළී සිටින හෝ සුරැකුම්පත් රක්ෂණය කිරීමේ හෝ තබා ගැනීමේ, යෙදී සිටින යම් පුද්ගලයෙක් හෝ සංස්ථාගත මණ්ඩලයක් අදහස් වේ ; සහ

"කොටස් වෙළඳපල" යන්නෙන් එම ව්‍යාපාරය හා සම්බන්ධ යම් සේවාවන් ද ඇතුලුව සුරැකුම් පත් විකිණීම, මිල දී ගැනීම හෝ හුවමාරු කිරීම සඳහා නිතිපතා අර්පණය කරනු ලබන වෙළඳපලක්, හුවමාරු ස්ථානයක් හෝ වෙනත් ස්ථානයක් අදහස් වේ.

12. (1) මේ පනතේ මේ කොටස් විධිවිධාන සියළු කාර්ය සඳහා 2005 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) 2005 ජනවාරි මස 01 වන දින ආරම්භ වී මේ පනත ක්‍රියාත්මක වන දිනයෙන් අවසන් වන කාලය තුළ මේ පනතේ මේ කොටස ප්‍රකාරව කොටස් තැරැව්කරුවන්ගේ ගනුදෙනු බද්ද වශයෙන් කොමසාරිස් ජනරාල්වරයා විසින් යම් මුදලක් එකතු කර ගෙන ඇති අවස්ථාවක දී එසේ එකතු කර ගත් කොටස් තැරැව්කාර ගණුදෙනු බද්ද නීත්‍යානුකූල ලෙස එකතු කර ගෙන ඇති බවට සලකනු ලැබිය යුතු අතර, ඉහත කී බද්ද එකතු කිරීම සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයාට එරෙහිව යම් සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු ලැබීමෙන් ඔහු වගකීමෙන් නිදහස් කරනු ලැබේ.

III වන කොටස

ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල බද්ද

13. 2005 ජනවාරි මස 01 වන දින සිට සහ ඉන්පසු එළඹෙන සෑම අවුරුද්දක් සඳහා ම බලපවත්වන පරිදි මේ පනතේ දෙවන උපලේඛනයේ දක්වා ඇති අනුප්‍රමාණවලට අනුව ගණන් බලනු ලබන්නා වූ ද, එම දිනය හෝ එදිනට පසුව එළඹෙන යම් ගිවිසුමකින් උපචිත වන කොන්ත්‍රාත්කරුවන්ගේ කොන්ත්‍රාත් වටිනාකම මත සෑම ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවකු විසින් ම ශ්‍රී ලංකාවෙහි ක්‍රියාත්මක කරනු ලබන සෑම ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවක් මත ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල් බද්ද යනුවෙන් හඳුන්වනු ලබන බද්දක් පනවනු ලැබිය යුතු ය. එසේ ගණන් බලනු ලබන ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල් බද්දේ ප්‍රතිශතය, මේ පනතේ දෙවන උපලේඛනයේ සඳහන් මුදල් ප්‍රමාණයට වඩා තනි පුද්ගල උපකොන්ත්‍රාත් වටිනාකම අඩු වුව ද අවස්ථාවෝචිත පරිදි එක් එක් කොන්ත්‍රාත්කරු හෝ උපකොන්ත්‍රාත්කරු විසින් ගෙවිය යුතු සම්පූර්ණ පිරිවැය මත පදනම් විය යුතු ය.

14. 13 වන වගන්තිය යටතේ ගෙවිය යුතු ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල් බද්ද, එක් එක් කොන්ත්‍රාත් මුදල්, කොන්ත්‍රාත්කරුට ලැබෙන අවස්ථාවේ දී ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු විසින් (මෙහි මින් මතු "අයි.සී.ටී.ඒ.ඩී" යනුවෙන් සඳහන් කරනු ලබන) ඉදිකිරීම් පුහුණු සහ සංවර්ධන ආයතනයට ගෙවනු ලැබිය යුතු ය.

15. 13 වන වගන්තිය ප්‍රකාරව සෑම කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් ම ආණ්ඩුව වෙනුවෙන් "අයි.සී.ටී.ඒ.ඩී" විසින් එකතු කරගනු ලබන ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල් බද්ද, එම බද්ද වශයෙන් ගෙවිය යුතු මුදල ගණනය කිරීමේ පදනම පෙන්නුම් කරන මාසික ප්‍රකාශයක් ද සමග 13 වන වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි සෑම මාසයක ම අවසානයේ සිට දින පහළොවක් ඇතුළත ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

16. ආණ්ඩුව වෙනුවෙන් ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල් බද්ද එකතු කිරීම සහ ප්‍රේෂණය කිරීමට අදාළ මාර්ගෝපදේශ භාණ්ඩාගාර ලේකම්වරයා විසින් කලින් කළ නිකුත් කරනු ලැබිය හැකි ය.

17. ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල් බද්ද එකතු කිරීමට අදාළ වන්නේ යම් වර්ෂයක් ද, එම වර්ෂයේ අවසාන දින සිට දින 30 ඇතුළත භාණ්ඩාගාර ලේකම්වරයා විසින් සඳහන් කරනු ලබන තොරතුරු ඇතුළත් ප්‍රකාශයක් "අයි.සී.ටී.ඒ.ඩී" විසින් ඉදිරිපත් කළ යුතු ය.

18. අදාළ කොන්ත්‍රාත්කරුවන් විසින් 2005 ජනවාරි මස 01 වන දින හෝ එදිනට පසුව එළඹ ඇති සෑම ගිවිසුමක් මතම පිරිවැටුමට අදාළව තමා විසින් එකතු කර ගන්නා ලද සියලු මුදල් පිළිබඳ වාර්තාවක් සහ ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල් බද්ද එකතු කිරීමට අදාළ ප්‍රකාශයක් "අයි.සී.ටී.ඒ.ඩී" විසින් පවත්වා ගෙන යා යුතු ය.

19. (1) 13 වන වගන්තිය ප්‍රකාරව ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල් බද්දේ මුළු ප්‍රමාණය ගෙවීමට අපොහොසත් වන්නා වූ ද, මේ පනතේ මේ කොටසේ විධිවිධාන අදාළ වන්නා වූ ද, යම් තැනැත්තකු පැහැර හරින්නකු වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ පැහැර හරින්නා සංස්ථාගත මණ්ඩලයක් වන අවස්ථාවක, ඒ සංස්ථාගත මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා, යම් අධ්‍යක්ෂවරයකු හෝ ප්‍රධාන නිලධරයා මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා පැහැර හරින්නකු වශයෙන් සලකනු ලැබිය යුතු ය. තව ද ඒ බද්ද, අයවිය යුතු දින හෝ ඊට පෙර නොගෙවා පැහැර හරිනු ලැබූ බද්දක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) පැහැර හරින්නා ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල් බද්දට අමතරව–

(අ) 16 වන වගන්තිය යටතේ බද්ද ගෙවිය යුතු දින පටන් එක් මසක් පසු වූ කාලපරිච්ඡේදයක් හෝ ඉන් යම් කොටසක් සඳහා අයවිය යුතු පැහැර හරින ලද බදු මුදලින් සියයට දහය බැගින් ; සහ

(ආ) (අ) ඡේදයේ නිශ්චිතව සඳහන් කරන ලද බද්ද ගෙවිය යුතු දින පටන් එක් මසක් පසු වූ කාල පරිච්ඡේදයක් හෝ ඉන් යම් කොටසක් සඳහා අයවිය යුතු පැහැර හරින ලද බදු මුදලින් සියයට දෙක බැගින්,

ගණන් බලනු ලබන අධිභාරයක් ගෙවීමට ද යටත් විය යුතු අතර, ඒ අධිභාරය "අයි.සී.ටී.ඒ.ඩී." විසින් එකතු කරනු ලැබිය යුතු ය.

(3) මාස තුනකට වැඩ කාල පරිච්ඡේදයක් පැහැර හැර ඇති ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල් බද්ද හෝ එහි කොටසක් සහ ඒ මත එකතු වූ අධිභාර මුදල ද සමග මෙහි මින් මතු සඳහන් කරනු ලබන ආකාරයට අයකර ගැනීම සඳහා "අයි.සී.ටී.ඒ.ඩී." ක්‍රියාකළ යුතු ය.

(4) පැහැර හැර ඇති ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල් බද්ද සහ ඒ මත එකතු වූ අධිභාර මුදල ද අයකර ගැනීමට පියවර කිසිවක් ගැනීමට සති තුනකට පෙරාතුව මේ වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පැහැර හැර ඇති ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල් බද්ද සහ ඒ මත එකතු වූ අධිභාර මුදල ද අයකර ගැනීම සඳහා නඩු පැවරීමට අදහස් කරන බව පැහැර හරින්නා වෙත දැනුම් දෙමින් "අයි.සී.ටී.ඒ.ඩී" විසින් පැහැර හරින්නා වෙත දැන්වීමක් නිකුත් කිරීමට සලස්වනු ලැබිය යුතු ය.

(5) "අයි.සී.ටී.ඒ.ඩී." විසින් (4) උපවගන්තිය ප්‍රකාරව පැහැර හරින්නා වෙත දැන්වීම් නිකුත් කරනු ලැබ, ඒ දැන්වීමේ සඳහන් සති තුනක කාල පරිච්ඡේදය ඉකුත් වී ඇති නමුත්, අධිභාරය සමග පැහැර හැර ඇති මුදල නොගෙවනු ලැබ ඇති අවස්ථාවක, පැහැර හරින්නා වාසය කරන්නා වූ හෝ ව්‍යාපාරය කර ගෙන යන්නා වූ හෝ කොට්ඨාසය සම්බන්ධයෙන් අධිකරණ බලය ඇත්තා වූ මහෙස්ත්‍රාත්වරයා වෙත පැහැර හරින්නාගේ නම සහ ලිපිනය සහ පැහැර හැර ඇති මුළු මුදල ඇතුළත් සහතිකයක් මේ වගන්තිය මගින් නියමිත ගෙවීම් කිරීම, එසේ නම් කරන ලද තැනැත්තා විසින් පැහැර ඇති බවට වූ ප්‍රකාශයක් ද සමග "අයි.සී.ටී.ඒ.ඩී" විසින් නිකුත් කරනු ලැබිය යුතු ය. පැහැර හරින්නා සංස්ථාගත මණ්ඩලයක් වන අවස්ථාවක, ඒ සංස්ථාගත මණ්ඩලයේ සභාපතිවරයාගේ, අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ සෑම අධ්‍යක්ෂවරයකුගේ ම හෝ ප්‍රධාන නිලධරයාගේ ම නම සහතිකයේ ඇතුළත් විය යුතු ය.

(6) (5) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ සහතිකය ලැබුන විට, නියම කරනු ලැබිය යුතු යම් දිනයක තමා ඉදිරියේ පෙනී සිට පැහැර හරින ලද ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල් බද්ද හෝ එහි කොටසක් සහ ඒ මත එකතු වූ අධිභාරය ද අය කර ගැනීම සඳහා ඔහුට විරුද්ධව නීත්‍යානුකූලව කටයුතු නොකළ යුත්තේ මන්දැයි හේතු දක්වන ලෙසට නියම කරමින්, මහේස්ත්‍රාත්වරයා විසින් පැහැර හරින්නා වෙත සිතාසි නිකුත් කරනු ලැබිය යුතු ය. දක්වන ලද හේතුව, නොගෙවීමට හේතුව පැහැදිළි කිරීම සඳහා ප්‍රමාණවත් නොවේ යයි මහේස්ත්‍රාත්වරයාට පෙනී යන අවස්ථාවක, මහේස්ත්‍රාත්වරයා විසින් ඒ බව සටහන් කර ගැනීමෙන් පසුව පැහැර හරින ලද ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල් බද්ද සහ ඒ මත එකතු වූ අධිභාරය ද මහේස්ත්‍රාත්වරයා විසින් පනවන ලද දඩයක් සේ සලකා පැහැර හරින්නාගෙන් අයකර ගැනීම සඳහා ආඥා කරනු ලැබිය යුතු ය. එසේ අයකර ගනු ලැබූ මුදල් "අයි.සී.ටී.ඒ.ඩී" වෙත ප්‍රේෂණය කර එකී මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

**20.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ මේ කොටසෙහි–

"ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු" යන්නෙන් යම් ලන්සුවක කොන්ත්‍රාත්කරු වශයෙන් නම් කරනු ලැබූ තැනැත්තා හෝ තැනැත්තන් හෝ සංවිධානය හෝ සංවිධාන නැතහොත් එම ගිවිසුමේ නියමයන් යටතේ සිදු කරනු ලබන ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීම, සම්පූර්ණ කිරීම සහ පවත්වාගෙන යාම සඳහා වගකිව යුතු තැනැත්තකු හෝ සංවිධානයක් වශයෙන් සේවායෝජකයා විසින් අන්‍යාකාරයකින් පිළිගනු ලබන තැනැත්තන් හෝ සංවිධානයක් අදහස් වේ ;

"කොන්ත්‍රාත් වටිනාකම" යන්නෙන් පිළිගැනීමේ ලිපියෙහි සඳහන් වන්නා වූ ද ගිවිසුමේ විධිවිධානවලට අනුකූලව ඉන්පසු වෙනස් කරනු ලබන්නා වූ ද මුදල හෝ මුදල් අදහස් වේ. එම කොන්ත්‍රාත් වටිනාකම වනුයේ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු පවත්වාගෙන යාම සම්බන්ධයෙන් එළඹ ඇති එක් එක් කොන්ත්‍රාත්තු හෝ කොන්ත්‍රාත් කීපයක මුලු එකතුව වන අතර උප කොන්ත්‍රාත් වටිනාකම, සැපයුම් කොන්ත්‍රාත් වටිනාකම් සහ වැඩ කටයුතු ඉටු කිරීමේ දී දැරීමට සිදුවන වෙනත් ඉදිකිරීම් වියදම් ද ඊට ඇතුළත් වේ ; සහ

"ඉදිකිරීම් පුහුණු සහ සංවර්ධන ආයතනය (අයි.සී.ටී.ඒ.ඩී.)" යන්නෙන් 1957 අංක 49 දරන රාජ්‍ය කර්මාන්ත සංස්ථා පනතේ 3 වන වගන්තිය යටතේ සාදනු ලැබ 1992 ජුනි මස 10 වන දින අංක 718/15 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය මගින් පිහිටුවන, සංස්ථාපනය කරන ලද කර්මාන්ත ව්‍යවසාය අදහස් වේ.

**21.** සියලු කාර්ය සඳහා මේ පනතේ විධිවිධාන 2005 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන ලෙස සලකනු ලැබිය යුතු ය.

**22.** 2005 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී මේ පනත ක්‍රියාත්මක වන දිනයෙන් අවසන් වන කාලසීමාව ඇතුළත මේ පනතේ, මේ කොටස, ප්‍රකාරව, ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල වශයෙන් "අයි.සී.ටී.ඒ.ඩී" මගින් අයකර, එකතු කරගන්නා ලද මුදල නීත්‍යානුකූල ලෙස අයකර එකතු කරගත් බවට සලකනු ලැබිය යුතු අතර, එම බද්ද එකතු කිරීම සම්බන්ධයෙන් යම් සිවිල් හෝ අපරාධ නඩුවක් පැවරීමේ දී "අයි.සී.ටී.ඒ.ඩී." මෙයින් වගකීමෙන් නිදහස් කරනු ලැබේ.

## IV වන කොටස

## 2002 අංක 11 දරන මුදල් පනත සංශෝධනය කිරීම

**23.** 2002 අංක 11 දරන මුදල් පනතේ I වන කොටසේ 2 වන වගන්තිය, (වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බද්ද) ඒ වගන්තියේ අතුරු විධානය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කිරීම මගින්, මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"එසේ වුව ද, ඉහත සඳහන් යම් භාණ්ඩයක රක්ෂණ වටිනාකම සහ නැව් බඩු වටිනාකම සම්බන්ධයෙන් 2004 නොවැම්බර් මස 19 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි වර්ෂයකට සියයට 1.5 ක අනුප්‍රමාණයක් මත බද්දක් පනවා අයකරනු ලැබිය යුතු ය :

එසේම තවදුරටත්, ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද භාණ්ඩයන් පිළිසකර කිරීමේ සහ නැවත අපනයනය කිරීමේ කාර්ය සම්බන්ධයෙන් වන අවස්ථාවක, එම භාණ්ඩයේ රක්ෂණ සහ නැව් බඩු වටිනාකම මත වූ බද්ද—

(අ) 2003 ජනවාරි මස 01 දිනයෙන් ආරම්භ වී 2004 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන කාලය සඳහා වර්ෂයකට සියයට 0.5 ක අනුප්‍රමාණයකට පනවා අයකරගනු ලැබිය යුතු ය ; තව ද,

(ආ) 2005 ජනවාරි මස 01 වන දිනයෙන් ආරම්භවන කාලය සඳහා වර්ෂයකට සියයට 0.25 ක අනුප්‍රමාණයකට පනවා අයකරගනු ලැබිය යුතු ය.".

**24.** 2002 අංක 11 දරන මුදල් පනතේ (1) වන කොටසේ සඳහන් යම් භාණ්ඩයක් ආනයනය කරන යම් තැනැත්තකුගෙන් 2004 නොවැම්බර් මස 19 වන දිනයෙන් ආරම්භ වී මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයෙන් අවසන් වන කාලසීමාව ඇතුළත මේ

පනතේ මේ කොටස ප්‍රකාරව වරාය හා ගුවන් තොටුපල බද්ද වශයෙන් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම භාණ්ඩයේ පිරිවැය, රක්ෂණ සහ නැව් බඩු වටිනාකමින් සියයට එකකට සමාන මුදලක් එකතු කරනු ලැබ ඇති අවස්ථාවක එසේ එකතු කර ගත් මුදල සියලු කාර්ය සඳහා වලංගු ලෙස එකතු කරගනු ලැබ ඇති බවට සලකනු ලැබිය යුතු අතර එම එකතු කර ගැනීම සම්බන්ධයෙන් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට එරෙහිව පවරනු ලැබිය හැකි සියලුම සිවිල් හෝ අපරාධ නඩුවල දී ඔහු මෙයින් වගකීමෙන් නිදහස් කරනු ලැබේ.

## V වන කොටස

## සාමාන්‍ය විධිවිධාන

25. (1) මේ පනත යටතේ නියම කරනු ලැබිය යුතු බවට නියමිත කාරණා සම්බන්ධයෙන් හෝ මේ පනත යටතේ සෑදීම සඳහා නියම කර ඇති හෝ බලය දී ඇති නියෝග අමාත්‍යවරයා විසින් සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර, එම ගැසට් පත්‍රයේ පළකරනු ලබන දින සිට හෝ එහි නිශ්චිතව දක්වනු ලබන යම් පසුව එළඹෙන දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකිරීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. පාර්ලිමේන්තුව විසින් අනුමත නොකරන ලද සෑම නියෝගයක් ම එකී අනනුමත දිනයේ සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

(4) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න වූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

26. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

# 2005 අංක 6 දරන එකතුකළ අගය මත බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2005 මාර්තු මස 30 වන දින]

2002 අංක 14 දරන එකතුකල අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

1. මේ පනත 2005 අංක 6 දරන එකතුකළ අගය මත බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය") යනුවෙන් සඳහන් කරනු ලබන, 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ —

(අ) "අනුප්‍රමාණ අනුව, එනම් :—" යන වචන වෙනුවට "අනුප්‍රමාණ අනුව 2අ වගන්තියේ විධිවිධානවලට සහ මේ පනතේ අනෙකුත් විධිවිධානවලට යටත්ව එනම්:—" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (ii) වන අනුඡේදයේ —

(1) "2004 ජනවාරි 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන යම් බදු අයකළ හැකි කාල සීමාවක් සඳහා" යන වචන වෙනුවට "2004 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව සහ

(අ) තුන්වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ සම්බන්ධයෙන්, 2004 නොවැම්බර් මස 18 වන දින ;

(ආ) තුන්වන උපලේඛනය අදාළ නොවන භාණ්ඩ සම්බන්ධයෙන් 2004 දෙසැම්බර් මස 31 වන දින,

හෝ ඊට පෙර අවසන්වන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා" යන වචන ආදේශ කිරීමෙන්.

(2) "(එහි බදු බණ්ඩය 3/23ක් වේ.) අයකරගනු ලැබිය යුතුය." යන වචන වෙනුවට "(එහි බදු බණ්ඩය 3/23ක් වේ.) අයකරගනු ලැබිය යුතුය;" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) ඒ උපවගන්තියේ (ii) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනුඡේද එකතු කිරීමෙන් :—

"(iii) 2004 නොවැම්බර් මස 19 වන දින හෝ ඊට පසු ආරම්භව 2004 දෙසැම්බර් මස 31 වන දින හෝ ඊට පෙර අවසන් වන කාලසීමාව සඳහා සහ 2005 ජනවාරි 1 වන දින හෝ ඉන්පසුව ආරම්භවන යම් බදු

අයකළ හැකි කාලසීමාවක් සඳහා, තුන්වන උපලේඛනයේ සඳහන් පරිදි වූ බදු අයකළ හැකි ශුන්‍ය අනුප්‍රමාණගත භාණ්ඩ නොවන භාණ්ඩ සැපයුම් වල හෝ ආනයනය කරන භාණ්ඩවල වටිනාකම අනුව සියයට පහක අනුප්‍රමාණය (මූලික අනුප්‍රමාණය) මත බදු අයකර ගනු ලැබිය යුතු ය. (එහි බදු ඛණ්ඩය 1/21ක් වේ) ;

(iv) 2005 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් බදු අයකළ හැකි කාලසීමාවක් සඳහා, හතර වන උපලේඛනයේ සඳහන් පරිදි වූ බදු අයකළ හැකි ශුන්‍ය අනුප්‍රමාණගත භාණ්ඩ නොවන භාණ්ඩ හා සේවා සැපයුම්වල හෝ ආනයනය කරන භාණ්ඩ වල වටිනාකම අනුව, සියයට දහඅටක අනුප්‍රමාණය (සුඛෝපභෝගී අනුප්‍රමාණය) මත බදු අයකරගනු ලැබිය යුතු ය. (එහි බදු ඛණ්ඩය 9/59ක් වේ) ; සහ

(v) 2005 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් බදු අයකළ හැකි කාලසීමාවක් සඳහා, පහත සඳහන් භාණ්ඩ සහ සේවා නොවන භාණ්ඩ හා සේවා සැපයුම් හෝ භාණ්ඩ ආනයනවල වටිනාකම අනුව සියයට පහළොවක අනුප්‍රමාණය (ප්‍රමිති අනුප්‍රමාණය) (එහි බදු ඛණ්ඩය 3/23ක් වේ) මත බදු අයකරනු ලැබිය යුතු ය :—

(අ) ශුන්‍ය ප්‍රතිශතය මත බදු අයකළ හැකි භාණ්ඩ හා සේවා ; සහ

(ආ) මේ පනතේ තුන්වන උපලේඛනයේ සහ හතරවන උපලේඛනයේ නිශ්චිතව ම සඳහන් භාණ්ඩ සහ සේවා.

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ –

(අ) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ "සපයා ඇත්නම්" යන වචන වෙනුවට "2005 ජනවාරි 1 වන දිනට පෙර යම් තේ සපයා ඇත්නම්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ "විය යුතු ය." යන වචන වෙනුවට "විය යුතු ය ;" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඇ) (i) රෙදිපිළි පංගු මණ්ඩලයේ ලියාපදිංචි ඇඟළුම් නිෂ්පාදකයන් විසින් හෝ අපනයන වෙළෙඳ ආයතන මාර්ගයෙන් හෝ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි ඇඟළුම් නිෂ්පාදකයන් විසින්, අපනයනය සඳහා ඇඟළුම් නිෂ්පාදනයේ දී ප්‍රයෝජනයට ගැනීම පිණිස, 1996 අංක 33 දරන, රෙදිපිළි පංගු මණ්ඩල පනතින් පිහිටුවන ලද රෙදිපිළි පංගු මණ්ඩලයේ අනුමතය ඇතිව, සැපයුම්කරු විසින් ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත යම් නිමිභාණ්ඩ සැපයුම මත ; හෝ

(ii) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි අපනයන වෙළඳ ආයතන මාර්ගයෙන් අපනයනය කිරීම සඳහා, 1996 අංක 33 දරන රෙදිපිළි පංගු මණ්ඩල පනතින් පිහිටුවන ලද රෙදිපිළි පංගු මණ්ඩලයේ අනුමතය ඇතිව, එම සැපයුම්කරු විසින් ශ්‍රී ලංකාවේ දී නිෂ්පාදිත නිමි ඇඟළුම් සැපයුම මත,

නිමි ඇඟළුම් නිෂ්පාදකයන්ගේ ක්‍රියාකාරකම් රෙදිපිළි පංගු මණ්ඩලය විසින් නියාමනය කරනු ලබනතාක් කල් සහ එම භාණ්ඩ බැහැර කිරීම පිළිබඳව, කොමසාරිස් ජනරාල්වරයා නියම කරන ආකාරයට ත්‍රෛමාසික පදනමක් මත රෙදිපිළි පංගු මණ්ඩලය විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත සැසඳුම් ප්‍රකාශ ඉදිරිපත් කරනතාක් සහ නිමි භාණ්ඩ එම සැපයුම් ලැබූවන් විසින් නිමි භාණ්ඩ, සත්‍ය වශයෙන්ම අපනයනය කරන ලද බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වනතාක් කල් ;

(ඈ) සැපයුම්කරුවන් විසින් ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත යම් භාණ්ඩ මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ එකඟත්වය සහිතව සහ 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය පනතින් පිහිටුවන ලද අපනයන සංවර්ධන මණ්ඩලයේ අනුමතිය ඇතිව, අපනයන කරුවන් ලෙස අපනයන සංවර්ධන මණ්ඩලයේ ලියාපදිංචි නිෂ්පාදකයන් විසින් මේ උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කාර්ය සඳහා සැපයුම් මත, නිෂ්පාදකයන්ගේ ක්‍රියාකාරකම මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ අනුමතය ඇතිව අපනයන සංවර්ධන මණ්ඩලය විසින් නියාමනය කරනු ලබනතාක් කල්, සහ එම භාණ්ඩ බැහැර කිරීම පිළිබඳ සැසඳුම් ප්‍රකාශ, කොමසාරිස් ජනරාල්වරයා නියම කර ඇති පරිදි හා කොමසාරිස්වරයා සෑහීමට පත්වන සේ අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ත්‍රෛමාසික පදනමක් මත සපයනු ලබන තාක් කල් හා එකී නිමි භාණ්ඩ එම සැපයුම් ලැබූවන් විසින් සත්‍ය වශයෙන්ම අපනයනය කරන ලද බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වනතාක් කල් ;

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ –

(අ) එහි (ඉ) ඡේදයේ "ආනයනය කරන ලද යම් නැවකට," යන වචන වෙනුවට "ආනයනය කරන ලද යම් නැවකට;" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (ඉ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :—

"(ඊ) 1996 අංක 33 දරන රෙදිපිළි පංගු මණ්ඩලය පනත යටතේ පිහිටුවන ලද රෙදිපිළි පංගු මණ්ඩලය යටතේ ලියාපදිංචි යම් තැනැත්තකු විසින්, රෙදිපිළි පංගු මණ්ඩලයේ අනුමතය ඇතිව, සහ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ හෝ ආයෝජන මණ්ඩලයේ හෝ අධීක්ෂණය යටතේ, අපනයනය පිණිස ඇගළුම් නිෂ්පාදනය කිරීමේ කාර්යය සඳහා ආනයනය කරන යම් ෆැබ්රික් හෝ උපාංග ;".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 2අ වගන්තිය ලෙස බලපවත්තේ ය :—

"අමාත්‍යවරයා විසින් නියමයක් මගින් අනුප්‍රමාණ වෙනස් කළ හැකි බව.

2අ (1) 2 වන වගන්තියේ නිශ්චය කොට දැක්වෙන අනුප්‍රමාණයන්, ඒවා එකී වගන්තිය යටතේ කලින් කල එකතු කළ අගය මත බදු පැනවීම හා සම්බන්ධ වන තාක් දුරට, ඒ කලින් දැක්වුණු අනුප්‍රමාණ වැඩි කිරීම හෝ අඩු කිරීම සඳහා වන තාක් දුරට ගැසට් පත්‍රයේ පළකරන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් වෙනස් කරනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන නියමයට අමාත්‍යවරයා අත්සන් තැබූ විට ඒ නියමය ක්‍රියාත්මක වන්නේ ය.

(3) ඒ සෑම නියමයක්ම හැකිතාක් ඉක්මණින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

(4) ඒ සෑම නියමයක්ම ඉන් පසුව පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින්, හැකිතාක් ඉක්මණින් අනුමත කරනු ලැබිය යුතු ය.

(5) එවැනි යම් නියමයක් එසේ පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු නොලැබූ අවස්ථාවක, ඒ යෝජනා සම්මතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය, එහි (ඈ) ඡේදයේ " 2002 අගොස්තු 1" යන වචන වෙනුවට "2002 අගෝස්තු 1 ට පසුව එහෙත් 2005 ජනවාරි 1 වන දිනට පෙර" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"ආනයනය කළ භාණ්ඩවල වටිනාකම.

6. ආනයනය කරන ලද භාණ්ඩවල වටිනාකම –

(අ) තීරු බදු කාර්ය සඳහා තීරණය කරන ලද භාණ්ඩවල වටිනාකම සියයට පහකින් වැඩි කළ අගය ; සහ

(ආ) ඒ භාණ්ඩ සඳහා ගෙවිය යුතු යම් තීරුබදු මුදලකට ගෙවිය යුතු අධිභාරයක්, සෙස් බද්දක්, 2002 අංක 11 දරන මුදල් පනත යටතේ ගෙවිය යුතු යම් වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්දක් හා 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ ගෙවිය යුතු යම් නිෂ්පාදන බද්දක් ද ඇතුළුව ගෙවිය යුතු මුදල් ප්‍රමාණය,

යන දෙකෙහි එකතුව විය යුතුය.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය එකී වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (vi) වන අනුඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් අනුඡේදය එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(vii) විදේශීය ගැණුම්කරුවන්ට ඇඟළුම් අපනයනය කිරීම සඳහා පහසුකම් සැලසීම පිණිස අත්‍යවශ්‍ය සේවාවක් බවට කොමසාරිස් ජනරාල්වරයා විසින් හඳුනාගනු ලබන තාක් ප්‍රමාණයට, කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි, ඇඟළුම් මිල දී ගැනීමේ කාර්යාලයක් විසින් 1996 අංක 33 දරන රෙදිපිළි පංගු මණ්ඩලය පනතින් පිහිටුවන ලද රෙදිපිළි පංගු මණ්ඩලයේ අධීක්ෂණය යටතේ, විදේශීය ගැනුම්කරුවන් සඳහා සපයනු ලබන්නා වූ සහ විදේශ ව්‍යවහාර මුදලින් බැංකුවක් මාර්ගයෙන් ගෙවීම් ලැබෙන්නා වූ සේවා සැපයීම ;".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියේ, (6) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ උපවගන්තිය, ඒ උපවගන්තියේ (අ) ඡේදය ලෙස නැවත අංකනය කිරීමෙන් ;

(2) එසේ නැවත අංකනය කළ (අ) ඡේදයේ, "මේ උපවගන්තිය යටතේ" යන වචන ආදේශ කිරීමෙන් :

(3) එසේ නැවත අංකනය කළ (6) වන උපවගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ආ) (2) වන උපවගන්තියේ කවර විධිවිධාන තිබුණ ද, එකතු කළ අගය මත බදු එකතු කිරීම විලම්බනය කරනු ලැබූ විටක, 2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ හෝ (ඇ) ඡේදය යටතේ කරන

ලද සැපයුම් වෙනුවෙන් සෑම ලියාපදිංචි තැනැත්තකුම "විලම්බනය කළ එකතු කළ අගය මත බදු යනුවෙන්" පෙන්නුම් කරනු ලබන එකතු කළ අගය මත බදු සරවකයන් සමග බදු ඉන්වොයිසියක් නිකුත් කළ යුතු ය. මේ ඡේදය යටතේ නිකුත් කරන ඉන්වොයිසියක් මේ පනතේ කාර්ය සඳහා බදු ඉන්වොයිසියක් ලෙස සලකනු නොලැබිය යුතු ය.".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය එහි (1) වන උපවගන්තියේ "අවසාන දිනට වඩා පසු නොවී" යන වචන වෙනුවට "එක් එක් බදු අය කළ හැකි කාලසීමාව අවසාන වූ පසු මාසයේ විසිවන දින පසු නොවී" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය, ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ දෙවන අතුරු විධානයට ඉක්බිතිව ම, පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" එසේම තවදුරටත්, ප්‍රවාහනයට යොදන මෝටර් වාහනයක් හෝ නිෂ්පාදනය සඳහා යොදන යන්ත්‍ර සූත්‍ර සම්බන්ධයෙන් නොවන එවැනි සැපයුමකට අදාළ ව යම් යෙදවුම් බද්දක් අඩු කිරීමට, සියයට පහක අනුප්‍රමාණය මත නිමැවුම් බද්ද ගිණුම් ගත කරන යම් තැනැත්තකුට හිමිකමක් නොමැති විය යුතු ය :

එසේම තවදුරටත්, මේ පනත යටතේ ඉඩ දෙනු ලැබිය හැකි යම් තැනැත්තකු විසින් සියයට දහඅටක අනුප්‍රමාණය මත ගෙවූ යම් යෙදවුම් බද්දක්, සියයට පහළොවකට සීමා කළ යුතු ය."

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඇ වගන්තියේ 5 වැනි උප වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ උපවගන්තියේ (උ) ඡේදයේ (ii) වන අනුඡේදයේ " 2004 ජනවාරි මස 01 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන" යන වචන වෙනුවට " 2004 ජනවාරි මස 01 වන දින ආරම්භව 2005 ජනවාරි මස 01 වන දිනට පෙර අවසන් වන" යන වචන ආදේශ කිරීමෙන්.

(2) ඒ උපවගන්තියේ (උ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(උඋ) 2005 ජනවාරි මස 01 වන දිනයෙන් ආරම්භ වන බදු අය කළ හැකි කාලසීමාව සඳහා, යම් තැනැත්තකු විසින්, සමාගමක ඒ තැනැත්තාට අයත් කොටස් විකිණීමෙන් ඒ තැනැත්තාට උපදින ලාභ හෝ ආදායම හෝ වෙනත් තැනැත්තන් විසින් එවැනි කොටස් මිල දී ගෙන විකුණනු ලැබීමට උපකාරී වන යම් තැනැත්තකුට උපදින ලාභ හෝ ආදායම වන, මේ පරිච්ඡේදයේ අර්ථානුකූල යම් "නිශ්චිත ආයතනයක හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි නොවූ එහෙත් මූල්‍ය සමාගම් සපයන එවැනි සේවාවලට සමාන සේවා සැපයීමේ යෙදී සිටින තැනැත්තකුට උපදින එවැනි ලාභ හෝ ආදායම් නොවන ලාභවලට හෝ ආදායම්".

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය, එහි "මාසයේ පහළොස්වන දිනට" යන වචන වෙනුවට "මාසයේ විසිවන දිනට" යන වචන ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තියේ එහි (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ උපවගන්තියේ දෙවන අතුරු විධානයේ " ඉඩදෙනු නොලැබිය යුතුය." යන වචන වෙනුවට " ඉඩදෙනු නොලැබිය යුතු ය ;" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) " ඉඩදෙනු නොලැබිය යුතු ය." යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

" ඉඩදෙනු නොලැබිය යුතු ය :

එසේම තවදුරටත්, ත්‍රිරෝද රථ සඳහා කල්බදු පහසුකම් සැපයීම සම්බන්ධ අවස්ථා හැර, එසේ අත්කරගත් භාණ්ඩ හෝ සේවා, බදු අයකළ හැකි සැපයුමක් කිරීමෙහි ලා භාවිත කර තිබෙන සහ ඒ වෙනුවෙන් යම් යෙදවුම් බද්දක් සඳහා හිමිකම් පෑමක් කරනු ලැබ ඊට ඉඩ දී ඇති විටක එහි දී නිදහස් කරන ලැබූ සැපයුමකට ආරෝපණය කළ හැකි නිදහස් කළ සැපයුමක් බවට පත්වන එම යෙදවුම් බද්දේ යම් කොටසක් වේ නම්, 22 වන වගන්තියේ කවර විධිවිධානයක් තිබුණ ද ඒ බදු අයකළ හැකි සැපයුම නිදහස් කළ සැපයුමක් බවට පත්වන බදු අයකළ හැකි කාලසීමාව ඇතුළත එයට ඉඩ නොහැරිය යුතු ය".

13. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ II වන කොටස පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි II (අ) කොටසේ (i) වන අයිතමයේ "අමු පොල්, පලා වර්ග" යන වචන වෙනුවට "අමුපොල්, අමු දළු ඇතුළු තේ" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එහි II (අ) කොටසේ (iv) වන අයිතමයේ "ගුවන් යානා, හෙලිකොප්ටර්, මුතු, දියමන්ති, ස්වාභාවික හෝ කෘත්‍රිම මැණික් හෝ බාල මැණික්, දියමන්ති කුඩු, අගනා ලෝහ, අගනා ලෝහ ආලේපිත ලෝහ, රන්කාසි සහ" යන වචන වෙනුවට, "ගුවන් යානා, හෙලිකොප්ටර් සහ" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) එහි IIඅ කොටසේ (x) වන අයිතමය "2004.07.01 දින සිට බලපැවැත් වේ; " යන්න වෙනුවට "2004.07.01 දින සිට බලපැවැත් වේ" යන වචන ආදේශ කිරීමෙන් ;

(4) එහි IIඅ කොටසේ (x) වන අයිතමයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් අයිතමය ඇතුළත් කිරීමෙන් :—

"(xi) කෘෂිකාර්මික බීජ, කෘෂිකාර්මික පැල, ඉස්සන් සඳහා ආහාර ඇතුළුව කුණිස්සන් සඳහා ආහාර සහ කුකුළු ආහාර හැර සත්ව ආහාර ;"

(5) එහි II ආ කොටසේ (ii) වන අයිතමයේ "කල්බදු පහසුකම් සැපයීම" යන වචන හා ඉලක්කම් වෙනුවට "කල්බදු පහසුකම් සැපයීම සහ ත්‍රිරෝද රථ සඳහා 2005 ජනවාරි 1 වන දින හෝ ඉන්පසු කල්බදු පහසුකම් වෙනුවෙන් ගෙවිය යුතු යම් බදු කුලී වෙනුවෙන් ත්‍රි රෝද රථ සඳහා කල්බදු පහසුකම් සැපයීම"

(6) එහි II (ආ) කොටසේ (iii) වන අයිතමයේ "විදුලි බලය සැපයීම," යන වචන වෙනුවට "විදුලි බලය සැපයීම සහ ජල විදුලි බලය හා තාප බලය නොවන විකල්ප මගින් විදුලි බලය සැපයීම" යන වචන ආදේශ කිරීමෙන් ;

(7) එහි II (ඇ) කොටසේ (viii)අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන් :—

"(ix) රුපියල් මිලියන එක සියයකට නොඅඩු ප්‍රාග්ධන ආයෝජනයක් බවට කොමසාරිස් ජනරාල්වරයා අනුමත කළ යම් ව්‍යාපෘතියක් සඳහා, එය ආරම්භ කිරීමේ සිට අවුරුදු තුනක් නොඉක්මවිය යුතු, ඒ ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමේ කාලසීමාව ඇතුළත භාණ්ඩාගාරයේ ලේකම්වරයා පළ කරන අකාර්ය ලැයිස්තුවේ භාණ්ඩ නොවන ව්‍යාපෘතිය හා සම්බන්ධිත ප්‍රාග්ධන භාණ්ඩ සැපයීමක් ලෙස සැලකෙන භාණ්ඩ, ඒ ව්‍යාපෘතිය සම්පූර්ණ වූ පසු එමගින් බදු අය කළහැකි සැපයුම් කිරීමට යටත්ව, සැපයීම. (2005.01.01 දින සිට බලපැවැත් වේ.)

(x) 1996 අංක 33 දරන රේඩිපිළි පංගු මණ්ඩලය පනත යටතේ පිහිටුවන ලද රේඩිපිළි පංගු මණ්ඩලයේ ලියාපදිංචි, ශ්‍රී ලංකාවේ පිහිටි යම් ඇඟළුම් මිල දී ගැනීමේ කාර්යාලය විසින් ව්‍යාපාරික කාර්ය සඳහා සපයනු ලබන ඇඟළුම් සාම්පල, ඒ අයිතම විකුණනු නොලබන තාක් කල් ;"

(8) එහි II (ඇ) කොටසට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතමය එකතු කිරීමෙන් :—

"(ඉ) විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම සඳහා, තීරුබදු රහිත සාප්පුවලට දේශීය වශයෙන් නිෂ්පාදිත භාණ්ඩ සැපයීම ;".

14. ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන උපලේඛන මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා එම ප්‍රඥප්තියේ තුන්වන හා හතරවන උපලේඛන ලෙස බලාත්මක විය යුතු ය :—

"තුන්වන උපලේඛනය (2 වන වගන්තිය)

මූලික අනුප්‍රමාණය

පහත සඳහන් ද්‍රව්‍ය සැපයීම හෝ ආනයනය –

(i) සීනි ;

(ii) පරිප්පු ;

(iii) අර්තාපල් ;

(iv) ළූනු ;

(v) කරවල ;

(vi) ළදරු කිරිපිටි හැර කිරිපිටි ;

(vii) මිරිස් ;

මේ උපලේඛනයේ (i) සහ (ii) වන අයිතමවල සඳහන් භාණ්ඩ ආනයනය හෝ සැපයීම, 2004 ඔක්තෝබර් 1 දින සිට 2004 නොවැම්බර් 18 දින දක්වා, සියලු කාර්ය සඳහා, එකතු කළ අගය මත බද්දෙන් නිදහස් ලෙස සැලකිය යුතු ය.

හතරවන උපලේඛනය (2 වන වගන්තිය)

සුඛෝපභෝගී අනුප්‍රමාණය

(අ) පහත සඳහන් භාණ්ඩ සැපයීම සහ ආනයනය –

(i) වායු සමීකරණ යන්ත්‍ර ;

(ii) ශීතකරණ ;

(iii) බඳුන් සෝදන යන්ත්‍ර ;

(iv) රෙදි සෝදන යන්ත්‍ර ;

(v) වැකුම් ක්ලීනර් සහ පොළොව ඔප දමන යන්ත්‍ර ;

(vi) මුළුතැන්ගෙයි අපද්‍රව්‍ය බැහැර කිරීමේ යන්ත්‍ර ;

(vii) ආහාර ඇඹරුම් හා මිශ්‍රක යන්ත්‍ර ;

(viii) උඳුන් සහ කුකර් ;

(ix) හෙයාර්ඩ්‍රයර් / හෙයාර් ඩ්‍රෙසිං උපකරණ ;

(x) වීඩියෝ ප්ලේයර් (වීසීඩී, ඩීවීඩී) ;

(xi) කැමරා ;

(xii) රේඩියෝ, කැසට් සහ මියුසික් සිස්ටම් ;

(xiii) රූපවාහිනී ;

(xiv) මෝටර් බයිසිකල්, බයිසිකල්, ත්‍රිරෝද රථ, සහ මගී ප්‍රවාහන බස්රථ, ලොරි, ට්‍රක් රථ, හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදා ගන්නා වෙනත් යම් වාහන හැර මෝටර් වාහන ;

(xv) අත් ඔරලෝසු / බිත්ති ඔරලෝසු ;

(xvi) සංගීත භාණ්ඩ ;

(xvii) ක්‍රීඩා සඳහා උපකරණ ;

(xviii) ස්වර්ණාභරණ ;

(xix) ඛනිජ පාන ;

(xx) මත්පැන් ;

(ආ) වෘත්තිකයන්ගේ සම්මේලන, සම්මන්ත්‍රණ හෝ වෙනත් ඒ හා සමාන කටයුතු නොවන විවාහ මංගල උත්සව සහ වෙනත් එවැනි සම්භාෂණ සඳහා හෝටල්, ආගන්තුක නිවාස, ආපන ශාලා හෝ ඒ සමාන ආයතන මගින් සේවා සැපයීම. මෙයට එවැනි සම්භාෂණ සඳහා ශාලා පහසුකම් කුලියට දීම ද ඇතුළත් වේ".

15. ප්‍රධාන ප්‍රඥප්තියේ –

(අ) 2(3) (ඊ) වගන්තියට මේ පනතේ 2 වන වගන්තියේ කරන ලද සංශෝධනය, 2005 ජනවාරි 1 වන දින දී බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය ;

(ආ) 6 වන වගන්තියට මේ පනතේ 5 වන වගන්තියෙන් කරන ලද සංශෝධනය 2005 ජනවාරි 1 වන දින දී බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය ;

(ඇ) 21 වන වගන්තියට මේ පනතේ 8 වන වගන්තියෙන් කරන ලද සංශෝධනය 2005 ජනවාරි මස 1 වන දින දී බලාත්මක වූ ලෙස සියළු කාර්ය සඳහා සැලකිය යුතු ය ;

(ඈ) 22 වන වගන්තියට –

(i) මේ පනතේ 9 වන වගන්තියේ පළමුවන අතුරු විධානයෙන් කරන ලද සංශෝධනය 2004 නොවැම්බර් මස 18 වන දින දී බලාත්මක වූ ලෙස සියළු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය ;

(ii) මේ පනතේ 9 වන වගන්තියේ දෙවන අතුරු විධානයෙන් කරන ලද සංශෝධනය 2005 ජනවාරි මස 1 වන දින දී බලාත්මක වූ ලෙස සියළු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය ;

(ඉ) 26 වන වගන්තියට මේ පනතේ 11 වන වගන්තියෙන් කරන ලද සංශෝධනය 2005 ජනවාරි මස 1 වන දින දී බලාත්මක වූ ලෙස සියළු කාර්ය සඳහා සැලකිය යුතු ය ;

(ඊ) 76 වන වගන්තියේ තුන්වන අතුරු විධානයට මේ පනතේ 11 වන වගන්තියෙන් කරන ලද සංශෝධනය 2005 ජනවාරි මස 1 වන දින දී බලාත්මක වූ ලෙස සියළු කාර්ය සඳහා සැලකිය යුතු ය.

16. 2004 අංක 13 දරන පනතේ 22 වන වගන්තිය, එහි (ඕ) අයිතමයේ (v) වන ඡේදයේ "2003 ඔක්තෝබර් 17" යන වචන හා ඉලක්කම් වෙනුවට "2003 සැප්තැම්බර් 17" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

17. 2004 නොවැම්බර් 19 වන දිනයෙන් ආරම්භව, 2004 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන කාලසීමව තුළ සහ 2005 ජනවාරි 1 වන දිනයෙන් ආරම්භව මේ පනත ක්‍රියාත්මක වන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා, මේ පනතේ විධිවිධාන සලසා තිබෙන පරිදි යම් තැනැත්තක විසින් එකතු කළ අගය මත බදු එකතු කර ගන්නේ ද ඒ තැනැත්තා නිසි බලය ඇතිව ක්‍රියා කළ සේ සැලකිය යුතුවාක් මෙන්ම එම බදු එකතු කිරීම හා සම්බන්ධව සියලු සිවිල් හෝ අපරාධ නඩුවලට එරෙහිව මෙයින් වගකීමෙන් ආරක්ෂා කරනු ලැබේ.

18. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 2005 අංක 7 දරන මුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2005 මාර්තු මස 31 වන දින]

2004 අංක 11 දරන මුදල් පනත සංශෝධනය කිරීම සඳහා ද ; මෝටර් වාහන ලියාපදිංචි කිරීමේ දී රුඳවුම් බද්දක් පැනවීම සඳහා ද ; ඊට සම්බන්ධ හා ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

1. මේ පනත 2005 අංක 7 දරන මුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1 වන කොටස

2004 අංක 11 දරන මුදල් පනතේ 1 වන කොටස සංශෝධනය කිරීම.

2. මේ කොටසේ "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන 2004 අංක 11 දරන මුදල් පනත ඒ පනතේ 1 වන කොටසේ 2 වන වගන්තියේ (3) වන උපවගන්තිය (ආර්ථික සේවා ගාස්තුවක් පැනවීම) පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ :—

(1) "යටත් විය හැකි පිරිවැටුම" යන යෙදුමේ අර්ථ නිරූපනයෙහි "යම් වෙළෙඳාමක් හෝ ව්‍යාපාරයක් හෝ වෘත්තියක් හෝ රක්ෂාවක්" යන වචන වෙනුවට "එම තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් නිෂ්පාදනය කරනු නොලැබූ හෝ සාදනු නොලැබූ එම භාණ්ඩ තොග වශයෙන් හෝ සිල්ලරට විකිණීමේ නියැලී සිටින යම් ව්‍යාපාරයක් හෝ වෙළෙඳාමක් නොවන යම් වෙළෙඳාමක්, ව්‍යාපාරයක් හෝ වෘත්තියක් හෝ රක්ෂාවක්" ; සහ

(2) "පිරිවැටුම" යන අර්ථ නිරූපණයේ (ii) වන ඡේදය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ii) යම් ප්‍රාග්ධන වත්කමක් බැහැර කිරීමෙන්, ලත් මුළු මුදල ; සහ".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ 1 වන උපවගන්තියෙහි "යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ගෙවන ලද" යන වචනවල සිට එම උපවගන්තියේ අවසානය දක්වා ඇති සියලු වචන ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් :—

"යම් තැනැත්තකු විසින් ගෙවන ලද යම් සේවා ගාස්තුවක ප්‍රමාණය (මෙහි මින් මතු "පළමුවෙන් සඳහන් කළ අදාළ තක්සේරු වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන) ඒ අදාළ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු ආදායම් බද්දක් වෙතොත් ඒ අදාළ ආදායම් බද්දෙන් අඩු කරනු ලැබිය යුතු ය.";

(2) එම වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, එම වගන්තියේ (1ආ) උපවගන්තිය ලෙස බලාත්මක විය යුතු පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1ආ) යම් අදාළ තක්සේරු වර්ෂයක් සඳහා යම් හවුල් ව්‍යාපාරයක් ලාභ හෝ පාඩු එහි හවුල්කරුවන් අතර විභාජනය කරනු ලබන අනුපාතයට ම එම හවුල් ව්‍යාපාරය විසින් ගෙවනු ලබන යම් සේවා ගාස්තුවක ප්‍රමාණය එම හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවන් අතර විභාජනය කරනු ලැබිය යුතු ය : යම් හවුල්කරුවකුට එසේ විභාජනය කර දෙනු ලැබූ සේවා ගාස්තු ප්‍රමාණය (මෙහි මින් මතු "පළමුවෙන් සඳහන් කළ අදාළ තක්සේරු වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන) එම අදාළ තක්සේරු වර්ෂය සඳහා එම හවුල්කරු විසින් ගෙවිය යුතු අදාළ ආදායම් බද්දෙන් අඩු කරනු ලැබිය යුතු ය.";

(3) එම වගන්තියේ (2) වන උපවගන්තියෙහි "(1) වන උපවගන්තියට අනුකූලව සේවා ගාස්තුව අඩුකිරීමෙන් පසුව ශේෂයක් වෙතොත්, එය (මෙහි මින් මතු "පළමුව එළඹෙන අදාළ තක්සේරු වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන) පළමුවෙන් සඳහන් කළ අදාළ තක්සේරු වර්ෂයට පසුව එළඹෙන අදාළ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින්, යන වචන වෙනුවට "(1) වන උපවගන්තියට අනුකූලව යම් තැනැත්තකු විසින් ගෙවන ලද සේවා ගාස්තු අඩුකිරීමෙන් පසුව ශේෂයක් වෙතොත්, එය (මෙහි මින් මතු "පළමුව එළඹෙන අදාළ තක්සේරු වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන) පළමුවෙන් සඳහන් කළ අදාළ තක්සේරු වර්ෂයට පසුව එළඹෙන අදාළ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තා විසින්" යන වචන ආදේශ කිරීමෙන් ;

(4) එම වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම, එම වගන්තියේ (2අ) උපවගන්තිය ලෙස බලාත්මක විය යුතු පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

(2අ) (1අ) උපවගන්තියට අනුකූලව යම් හවුල්කරුවකු වෙත විභාජනය කරදෙන ලද යම් සේවා ගාස්තුවක ශේෂයක් වෙතොත්, එම ශේෂය (1අ) උපවගන්තියට අනුකූලව අඩුකිරීමෙන් පසුව ඉතිරි කොටස (මෙහි මින් මතු "පළමුව එළඹෙන අදාළ තක්සේරු වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන) පළමුවෙන් සඳහන් කරන ලද අදාළ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන අදාළ තක්සේරු වර්ෂ සඳහා එම හවුල්කරු විසින් ගෙවිය යුතු අදාළ ආදායම් බද්දෙන් අඩුකරනු ලැබිය යුතු ය.";

(5) එම වගන්තියේ (3) වන උපවගන්තියේ "(2) වන උපවගන්තියට අනුකූලව" යන වචනවල සිට "අදාළ තක්සේරු වර්ෂය සඳහා" යන වචන දක්වා ඇති කොටස ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"(2) වන උපවගන්තිය හෝ (2අ) වන උපවගන්තිය යන උපවගන්තිවලින් කවර හෝ උපවගන්තියකට අනුකූලව අඩුකිරීමෙන් පසුව, අවස්ථාවෝචිත පරිදි ඒ සේවා ගාස්තුවේ ශේෂයේ ඉතිරි කොටසක් වෙතොත් එය (මෙහි මින් මතු "දෙවනුව එළඹෙන අදාළ තක්සේරු වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන) පළමුව එළඹෙන අදාළ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන අදාළ තක්සේරු වර්ෂය සඳහා අවස්ථාවෝචිත පරිදි එම තැනැත්තා විසින් හෝ එම හවුල් ව්‍යාපාරයේ එම හවුල්කරු විසින් ";

(6) එම වගන්තියේ (5) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(5) මේ වගන්තියේ කාර්ය සඳහා සහ යම් අදාළ තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වන විට,—

"යටත්විය හැකි පිරිවැටුමට ආරෝපණය කළ යුතු" යන්නෙන් යම් හවුල් ව්‍යාපාරයක යම් හවුල්කරුවකුගේ බෙදිය හැකි ලාභවල කොටසේ යම් කොටසක් සම්බන්ධයෙන් වන විට, යම් අදාළ තක්සේරු වර්ෂයක් සඳහා යම් හවුල් ව්‍යාපාරයක පිරිවැටුමට එම අදාල තක්සේරු වර්ෂය සඳහා එම හවුල් ව්‍යාපාරයේ යටත්විය හැකි පිරිවැටුම කවර අනුපාතයක් දරන්නේ ද, එම හවුල් ව්‍යාපාරයෙන් එම හවුල්කරු ලබන බෙදිය හැකි ලාභවල කොටසට අදාළව ඊට සමාන අනුපාතයක් දරන මුදල අදහස් වේ ;

"ගෙවිය යුතු අදාළ ආදායම් බද්ද" යන්නෙන්-

(අ) යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට එම තැනැත්තා යම් හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකු නොවන තාක් දුරට, ඒ අදාළ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු මුළු ආදායම් බදු ප්‍රමාණය, ඒ අදාළ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමට කවර අනුපාතයක් දරන්නේ ද, ඒ අදාළ තක්සේරු වර්ෂයේ පළමු දිනට පෙරාතුවම වූ මාස තිස්හයක කාල පරිච්ඡේදය ඇතුළත් වූ දිනයක, ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් හෝ නැතහොත් වෙන යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් වාණිජ කටයුතු ආරම්භ කරන ලද්දා වූ (එම තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් නිෂ්පාදනය කරනු නොලැබූ හෝ සාදනු නොලැබූ භාණ්ඩ තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් විකිණීමේ නියැළී සිටින යම් වෙළෙඳාමක් හෝ ව්‍යාපාරයක් නොවන) යම් වෙළෙඳාමක් හෝ ව්‍යාපාරයක් නැතහොත් යම් වෘත්තියක් හෝ රක්ෂාවක් හැර, එම තැනැත්තා විසින් කරගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන සෑම වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින්ම අදාළ තක්සේරු වර්ෂය සඳහා එම තැනැත්තාගේ මුළු ව්‍යවස්ථාපිත ආදායම මත ඊට සමාන අනුපාතයක් දරන මුදල අදහස් වේ;

(ආ) යම් තැනැත්තකු යම් හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකු වනතාක් දුරට, එම තැනැත්තා සම්බන්ධයෙන් වන විට, "ගෙවිය යුතු අදාළ ආදායම් බද්ද" යන්නෙන් එම අදාළ තක්සේරු වර්ෂය සඳහා යම් තැනැත්තකුගේ හෝ හවුල් ව්‍යාපාරයක මුළු ව්‍යවස්ථාපිත ආදායමට එම තක්සේරු වර්ෂය සඳහාම එම තැනැත්තා විසින් ගෙවිය යුතු සම්පූර්ණ ආදායම් බද්ද දරන අනුපාතයට කවර අනුපාතයක් දරන්නේ ද එම හවුල් ව්‍යාපාරය විසින් කරගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන සෑම වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවකට යටත් විය හැකි පිරිවැටුමට ඊට සමාන අනුපාතයක් දරන එම හවුල් ව්‍යාපාරයෙන් එම තැනැත්තාට ලැබෙන බෙදිය හැකි ලාභ කොටස්වල කොටසට අදාළ වන මුදල අදහස් වේ ;

"ගෙවිය යුතු මුළු ආදායම් බද්ද" යන්නෙන් යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, දේශීය ආදායම් පනතේ උචිත උපලේඛනයෙහි නියමිත ආදායම් බදු ප්‍රමාණය, ඒ අදාළ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ හෝ හවුල් ව්‍යාපාරයේ බදු අයකළ හැකි ආදායම සම්බන්ධයෙන් අදාළ කිරීම මගින් නිශ්චය කරගත් මුදල අදහස් වේ.".

(7) එම වගන්තියේ පැති සටහන වෙනුවට පහත සඳහන් පැති සටහන ආදේශ කිරීමෙන් :—

"අදාළ ආදායම් බද්දෙන් සේවා ගාස්තුව අඩුකළ යුතු බව"

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය, එම වගන්තියේ දැක්වෙන "xix, xx, xxi" යන ඉලක්කම් වෙනුවට "xii, xix, xx, xxi" යන ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 11අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය.

"නියෝග.11අ. (1) නියම කරනු ලැබිය යුතු යයි මේ පනතේ මේ කොටස මගින් නියමිත සියලු කරුණු සම්බන්ධයෙන් හෝ නියෝග සෑදීමට මේ පනතේ මේ කොටස යටතේ නියම කර ඇති හෝ බලය දී ඇති කරුණු සම්බන්ධයෙන් හෝ අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) විශේෂයෙන්ම සහ (1) වන උපවගන්තිය මගින් පවරා ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොවන පරිදි, 2 වන වගන්තියේ (3) වන උපවගන්තියේ ඇති "පිරිවැටුම" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඇති අතුරු විධානය අදාළ නොවන අවස්ථා සම්බන්ධයෙන්, යෙදෙන විට එම "පිරිවැටුම" යන යෙදුමේ අර්ථය තහවුරුකර ගැනීමට අදාළ මාර්ගෝපදේශ නිශ්චිතව දක්වමින් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එය පළ කරනු ලබන දින සිට හෝ එහි නිශ්චිතව සඳහන් කරනු ලබන පසු දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක් ම, එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සළකනු ලැබිය යුතු නමුත් එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් සිදු නොවිය යුතු ය.

(5) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ බවට සළකනු ලබන දිනය පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) "අනුයෝජිතයා", "ක්ෂයවීම සඳහා වූ දීමනාව" හා "තක්සේරුකරු" යන යෙදුම්වල අර්ථ නිරූපණය වෙනුවට "අනුයෝජිතයා", "ක්ෂය වීම සඳහා වූ දීමනාව", "තක්සේරුකරු" හා "සමාගම" යන යෙදුම්වල අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් ;

(2) "ආයෝජන මණ්ඩල ව්‍යවසාය" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් :—

"ආයෝජන මණ්ඩල ව්‍යවසාය" යන්නෙන් යම් අදාළ තක්සේරු වර්ෂයකට අදාළව ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ, යම් ව්‍යවසායක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ඇති කර ගත් යම් ගිවිසුමක් ප්‍රකාරව, තම ලාභ සහ ආදායම ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබ ඇති අදාල ආදායම් වර්ෂය තුළ හෝ එහි යම් කොටසක් තුළ පවතින ව්‍යවසායක් අදහස් වේ;

(3) "තැනැත්තා" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් :—

"තැනැත්තා" යන්නට සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වන නමුත්, ඊට—

(අ) ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතේ අර්ථානුකූලව, යම් ලියාපදිංචි සමිතියක්;

(ආ) යම් ගුවන් යානයක් හෝ නැවක අයිතිකරුවකු හෝ කුලියට ගත් තැනැත්තකු ලෙස ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යන යම් අනේවාසික තැනැත්තකු,

ඇතුළත් නොවේ.

7\. (1) (2) වන උපවගන්තියට යටත්ව මේ පනතේ 1 වන කොටසේ විධිවිධාන 2005 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන බවට සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(2) පහත දැක්වෙන විධිවිධාන, සියලු කාර්ය සඳහා 2004 අප්‍රේල් මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ බවට සලකනු ලැබිය යුතු ය :—

(අ) මේ පනතේ 3 වන වගන්තියේ (1), (2), (3), (4), (5), සහ (6) යන අයිතම මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියට කරන ලද සංශෝධනය ; සහ

(ආ) මේ පනතේ 6 වන වගන්තියේ (2) වන උපවගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියට කරන ලද සංශෝධනය.

## II වන කොටස

### අලුත් IIIඅ කොටස ඇතුළත් කිරීම සඳහා 2004 අංක 11 දරන මුදල් පනත සංශෝධනය කිරීම.

8\. 2004 අංක 11 දරන මුදල් පනතේ 28 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් කොටස මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ IIIඅ කොටස (28අ, 28ආ, 28ඇ සහ 28ඈ වගන්ති) ලෙස බලාත්මක විය යුතු ය :—

"IIIඅ වන කොටස

මෝටර් වාහන ලියාපදිංචි කිරීමේ දී රුඳවුම් බද්දක් පැනවීම

මෝටර් වාහන මත රුඳවුම් බද්දක් පැනවීම.

28අ. (1) පොදු ප්‍රවාහන සේවා සැපයීම සඳහා පමණක් ම භාවිතා කරනු ලබන ත්‍රීරෝද රථ, ලොරි සහ බස් රථ හැර, (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ විධිවිධානවලට අනුකූලව මෝටර් වාහන කොමසාරිස්වරයා විසින් ලියාපදිංචි කරනු ලබන සෑම මෝටර් වාහනයක් සම්බන්ධයෙන්ම 2005 අප්‍රේල් මස 1 වන දින සිට බලපවත්වන පරිදි, 28ආ වගන්තියේ නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණවලට අනුකූලව රුඳවුම් බද්දක් පනවනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා "මෝටර් වාහනය" යන්නට (203 වන අධිකාරිය වූ) මෝටර් වාහන පනතේ දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ ගෙවිය යුතු රුඳවුම් බද්ද ඉල්ලුම්කරුවකු විසින් ගෙවනු ලැබ ඇත්නම් මිස මෝටර් වාහන කොමසාරිස්වරයා විසින් යම් වාහනයක් සම්බන්ධයෙන් ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් නොකළ යුතු ය. මේ වගන්තිය යටතේ ගෙවන ලද යම් බදු මුදලක්, ඉල්ලුම්කරු වෙත සහතිකයක් නිකුත් කිරීම මගින් යථා පරිදි භාර ගත යුතු ය.

බද්ද ගණන් බැලිය යුතු අනුප්‍රමාණය.

28ආ. 28අ වගන්තිය යටතේ පනවනු ලබන රුඳවුම් බද්ද පහත සඳහන් ආකාරයට එකතු කරනු ලැබිය යුතු ය :—

(අ) මෝටර් වාහනයක පළමු ලියාපදිංචිය සඳහා රුපියල් පන්දහසක මුදලක් ; සහ

(ආ) අනෙක් සෑම ලියාපදිංචියක් සඳහා ම රුපියල් එක්දහසක මුදලක්.

එකතු කර ගන්නා මුදල් භාණ්ඩාගාර ලේකම්වරයා වෙත ප්‍රේෂණය කළ යුතු බව.

28ඇ. මේ කොටස ප්‍රකාරව රුඳවුම් බද්ද වශයෙන් මෝටර් රථ කොමසාරිස්වරයා විසින් එකතු කර ගනු ලබන මුදල්, ඔහු විසින් එසේ බදු මුදල් එකතු කර ගත් මාසයට පසුව එළඹෙන මාසයේ 15 වන දිනට පෙර කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතු අතර, ඒ සමග ඔහු විසින් එකතු කරන ලද මුදල් පිළිබඳ වාර්තාවක් ද යවනු ලැබිය යුතු ය.

රඳවුම් බද්ද ආදායම් බද්දෙන් අඩුකළ යුතු බව.

28ඈ. පනතේ මේ කොටස යටතේ රඳවුම් බද්ද ගෙවන ලද යම් තැනැත්තකුට, ඒ තැනැත්තා විසින් දේශීය ආදායම් පනත යටතේ ගෙවිය යුතු ආදායම් බද්දෙන්, එම රඳවුම් බද්ද අඩු කිරීමට හිමිකමක් තිබිය යුතු ය.".

III වන කොටස

2004 අංක 11 දරන මුදල් පනතේ උපලේඛනයට කරන ලද සංශෝධනය

9. (1 වන කොටස යටතේ අය කළ යුතු සේවා ගාස්තුවල අනුප්‍රමාණයට අදාලව) 2004 අංක11 දරන මුදල් පනතේ උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම උපලේඛනයේ 2 වන අයිතමයෙහි "ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ගිවිසුමකට එළඹ ඇති" යන වචන වෙනුවට "යම් ආයෝජන මණ්ඩල ව්‍යවසායක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම උපලේඛනයේ 4 වන අයිතමයෙහි "යම් වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින්" යන වචන වෙනුවට (අලෙවිකරුවකු විසින් නිෂ්පාදනය කරනු නොලැබූ හෝ සාදනු නොලැබූ භාණ්ඩ තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් අලෙවි කිරීමේ නියැලී සිටින යම් වෙළෙඳාමක් හෝ ව්‍යාපාරයක් නොවන) යම් වෙළඳාමකින් හෝ ව්‍යාපාරයකින් හෝ වෘත්තියකින් හෝ රක්ෂාවකින් " යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) එම උපලේඛනයේ 4 වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන් :—

"5. අලෙවිකරුවකු විසින් නිෂ්පාදනය කරනු නොලැබූ හෝ සාදනු නොලැබූ භාණ්ඩ තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් අලෙවි කිරීමේ නියැලී සිටින යම් වෙළෙඳාමකින් හෝ ව්‍යාපාරයකින් ලැබෙන පිරිවැටුම ඇතුළත් වන පරිදි, යටත් වන පිරිවැටුමේ යම් කොටසක්. ". සියයට 0.5.

10. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 2005 අංක 8 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2005 මාර්තු මස 31 වන දින]

2000 අංක 38 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

1. මේ පනත 2005 අංක 8 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 2004 අංක 12 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (උ උ) ඡේදයේ "සුදු ක්‍රීඩාවකින් දිනුම් ලැබීම් ; සහ" යන වචන වෙනුවට "සුදු ක්‍රීඩාවකින් දිනුම් ලැබීම" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) එම වගන්තියේ (උ උ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(උ උ උ) රාජ්‍ය නොවන සංවිධානයක් සම්බන්ධයෙන් වන විට 2005 අප්‍රේල් මස 01 වන දින හෝ එදිනට පසුව ප්‍රදාන, පරිත්‍යාග හෝ දායක මුදල් හෝ වෙනත් යම් ආකාරයකින් එම සංවිධානය වෙත ලැබුන යම් මුදලක් ; සහ"

3. 2003 අංක 37 දරන පනත මගින් සංශෝධිත පරිදි ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ (1) උප වගන්තිය පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (1) වන උප වගන්තියේ (ඈ) ඡේදයේ අතුරු විධානයෙහි "එසේ වුව ද" යන වචනවල සිට එම අතුරු විධානයේ අවසානය දක්වා ඇති වචන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"එසේ වුව ද,

(අ) 2005 මාර්තු 31 දින හෝ එදිනට පෙර (අ) ඡේදයේ සඳහන් ලාභවල එකතුව රුපියල් එක්ලක්ෂ පනස් දහසක් නොඉක්මවන අවස්ථාවක, රුපියල් එක් ලක්ෂ විසිදහසකට වැඩි කුලී වටිනාකමේ යම් අතිරික්තයක් ; සහ

(ආ) 2004 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා (අ) ඡේදයේ සඳහන් ලාභවල එකතුව රුපියල් එක් ලක්ෂ පනස් දහසකට වැඩි වන අවස්ථාවක, රුපියල් එක් ලක්ෂ අසූ දහසකට වැඩි කුලී වටිනාකමේ අතිරික්තයක්,

නොසලකා හැරිය යුතු ය ; සහ ;"

(2) එම උප වගන්තියේ (ඉ) ඡේදයෙහි —

(අ) එම ඡේදයේ පළමුවන අතුරු විධානයට ඉක්බිතිවම ඇති ඡේදයෙහි "එම ලාභ ඒ තක්සේරු වර්ෂය සඳහා XII වන පරිච්ඡේදයේ අර්ථානුකූලව වූ එකම බදු අය කළ හැකි ආදායමය" යන වචන වෙනුවට "එම ලාභ ඒ තක්සේරු වර්ෂය සඳහා VII වන පරිච්ඡේදයේ අර්ථානුකූලව වූ එකම බදු අය කළහැකි ආදායමය" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

4. 2004 අංක 12 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ (අ) ඡේදය පහත දැක්වෙන පරිදි තව දුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම ඡේදයේ (Lxxvii) අනුඡේදයෙහි "ශ්‍රී ලංකා බදුකරන කාර්යායතනය" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා බදුකරන කාර්යායතනය ;" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) එම ඡේදයේ (Lxxvii) අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අනුඡේදය එකතු කිරීමෙන් :—

"(Lxxviii) ද නෝඩික් ආයෝජන බැංකුව"

5. 2003 අංක 37 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (ආ) ඡේදයේ "නිල පඩිනඩි, වශයෙන්–" යන වචන වෙනුවට "2005 අප්‍රේල් මස 01 වැනි දින හෝ එදිනට පෙර ආරම්භ වූ යම් තක්සේරු වර්ෂයක් සඳහා නිල පඩි නඩි, වශයෙන් -" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම උප වගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ආආ) 2005 අප්‍රේල් මස 01 වැනි දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා නිල පඩිනඩි වලින් හරි අඩක් වශයෙන් —

(i) ජනරජය යටතේ යම් වැටුප් ලබන ධුරයක් දරන යම් පුද්ගලයකුට ඒකාබද්ධ අරමුදලින් ගෙවීම ;

(ii) පාර්ලිමේන්තුව විසින් යම් රාජ්‍ය සංස්ථාවකට වාර්ෂිකව ඒකාබද්ධ අරමුදලින් සම්මත කරනු ලබන මුදල්වලින් සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසකින් සේවා නියුක්තිය වෙනුවෙන් පඩිනඩි හෝ විශ්‍රාම වැටුප හෝ එම ලාභ ගෙවන රාජ්‍ය සංස්ථාවක් වන යම් රාජ්‍ය සංස්ථාවක යම් සේවා නියුක්තයකුට ;

(iii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ආ) ව්‍යවස්ථාව යටතේ යම් පලාතක් සඳහා පත් කරන ලද ආණ්ඩුකාරවරයාට ගෙවීම් ;

(iv) යම් පළාත් සභාවක යම් මන්ත්‍රීවරයකුට ගෙවීම් ;

(v) යම් පළාත් සභාවක යම් සේවා නියුක්තයකුට හෝ යම් පළාත් රාජ්‍ය සේවයක යම් නිලධරයකුට ගෙවීම් ;

(vi) යම් පළාත් පාලන ආයතනයක යම් සභිකයකුට ගෙවීම් ;

(vii) යම් පළාත් පාලන ආයතනයක යම් සේවා නියුක්තයකුට ගෙවීම් ;

(viii) 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත මගින් පිහිටුවන ලද හෝ පිහිටුවන ලදැයි සළකනු ලබන යම් විශ්ව විද්‍යාලයක යම් සේවා නියුක්තයකුට ගෙවීම් ;

(ix) 1988 අංක 53 දරන ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ සේවා නියුක්තයකුට ගෙවීම් ;

(x) සියලුම සාමාජිකයන් ජනාධිපතිවරයා විසින් හෝ අමාත්‍යවරයකු විසින් හෝ පත්කරනු ලබන මණ්ඩලයක් හෝ පරීක්ෂණ කොමිෂන් සභාවක් වන, යම් පනතක් මගින් හෝ යම් පනතක් යටතේ පිහිටුවන ලද යම් මණ්ඩලයක හෝ පරීක්ෂණ කොමිෂන් සභාවක සාමාජිකයකුට හෝ සේවා නියුක්තයකුට ගෙවීම ;".

සහ යම් තැනැත්තකු විසින් හෝ වෙනත් තැනැත්තකු විසින් (i) වන, (iii) වන, (iv) වන, (v) වන, (vi) වන, (vii) වන, (viii) වන, හෝ (ix) වන විෂයයන්හි සඳහන් පුද්ගලයකු හෝ සේවා නියුක්තයකු ආණ්ඩුකාරවරයා හෝ සාමාජිකයකු වශයෙන් මේ පනත ආරම්භවීමට පෙර හෝ පසුව හෝ වුවද ඉටු කරන ලද ඉකුත් සේවා සම්බන්ධයෙන් ඒ තැනැත්තාට ලැබුනු එවැනි යම් විශ්‍රාම වැටුපක් හෝ යම් ලාභයක් 4 වන වගන්තියෙහි (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයෙහි සඳහන් සේවා නියුක්තියෙන් ලැබුනු යම් ලාභ. ";

(3) එම උපවගන්තියේ (ජ) ඡේදයෙහි "යම් සේවා නියුක්තයකුගේ සේවා යෝජක විසින්", යන වචන වෙනුවට "2005 අප්‍රේල් මස 1 දින හෝ එදිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් සේවා නියුක්තයකුගේ සේවායෝජක විසින් -" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(4) එම උපවගන්තියේ (ජ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුලත් කිරීමෙන් :-

"(ජජ) 2005 අප්‍රේල් මස 1 දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා -

(i) කොමසාරිස්වරයාගේ මතය අනුව එම සේවා යෝජකයා විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබ ඇති සියලුම සේවා නියුක්තයන්ට ඒකාකාරී ලෙස අදාළ වන යෝජනා ක්‍රමයකට අනුකූලව එම සේවා නියුක්තයා ස්වේච්ඡාවෙන් විශ්‍රාම යාමේ ; හෝ

(ii) කම්කරු කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලද යෝජනා ක්‍රමයකට අනුකූලව එම සේවා යෝජකයාගේ සේවය අහිමිවීමේ,

ප්‍රතිඵලයක් වශයෙන් යම් ධූරයක් හෝ රැකියාවක් අහිමිවීම සඳහා වන්දි මුදලක් වශයෙන් එම සේවා නියුක්තයාට ගෙවන ලද යම් මුදලකින් රුපියල් මිලියන දෙකක් නොඉක්මවන යම් කොටසක්.".

6. 2004 අංක 12 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (ඉ) ඡේදයෙහි "ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමතිය ඇතිව යම් තැනැත්තකු විසින් හෝ ඔහු වෙනුවෙන් යම් වානිජ බැංකුවක විවෘත කරන ලද", යන වචන වෙනුවට "ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය ඇතිව යම් තැනැත්තකු විසින් හෝ ඔහු වෙනුවෙන් යම් වානිජ බැංකුවක හෝ යම් විශේෂිත බැංකුවක හෝ විවෘත කරන ලද" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (ඌ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :—

"(එ) 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත මගින් පිහිටුවන ලද ජාතික ඉතිරි කිරීමේ බැංකුව මගින් හෝ (397 වන අධිකාරය වූ) ලංකා බැංකු ආඥා පනත මගින් පිහිටුවනු ලැබූ ලංකා බැංකුව විසින් හෝ 1971 අංක 29 දරන මහජන බැංකු පනත මගින් පිහිටුවනු ලැබූ මහජන බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා වූ යම් විශේෂිත තැන්පතු ක්‍රමයකින් 2005 අප්‍රේල් මස 1 වැනිදින හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක 1 වන දිනයේ දී වයස අවුරුදු 60 ට වැඩි වූ ද, ශ්‍රී ලංකාවේ පුරවැසියකු වූ ද, නේවාසිකයකු වූ ද, යම් පුද්ගලයකුට එම තක්සේරු වර්ෂය තුළ දී උපචිත වූ පොලියෙන් රුපියල් එක් ලක්ෂයකට වැඩි නොවන යම් කොටසක්.".

7. 2004 අංක 12 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (i) ඡේදයෙහි "කොටස් හිමියකුට ගෙවන ලද ලාභාංශයක්", යන වචන වෙනුවට "ඒකක දරන්නකුට ගෙවන ලද ලාභාංශයක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

8. 2003 අංක 37 දරන පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියේ (1 අ) උප වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

"(1 අ) යම් නිවසක් 2003 අප්‍රේල් මස 1 වැනි දින හෝ ඉන්පසුව ඉදිකරනු ලැබ ඇති අවස්ථාවක, ඒ නිවස හුදෙක් වාසික කාර්ය සඳහා යොදා ගෙන ඇත්නම්, ඒ නිවාස ඉදිකිරීම සම්පූර්ණ කළ තක්සේරු වර්ෂයට හා ඉන් ඉක්බිතිවම එළඹෙන අනුක්‍රමික තක්සේරු වර්ෂ හතර සඳහා ඒ නිවසේ අයිතිකරුට උපචිතවන ආදායම, ආදායම් බද්දෙන් නිදහස් වන්නේ ය :

එසේ වුව ද, එම නිවසේ බිම් ප්‍රමාණය වර්ග අඩි එක් දහස් පන්සියයක් හෝ ඊට අඩු වන අවස්ථාවක, ඒ නිවස ඉදිකිරීම සම්පූර්ණ කළ තක්සේරු වර්ෂයට හා ඉන් ඉක්බිතිව ම එළඹෙන අනුක්‍රමික තක්සේරු වර්ෂ හය සඳහා 2005 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව එම නිවසේ අයිතිකරුට උපචිත වන ආදායම, ආදායම් බද්දෙන් නිදහස් වන්නේ ය.".

9. 2004 අංක 12 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය මෙයින් තවදුරටත් පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (එ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(එ) (i) 2005 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වූ යම් තක්සේරු වර්ෂයක් සඳහා රත්, මැණික් හෝ ස්වර්ණාභරණ විකිණීමෙන් ;

(ii) 2005 අප්‍රේල් මස 1 වැනි දින හෝ ඉන්පසුව, ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රත්, මැණික්, හෝ ස්වර්ණාභරණ අපනයනය කිරීමෙන්,

යම් තැනැත්තකුට උපචිත වන 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව වූ යම් ලාභ හා ආදායම්";

(2) ඒ වගන්තියේ (නන) ඡේදය වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(නන) 2004 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වී 2004 දෙසැම්බර් මස 31 වැනි දිනයෙන් අවසන් වන කාලය සඳහා බැහැර කිරීම සිදු වී ඇත්තේ අත්කර ගැනීමට අවුරුදු දෙකකට පසුව වන අවස්ථාවක, යම් කොටසකට හෝ ප්‍රසාද කොටසක් හෝ කොටස් බලපත්‍රයක් ඇති අයිතියක් ඇතුළුව යම් කොටසක් විකිණීමෙන්, ඒකක භාරයක් හෝ අන්‍යොන්‍ය අරමුදලක් නොවන යම් තැනැත්තකුට උද්ගත වන හෝ උපචිත වන යම් ලාභයක්;"; සහ

(3) එම වගන්තියේ (නන) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(නනන) 2005 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී 2005 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන කාලය සඳහා සහ 2005 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා 2005 අංක 5 දරන මුදල් පනතේ 7 වන වගන්තිය යටතේ කොටස් ගනුදෙනු බද්ද අයකරනු ලැබ ඇති හෝ විකිණීම සිදු වී ඇත්තේ අත්කර ගැනීමේ දින සිට අවුරුදු දෙකකට පසුව වන අවස්ථාවක, යම් කොටසක්, කොටසකට ඇති අයිතියක්, ප්‍රසාද කොටසක් හෝ කොටස් බලපත්‍රයක් විකිණීමෙන් යම් ඒකක භාරයක් හෝ අන්‍යොන්‍ය අරමුදලක් හෝ යම් ව්‍යවසාය ප්‍රාග්ධන සමාගමක් හැර යම් තැනැත්තකු විසින් හෝ හවුල් ව්‍යාපාරයක් විසින් උපයනු ලබන යම් ලාභ හෝ එම තැනැත්තාට හෝ හවුල් ව්‍යාපාරයට උපචිත වන යම් ලාභ ;".

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 16 අ වගන්තිය ලෙස බලාත්මක විය යුතුය :—

"ශ්‍රී ලංකාවෙන් පිටතදී උපයනු ලබන ලාභ සහ ආදායම නිදහස් කිරීම.

16අ. මේ පනතේ වෙනත් යම් විධිවිධානවලට පටහැනිව කුමක් සඳහන්වුව ද, ශ්‍රී ලංකාවේ අනේවාසිකයකු වන එහෙත් ශ්‍රී ලංකාවට පැමිණ එහි නැවතී සිටින යම් පුද්ගලයකු විසින්, එම පුද්ගලයා ශ්‍රී ලංකාවට පැමිණි අවස්ථාවේදී සහ එහි නැවතී සිටින සම්පූර්ණ කාලය තුල ඔහු ශ්‍රී ලංකාවේ සහ වෙනත් රටක යන රටවල් දෙකේ ම පුරවැසියකු නම්, ඔහු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත දී උපයන ලද ලාභ සහ ආදායම්, ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතුය.".

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 17 අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :—

"කෘෂිකාර්මික ව්‍යවසායවලින් ලැබෙන ලාභ සහ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

17 අ.(1) (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබෙන යම් ලාභයක් සහ ආදායමක් හැර) යම් කෘෂිකාර්මික ව්‍යවසායකින් ලැබෙන ලාභ සහ ආදායම, 2005 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ සිට ගණන් බලනු ලබන අවුරුදු පහක කාලයක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතුය.

(2) (1) වන උපවගන්තියේ කාර්යයන් සඳහා "කිසියම් කෘෂිකාර්මික ව්‍යවසායකින් වූ ලාභ සහ ආදායම්" යන්නෙන්, ඉඩම් වගා කිරීමකින් සහ ඒ වගා කිරීමෙන් වූ නිෂ්පාදන විකිණීමෙන් ලබන ලාභ සහ ආදායම් අදහස් වේ :

එසේ වුව ද, ඉඩම් වගා කිරීමෙන් ලත් නිෂ්පාදන එක් ව්‍යවසායක් කරගෙන යන අතරතුර දී වූ යම් නිෂ්පාදන හෝ සැකසුම් ක්‍රියාවලියකට යටත් වන්නා වූ අවස්ථාවක දී, ඒ නිෂ්පාදනය එම විකිණීම සිදු වූ අවස්ථාවේ දී පැවති විවෘත වෙළෙඳපලේ මිලට අනුව නිෂ්පාදනය කිරීම සඳහා හෝ සකස් කිරීම සඳහා විකුණනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඉඩම් වගා කිරීමෙන් සහ ඒ වගාවෙන් වූ නිෂ්පාදන විකිනීමෙන් ලත් ලාභ සහ ආදායම් එසේ උද්දේශිත විකුණුම්වලින් උපදින ලාභ සහ ආදායම් ලෙස සලකනු ලැබිය යුතුය.

12. 2004 අංක 12 දරන පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තියේ "යම් තැනැත්තකු විසින්" යන වචනවල සිට ඒ වගන්තියේ අවසානය දක්වා වූ වචන වෙනුවට, "යම් තැනැත්තකු විසින් 1977 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව, ඒ තැනැත්තා විසින් ඉදි කිරීම ආරම්භ කරන ලද හතරැස් අඩි දෙදහසකට වඩා වැඩි නොවූ ගෙබිම් වර්ග ප්‍රමාණයක් ඇත්තා වූ යම් නිවාසයක් හෝ තට්ටු නිවාසයක් 2005 මාර්තු මස 31 වැනි දින හෝ එදිනට පෙර හෝ විකුණන අවස්ථාවක, ඒ විකිණීම, ඒ නිවාසයේ හෝ තට්ටු නිවාසයේ පළමුවන විකිනීම වන විට, ඒ විකිණීමෙන් උද්ගත වන ලාභවලින් සහ අදායමින් සියයට හැත්තෑපහක් ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතුය." යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

13. 2004 අංක 12 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 21 අ වගන්තියේ (4) වන උප වගන්තියේ (iii) වන ඡේදයෙහි "සාම්ප්‍රදායික නොවන නිෂ්පාදන", යන වචන වෙනුවට "සාම්ප්‍රදායික නොවන නිෂ්පාදන" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

14. 2004 අංක 12 දරන පනත මගින් සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (ආආ) ඡේදයෙහි —

(අ) එම ඡේදයේ (i) අනුඡේදයේ,

"වර්ෂයකට සියයට විසිපහක අනුප්‍රමාණයට;", යන වචන වෙනුවට පහත දැක්වෙන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් :—

"වර්ෂයකට සියයට විසිපහක අනුප්‍රමාණයට :

එසේ වුව ද, 2005 අප්‍රේල් මස 01 වැනි දින හෝ එදිනට පසුව අත්කර ගත් මෘදුකාංග සම්බන්ධයෙන් වන විට–

(අ) එම මෘදුකාංග ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලැබූ මෘදුකාංග වන අවස්ථාවක, අනුප්‍රමාණය සියයට සියයක් විය යුතුය ; සහ

(ආ) එම මෘදුකාංග, ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත මෘදුකාංග නොවන වෙනත් මෘදුකාංග වන අවස්ථාවක, අනුප්‍රමාණය සියයට විසිපහක් විය යුතුය.

(ආ) එම ඡේදයේ (vi) වන උප ඡේදයේ "1978 අංක 41" යන වචන වල සිට "තුනෙන් දෙකක අනුප්‍රමාණය:" යන වචන දක්වා වූ සියලුම වචන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් :—

"(vi) යම් සුදුසුකම් ලැබූ ගොඩනැගිල්ලක් 1978 අංක 41 දරන නාගරික සංවර්ධන පනත මගින් පිහිටුවනු ලැබූ නාගරික සංවර්ධන අධිකාරිය විසින් අනුමත කරනු ලැබුවා වූ ද, වාණිජ ඒකකයක් ලෙස භාවිතා කිරීම සඳහා ඉදි කරන ලදුව අත්කර ගත්තා වූ ද, සභාධිපත්‍ය දේපලකට යම් ඒකකයක් හෝ යම් වෙළෙඳාමක් හෝ ව්‍යාපාරයක් සඳහා එම ගොඩනැගිල්ල භාවිතා කළ තැනැත්තකුගෙන් අත්කර ගත් යම් (හෝටල් ගොඩනැගිලි සංකීර්ණයක් ඇතුළුව) හෝටල් ගොඩනැගිල්ලක් හෝ (කාර්මික ගොඩනැගිලි සංකීර්ණයක් ඇතුළුව) යම් කාර්මික ගොඩනැගිල්ලක් අවස්ථාවෝචිත පරිදි, ඉදිකිරීමේ වියදම හෝ අත්කර ගැනීමේ වියදම මත සියයට හයයි තුනෙන් දෙකක අනුප්‍රමාණය :"; සහ

(ඇ) එම ඡේදයට ඇති අතුරු විධානයෙහි "(v) වන අනුඡේදවල හෝ මේ අනුඡේදයේ" යන වචන වෙනුවට "(v) හෝ (vi) වන අනුඡේදවල" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (ක)ඡේදයේ අතුරු විධානයේ (1ඇ) අනු ඡේදයට ඉක්බිතිවම ඇති ඡේදයේ "(1අ) (1ආ), (1ඇ) අනු ඡේදවල" යන වචන වෙනුවට "(1අ), (1ආ) සහ (1ඇ) අනු ඡේදවල සහ මේ අනුඡේදයේ" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) එම වගන්තියේ 3 (ආ) උපවගන්තිය, (3 ආ) උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන්,

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම උපවගන්තියේ (ඇ) ඡේදයේ –

(අ) "23 වන වගන්තියේ (1) වන උපවගන්තියේ" යන වචන වෙනුවට "2004 මාර්තු මස 31 වන දිනට පෙරාතුව 23 වන වගන්තියේ (1) වන උපවගන්තියේ" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) එම ඡේදයට ඇති අතුරු විධානයෙහි "2002 අප්‍රේල් මස 01 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2002 අප්‍රේල් මස 01 වැනි දින හෝ එදිනට පසු ආරම්භ වන එහෙත් 2005 අප්‍රේල් මස 01 වන දිනට පෙරාතුව වූ යම් තක්සේරු වර්ෂයක දී" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) එම උප වගන්තියේ (ඇ) ඡේදයෙන් –

(අ) "(ii) 23 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ක) ඡේදයේ", යන වචන වෙනුවට "(ii) 2005 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව, 23 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ක) ඡේදයේ" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) එම ඡේදයට ඇති අතුරු විධානයේ "2004 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයකදී", යන වචන සහ ඉලක්කම් වෙනුවට "2002 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන එහෙත් 2005 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව වූ යම් තක්සේරු වර්ෂයකදී" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(3) එම උපවගන්තියේ (ඉ) ඡේදයට ඇති අතුරු විධානයේ "2002 අප්‍රේල් මස 1 වැනි දින හෝ ඉන් පසුව", යන වචන සහ ඉලක්කම් වෙනුවට "2002 අප්‍රේල් මස 1 වැනි දින හෝ එදිනට පසුව එහෙත් 2005 අප්‍රේල් මස 1 වැනි දිනට පෙරාතුව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(4) එම වගන්තියේ (ඊ) ඡේදයෙහි "2002 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයකදී", යන වචන සහ ඉලක්කම් වෙනුවට "2002 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයකදී එහෙත් 2005 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පෙරාතුව ආරම්භ වූ යම් තක්සේරු වර්ෂයකදී"යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(5) එම වගන්තියේ (ඕ) ඡේදයේ (iv) අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අනුඡේද ඇතුළත් කිරීමෙන් :—

"(v) 2004 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව 2004 අංක 11 දරන මුදල් පනත යටතේ අයකරන ලද යම් ආර්ථික සේවා ගාස්තුවක් ;

(vi) 2005 අප්‍රේල් මස 1 වැනි දින හෝ එදිනට පසුව 2004 අංක 13 දරන සංශෝධිත පනතින් ඇතුල් කරන ලද 2003 අංක 12 දරන එකතු කළ අගය මත බදු පනතේ IIIඅ පරිච්ඡේදය යටතේ අයකරනු ලැබූ මුලා සේවා මත වූ එකතු කළ අගය මත බද්දක් ;

(vii) 2005 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව අයකරනු ලැබූ 2005 අංක 5 දරන මුදල් පනතේ පළමුවන උපලේඛනයේ (4) වන අයිතමයේ සඳහන් යම් සමාජ වගකීම් බද්දක් ;"; සහ

(6) එම උපවගන්තියේ අවසානයට පහත දැක්වෙන අලුත් ඡේද එකතු කිරීමෙන් :—

"(න) යම් භාණ්ඩ හෝ බඩුවල අපනයන වෙළෙඳාමට අදාළව පමණක් හෝ විදේශ විනිමයවලින් මුදල් ගෙවීම සඳහා වූ යම් සේවයක් සැලසීමට අදාළව පමණක් ශ්‍රී ලංකාවෙන් පිටත දී දරන ලද වෙළෙඳ ප්‍රචාරක දැන්වීම් සඳහා වූ වියදම් හැර, 2005 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයකදී එම තැනැත්තා විසින් කරගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන යම් වෙළෙඳාමකට, ව්‍යාපාරයකට, වෘත්තියකට හෝ රක්ෂාවකට අදාළව එම තැනැත්තාගේ වෙළෙඳ ප්‍රචාරක දැන්වීම් ගාස්තුවලින් හරි අඩක් ;

(ප) 2005 අප්‍රේල් මස 01 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ලාභය සහ ආදායම පිළිබඳව සඳහන් කරමින් අනේවාසික සමාගමක, යම් වෙළෙඳාමකින් හෝ ව්‍යාපාරයකින් ලැබුන ව්‍යවස්ථාපිත ආදායම ගණන් බලනු ලැබූ යම් කාලසීමාවකදී දරන ලද ප්‍රධාන කාර්යාල වියදම්වල ස්වභාවයෙන් යුක්ත වූ වියදම් වන එම සමාගම විසින් ශ්‍රී ලංකාව තුළ සිදු කරන ලද යම් වෙළෙඳාමක දී හෝ ව්‍යාපාරයක දී දරන ලද යම් වියදමක්.

මේ ඡේදයේ කාර්යය සඳහා "ප්‍රධාන කාර්යාල වියදම්" යන යෙදුමට මේ පනතේ 24අ වගන්තියේ ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය.".

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 24අ වගන්තිය ලෙස බලාත්මක විය යුතුය :—

"යම් අනේවාසික සමාගමක් විසින් දරනු ලබන ප්‍රධාන කාර්යාල වියදම් අඩු කිරීම.

24අ. (1) 2005 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී ශ්‍රී ලංකාවේ යම් වෙළෙඳාමක් හෝ ව්‍යාපාරයක් පවත්වාගෙන යන යම් අනේවාසික සමාගමක් විසින් ප්‍රධාන කාර්යාල වියදම් වශයෙන් යම් වියදමක් දරනු ලබන අවස්ථාවක දී—

(අ) එම වියදම් ප්‍රමාණය ; හෝ

(ආ) එම ලාභයෙන් හෝ ආදායමෙන් සියයට දහයකට සමාන මුදලක්,

හෝ ඊට අඩු මුදලක් එම වෙළෙඳාමෙන් හෝ ව්‍යාපාරයෙන් එම තක්සේරු වර්ෂය සඳහා එම සමාගමේ ලාභවලින් සහ ආදායමින් අඩු කරනු ලැබිය යුතුය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා අනේවාසික සමාගමක් සම්බන්ධයෙන් සහ යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වන විට "ප්‍රධාන කාර්යාල වියදම්" යන්නෙන් -

(අ) එම සමාගමේ ශ්‍රී ලංකාවෙන් පිටත යම් කාර්යාලයක සේවයේ නියුක්ත හෝ සමාගමේ කටයුතු කළමනාකරණය කරන සෑම සේවා නියුක්තයකුගේ ම සහ සේවයේ නියුක්ත වෙනත් සෑම තැනැත්තකුගේ ම, සේවා නියුක්තියෙන් ලැබෙන සම්පූර්ණ ලාභවල මුලු එකතුව හා එම සේවා නියුක්තයන්ගේ සහ තැනැත්තන්ගේ මුළු ගමන් වියදම් සංයුක්ත වන්නා වූ ද ;

(ආ) (i) ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටි යම් පරිශ්‍රයක් සම්බන්ධයෙන් ; සහ

(ii) සියලු අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගැනීමේ දී සලකා බැලීම සාධාරණ බවට සහ වානිජ වශයෙන් යුක්තිසහගත බවට කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබිය හැකි විධායක සහ සාමාන්‍ය පරිපාලන කටයුතුවලට සම්බන්ධ වෙනත් සියලු කාරණා,

ඇතුළත් වූ, එම සමාගම විසින් ශ්‍රී ලංකාවෙන් පිටත දී දරන ලද විධායක හා සාමාන්‍ය පරිපාලන වියදම් අදහස් වේ.".

17. 2004 අංක 12 දරන පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (1අ) උපවගන්තියෙහි -

(අ) (අ) ඡේදයෙහි "පොලීවලින් ලත් ව්‍යවස්ථාපිත ආදායම, සහ", යන වචන වෙනුවට "පොලීවලින් ලත් ව්‍යවස්ථාපිත ආදායම" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) එම උපවගන්තියේ (ආ) ඡේදයෙහි "ව්‍යවස්ථාපිත ආදායම" යන වචන වෙනුවට "ව්‍යවස්ථාපිත ආදායම; සහ" යන වචන ආදේශ කිරීමෙන් ;සහ

(ඇ) එම උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් -

(ඇ) (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද යම් සුරැකුම්පතක් හෝ භාණ්ඩාගාර බැඳුම්කරයක් මත හෝ (417 වන අධිකාරය වූ) භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත් මත හෝ (422 වන අධිකාරය වූ)මුදල් නීති පනත යටතේ නිකුත් කරන ලද ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් මත සිදු වූ ද්විතීය වෙළෙඳපල ගණුදෙනුවක් සම්බන්ධයෙන් යම් පුද්ගලයකුට උපදින හෝ උපචිත වන පොලියෙන් සහ ප්‍රාථමික වෙළෙන්දකුගෙන් 122 අ වගන්තිය යටතේ බදු අඩු කරනු ලැබූ පොළියෙන් ලැබෙන ව්‍යවස්ථාපිත ආදායම ;";

(2) එම වගන්තියේ (1ආ) උපවගන්තියෙහි "(1අ) සහ (1ආ) උපවගන්තිවල කාර්ය සඳහා,", යන වචන වල සිට එම ඡේදයේ අවසානය දක්වා ඇති සියලු වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් :—

"මේ වගන්තියේ (1අ) සහ (1ආ) උපවගන්තිවල කාර්ය සඳහා –

"පොලී ආදායම" යන්නෙන් මේ වගන්තියේ (1ආ) උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් සුරැකුම්පතක් හෝ සාධන පත්‍රයක් නිකුත් කරන්නකු විසින් එම සුරැකුම් පත්‍රයේ හෝ වෙනත් සාධන පත්‍රයේ කල්පිරීමේ කාලසීමාවට අතිරික්තව එය දරන්නා විසින් එම සුරැකුම්පත හෝ වෙනත් සාධන පත්‍රය දරා සිටීමේ කාලසීමාවට අනුපාතිකව එම සුරැකුම්පත හෝ සාධන පත්‍රය නිකුත් කරන්නා විසින් ලබා දී ඇති පොලී හෝ වට්ටම් පිළිබඳ සමානුපාතික ප්‍රමාණයක් අදහස් වේ ;

"ප්‍රාථමික වෙළෙඳපොල ගනුදෙනුව" යන්නෙන් (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥා පනත යටතේ නිකුත් කරන ලද යම් සුරැකුම්පතක් හෝ භාණ්ඩාගාර බැඳුම්කරයක් නැතහොත් (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගර බිල්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පතක් හෝ (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ නිකුත් කරන ලද ශ්‍රී ලංකා මහබැංකුවේ සුරැකුම්පත් එම සුරැකුම්පත් භාන්ඩාගාර බිල්පත් හෝ බැඳුම්කර මුලින් ම නිකුත් කරනු ලැබූ අවස්ථාවේ දී යම් වට්ටම් මුදලක් හෝ පොලී මුදලක් ගෙවීමට යටත්ව යම් ප්‍රාථමික වෙළෙන්දකු විසින් මිලදී ගැනීම අදහස් වේ ;

"ද්විතීය වෙළෙඳපල ගනුදෙනුව" යන්නෙන් මේ වගන්තියේ (1ආ) උපවගන්තියේ (ආ) අනුඡේදයේ සඳහන් යම් සුරැකුම්පත් හෝ වෙනත් සාධන පත්‍ර අත්කර ගෙන ඇති යම් ප්‍රාථමික වෙළෙන්දකු විසින් ඒවා විකිණීම හෝ එම සුරැකුම්පත් මුලින් නිකුත් කිරීමෙන් පසුව හෝ ඒවා අත්කර ගැනීමේ දින සිට එක් දිනකට වැඩි කාලයක් සඳහා එම සුරැකුම්පත් හෝ සාධන පත්‍ර දැරීමෙන් පසු නැවත මිලදී ගැනීමෙන් හෝ ආපසු නැවත මිලදී ගැනීම අදහස් වේ.";

(3) එම වගන්තියේ (2) වන උපවගන්තියේ -

(අ) (අඅඅ) ඡේදයේ (iv) අනුඡේදයේ ඇති "පොලිය" යන වචනයේ අර්ථ නිරූපණයෙහි (i) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(i) 2004 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව යම් නිවසක් ඉදිකිරීම සඳහා හෝ මිලදී ගැනීම සඳහා හෝ නැතහොත් යම් නිවසක් ඉදි කිරීම සඳහා යම් ඉඩම් ප්‍රමාණයක් මිලදී ගැනීම සඳහා;";

(ආ) එම වගන්තියේ (ඊ) ඡේදයෙහි–

(i) "එම වර්ෂය සඳහා සම්පූර්ණ ව්‍යවස්ථාපිත ආදායමින් සියයට තිස්පහක උපරිම සීමාවක් දක්වා ගනු ලැබිය හැකි අතර එසේ අඩුකරගත නොහැකි යම් පාඩුවක් ඊළඟ තක්සේරු වර්ෂය සඳහා සහ ඉන් ඉදිරියට ගෙන යා හැකිය:"; යන වචන වෙනුවට "එම වර්ෂය සඳහා -

(අ) (1අ) උපවගන්තියේ සඳහන් පොලියෙන් සහ ලාභාංශවලින් ලැබෙන ව්‍යවස්ථාපිත ආදායම ;

(ආ) (1ආ) උපවගන්තියේ සඳහන් යම් පොලී ආදායමක් ; සහ

(ඇ) (1ඇ) උපවගන්තියේ සඳහන් යම් තෑගි මුදලක්, දඩයක කොටසක්, යම් ලොතරැයි දිනුමක සහ ගෙවිය යුතු වන්දි මුදලක් මත වූ පොලියක්,

හැර ඉතිරි සම්පූර්ණ ව්‍යවස්ථාපිත ආදායමින් සියයට තිස් පහක උපරිම සීමාවක් දක්වා අඩුකර ගනු ලැබිය යුතු අතර, එසේ අඩුකර ගත නොහැකි යම් පාඩුවක් ඊළඟ තක්සේරු වර්ෂය සඳහා සහ ඉන් ඉදිරියටත් ගෙන යා හැකිය :";

(ii) එම ඡේදයේ අතුරු විධානයේ (iii) වන අයිතමයේ "කිසිම පාඩුවක් එම දිනයෙන් පසු උපචිත වන ආදායමෙන් අඩු කරනු නොලැබිය යුතුය;" යන වචන වෙනුවට "කිසිම පාඩුවක් එසේ බුන්වත් භාවයට පත්වීම ප්‍රකාශයට පත්කිරීමෙන් පසු උපචිත වන ආදායමෙන් අඩු කරනු නොලැබිය යුතුය;" යන වචන ආදේශ කිරීමෙන් ;"; සහ

(4) ඒ වගන්තියේ (2අ) උපවගන්තියේ —

"(2) වන උප වගන්තියේ (ආ), (ඇ), (ඈ) සහ (ඉ) ඡේදවල විධිවිධාන", යන වචන සහ ඉලක්කම් වෙනුවට (2) "වන උපවගන්තියේ (ආ), (ඇ), (ඈ), සහ (ඉ) ඡේදවල හෝ (4) වන උපවගන්තියේ හෝ (5) වන උපවගන්තියේ (ඈ) ඡේදයේ (i) සහ (iii) වන අනුඡේදවල හෝ (6), (7) සහ (8) වන උපවගන්තිවල විධිවිධාන" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

18. 2004 අංක 12 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ අතුරු විධානයෙහි "මුදලින් හැර අන්‍යාකාරයකින් 2004 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව කරන ලද යම් පරිත්‍යාගයක රුපියල් මිලියන දෙකක් ඉක්මවා", යන වචන සහ ඉලක්කම් වෙනුවට "මුදලින් හැර අන්‍යාකාරයකින් 2004 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව එහෙත් 2005 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව කරන ලද යම් පරිත්‍යාගයක රුපියල් මිලියන දෙකක් ඉක්මවා", යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්,

(2) එම වගන්තියේ (4) වන උපවගන්තියේ (අ) ඡේදයේ–

(අ) ඒ ඡේදයේ (i) වන අනුඡේදය වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :—

(i) (අ) 2004 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර අවසන් වන යම් තක්සේරු වර්ෂයකදී ඔහු විසින් කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන (2) වන උපවගන්තියේ (ආ), (ඈ), (උ), (ඌ), (එ), (ඒ) සහ (ඔ) යන ඡේදවල සඳහන් ; සහ

(ආ) 2004 අප්‍රේල් මස 1වන දින හෝ එදිනට පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයකදී ඔහු විසින් කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන (2) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ), (ඉ), (උ), (ඌ), (එ), (ඒ), සහ (ඔ) ඡේදවල සඳහන්,

සුදුසුකම් ලැබීමේ ගෙවීම් හැර, අනෙක් සියලු ලබන ගෙවීම් සම්බන්ධයෙන් එකී තක්සේරු කල හැකි ආදායමෙන් තුනෙන් එකක් හෝ රුපියල් විසිපන් දහසක් යන දෙකෙන් වඩා අඩු වන්නා වූ මුදල නොඉක්ම විය යුතුය ;";

(ආ) ඒ ඡේදයේ (iii) අනුඡේදයේ "ඒ තක්සේරු වර්ෂය තුළ ඒ තැනැත්තා විසින් කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන", යන වචන සහ ඉලක්කම් වෙනුවට "2004 මාර්තු 31 වන දිනට පෙරාතුව ඔහු විසින් කරන ලද හෝ ඒ තක්සේරු වර්ෂය තුළ ඔහු විසින් කරන ලදැයි සලකනු ලබන" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(ඇ) ඒ ඡේදයේ (v) වන අනුඡේදය වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :—

"(v) සියලු සුදුසුකම් ලබන ගෙවීම්වල එකතුව සම්බන්ධයෙන් -

(අ) 2004 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර සිදුකරන ලද සහ (2) වන උපවගන්තියේ (අ), (ඇ), (ඈ), (ඉ), සහ (ඊ) ඡේදවල සඳහන් සියලු සුදුසුකම් ලැබීමේ ගෙවීම්වල එකතුව වෙනුවෙන්, රුපියල් විසිපන්දහසක් නොඉක්මවිය යුතුය ; සහ

(ආ) 2004 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසු සිදුකරන ලද සහ (2) වන උපවගන්තියේ (අ), (ඉ), සහ (උ) ඡේදවල සඳහන් සියලු සුදුසුකම් ලැබීමේ ගෙවීම්වල එකතුව වෙනුවෙන් රුපියල් හැත්තෑපත් දහසක් හෝ තක්සේරු කල හැකි ආදායමෙන් තුනෙන් එකක් නොඉක්මවිය යුතුය ;" සහ

(3) (6අ) උපවගන්තියේ "(2) වන උපවගන්තියේ (එ) හෝ (ඒ) ඡේදවල", යන වචන සහ ඉලක්කම් වෙනුවට "(2) වන උපවගන්තියේ (එ) ඡේදයේ", යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් .

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 38 ඈ වගන්තියේ "ආදායම් බද්දට යටත් විය යුතුය." යන වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"ආදායම් බද්දට යටත් විය යුතුය :

එසේ වුව ද, 2005 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව යම් කොටස් විකිණීමක් සම්බන්ධයෙන් 2005 අංක 5 දරන මුදල් පනතේ 7 වන වගන්තිය යටතේ කොටස් ගනුදෙනු බද්ද ගෙවනු ලැබ ඇත්නම්, එම විකිණීම සම්බන්ධයෙන් මේ වගන්තියේ විධිවිධාන අදාල නොවිය යුතුය.".

20. 2003 අංක 37 දරන පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තියේ (2) වන උපවගන්තියේ, (අ) ඡේදයේ (ii) වන අනු ඡේදය වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

"(ii) මේ පනතේ 17 අ වගන්තියේ විධිවිධානවලට යටත්ව, කවර හෝ විස්තරයකට අයත් ශාක වලින් ඉඩමක් වගා කිරීම; සහ.;".

21. 2004 අංක 12 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 48 අ වගන්තියේ "11 වන වගන්තියේ (අ), (ආ), (ඇ), (ඈ), (ඉ), (ඊ), (උ) සහ (ඌ) ඡේදවල", යන වචන සහ ඉලක්කම් වෙනුවට "11 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ), (ඈ), (ඉ), (ඊ), (උ) සහ (ඌ) ඡේදවල", යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

22. 2004 අංක 12 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 52 අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "2003 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන", යන වචන සහ ඉලක්කම් වෙනුවට "2003 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2005 මාර්තු මස 31 වන දිනට පෙරාතුව ආරම්භ වන" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ "2003 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන", යන වචන සහ ඉලක්කම් වෙනුවට "2003 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු එහෙත් 2005 මාර්තු මස 31 වන දිනට පෙරාතුව ආරම්භ වන" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

23. 2004 අංක 12 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඉ) ඡේදයෙහි "(1) වන උප වගන්තියේ (අ) ඡේදය යටතේ", යන වචන වෙනුවට "මේ උපවගන්තියේ (අ) ඡේදය යටතේ" යන වචන ආදේශ කිරීමෙන්.

24. 2004 අංක 12 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තියේ "2004 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2002 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වූ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

25. ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "(1)පස් දෙනෙකුට වැඩි නොවන තැනැත්තන් සංඛ්‍යාවක් විසින් පාලනය කරනු ලබන සමාගමක් සම්බන්ධයෙන් වූ විට, යම් තක්සේරු වර්ෂයක් සඳහා සමාගම තම ලාභවලින් සාධාරණ කොටස් තම කොටස්කරුවකුට බෙදා දී නැති බවට තක්සේරුකරු සෑහීමට පත් වූ අවස්ථාවක,", යන වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් :-

"(1) (අ) 2005 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පෙර ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් තැනැත්තන් පස් දෙනෙකුට වැඩි නොවන සංඛ්‍යාවක් විසින් පාලනය කරනු ලබන සමාගමක් සම්බන්ධයෙන් වන විට ; හෝ

(ආ) 2005 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන්, යම් සමාගමක් සම්බන්ධයෙන් වන විට,

යම් තක්සේරු වර්ෂයක් සඳහා සමාගම තම ලාභවලින් සාධාරණ කොටස් තම කොටස්කරුවකුට බෙදා දී නැති බවට තක්සේරුකරු සෑහීමට පත්වූ අවස්ථාවක," යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එම වගන්තියේ (7) වන උප වගන්තිය ඉවත් කිරීමෙන්.

26. ප්‍රධාන ප්‍රඥප්තියේ 72 අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උප වගන්තියේ "එම බදු ගෙවනු ලැබිය යුතුය.", යන වචන වෙනුවට "එම බදු ගෙවනු ලැබිය යුතුය :

එසේ වුවද, 2004 අංක 11 දරන මුදල් පනත යටතේ ගෙවන ලද ආර්ථික සේවා බද්ද, මෙම උපවගන්තිය යටතේ ගෙවිය යුතු ආදායම් බද්දට වඩා වැඩි නම්, 2005 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා (1) වන උපවගන්තියෙහි සඳහන් ආදායම් බද්ද ගෙවීම අදාල නොවිය යුතු ය :

එසේම තවදුරටත්, (1) වන උප වගන්තිය යටතේ ගෙවිය යුතු ආදායම් බද්ද, 2004 අංක 11 දරන මුදල් පනත යටතේ ගෙවන ලද ආර්ථික සේවා බද්දට වඩා වැඩි නම්, ගෙවිය යුතු ආදායම් බද්දෙන් එම තක්සේරු වර්ෂය සඳහා ගෙවන ලද ආර්ථික සේවා බද්ද අඩු කරනු ලැබිය යුතු ය."; සහ

(2) එම වගන්තියේ (3) වන උපවගන්තියේ "එම හවුල් ව්‍යාපාරය විසින් ගෙවනු ලබන ආර්ථික සේවා ගාස්තුවලට එරෙහිව", යන වචන වෙනුවට "එම හවුල් ව්‍යාපාරය විසින් ගෙවනු ලබන 2004 අංක 11 දරන මුදල් පනත යටතේ ගෙවනු ලබන ආර්ථික සේවා ගාස්තුවලට එරෙහිව" යන වචන ආදේශ කිරීමෙන්.

27. ප්‍රධාන ප්‍රඥප්තියේ 96 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුලත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 96අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :-

"රාජ්‍ය නොවන සංවිධානවල ලාභ සහ ආදායමෙන් ආදායම් බදු අයකල යුතු බව.

96අ. (1) මේ වගන්තියේ (2) වන උපවගන්තියේ අර්ථ නිරූපනය කර ඇති පරිදි යම් රාජ්‍ය නොවන සංවිධානයකට, 2005 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී ප්‍රදාන, පරිත්‍යාග, දායක මුදල් හෝ වෙනත් යම් ආකාරයකින් යම් මුදලක් ලැබෙන අවස්ථාවක, මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද, එම මුදලින් සියයට තුනකට සමාන මුදලක් එම තක්සේරු වර්ෂය සඳහා රාජ්‍ය නොවන සංවිධානයේ මුළු ලාභ සහ ආදායම ලෙස සලකනු ලැබිය යුතු අතර එම ලාභ සහ ආදායම ශ්‍රී ලංකාවේ දී උපචිත වූ ලෙස සලකනු ලැබිය යුතුය.

(2) (1) වන උප වගන්තියේ කාර්ය සඳහා "රාජ්‍ය නොවන සංවිධානයක්" යන්නෙන් රාජ්‍ය නොවන ස්වභාවයකින් යුත් ස්වේච්ඡා පදනමක් මත පුද්ගල කණ්ඩායමක් විසින් පිහිටුවනු ලැබුවා වූ ද, දේශීය වශයෙන් හෝ යම් විදේශ රටකින් නැතහොත් යම් විදේශීය හෝ දේශීය සංවිධානයකින් ලැබෙන ප්‍රදාන, පරිත්‍යාග, දායක මුදල් හෝ වෙනත් යම් ආකාරයකින් ලැබුණු මුදල් මත යැපෙන්නා වූ ද, දුප්පත් හා අසරණ අයට ද, රෝගී තැනැත්තන්ට, අනාථ දරුවන්ට සහ වැන්දඹුවන්ට, යෞවනයන්ට සහ ළමයින්ට සහ සාමාන්‍යයෙන් ව්‍යසන අවස්ථාවන්හි දී අවශ්‍ය පුද්ගලයන්ට සහන සැලසීම සඳහා ස්ථාපිත කරනු ලැබුවා වූ හෝ පිහිටුවනු ලැබුවා වූ ද, මේ වගන්තියේ කාර්ය සඳහා රාජ්‍ය නොවන සංවිධානයක් වශයෙන් කොමසාරිස්ජනරාල් වරයා විසින් තීරණය කරනු ලබන්නා වූ ද, යම් සංවිධානයක් හෝ සංගමයක් අදහස් වේ.".

(3) රාජ්‍ය නොවන සංවිධානයක ලාභවලින් සහ ආදායමින් මේ පනතේ හය වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උචිත අනුප්‍රමාණවලට අනුව ආදායම් බදු අය කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද, යම් රාජ්‍ය නොවන සංවිධානයක්-

(අ) තත් කාර්ය සඳහා රජය විසින් හඳුනාගනු ලැබූ යම් ප්‍රදේශයක අවතැන්වූ තැනැත්තන්ට පුනරුත්ථාපන කටයුතු සහ යටිතල පහසුකම් සහ ජීවනෝපාය පහසුකම් සලසන කටයුතුවල පමණක් නියැලී සිටින බවට ; හෝ

(ආ) යම් ව්‍යසනයක ස්වභාවය සහ බරපතලකම සහ ඒ අනුව ලබා දිය යුතු සහනවල ප්‍රමාණය සැලකිල්ලට ගෙන, මානුෂික ස්වභාවයෙන් යුක්ත බවට අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන වෙනත් යම් ක්‍රියාකාරකමක පමණක් නියැලී සිටින බවට,

කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයා විසින් එම තක්සේරු වර්ෂය සඳහා එම රාජ්‍ය නොවන සංවිධානය විසින් ගෙවිය යුතු බදු මුදල ප්‍රේෂනය කරනු ලැබිය හැකිය.".

28. 2004 අංක 12 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 98 වන වගන්තිය පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (1ඇ) උපවගන්තියේ (ආ) ඡේදයේ "එම කාලය ඇතුලත ප්‍රකාශයට පත් කරන ලද ප්‍රේෂණ මුදල් කිසිවක් නොමැති", යන වචන වෙනුවට "එම කාලය ඇතුලත කිසිදු මුදලක් ප්‍රේෂණය නොකරන ලද" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එම වගන්තියේ (1ඇ) උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුලත් කිරීමෙන් :-

"(1ඈ) (අ) 2005 අප්‍රේල් මස 1 වන දින හෝ ඊදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් ඇතුලත් මේ උපවගන්තියේ (ආ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති නියමයන් පහෙන් යම් නියමයන් හතරක් සපුරාලන යම් පුද්ගලයකු විසින් එසේ නියමයන් සපුරාලීමේ දින සිට එක් මාසයකට නොවැඩි කාලයක් ඇතුලත කොමසාරිස් ජනරාල්වරයා වෙත ආදායම් පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ආ) මේ වගන්තියේ (අ) ඡේදයේ කාර්ය සඳහා එම නියමයන් පහත දැක්වෙන පරිදි වේ :—

(i) රුපියල් දස දහයකට වැඩි ශුද්ධ මුදල් ප්‍රමාණයක් මාසික නේවාසික විදුලි බිල්පතක් වශයෙන් ගෙවීම ;

(ii) මාසයකට රුපියල් විසිපන්දහසකට වැඩි මුදලක් මාසික ක්‍රෙඩිට් කාඩ් බිල්පතක් වශයෙන් වැය කිරීම ;

(iii) රුපියල් දස දහසකට වැඩි ශුද්ධ මුදලක් මාසිකව නිවාස දුරකථන බිල්පතක් වශයෙන් ගෙවීම ;

(iv) පිටරට යාම සඳහා ගුවන් ටිකට් පතක් මිලදී ගැනීම ; සහ

(v) ගමනාගමන කටයුතු සඳහා භාවිතා කරනු ලබන මෝටර් වාහනයක අයිතිකරුව සිටීම.".

(1ඉ) මේ පනතේ යම් විධිවිධානයක් යටතේ ආදායම් බදු ගෙවීමට යටත් වන සෑම තැනැත්තෙක් ම—

(අ) 2005 අප්‍රේල් මස 1 වන දින හෝ ඊදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක අවසාන දිනයේ දී, සෑම වත්කම් හා බැරකම්වලම වටිනාකම; සහ

(ආ) 2005 අප්‍රේල් මස 1 වන දින හෝ ඊදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා මේ පනත යටතේ ආදායම් බදු ගෙවීමෙන් නිදහස් කරනු ලැබූ යම් ලාභ හෝ ආදායම පිළිබඳව,

ප්‍රකාශයක් කල යුතු ය.".

**29**. ප්‍රධාන ප්‍රඥප්තියේ 104 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (ආ) ඡේදයේ "අවස්ථාවක ; හෝ", යන වචන වෙනුවට "අවස්ථාවක;" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම උපවගන්තියේ (ඇ) ඡේදයේ "පැහැර හරින අවස්ථාවක,", යන වචන වෙනුවට "පැහැර හරින අවස්ථාවක; හෝ" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) එම උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඈ) 2005 අප්‍රේල් මස 1 වන දින හෝ ඊදිනට පසුව 98 වන වගන්තියේ (1 ඈ) උපවගන්තියේ සඳහන් කාලය ඇතුළත, එම වගන්තිය යටතේ එම තැනැත්තා විසින් ඉදිරිපත් කල යුතු වාර්තාව ඉදිරිපත් කිරීමට අපොහොසත් වී ඇති යම් තැනැත්තෙක්,".

**30**. ප්‍රධාන ප්‍රඥප්තියේ XIV පරිච්ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් පරිච්ඡේදය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ XIVඅ පරිච්ඡේදය ලෙස බලාත්මක විය යුතු ය :—

"XIVඅ පරිච්ඡේදය

ආණ්ඩුවේ ආයතනයක් විසින් ආදායම් බදු ගෙවීමට අදාල විධිවිධාන

ආණ්ඩුවේ ආයතනයක් විසින් එහි සේවා නියුක්තයන්ගේ ආදායම් බදු ගෙවීම.

121අ. (1) මේ පනතේ XIII වන සහ XIV වන පරිච්ඡේදවල සහ 2 වන වගන්තියේ කුමක් සඳහන් වුව ද, 2005 අප්‍රේල් මස 1 වන දින හෝ ඊදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ආණ්ඩුවේ ආයතනයක යම් සේවා නියුක්තයකුගේ නිල පරිශ්‍රමිකවල දෙකෙන් කොටසක්ම අදාල කළ හැකි ආදායම් බද්ද, නිල පාරිශ්‍රමිකවල එම කොටස 30 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් දීමනාවට සමාන මුදලක් ඉක්මවා යන්නේ නම් එම ආණ්ඩුවේ ආයතනය විසින් ගෙවනු ලැබිය යුතු ය :

එසේ වුව ද, එම ආදායම් බද්දෙන් කිසිම කොටසක් එම සේවා නියුක්තයාට ආපසු ගෙවීම හෝ එම සේවා නියුක්තයා විසින් ගෙවිය යුතු යම් බද්දකට එරෙහිව හිලව් කිරීම හෝ නොකළ යුතු ය.";

(2) මේ පනතේ 4 වන වගන්තියේ කුමක් සඳහන් වුව ද, ආණ්ඩුවේ ආයතනයක් යම් සේවා නියුක්තියකුගේ නිල පාරිශ්‍රමිකවල දෙකෙන් කොටසකට අදාල කල හැකි වූ ආදායම් බද්ද, ඒ සේවා නියුක්තිකයාගේ සේවා නියුක්තියෙන් ලබන ලද ලාභවලින් කොටසක් සංයුක්ත කරනු ලබන ලෙස සලකනු නොලැබිය යුතු ය.

(3) (1) වන උප වගන්තියේ කාර්යයන් සඳහා "ආණ්ඩුවේ ආයතනයක යම් සේවා නියුක්තිකයකුගේ නිල පරිශ්‍රමිකවල දෙකෙන් කොටසකට අදාල කළ හැකි ආදායම් බද්ද" යන්නෙන්, යම් සේවා නියුක්තිකයකුගේ පරිශ්‍රමිකවල දෙකෙන් කොටසක් මත, 30 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් කරන ලද දීමනාවට සමාන මුදලක් එයින් අඩු කිරීමෙන් පසුව, මේ පනතේ පළමුවන උපලේඛනයේ, 1 ඈ කොටසේ නිශ්චිතව සඳහන් කරන ලද අනුප්‍රමාණයන්ට ගණනය කල, ආදායම් බද්ද අදහස් වේ.

(4) මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා :—

"ආණ්ඩුවේ ආයතනය" යන්නෙන් මේ පනතේ 9 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආආ) ඡේදයේ සඳහන් කරනු ලැබුවා වූ ජනරජය යටතේ යම් ගෙවීම් කරනු ලබන ධූරයක් දරන පුද්ගලයන් සේවයේ නියුක්ත කරනු ලබන යම් ආයතනයක් හෝ පුද්ගල මණ්ඩලයක්, රාජ්‍ය සංස්ථාවක්, පළාත් සභාවක්, පළාත් පාලන ආයතනයක්, විශ්ව විද්‍යාලයක්, මණ්ඩලයක් හෝ කොමිෂන් සභාවක් අදහස් වේ ; සහ

"නිල පඩිනඩි" යන්නෙන් විශ්‍රාම වැටුප හැර, ලබාදෙන සේවය සඳහා, ලැබෙන 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ නිශ්චිතව දැක්වෙන සේවා නියුක්තියකින් ලැබෙන ලාභ, අදහස් වේ.".

**31**. 2004 අංක 12 දරන පනතින් අවසන් වරට සංශෝධනය කරන ලද ප්‍රධාන ප්‍රඥප්තියේ 122 ආ වගන්තියේ (1) වන උපවගන්තියේ "2002 නොවැම්බර් මස 1 වන දිනට පෙර හෝ ඉන් පසුව දායක වන යම් මුදල් ප්‍රමාණයක්", යන වචන සහ ඉලක්කම් වෙනුවට "2002 නොවැම්බර් මස 1 වන දිනට හෝ ඉන් පසුව එහෙත් 2005 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව, දායක වන යම් මුදල් ප්‍රමාණයක්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

**32**. 2004 අංක 12 දරන පනතින් අවසන් වරට සංශෝධනය කරන ලද ප්‍රධාන ප්‍රඥප්තියේ 123 අ වගන්තියේ "යම් සුරැකුම්පතක්, බැඳුම්කරයක් හෝ බිල් පත්‍රයක් 2002 අප්‍රේල් 1 වන දිනට පෙර නිකුත් කර ඇත්තා වූ අවස්ථාවක, ඒ පොලී ආදායම", යන වචන වෙනුවට "යම් සුරැකුම්පතක්, බැඳුම්කරයක් හෝ බිල්පත්‍රයක්, ඒ පොලී ආදායම" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

**33**. 2004 අංක 12 දරන පනතින් අවසන් වරට සංශෝධනය කරන ලද ප්‍රධාන ප්‍රඥප්තියේ 123 ආ වගන්තියේ (3) වන උපවගන්තියේ "අවස්ථාවෝචිත පරිදි, 122 අ හෝ 22 ආ වගන්ති", යන වචන වෙනුවට "ගෙවන විට හෝ බැර කරන විට, අවස්ථාවෝචිත පරිදි 122 අ හෝ 122 ආ වගන්ති" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

**34**. ප්‍රධාන ප්‍රඥප්තියේ 124 ආ වගන්තියේ (1) වන උපවගන්තියේ "හෝ වෙනත් සමාගමකින් පොලී ආදායම අඩුකර ගනු ලබන්නේ යම් පුද්ගලයකුගෙන් ද ඒ පුද්ගලයා හැර වෙනත් තැනැත්තකුගේ", යන වචන වෙනුවට "හෝ වෙනත් සමාගමක් පොලී ආදායම අඩුකර ගනු ලබන්නේ යම් පුද්ගලයකුගෙන්ද, ව්‍යාපාරික ආදායමක් ලෙස පොලී ආදායමක් ලබන සමාගමක් වන යම් තැනැත්තකු හෝ වෙනත් යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**35**. ප්‍රධාන ප්‍රඥප්තියේ 129 අ වගන්තියේ "144 වන වගන්තියේ (3අ) උපවගන්තියෙහි", යන වචන සහ ඉලක්කම් වෙනුවට "144 වන වගන්තියේ (3) වන උපවගන්තියෙහි" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**36**. 2004 අංක 12 දරන පනතින් අවසන් වරට සංශෝධනය කරන ලද ප්‍රධාන ප්‍රඥප්තියේ 132 අ වගන්තියේ දෙවන අතුරු විධානයේ "එම තැනැත්තා යටත් විය යුතු ය.", යන වචන වෙනුවට "එම තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය යටත් විය යුතු ය.", යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

**37**. ප්‍රධාන ප්‍රඥප්තියේ 132 ආ වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ ඡේදයේ (i) වන අනුඡේදයේ "එක් එක් මාසයේ අවසාන වැඩ කරන දිනයේ දී", යන වචන වෙනුවට "එක් එක් මාසයේ අවසාන වැඩ කරන දිනයේ ද හෝ යම් මාසයක අවසාන ත්‍යාග මුදල් ගෙවන ලද දිනයේ දී" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ ඡේදයේ (ii) වන අනුඡේදයේ "එක් එක් මාසයේ අවසාන වැඩ කරන දිනයේදී", යන වචන වෙනුවට "එක් එක් මාසයේ අවසාන වැඩ කරන දිනයේදී හෝ යම් මාසයකදී ගෙවන අවසාන දඩ මුදල් කොටස මත" යන වචන ආදේශ කිරීමෙන්.

**38**. 2004 අංක 12 දරන පනතින් අවසන් වරට සංශෝධනය කරන ලද ප්‍රධාන ප්‍රඥප්තියේ 134 වන වගන්තියේ (5) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) "67 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව-", යන වචනවලට සිට "වර්ෂ පහක් ඉකුත් වීමෙන් පසුව" යන වචන දක්වා වූ සියලුම වචන වෙනුවට, පහත සඳහන් වචන ආදේශ කිරීමෙන් :—

"67 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව -

(අ) යම් තක්සේරු වර්ෂයකට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂයේ නොවැම්බර් මස 30 වන දින හෝ ඊට පෙර තමාගේ ආදායම පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කර ඇති යම් තැනැත්තකු සම්බන්ධයෙන් ඒ තක්සේරු වර්ෂයේ අවසානයේ සිට වසර තුනක් ඉකුත් වීමෙන් පසුව ; සහ

(ආ) පෙරාතුවම වූ ඡේදයේ සඳහන් කරන ලද තැනැත්තකු සම්බන්ධයෙන් නොවන යම් තැනැත්තකු විසින් ඒ තක්සේරු වර්ෂයේ අවසානයේ සිට වසර හයක කාලයක් ඉකුත්වීමෙන් පසුව,

මේ පනත යටතේ ගෙවිය යුතු ආදායම් බද්ද වෙනුවට කිසිම තක්සේරුවක් කරනු නොලැබිය යුතු ය :";

(2) ඒ උපවගන්තියේ දෙවන අතුරු විධානයේ "ඒ තක්සේරු වර්ෂය අවසාන වීමෙන් පසු වර්ෂ පහක් ඉකුත් වීමට පෙර", යන වචන වෙනුවට "ඒ තක්සේරු වර්ෂයේ අවසානයෙන් පසු ඕනෑම කාලයක් තුල" යන වචන ආදේශ කිරීමෙන්.

**39.** ප්‍රධාන ප්‍රඥප්තියේ 144අ වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

**40.** ප්‍රධාන ප්‍රඥප්තියේ 162 අ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"ඇතැම් අවස්ථානුගත කරුනුවලදී වසර පහක් ඉකුත්වීමෙන් පසුව නඩු පවරනු නොලැබිය යුතු බව.

162අ. 2004 අංක 10 දරන දේශීය ආදායම් (සමාවදීම විධිමත් කිරීමේ) පනතේ, 4 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, 142 වන වගන්තිය යටතේ එම බදු තක්සේරුව අවසාන හා තීරණාත්මක භාවයට එළඹුනා වූ තක්සේරු වර්ෂයේ අවසානයේ සිට වසර පහකට පසුව, පැහැර හරින ලද බදු අයකර ගැනීම සඳහා මේ පනතේ 148 වන, 149 වන, 150 වන, 151 වන හෝ 152 වන වගන්ති යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ආරම්භ නොකළ යුතු ය.".

**41.** 2004 අංක 12 දරන පනතින් අවසන් වරට සංශෝධනය කරන ලද ප්‍රධාන ප්‍රඥප්තියේ පළමු උපලේඛනය මෙයින් තවදුරටත් පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ උපලේඛනයේ 1ඇ කොටසේ "2004 අප්‍රේල් මස 1 වන දිනයෙන් හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා-", යන වචන සහ ඉලක්කම් වෙනුවට "2004 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2005 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුවම ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා-" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ උපලේඛනයේ 1ඇ කොටසට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් කොටස ඇතුලත් කිරීමෙන් :—

"1 ඈ කොටස

2005 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා-

| | |
|---|---|
| බදු අයකල හැකි ආදායමෙහි පළමු වන රු. 3,00,000 මත | සියයට 5 |
| බදු අයකල හැකි ආදායමෙහි ඊළඟ රු. 2,00,000 මත | සියයට 10 |
| බදු අයකල හැකි ආදායමෙහි ඊළඟ රු. 2,00,000 මත | සියයට 15 |
| බදු අයකල හැකි ආදායමෙහි ඊළඟ රු. 2,00,000 මත | සියයට 20 |
| බදු අයකල හැකි ආදායමෙහි ඊළඟ රු. 2,00,000 මත | සියයට 25 |
| බදු අයකල හැකි ආදායමෙහි ඉතිරි කොටස මත | සියයට 30 |

(3) ඒ උපලේඛනයේ III ආ කොටසට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් කොටස ඇතුලත් කිරීමෙන් :—

"III ඇ කොටස

2005 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා -

| | |
|---|---|
| "32 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ), (ඈ), (ඉ) හෝ (ඊ) යන ඡේදවල සඳහන් යම් ගෙවීම් වර්ගයකට අදාළ වූ දායක කාලසීමාව හෝ සේවා කාලය අවුරුදු 20ට වඩා අඩු නොවන්නේ නම්, පළමුවන රුපියල් 20,00,000 සම්බන්ධයෙන් ; | කිසිවක් නැත. |
| හෝ | |
| 32 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ), (ඈ), (ඉ), හෝ (ඊ) යන ඡේදවල සඳහන් යම් ගෙවීම් වර්ගයකට අදාළ වූ දායක කාලසීමාව අවුරුදු 20ට වඩා අඩු වන්නේ නම්, පළමුවන රු. 10,00,000 සම්බන්ධයෙන් — | කිසිවක් නැත. |
| ඊළඟ රු. 5,00,000 මත | සියයට 5 |
| ඊළඟ රු. 5,00,000 මත | සියයට 10 |
| ඉතිරි කොටස මත | සියයට 15 |

42. 2004 අංක 12 දරන පනතින් සංශෝධනය කරන ලද ප්‍රධාන ප්‍රඥප්තියේ හයවන උපලේඛනය මෙයින් තවදුරටත් පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ.

(1) ඒ උපලේඛනයේ 20 වන අයිතමයේ "සියයට 15ක උපරිමයකට යටත්ව" යන වචන වෙනුවට "සියයට දහයක උපරිමයකට යටත්ව", යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ උපලේඛනයේ 23 වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන් :—

"24. රාජ්‍ය නොවන සංවිධානයන් විසින් පිහිටුවන ලද යම් අරමුදලකට ලැබුනු හෝ ලබා ගන්නා ලද අරමුදල්වලින් වූ ලැබීම් මත වූ ලාභවලට අදාළ කරගත හැකි ආදායම් බදු අනුප්‍රමාණය (96 අ වගන්තිය) සියයට 30".

43. (1) මේ පනතේ 17 (1) සහ (2) සහ 32 වන වගන්ති මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තියේ (1අ) උපවගන්තියේ (ඇ) ඡේදයට සහ (1ආ) උපවගන්තියට සහ 123අ වගන්තියට කරන ලද සංශෝධන සියලු කාර්ය සඳහා 2002 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ 37 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 132ආ වගන්තියට කරන ලද සංශෝධන සියලු කාර්ය සඳහා 2003 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ 14 (1) (ආ), 17 (3) සහ (4), 26, 39, සහ 40 යන වගන්ති මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආආ) ඡේදයේ (vi) අනු ඡේදයට සහ 29 වන වගන්තියේ (අඅ) ඡේදයේ (iv) වන අනුඡේදයේ දැක්වෙන "සම්බන්ධතාව" යන වචනයේ අර්ථ නිරූපනය සහ 29 වන වගන්තියේ (2) උපවගන්තියේ (ඊ) ඡේදයට සහ 29, 72අ, 144අ සහ 162අ යන වගන්තිවලට කරන ලද සංශෝධන සියලු කාර්ය සඳහා 2004 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) මේ පනතේ 6(1) වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ (ඉ) ඡේදයට කරන ලද සංශෝධන 2005 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) මේ පනතේ 20 වන සහ 38 වන වගන්ති මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියට (lxxviii) ඡේදය ඇතුළත් කිරීමෙන් කරන ලද සංශෝධනය සහ ප්‍රධාන ප්‍රඥප්තියේ 39 සහ 134 වන වගන්තිවලට කරන ලද සංශෝධන සහ මේ පනතේ 10 සහ 27 වන වගන්ති මගින් ප්‍රධාන ප්‍රඥප්තියට අලුතින් 16අ සහ 96අ වගන්ති ඇතුලත් කිරීම සියලු, කාර්ය සඳහා 2005 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන බවට සලකනු ලැබිය යුතු ය.

44. 2004 අංක 12 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතේ 61 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එම වගන්තියේ (1) උපවගන්තියෙහි "15 වන වගන්තියේ (ක) ඡේදයට සහ 48(අ)", යන වචන වෙනුවට සහ "6(5), 20, 24," යන ඉලක්කම් වෙනුවට පිළිවෙලින් "48අ," සහ "21, 25," යන ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියෙහි "11 වන වගන්තිය මගින් " යන වචන සහ ඉලක්කම් වෙනුවට "12 වන වගන්තිය මගින්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(3) එම වගන්තියේ (4) වන උපවගන්තියේ "(අ) ඡේදයට සහ (අ) ඡේදයේ අතුරු විධානයට" යන වචන වෙනුවට "(අ) ඡේදයේ අතුරු විධානය" යන වචන ආදේශ කිරීමෙන් ;

(4) එම වගන්තියේ (5) වන උපවගන්තියේ–

(අ) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ "9, 10, 12, 18 සහ 21" යන ඉලක්කම් වෙනුවට "10, 11, 13, 19 සහ 22" යන ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(ආ) එම වගන්තියේ (ආ) ඡේදය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ආ) මේ පනතේ 2(2) වගන්තිය සහ 6(5) වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියේ (ක) ඡේදයට කරන ලද සංශෝධනය සහ 3 වන වගන්තියට ඇතුලත් කරන ලද (ළළ) අලුත් ඡේදය;";

(5) එම වගන්තියේ (6) වන උපවගන්තියේ :—

(අ) එම උපවගන්තියේ (අ) ඡේදයේ "15(2) සහ (3), 17, 21, 22, 23," යන ඉලක්කම් වෙනුවට "16(2) සහ (3), 18, 23, 24," යන ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ආ) "131අ, 131ආ, 132ඇ" යන ඉලක්කම් සහ "19, 25, 28" යන ඉලක්කම් වෙනුවට පිළිවෙලින් "130ඈ, 130ඉ" යන ඉලක්කම් සහ "20, 26, 29" යන ඉලක්කම් ආදේශ කිරීමෙන්.

45. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

# 2005 අංක 24 දරන කල්බදු මූල්‍යකරණ (සංශෝධන පනත)

[සහතිකය සටහන් කළේ 2005 අගෝස්තු මස 08 වන දින]

2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

1. මේ පනත 2005 අංක 24 දරන කල්බදු මූල්‍යකරණ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතේ 4 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ "පොදු සමාගමක් සම්බන්ධයෙන් වන විට-", යන වචන වෙනුවට "3 වන වගන්තියේ (අ) සහ (ආ) ඡේදවල සඳහන් කරන ලද ඒවා නොවන පොදු සමාගමක් සම්බන්ධයෙන් වන විට-" යන වචන සහ අංක ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "දින විසි එකකට නොඅඩු" යන වචන වෙනුවට "දින හතකට නොඅඩු" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"බදු දීමනාකරුගේ අයිතිවාසිකම් පැවරීම හෝ භාර කිරීම.

24. (1) කල්බදු මූල්‍යකරණයකට එළඹෙන අවස්ථාවක දී හෝ ඉන් පසුව ලබාගත් බදු දීමනාකරුගේ ලිඛිත කැමැත්ත ඇතිව, කල්බදු මූල්‍යකරණය යටතේ වූ හෝ ඒ කල් බද්ද යටතේ සපයන ලද කිසියම් උපකරණයකට හෝ ඒ දෙයාකාරයටම අදාළ වූ බදු දීමනාකරුගේ අයිතිවාසිකම් සියල්ලම හෝ ඉන් කිසිවක්, යම් ලියාපදිංචි කරන ලද ආයතනයක් වෙත හෝ යම් විශේෂ කාර්ය ප්‍රවාහකයක් වෙත පැවරීම හෝ භාර කිරීම කරනු ලැබිය හැකි ය :

එසේ වුවද, යම් විශේෂ කාර්ය ප්‍රවාහකයක් වෙත පැවරීමක් හෝ භාර කිරීමක් කරනු ලැබූ විටක දී, එම පැවරීම හෝ භාරකිරීම සුරැකුම්කරණය කිරීමේ කාර්යය සඳහාම පමණක් කරනු ලැබිය යුතු අතර, සුරැකුම්කරණ ව්‍යුහය සඳහා වූ සැලැස්ම මහ බැංකුව විසින් අනුමත කරන ලද පරිදි වූ එකක් විය යුතු ය.

(2) ලියාපදිංචි කරන ලද ආයතනයක් හෝ විශේෂ කාර්ය ප්‍රවාහකයක්, මහ බැංකුව විසින් අනුමත කරන ලද ව්‍යුහයට අනුකූලව සහ මහ බැංකුව විසින් කලින් කලට නිකුත් කරනු ලැබිය හැකි යම් නියෝග සහ මාර්ගෝපදේශවලට අනුකූලව පමණක් සුරැකුම්කරණය ක්‍රියාත්මක කළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වූ පැවරුමකින් හෝ භාරකිරීමකින්, පැවරුම්කරු හෝ භාරකරන්නා—

(අ) කල්බදු මූල්‍යකරණය යටතේ වූ ස්වකීය කාර්යවලින් මුදාහැරීමක් හෝ ඒ කල්බදු මූල්‍යකරණයේ ස්වභාවයේ හෝ නීතියේ බලපෑමේ වෙනස් කිරීමක් ; හෝ

(ආ) කල්බදු මූල්‍යකරණය යටතේ සපයන ලද කිසියම් උපකරණයකට අදාළ වනතාක් දුරට ස්වකීය කාර්යයවලින් මුදාහැරීමක්,

නොවන්නේ ය.

(4) (203 වන අධිකාරය වූ) මෝටර් රථවාහන පනතේ අර්ථානුකූලව, මෝටර් රථයක් කෙරෙහි බදු දීමනාකරු සතු අයිතිවාසිකම් (1) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි බදු දීමනාකරු විසින් විශේෂ කාර්ය ප්‍රවාහකයක් වෙත පැවරීමකින් හෝ භාරකිරීමකින් පසු—

(අ) (203 වන අධිකාරය වූ) මෝටර් රථවාහන පනතේ එරෙහිව කුමක් සඳහන් වුවද, පැවරුම්ලාභියා හෝ භාරගන්නා මෝටර් රථයේ පරම අයිතිකරු වශයෙන් සලකනු ලැබිය යුතු අතර, අවස්ථාවෝචිත පරිදි පැවරීමකින් හෝ භාරකිරීමකින් පසුව දින හතක් ඇතුළත, පැවරුම්ලාභියා හෝ භාරගන්නා විසින්, කොමසාරිස්වරයා විසින් සලසනු ලැබිය හැකි යම් ආකෘතියකින් තත්කාර්යය සඳහා පවත්වාගෙන යන නිසි රෙජිස්ටරයක, වාහනයේ පරම අයිතිකරු ලෙස පැවරුම්ලාභියාගේ හෝ භාරගන්නාගේ නම් ඇතුළත් කරනු ලැබීම සඳහා කොමසාරිස්වරයා වෙත ඉල්ලුම් කරනු ලැබිය හැකි ය. ඉල්ලුම්පත්‍රය සමග ඉහත කී පනත යටතේ ඒ සඳහා නියමිත ගාස්තුව සහ අවස්ථාවෝචිත පරිදි, පැවරීමේ හෝ භාරකිරීමේ සාධන පත්‍රයෙහි පිටපතක් ද ඉදිරිපත් කළ යුතු ය. මහ බැංකුව විසින් අනුමත කරන ලද සුරැකුම්කරණ ව්‍යුහය සඳහා වූ සැලැස්ම යටතේ ඒ පැවරීම හෝ භාරකිරීම කර ඇති බවට ඉල්ලුම්පත්‍රය සමග කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරන ලද ලේඛනවල වූ අන්තර්ගත කරුණු මත කොමසාරිස්වරයා විසින් සෑහීමට පත්වීමෙන් පසුව, කොමසාරිස්වරයා විසින් පවත්වාගෙන යනු ලබන නිසි රෙජිස්ටරයක, වාහනයේ පරම අයිතිකරුවන් ලෙසින්

අවස්ථාවෝචිත පරිදි, පැවරුම්ලාභියාගේ හෝ භාරගන්නාගේ නම් ඇතුළත් කරනු ලැබීමට සලස්වනු ලැබිය යුතු ය ; සහ

(ආ) ඉහත කී පනත යටතේ හෝ කල්බදු මූල්‍යකරණය යටතේ, (1) වන උපවගන්තිය යටතේ ස්වකීය අයිතිවාසිකම් පැවරීමට හෝ භාර කිරීමට පෙරාතුව ම පැවරුම්කරු හෝ භාරකරු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකිව තිබුණා වූ සියලු අයිතිවාසිකම්, ලියාපදිංචි කරන ලද දින සිට පැවරුම්ලාභියා හෝ භාරගන්නා විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

මේ වගන්තියේ කාර්යය සඳහා "කොමසාරිස්වරයා" යන්නෙන්, (203 වන අධිකාරය වූ) මෝටර් රථවාහන පනතේ 204 වන වගන්තිය යටතේ පත් කරන ලද මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා අදහස් වේ.".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"ලියාපදිංචි කරන ලද ආයතනයක් සහ විශේෂ කාර්ය ප්‍රවාහකයක් ණය දෙන ආයතනයක් වශයෙන් සැලකිය යුතු බව.

38. සෑම ලියාපදිංචි කරන ලද ආයතනයක් ම සහ සෑම විශේෂ කාර්ය ප්‍රවාහකයක්ම, 1990 අංක 18 දරන ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය පනතේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා ණය දෙන ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"වැරදි.

39. (අ) 2 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් කල්බදු මූල්‍යකරණ ව්‍යාපාර කටයුතු කරගෙන යන ;

(ආ) 5 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියාකිරීම පැහැර හරින ;

(ඇ) 6 වන වගන්තිය මගින් නියම කරන ලද පරිදි වාර්ෂිකව ලියාපදිංචි කිරීමේ ගාස්තුව ගෙවීම පැහැර හරින ;

(ඈ) 7 වන වගන්තිය යටතේ නියම කරන ලද විස්තර සැපයීම පැහැර හරින ;

(ඉ) 8 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් මෙහෙයුම් සංග්‍රහයේ හෝ සාංගමික සංස්ථා පත්‍රයේ හෝ ව්‍යවස්ථාවලියේ ඇතුළත් විස්තර වෙනස්කරන ; හෝ

(ඊ) මේ පනත යටතේ සාදන ලද කිසියම් නියෝගයක් උල්ලංඝනය කරන හෝ මේ පනත යටතේ නිකුත් කළ කිසියම් විධානයකට හෝ දැන්වීමකට අනුකූලව ක්‍රියාකිරීම පැහැර හරින,

සෑම තැනැත්තකුම, මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තියේ "මුදල් මණ්ඩලය" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථනිරූපණය ඇතුළත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"සුරැකුම්කරණය" යන්නෙන්, බදුදීමනාකරුවකු විසින් විශේෂ කාර්ය ප්‍රවාහකයක් වෙත පවරන ලද හෝ භාර දෙන ලද කල්බදු මූල්‍යකරණයක හෝ කල්බදු මූල්‍යකරණයක විෂය වස්තුව සංයුක්ත වූ යම් උපකරණයක හෝ ඒ දෙකෙහිම අයිතිවාසිකම් වලින් යම් අයිතිවාසිකමක් හෝ සියලුම අයිතිවාසිකම්වලින් ආවරණය කර ඇත්තා වූ, විශේෂ කාර්ය ප්‍රවාහකයක් විසින් සුරැකුම්පත් නිකුත් කිරීම අදහස් වේ ;

"විශේෂ කාර්ය ප්‍රවාහකය" යන්නෙන්, හුදු සුරැකුම්කරණය කිරීමේ කාර්ය සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ එයට ආනුෂංගික කටයුතු සඳහාම පමණක් පිහිටුවන ලද, භාරයක් ද ඇතුළුව, සංස්ථාපිත හෝ සංස්ථාපිත නොවන පුද්ගල මණ්ඩලයක් අදහස් වේ ;".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 44අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :—

"ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය යටතේ ලියාපදිංචි නොවූ තැනැත්තන් ලියාපදිංචි කිරීම.

44අ. (1) ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, එම උපවගන්තියේ නියම කර ඇති කාල පරිච්ඡේදය ඇතුළත ඒ උපවගන්තිය යටතේ ලියාපදිංචි වීමට නියම කර තිබූ සහ මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට ලියාපදිංචි වීමක් ලබා නොගත් තැනැත්තකු—

(අ) ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ වරදක් සිදුකරනු ලැබ ඇති බවට සලකනු නොලැබිය යුතු අතර, ඒ අනුව ඒ තැනැත්තා විසින් ඇතුළත් වූ ගිවිසුම් කිසිවක් වලංගු ලෙසට සලකනු ලැබිය යුතු ය ;

(ආ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට අවුරුදු දෙකක කාල පරිච්ඡේදයක් සඳහා කල්බදු මූල්‍යකරණ ව්‍යාපාර කටයුතු නොකඩව කරගෙන යාමට හැකි ය ; සහ

(ඇ) මේ වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, ඒ තැනැත්තාට එම කල්බදු මූල්‍යකරණ ව්‍යාපාර කටයුතු නොකඩව කරගෙන යාම සඳහා මෙම වගන්තියේ (ආ) ඡේදයේ සඳහන් කරන ලද කාලපරිච්ඡේදය ඇතුළත, ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි සහතිකයක් ඉල්ලුම්කර ලබාගත යුතු බවට නියම කරනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ 3 වන වගන්තියේ (ඇ) ඡේදය යටතේ අවම නිකුත් කළ සහ ගෙවා නිමි ප්‍රාග්ධනය ලෙස නියම කරන ලද ප්‍රමාණය නොඉක්මවන්නා වූ, නියම කරන ලද අවම නිකුත් කළ සහ ගෙවා නිමි ප්‍රාග්ධන ප්‍රමාණයක් ඇති, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත පොදු සමාගමක් වේ නම් මිස, ඒ තැනැත්තා මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ ලියාපදිංචි කරනු ලැබීමට සුදුසුකම් නොලැබිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ ලියාපදිංචි කිරීමක් සඳහා කරන සෑම ඉල්ලීමක් සමගම—

(අ) ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ සඳහන් කරන ලද ලේඛන ;

(ආ) ඉල්ලීම භාරදීමේ දිනට පෙරාතුව ම වූ වර්ෂය සඳහා වන විගණන ශේෂ පත්‍රයේ සහ ලාභ අලාභ ගිණුමේ පිටපතක් ; සහ

(ඇ) නියම කරන ලද ගාස්තුව,

ඉදිරිපත් කළ යුතු ය.

(4) (3) වන උපවගන්තියේ සඳහන් කරන ලද ලේඛනවලට අමතරව, තමා විසින් අවශ්‍ය යයි තීරණය කරනු ලැබිය හැකි වැඩිදුරටත් වූ ලේඛන කිසිවක් හෝ තොරතුරු ලබාදෙන ලෙසට අධ්‍යක්ෂවරයා විසින් ඉල්ලුම්කරුගෙන් ඉල්ලා සිටිය හැකි අතර, එවැනි ඉල්ලීමකට අනුකූලව කටයුතු කිරීම ඉල්ලුම්කරුගේ කාර්යය විය යුතු ය.

(5) 44 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන මේ වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද තැනැත්තකු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(6) අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අධ්‍යක්ෂවරයා විසින් තත්කාර්ය සඳහා නිකුත් කරනු ලබන දැන්වීමක් මගින් එහි නිශ්චිතව සඳහන් කර ඇති කාලසීමාව ඇතුළත, ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති යම් ප්‍රමාණයකට මේ වගන්තිය යටතේ ලියාපදිංචි තැනැත්තකුගේ අවම නිකුත් කළ සහ ගෙවා නිමි ප්‍රාග්ධනය වැඩිකිරීමට මේ වගන්තිය යටතේ ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය. එසේ වුව ද, වැඩිකරන ලද ඒ අවම නිකුත් කළ සහ ගෙවා නිමි ප්‍රාග්ධනය, 3 වන වගන්තියේ (ඇ) ඡේදය යටතේ නියම කරන ලද ප්‍රමාණයට වැඩි නොවිය යුතු ය.

(7) යම් ලියාපදිංචි තැනැත්තකු විසින් (6) වන උපවගන්තිය යටතේ කරන ලද යම් නියමයකට අනුකූලවීම පැහැර හරින අවස්ථාවක දී, දැන්වීමෙහි ඇතුළත් නියමයට අනුකූල වන තෙක්, එම තැනැත්තා විසින් කරගෙන යනු ලබන කල්බදු මූල්‍යකරණ ව්‍යාපාර කටයුතු හෝ වෙනත් යම් ගනුදෙනු කටයුතු, සීමා කිරීමට හෝ සීමිත කිරීමට අධ්‍යක්ෂවරයාට බලය ඇත්තේ ය.''.

9. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත

[සහතිකය සටහන් කළේ 2005 අගෝස්තු මස 08 වන දින]

ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුතිය බලාත්මක කිරීම පිණිස සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

1. මේ පනත 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. සම්මුතියට පාර්ශ්වයන් වන රාජ්‍යයන් කවරේදැයි අමාත්‍යවරයා විසින්, කලින් කල ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් සහතික කරනු ලැබිය හැකි ය. මේ වගන්තිය යටතේ නියමයක් පළ කරනු ලබන්නේ යම් රාජ්‍යයක් සම්බන්ධයෙන් ද ඒ රාජ්‍යය "සම්මුතිගත රාජ්‍යයක්" යනුවෙන් මෙහි මින් මතු සඳහන් කරනු ලැබේ.

3. (1) කිසියම් මාර්ගයකින්, කෙලින්ම හෝ අන්‍යාකාරයෙන් නීති විරෝධී ලෙස සහ හිතාමතාම අරමුදල් සපයන හෝ එකතු කරන, සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් වශයෙන්—

(අ) මෙහි 1 වන උපලේඛනයේ නිශ්චිතවම සඳහන් ගිවිසුම් වලින් කිසියම් ගිවිසුමක විෂයය පථය තුළට ගැනෙන හෝ විග්‍රහය තුළට ගැනෙන වරදක් සංස්ථාපනය වන යම් ක්‍රියාවක් ;

(ආ) සන්නද්ධ ගැටුම් පවතින තත්ත්වයක දී ඒ එදිරිවාදිකම්වල ක්‍රියාකාරී සහභාගිත්වයක් නොදරන සිවිල් වැසියකුට හෝ වෙනත් යම් තැනැත්තකුට මරණය හෝ දරුණු ශාරීරික තුවාල සිදු කිරීමට අරමුණු කරන ලද වෙනත් යම් ක්‍රියාවක් සිදු කිරීම පිණිස, ඒ අරමුදල් භාවිත කිරීමේ චේතනාවෙන් හෝ භාවිත කළ යුතු බව හෝ භාවිත කළ හැකි යයි විශ්වාස කිරීමට හේතු ඇති බව දැන දැනම සහ ඒ ක්‍රියාවල අරමුණුවල ස්වභාවය හෝ සංදර්භය මගින් කිසියම් ක්‍රියාවක් සිදුකිරීමට හෝ යම් ක්‍රියාවක් සිදුකිරීමෙන් වැළකී සිටීමට ජනතාවට තර්ජනය කරන හෝ ආණ්ඩුවකට හෝ ජාත්‍යන්තර ආයතනයකට බලපෑම් කරන ඕනෑම තැනැත්තකු, ත්‍රස්තවාදීන්ට හෝ ත්‍රස්තවාදී සංවිධානවලට මුදල් සැපයීමේ වරදට වරදකරු විය යුතු ය :

එසේ වුව ද, යම් ක්‍රියාවක් මගින් ඉහත දක්වා ඇති වරදක් සංස්ථාපනය වීම සඳහා ඒ එකතු කරන ලද අරමුදල සත්‍ය වශයෙන්ම වරදක් සිදු කිරීම සඳහා භාවිත කර ඇතැයි දැක්වීම අවශ්‍ය නොවිය යුතු ය.

(2) (අ) ත්‍රස්තවාදීන්ට හෝ ත්‍රස්තවාදී සංවිධානවලට මුදල් සැපයීමේ වරදක් සිදු කිරීමට තැත් කරන ;

(ආ) ත්‍රස්තවාදීන්ට හෝ ත්‍රස්තවාදී සංවිධානවලට මුදල් සැපයීමේ වරදක් සිදු කිරීමට ආධාර හෝ අනුබල දෙන ; හෝ

(ඇ) ත්‍රස්තවාදීන්ට හෝ ත්‍රස්තවාදී සංවිධානවලට මුදල් සැපයීමේ වරදක් සිදු කිරීමට සහාය දැක්වීමට වෙනත් යම් තැනැත්තකු හෝ තැනැත්තන් කණ්ඩායමක් සමග පොදු අරමුණක් ඇතිව ක්‍රියා කරන,

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

මේ උපවගන්තියේ "අනුබල දීම" යන්නට දණ්ඩ නීති සංග්‍රහයේ 100 සහ 101 වන වගන්තිවලට දී ඇති අර්ථයම ඇත්තේ ය.

(3) (1) වන උපවගන්තියේ හෝ (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබූ අවස්ථාවක, ඒ පුද්ගල මණ්ඩලයේ සෑම සාමාජිකයෙක්, අධ්‍යක්ෂවරයෙක්, කළමනාකරුවෙක්, ලේකම්වරයෙක්, නිලධරයෙක් හෝ සේවකයෙක් විසින් තමාගේ දැනීමක් නොමැතිව ඒ වරද කර ඇති බව හෝ වරද කිරීමෙහි ලා එය වැළැක්වීමට නිසි උද්යෝගයෙන් ක්‍රියාකර ඇති බව ඔප්පු කරනු ලැබුවහොත් මිස ඒ සාමාජිකයා, අධ්‍යක්ෂවරයා, කළමනාකරු, ලේකම්වරයා, නිලධරයා හෝ සේවකයා වරදට වරදකරු විය යුතු ය.

(4) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ හෝ (2) වන උපවගන්තිය යටතේ වරදකට වරදකරු වන තැනැත්තකු අධිචෝදනා මත මහාධිකරණය විසින් පවත්වනු ලබන නඩු විභාගයක දී වරදකරු කරනු ලැබුවහොත් අවුරුදු පහළොවකට නොඅඩු සහ අවුරුදු විස්සකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කරනු ලැබීමට සහ දඩයකට ද යටත් වන්නේ ය.

4. (1) මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන්, මහාධිකරණයේ දී යම් තැනැත්තකු අධිචෝදනා ලැබූ විට, 3 වන වගන්තියේ විධිවිධාන කඩකරමින් එකතු කරන ලද, සියලු අරමුදල් ඒ අධිචෝදනාව ඉදිරිපත් කරනු ලැබූ දින පටන්—

(අ) ඒ අරමුදල් යම් බැංකුවක බැංකු ගිණුමක ඇත්නම්, ක්‍රියා විරහිත කිරීමේ ආඥාවකට යටත් කරනු ලැබිය යුතු ය ; නැතහොත්

(ආ) ඒ අරමුදල් යම් තැනැත්තකුගේ සන්තකයේ හෝ පාලනයේ පවතී නම්, තහනමට යටත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය ප්‍රකාර, අරමුදල් ක්‍රියාවිරහිත කිරීම හෝ තහනමට ගැනීම, නඩු විභාගය අවසන් වන තුරු බලාත්මක විය යුතු ය.

(3) අධිචෝදනා ඉදිරිපත් කරනු ලැබූ විට, අවස්ථාවෝචිත පරිදි, ක්‍රියා විරහිත කිරීම හෝ තහනමට ගැනීම පිළිබඳව, නීතිපතිවරයා විසින්, මහ බැංකුව වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(4) එවිට, මහබැංකුව විසින්, සුදුසු යයි සිතන ආකාරයකට, අවස්ථාවෝචිත පරිදි, ක්‍රියාවිරහිත කිරීමේ හෝ තහනමට ගැනීමේ ආඥාව පිළිබඳව ප්‍රමාණවත් ප්‍රචාරයක් දෙනු ලැබිය යුතු ය.

5. (1) 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ විට, 3 වන වගන්තියේ (1) වන උපවගන්තියට අනුකූලව එකතු කරන ලද අරමුදල් කිසිවක් රාජසන්තක කළ යුතු යයි අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ රාජසන්තක කරන ලද අරමුදල් කිසිවක් නිත්‍ය වශයෙන් ම රාජ්‍යය වෙත පවරනු ලැබිය යුතු ය. ඒ පැවරීම,—

(අ) රාජසන්තක කිරීමේ ඒ ආඥාවට එරෙහිව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැක්කේ යම් කාල පරිච්ඡේදයක් ඇතුළත ද ඒ කාල පරිච්ඡේදය ඉකුත්වීමේ දී රාජසන්තක කිරීමේ ආඥාවට එරෙහිව අභියාචනාධිකරණය වෙත කිසිදු අභියාචනයක් ඉදිරිපත් කර නොමැත්තා වූ අවස්ථාවක ;

(ආ) ඒ රාජසන්තක කිරීමේ ආඥාවට එරෙහිව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත්තා වූ හා අභියාචනාධිකරණය ඒ ආඥාවට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි කාල පරිච්ඡේදය ඉකුත් වීමේ දී, ඒ රාජසන්තක කිරීමේ ආඥාව ස්ථිර කරන හෝ පිළිගනු ලබන අභියාචනාධිකරණයේ ආඥාවට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත කිසිදු අභියාචනයක් ඉදිරිපත් කර නොමැත්තා වූ අවස්ථාවක ;

(ඇ) ඒ රාජසන්තක කිරීමේ ආඥාවට එරෙහිව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත්තා වූ හා රාජසන්තක කිරීමේ ආඥාව ස්ථිර කෙරෙන හෝ පිළිගනු ලැබූ ශ්‍රේෂ්ඨාධිකරණයේ නිගමනය මත පළමුව සඳහන් කළ අභියාචනය සම්බන්ධයෙන් අභියාචනාධිකරණයේ නිගමනය පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත්තා වූ අවස්ථාවක,

බලාත්මක විය යුතු ය.

(3) 3 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වරදක් සම්බන්ධයෙන් වූ නඩු විභාගයක දී ඉදිරිපත් කරන ලද සාක්ෂි මත, යම් බැංකුවක යම් ගිණුමක බැරට ඇත්තා වූ අරමුදල් කිසිවක්, ඒ වරදින් ලත් මුදල් බවට අධිකරණය සෑහීමට පත් වූ අවස්ථාවක නඩු විභාගය අවසන් වන තුරු ගිණුමෙන් අරමුදල් කිසිවක් ආපසු ගැනීමට අවසර දීම හෝ ඉඩදීම, ඒ බැංකුවේ කළමනාකරුට ලිඛිත ආඥාවක් මගින් තහනම් කරනු ලැබිය හැකි ය.

6. (1) වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, මේ පනත යටතේ වූ වැරදි සම්බන්ධයෙන් නඩු විභාග කිරීම සඳහා කොළඹ දී පැවැත්වෙන ශ්‍රී ලංකා මහාධිකරණයට හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාත සඳහා පිහිටුවන ලද පළාත්බද මහාධිකරණයට අනන්‍ය අධිකරණ බලය තිබිය යුතු ය.

(2) මේ පනත යටතේ වරදක් ලෙස සංස්ථාපනය වන ක්‍රියාවක්, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිදුකර ඇති අවස්ථාවක දී,—

(අ) ඒ ක්‍රියාව සිදු කළ තැනැත්තා ශ්‍රී ලංකාවේ සිටී නම් ;

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විසින් හෝ මේ සම්මුතියට පාර්ශ්වකරුවකු වන කවර හෝ වෙනත් රාජ්‍යයක ජාතිකයකු විසින් හෝ සිරිත් පරිදිම ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින අදේශික තැනැත්තකු විසින් ඒ ක්‍රියාව සිදුකර ඇත්නම් ;

(ඇ) වරද සිදු කරන කාලයේ දී, ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ නැවකට හෝ ගුවන් යානයකට විරුද්ධව හෝ ඒ තුළ දී ඒ ක්‍රියාව සිදු කර ඇත්නම් ;

(ඈ) වරද සිදුකරන කාලයේ දී, මේ සම්මුතියට පාර්ශ්වකරුවකු වන කවර හෝ වෙනත් රාජ්‍යයක නීතිය යටතේ ලියාපදිංචි කළ නැවකට හෝ ගුවන් යානයකට විරුද්ධව හෝ ඒ තුළ දී ඒ ක්‍රියාව සිදුකර ඇත්නම් ;

(ඉ) වරද සිදු කරනු ලැබුවා යයි කියනු ලබන්නේ යම් තැනැත්තකුට අදාළව ද, ඒ තැනැත්තා ශ්‍රී ලංකාවේ පුරවැසියකු නම් ;

(ඊ) යම් ක්‍රියාවක් කිරීමට හෝ කිරීමෙන් වැළකී සිටීමට ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට බල කිරීම පිණිස ඒ ක්‍රියාව සිදුකර ඇත්නම් ;

(උ) වෙනත් යම් රටක පිහිටි රාජ්‍යයක, යම් රාජ්‍ය දූත හෝ කොන්සල් පරිශ්‍ර ඇතුළුව ඒ රාජ්‍යයේ හෝ ආණ්ඩුවේ සම්පත්වලට එරෙහිව සිදුකරන ලද යම් ක්‍රියාවක් ; හෝ

(ඌ) ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලයක් හෝ ශ්‍රී ලංකාවේ වෙනත් රාජ්‍ය දූත හෝ කොන්සල් පරිශ්‍ර ඇතුළුව ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් අයිතිකර ගත්, බද්දට ගත් හෝ භාවිත කළ යම් දේපළකට විරුද්ධව සිදු කරන ලද යම් ක්‍රියාවක්,

ශ්‍රී ලංකාව තුළ දී සිදුකරනු ලැබූ ලෙස සලකා, (1) වන උපවගන්තියේ සඳහන් මහාධිකරණයට ඒ වැරදි සම්බන්ධයෙන් නඩු විභාග පැවැත්වීමේ අධිකරණ බලය තිබිය යුතු ය.

7. මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන යම් තැනැත්තකු සිරභාරයට ගනු ලැබූ අවස්ථාවක දී,—

(අ) ඔහු ජාතිකත්වය දරන රාජ්‍යයේ හෝ වෙනත් ආකාරයකින් ඔහුගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට හිමිකම ඇති රාජ්‍යයේ නිසි නියෝජිතයා සමග හෝ, ඔහු අදේශික තැනැත්තකු නම්, ඔහු සිරිත් පරිදි වාසය කරන දේශයේ රාජ්‍යයේ ආසන්නතම නිසි නියෝජිතයා සමග හෝ අප්‍රමාදව සංදේශනය කිරීමට ;

(ආ) ඒ රාජ්‍යයේ නියෝජිතයකු විසින් ඔහු හමුවීමට පැමිණීමට ;

(ඇ) (අ) සහ (ආ) ඡේද යටතේ ඔහුගේ අයිතිවාසිකම් ගැන දැනුම් දීමක් ලැබීමට,

ඒ තැනැත්තාට හිමිකම ඇත්තේ ය.

8. මේ පනතේ 3 වන වගන්තිය යටතේ වූ වරදක් හෝ II වන උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති වරදක් සම්බන්ධයෙන් චෝදනා කරනු ලැබ හෝ වරදකරු කරනු ලැබ ඇති යම් තැනැත්තකු උදර්පනය කිරීම සඳහා ඉල්ලීමක් සම්මුතිගත රාජ්‍යයක ආණ්ඩුව විසින් හෝ එය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙත ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී ඒ වරද සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව නඩු පැවරීමට හෝ ඔහු උදර්පනය කිරීමට හෝ ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ගනු ලැබ ඇති හෝ ගනු ලැබීමට යෝජිත හෝ පියවර කවරේදැයි, යට කී ඉල්ලීම ඉදිරිපත් කරන රාජ්‍යයේ ආණ්ඩුව වෙත ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙනුවෙන් අමාත්‍යවරයා විසින් නොපමාව ම දැනුම් දිය යුතු ය.

9. (1) මේ පනතේ 3 වන වගන්තිය යටතේ වූ වරදක් හෝ II වන උපලේඛනයෙහි සඳහන් වරදක් සම්බන්ධයෙන් විමර්ශනය කිරීම හා නඩු පැවරීම සඳහා අවශ්‍ය කවර විටක දී වුව ද, 2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ විධිවිධාන, ඉහත කී පනතේ 2 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආණ්ඩුව සහ නියමයක් මගින් අමාත්‍යවරයා විසින් සඳහන් කරනු ලබන පොදු රාජ්‍ය මණ්ඩලයේ රටවල් හෝ ඉහත කී පනත ප්‍රකාර ශ්‍රී ලංකා ආණ්ඩුව ගිවිසුමකට ඇතුළත් වූ පොදු රාජ්‍ය මණ්ඩලයේ නොවන රටවල් අතර ආධාර සපයා ගැනීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(2) ඉහත කී පනතේ 2 වන වගන්තිය යටතේ නියමයක් මගින් අමාත්‍යවරයා විසින් සඳහන් කරනු ලබන පොදු රාජ්‍ය මණ්ඩලයේ රටක් හෝ ඉහත කී පනත ප්‍රකාරව ශ්‍රී ලංකා ආණ්ඩුව ගිවිසුමකට ඇතුළත් වූ පොදු රාජ්‍ය මණ්ඩලයේ රටක් නොවන රටක් සම්බන්ධයෙන් වන විට, සම්මුති රටකට යම්තාක් වූ සියලු ආධාර දීම සහ එක්සත් ජාතීන්ගේ සම්මුතිය යටතේ වූ බැඳීම් (සාක්ෂි හා ප්‍රකාශ ලබා ගැනීම, සිතාසි භාරදීම හා සෝදිසි කිරීම ද ඇතුළුව) ඉටුකිරීම සඳහා අවශ්‍ය වන තාක් ප්‍රමාණයට අමාත්‍යවරයා මගින් සියලු ආධාර ඉල්ලා සිටීම ආණ්ඩුවේ කාර්යය විය යුතු ය.

(3) සම්මුති රටකට ආධාර දීම, සුදුසු යයි අමාත්‍යවරයා සිතන යම් නියම හා කොන්දේසිවලට යටත්ව කරනු ලැබිය හැකි ය.

10. යම් සම්මුතිගත රාජ්‍යයක් සමග ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ඇතිකර ගනු ලැබූ යම් උදර්පන වැඩ පිළිවෙලක් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී බලාත්මකව පැවතියේ නම්, ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පන පනතේ උදර්පනය සඳහා සලස්වා ඇති විධිවිධානවලට මේ පනතේ II වන උපලේඛනයේ සඳහන් උදර්පනය කළ යුතු වැරදි ද ඇතුළත් වන්නේ යයි ඒ පනතේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

11. යම් සම්මුතිගත රාජ්‍යයක් සමග උදර්පන වැඩ පිළිවෙලක් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ඇති කරගෙන නොමැති අවස්ථාවක දී, මේ පනතේ II වන උපලේඛනයෙහි සඳහන් වැරදි සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ එකී සම්මුතිගත රාජ්‍ය අතර ඇතිකරගෙන තිබෙන වැඩ පිළිවෙලක් ලෙස, ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පන පනතේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් මෙම සම්මුතිය උදර්පන වැඩ පිළිවෙලක් ලෙස සලකනු ලැබිය හැකි ය.

12. ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පන පනත එහි උපලේඛනයේ "ආ" කොටසට පෙරාතුව ම පහත දැක්වෙන අයිතමය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(46) 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුතිය පනතේ විෂයය පථය තුළට ගැනෙන වරදකි."

13. ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පන පනතේ කුමක් සඳහන් වුව ද, ඒ පනතේ උපලේඛනයේ හා මේ පනතේ II වන උපලේඛනයේ සඳහන් වරදක්, ඒ පනතේ කාර්ය සඳහා දේශපාලන ස්වභාවයේ වරදක් හෝ දේශපාලන වරදකට සම්බන්ධ වරදක් හෝ දේශපාලන හේතුවලින් පෙළඹ වූ වරදක් වශයෙන්, ශ්‍රී ලංකා ආණ්ඩුව හා යම් සම්මුති රටක් අතර යම් තැනැත්තකු උදර්පනය කිරීමේ කාර්යය සඳහා පමණක් හෝ 9 වන වගන්තිය යටතේ සම්මුති රටකට ආධාර දීම සම්බන්ධයෙන් චෝදනා ලැබූ හෝ එවැනි යම් වරදකට වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු උදර්පනය කිරීමේ කාර්යය සඳහා වරදක් වශයෙන් සලකනු නොලැබිය යුතුය.

14. 3 වන වගන්තියේ සඳහන් වැරදි වළක්වාලීමේ දී ජාත්‍යන්තර සහයෝගය වැඩි දියුණු කිරීම සඳහා, විදේශ කටයුතු විෂයය භාර අමාත්‍යවරයා විසින්, අයථා මුදල් පරිහරණය පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා විමසා, මේ පනත යටතේ වූ යම් වරදක් හෝ අයථා මුදල් පරිහරණය පිළිබඳ වරද වළක්වාලීමේ හා ඊට එරෙහිව සටන් කිරීමේ කාර්යය සඳහා යම් නියෝග සෑදීම, යම් විධාන නිකුත් කිරීම හෝ තත් කාලයෙහි බලපවත්නා යම් ලිඛිත නීතියක් මගින් විධිවිධාන සලස්වා ඇති යම් ක්‍රියා මාර්ගයක් ගැනීම කරනු ලැබිය හැකි ය.

15. මේ පනතේ ඇතුළත් කර ඇති පරිදි සම්මුතියේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන සාමාන්‍ය හෝ විශේෂ විධාන අමාත්‍යවරයා විසින් කලින් කල නිකුත් කරනු ලැබිය හැකි ය.

16. (1) මේ පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්ය සඳහා හෝ මේ පනත යටතේ නියෝග සෑදීමට නියමිත හෝ බලය ඇති කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එය එසේ පළ කරන ලද දිනයෙහි හෝ නියෝගයේ නිශ්චිතව සඳහන් යම් පසු දිනයක දී හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. පාර්ලිමේන්තුව විසින් එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොමැතිව, එහි අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) අනනුමත කරන ලද දිනය පිළිබඳ දැන්වීමක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

17. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

I වන උපලේඛනය [3 වන වගන්තිය]

1. 1970 වර්ෂයේ දෙසැම්බර් මස 16 වන දින හේග් නුවර දී පවත්වන ලද, ගුවන් යානා නීති විරෝධී ලෙස තහනමට ගැනීම මැඩපැවැත්වීම සඳහා වූ සම්මුතිය.

2. 1971 වර්ෂයේ සැප්තැම්බර් මස 23 වන දින මොන්ට්‍රියල් නුවර දී පවත්වන ලද, සිවිල් ගුවන් සේවා ආරක්ෂාවට එරෙහිව සිදු කරනු ලබන නීති විරෝධී ක්‍රියාවක් මැඩපැවැත්වීම සඳහා වූ සම්මුතිය.

3. 1973 වර්ෂයේ දෙසැම්බර් මස 14 වන දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූ රාජ්‍ය දූත නියෝජිතයන් ඇතුළුව ජාත්‍යන්තර වශයෙන් ආරක්ෂිත තැනැත්තන්ට විරුද්ධව අපරාධ වැළැක්වීම සහ දඬුවම් දීම සඳහා වූ සම්මුතිය.

4. 1979 වර්ෂයේ දෙසැම්බර් මස 17 වන දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූ ප්‍රාණ ඇපකරුවන් ග්‍රහණයට ගැනීමට විරුද්ධ ජාත්‍යන්තර සම්මුතිය.

5. 1980 වර්ෂයේ මාර්තු මස 3 වන දින වියානා නුවර දී සම්මත කර ගනු ලැබූ න්‍යෂ්ටික ද්‍රව්‍ය වලින් භෞතික ආරක්ෂාව සඳහා වූ සම්මුතිය.

6. 1988 වර්ෂයේ පෙබරවාරි මස 24 වන දින මොන්ට්‍රියල් නුවර දී පවත්වන ලද, සිවිල් ගුවන් සේවාවල ආරක්ෂාවට එරෙහිව සිදු කරනු ලබන නීතිවිරෝධී ක්‍රියා මැඩපැවැත්වීම සඳහා වූ සම්මුතියට අතිරේකව ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සඳහා වූ ගුවන් තොටුපලවල දී සිදු කරනු ලබන නීතිවිරෝධී ප්‍රචණ්ඩ ක්‍රියා මැඩපැවැත්වීම සඳහා වූ සම්මුතිය.

7. 1988 වර්ෂයේ මාර්තු මස 10 වන දින රෝම නුවර දී පවත්වන ලද සමුද්‍රීය සංතරණයේ ආරක්ෂාවට එරෙහිව සිදු කරනු ලබන නීති විරෝධී ක්‍රියා මැඩපැවැත්වීම සඳහා වූ සම්මුතිය.

8. 1988 වර්ෂයේ මාර්තු මස 10 වන දින රෝම නුවර දී පවත්වන ලද, මහාද්වීපික තටාකවල පිහිටා ඇති නිශ්චිත වැඩ පිළිවෙලවල ආරක්ෂාවට එරෙහිව සිදු කරනු ලබන නීති විරෝධී ක්‍රියා මැඩපැවැත්වීම සඳහා වූ සම්මුතිය.

9. 1997 වර්ෂයේ දෙසැම්බර් මස 15 වන දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාර මැඩපැවැත්වීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය.

II වන උපලේඛනය [ 8, 9, 10, 11 සහ 13 වන වගන්ති]

(1) (අ) මේ පනතේ 1 වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් ගිවිසුම් වලින් කිසියම් ගිවිසුමක විෂය පථය තුළට හෝ විග්‍රහය තුළට ගැනෙන වරදක් සංයුක්ත වන ක්‍රියාවක් වූ, හෝ

(ආ) සන්නද්ධ ගැටුම් පවතින තත්වයක දී ඒ එදිරිවාදිකම්වලට ක්‍රියාකාරීව සහභාගි නොවන සිවිල් වැසියකුට හෝ වෙනත් යම් තැනැත්තකුට මරණය හෝ දරුණු ශාරීරික තුවාල සිදු කිරීම අරමුණු කරගත් ක්‍රියාවක්,

සහ එහි ස්වභාවය සහ සන්දර්භය අනුව එහි අරමුණ, කිසියම් ක්‍රියාවක් සිදු කිරීමට හෝ කිසියම් ක්‍රියාවක් සිදු කිරීමෙන් වැළකීමට මහජනයා බිය ගැන්වීමෙන් පෙළඹවීම හෝ ආණ්ඩුවකට හෝ ජාත්‍යන්තර සංවිධානයකට බලකිරීම පිණිස, සම්පූර්ණ හෝ කොටසක් හෝ යොදා ගත යුතු ය, යන චේතනාවෙන් හෝ එසේ භාවිතා කළ යුතු බව හෝ භාවිතා කළ හැකි යයි විශ්වාස කිරීමට හේතු ඇති බව දැන දැනම, නීති විරෝධීව සහ හිතාමතාම අරමුදල් සැපයීම හෝ එකතු කිරීම.

(2) (1) වන ඡේදයේ සඳහන් කරන ලද වරදක් සිදුකිරීමට තැත්කිරීම.

(3) (1) වන ඡේදයේ සඳහන් කරන ලද වරදක් සිදු කිරීමට ආධාර සහ අනුබල දීම.

(4) (1) වන ඡේදයේ සඳහන් යම් වරදක් සිදු කිරීමට වෙනත් තැනැත්තකු හෝ තැනැත්තන් කණ්ඩායමක් හෝ සමග පොදු අරමුණකින් කටයුතු කිරීම.

## 2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනත

[සහතිකය සටහන් කළේ 2005 සැප්තැම්බර් මස 20 වැනි දින]

ගෙවීම්, නිෂ්කාශනය සහ බේරුම් කිරීමේ පද්ධති විධිමත් කිරීම සඳහා ද ශ්‍රී ලංකා මහ බැංකුවේ පොත්පත් අනුව සුරැකුම්පත් නියාදනය සඳහා ද මූල්‍ය සේවා සැපයුම්කරුවන් විධිමත් කිරීම සඳහා සහ විද්‍යුත් ක්‍රම මගින් චෙක්පත් ඉදිරිපත් කිරීම සඳහා විධිවිධාන සැලසීම පිණිස සහ ඒ හා සම්බන්ධ සහ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

1. මේ පනත 2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරන නියමයක් මගින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරන) දිනයක සිට ක්‍රියාත්මක වන්නේ ය.

### I වන කොටස

### පොදු විධිවිධාන

2. (1) මෙම පනතේ අරමුණු වන්නේ—

(අ) ගෙවීමේ, නිෂ්කාශනය කිරීමේ සහ බේරුම් කිරීමේ පද්ධති විධිමත් කිරීම, අධීක්ෂණය සහ සමීක්ෂණය සඳහා විධිවිධාන සැලසීම ;

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වාගෙන යන සුරැකුම්පත් ගිණුම්වල සුරැකුම්පත් නියාදනය සඳහා විධිවිධාන සැලසීම ;

(ඇ) මූල්‍ය සේවා සැපයුම්කරුවන් විධිමත් කිරීම, අධීක්ෂණය සහ සමීක්ෂණය සඳහා විධිවිධාන සැලසීම ; සහ

(ඈ) විද්‍යුත් ක්‍රමයෙන් චෙක්පත් ඉදිරිපත් කිරීම සඳහා විධිවිධාන සැලසීමත් ය.

(2) මේ පනතේ වෙනත් විධිවිධානවලින් නිශ්චිතව සපයා තිබෙන අර්ථකථනවලට යටත්ව සහ පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වේ නම් මිස—

"නිෂ්කාශන පද්ධති" යන්නෙන්, බැංකු අතර සහ වෙනත් මූල්‍ය ආයතන අතර ගෙවීම් කිරීම පිණිස හෝ සුරැකුම්පත් පැවරීම පිණිස, බැඳීම් හුවමාරු කිරීම සහ සැකසුම් කිරීම සඳහා වූ, එම බැඳීම් නිදහස් කිරීමේ කාර්යය සඳහා වූ යාන්ත්‍රණය අදහස් වේ ;

"මුදල් සේවා" යන්නෙන්, මුදල් සුරක්ෂිතව තබා ගැනීම, මුදල් ප්‍රේෂණය, චෙක්පත් සඳහා මුදල් ගෙවීම සහ ව්‍යවහාර මුදල් හුවමාරුව ඇතුළුව මුදල් හා සම්බන්ධ සේවා අදහස් වේ ;

"ගෙවීමේ පද්ධතිය" යන්නෙන්, මුදලින් ගෙවීම සහ ගෙවීම් කිරීමේ ගනුදෙනු මාර්ගයෙන් මුදල් වටිනාකම පැවරුම සඳහා පහසුකම් සලසන ආයතන සහ යාන්ත්‍රණ අදහස් වන අතර එයට ගෙවීමේ බැඳීම් නිෂ්කාශනය කිරීමේ හා බේරුම් කිරීමේ යාන්ත්‍රණ ද ඇතුළත් වේ ;

"විද්‍යුත් ක්‍රම මගින් චෙක්පත් ඉදිරිපත් කිරීම" යන්නෙන්, චෙක්පතක් ලියා ඇත්තේ යම් බැංකුවක් නමට ද ඒ බැංකුවට බැංකුකරුවකු විසින් ප්‍රතිබිම්බයක් සහ ගෙවීම් තොරතුරු විද්‍යුත් මාර්ගයෙන් ප්‍රේෂණය කිරීම අදහස් වේ ;

"පියවීමේ පද්ධති" යන්නෙන්, බැංකු විසින් සහ වෙනත් මූල්‍ය ආයතන විසින් ඔවුනොවුන්ගේ ගිණුම් ගලපාගැනීමෙන් බැංකු විසින් හා වෙනත් මූල්‍ය ආයතන විසින් ගෙවීම් කිරීමට හා නිෂ්කාශනය කරන ලද සුරැකුම්පත් පැවරීම සඳහා වූ බැඳුම් ඉටු කිරීම සඳහා වූ යාන්ත්‍රණය අදහස් වේ ;

"පොත්, වාර්තා, ගිණුම්, ලේඛන හෝ තොරතුරු" යන්නෙන්, ඕනෑම තොරතුරු පද්ධතියක හෝ පත්‍ර මාර්ගයෙන් හා විද්‍යුත්, ප්‍රකාශ චුම්බක මාර්ගයෙන් ඇතුළුව ඕනෑම මාධ්‍යයක වාර්තාගත හෝ ගබඩා කර ඇති පොත්, වාර්තා, ගිණුම්, ලේඛන හෝ තොරතුරු අදහස් වේ.

3. (1) මේ පනතේ විධිවිධාන යටතේ ඇති කරනු ලබන බැඳීම්, නියමයන්, බලතල හා නියාමන උපක්‍රම වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ වන බැඳීම්, නියමයන්, බලතල හා නියාමන හැසිරවීම්වලට අමතරව විය යුතු අතර, මේ පනතින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරෙන බලතල (422 වන අධිකාරය වූ) මුදල් නීති පනතින්, 1988 අංක 30 දරන බැංකු පනතින් හෝ තත් කාලය සඳහා බලපවත්නා වෙනත් යම් ලිඛිත නීතියකින් පැවරී තිබෙන බලතලවලට අමතරව විය යුතු ය.

(2) මේ පනතේ විධිවිධාන, (422 වන අධිකාරය වූ) මුදල් නීති පනතේ සහ 1988 අංක 30 දරන බැංකු පනතේ විධිවිධානවලට අනුකූලතාවයෙන් යුතුව කියවා තේරුම් ගත යුතු ය.

(3) මේ පනතේ කාර්ය සඳහා "ශ්‍රී ලංකා මහ බැංකුව" යන්නෙන්, (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ.

(4) මේ පනත යටතේ යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාවේ යෙදීමට, කිරීමට හෝ ඉටුකිරීමට නියමිතව හෝ බලය පැවරී ඇති අවස්ථාවක, ඒ බලය ක්‍රියාවේ යෙදීම, කාර්යය කිරීම හෝ කර්තව්‍ය ඉටුකිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ යම් නිලධරයකුට ලියවිල්ලක් මගින් බලය දෙනු ලැබිය හැකි ය.

## II වන කොටස

## ගෙවීමේ, නිෂ්කාශනය කිරීමේ සහ බේරුම් කිරීමේ පද්ධති සහ මුදල් සේවා

### I වන පරිච්ඡේදය

### ජාතික ගෙවීමේ පද්ධතිය

4. (1) ශ්‍රී ලංකා මහ බැංකුව ජාතික ගෙවීමේ පද්ධතියක් සඳහා සැලසුම් සකස් කිරීම සඳහා වගකිව යුතු බලධරයා වන්නේ ය. ශ්‍රී ලංකාවේ ගෙවීමේ, නිෂ්කාශනය කිරීමේ සහ බේරුම් කිරීමේ ක්‍රම පද්ධති ඇති කිරීම සහ සංවර්ධනය කිරීමට මගපෙන්වීම හා නායකත්වය සැපයීම පිළිබඳ වගකීම ද ශ්‍රී ලංකා මහ බැංකුව වෙත භාර වන්නේ ය.

(2) ශ්‍රී ලංකා මහ බැංකුව විසින්—

(අ) එහි නිෂ්කාශන හෝ බේරුම් කිරීමේ පද්ධති සහ ඒ හා සම්බන්ධ වැඩපිළිවෙළ, ගෙවීම් හෝ සුරැකුම්පත් හුවමාරු කිරීම, නිෂ්කාශනය කිරීම හෝ බේරුම් කිරීමට සම්බන්ධ වෙනත් පද්ධති සහ වැඩපිළිවෙළවල් සමග අන්තර් ක්‍රියාකාරිත්වය සඳහා පහසුකම් සැලසීම ;

(ආ) දේශීය හෝ විදේශීය ව්‍යවහාර මුදලින් ගෙවීම් කිරීම සහ සුරැකුම්පත් පැවරීම සඳහා නව ක්‍රම සහ තාක්ෂණවේද සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම ;

(ඇ) ගෙවීම් පද්ධති විකාශනයෙහි සහ ගෙවීම් සේවා සැපයීමෙහි සියලු සහභාගිකරුවන් අතර සහයෝගිතාව සඳහා පහසුකම් සැලසීම,

සිදුකළ යුතු ය.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාවේ යෙදීමේ දී, වෙනත් යම් නීතියක පටහැනිව කවර විධිවිධානයක් තිබුණද, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පහත සඳහන් කටයුතු කරනු ලැබිය හැකි ය. එනම් :—

(අ) දේශීය හෝ විදේශීය මුදලින් ගෙවුම් අණකර සහ ස්වකීය ගනුදෙනුකරුවන් සඳහා සුරැකුම්පත් පැවරීම පිණිස උපදෙස් යැවීම, පිරිසැකසුම් කිරීම හා ලබාගැනීම සම්බන්ධයෙන් යම් බැංකුවක්, වෙනත් මූල්‍ය ආයතනයක් හෝ තැනැත්තකු විසින් සපයනු ලබන සේවා සහ පහසුකම් විධිමත් කිරීම සහ අධීක්ෂණය කිරීම හා එවැනි සේවා සහ පහසුකම් පිහිටුවීම, මෙහෙයවීම සහ සංවිධානය සඳහා යම් බැංකුවකට හෝ වෙනත් මූල්‍ය ආයතනයකට සහාය වීම ;

(ආ) (i) ගෙවීම්, නිෂ්කාශනය සහ බේරුම් කිරීම සඳහා වූ යම් පද්ධතියක් සහ දේශීය හෝ විදේශීය ව්‍යවහාර මුදලින් ගෙවීම් කිරීම හෝ හුවමාරුව සඳහා වූ වෙනත් වැඩපිළිවෙළක් ;

(ii) සුරැකුම්පත් නිෂ්කාශනය හා බේරුම් කිරීම සඳහා වූ යම් පද්ධතියක් සහ සුරැකුම්පත් හුවමාරුව සඳහා වූ වෙනත් වැඩපිළිවෙළක් ;

(iii) ඕනෑම ව්‍යවහාර මුදලක ගෙවීම් හෝ සුරැකුම්පත්වලට ඕනෑම ව්‍යවහාර මුදලකින් ගෙවීම් කිරීම හෝ ගෙවීම් හුවමාරු කිරීම හෝ සුරැකුම්පත් හුවමාරු කිරීම සඳහා වූ වෙනත් වැඩපිළිවෙළවල් ඇතුළුව, නිෂ්කාශනය සහ බේරුම් කිරීම සඳහා පහසුකම් සැලසීම පිණිස වූ යම් පද්ධති,

පිහිටුවීම, ක්‍රියාත්මක කිරීම, සංවිධානය, ප්‍රවර්ධනය, ඊට සහභාගිවීම හෝ ඒවා පිහිටුවීමට, ක්‍රියාත්මක කිරීමට, සංවිධානයට සහ ප්‍රවර්ධනයට සහායවීම සහ ඒවා විධිමත් කිරීම සහ අධීක්ෂණය කරනු ලැබිය හැකි ය.

5. (1) ශ්‍රී ලංකාව සඳහා ගෙවීම් පද්ධති ප්‍රතිපත්තියක් සකස් කිරීමට, පිළිගැනීමට සහ ක්‍රියාත්මක කිරීම, ප්‍රතිපත්ති සමීක්ෂණය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට බලය ඇත්තේ ය. එම ප්‍රතිපත්තිය ප්‍රසිද්ධ කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ස්වකීය නිලතල ක්‍රියාත්මක කිරීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුව උසස්ම ජාත්‍යන්තර ප්‍රමිතිවල මාර්ගෝපදේශකත්වය ලබාගත යුතු ය. මහ බැංකුවේ ගෙවීම් පද්ධති ප්‍රතිපත්තිය මූලික වශයෙන් මූල්‍ය ක්‍රමයේ සමස්ථ ස්ථාවරත්වය, ගෙවීම් පද්ධතියේ සුරක්ෂිතභාවය ප්‍රවර්ධනය කිරීම, කාර්යක්ෂමතාව සහ අවදානම පාලනය කිරීම සඳහා පහසුකම් සැලසෙන පරිදි සැලසුම් කළ යුතු ය. මෙම මූලික අරමුණට යටත්ව මෙම ප්‍රතිපත්තිය මහජන යහපත පිළිබඳ සෙසු අංශ වැඩි දියුණු කිරීමට, විශේෂයෙන් ගෙවීම් වෙළෙඳපලෙහි තරගකාරීත්වය ප්‍රවර්ධනය කිරීමට සහ ගෙවීම් පද්ධතිය පාවිච්චි කරන්නන්ගේ ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීමට දායක වන පරිදි සැලසුම් කළ යුතු ය.

(3) ගෙවීම් පද්ධතියේ සුරක්ෂිතභාවය හා කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කිරීමේ දී, ශ්‍රී ලංකා මහ බැංකුව වෙනත් රටවල මහ බැංකු සහ වෙනත් අදාළ දේශීය හෝ විදේශීය බලධරයන් සමග සහයෝගයෙන් ක්‍රියා කළ යුතු ය.

## II වන පරිච්ඡේදය

## සුරැකුම්පත් ගිණුම්

6\. (1) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එක් එක් සෘජු සහභාගිකරුවකු සඳහා සහ අලෙවිකාර සෘජු සහභාගිකරුවකුගේ එක් එක් ගනුදෙනුකරුවකු සඳහා සුරැකුම්පත් ගිණුම් පවත්වාගෙන යා යුතු ය. යම් තැනැත්තකු විසින් සුරැකුම්පත් ගිණුම් එකකට වැඩි සංඛ්‍යාවක් තබා ගත හැකි ය. සුරැකුම්පත් ගිණුමක් නාමෝද්දිෂ්ට සුරැකුම්පත් ගිණුමක් විය හැකි ය.

(2) සුරැකුම්පත් ගිණුම් හිමියකු විසින්, ඔහුගේ හෝ ඇයගේ සුරැකුම්පත් ගිණුමට හෝ නාමෝද්දිෂ්ට සුරැකුම්පත් ගිණුමට හෝ බැරකර තිබෙන සුරැකුම්පත් සංයුක්ත වන සියලු අයිතිවාසිකම්, ඊට අදාළ යම් විරුද්ධ හිමිකම් පෑමකට යටත්ව, ක්‍රියාවේ යොදනු ලැබිය හැකි ය :

එසේ වුව ද, ගනුදෙනුකාර සුරැකුම්පත් හිමියකු විසින් මේ වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි ඔහුගේ හෝ ඇයගේ සුරැකුම්පත් ගිණුමෙහි ගනුදෙනු කිරීම, ඒ ගනුදෙනුකරුගේ සුරැකුම්පත් ගිණුමෙහි ක්‍රියාකිරීමට බලය පවරනු ලැබ සිටින අලෙවිකාර සෘජු සහභාගිකරුවකු මගින් පමණක්, කරනු ලැබිය හැකි ය : තව ද

එසේම තවදුරටත්, මේ වගන්තිය යටතේ අයිතිවාසිකම් ක්‍රියාවේ යෙදීම ගිවිසුමක් කඩකිරීමෙන් වන අවස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම් අන්‍යාකාරව උල්ලංඝනය කිරීමක් වන අවස්ථාවක, ගිණුම්හිමියාට එරෙහිව වූ යම් ප්‍රතිකර්මයකට අගතියක් නොවිය යුතු ය.

(3) සුරැකුම්පත් ගිණුමක් පිළිබඳ වූ සියලු සංනිවේදන හා ගෙවීම්, ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කිරීම හෝ ශ්‍රී ලංකා මහ බැංකුවට හෝ ශ්‍රී ලංකා මහබැංකුව විසින් හෝ සිදු කිරීම—

(අ) ස්වකීය සුරැකුම්පත් ගිණුම් සම්බන්ධයෙන් සෘජු සහභාගිකරුවකු විසින්ම හෝ සෘජු සහභාගිකරුවකු වෙතට පමණක් ද ;

(ආ) ස්වකීය සුරැකුම්පත් ගිණුම් සම්බන්ධයෙන් සහ තමන්ට ක්‍රියා කිරීමට බලය දී තිබෙන තමන්ගේ ගනුදෙනුකරුවන්ගේ සුරැකුම්පත් ගිණුම් සම්බන්ධයෙන්, අලෙවිකාර සෘජු සහභාගිකරුවකු විසින්ම හෝ වෙතට පමණක් ම ද,

කරනු ලැබිය යුතු ය.

එක් එක් නියාදනය එම සුරැකුම්පත පැවරුම්කරුගේ සහ පැවරුම්ලාභියාගේ සුරැකුම්පත් ගිණුමෙහි කෙළින්ම වාර්තාගත කළ යුතු අතර, ඒ නියාදනයක් පැවරුම්කරු හෝ පැවරුම්ලාභියා වන ගනුදෙනුකරු වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා බලය පවරනු ලැබ සිටින අලෙවිකාර සෘජු සහභාගිකරුගේ ගිණුම ඔස්සේ සිදු නොවිය යුතු ය.

(4) මේ වගන්තියේ අන්තර්ගත විධිවිධාන, පිළිවෙලින් (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනතේ සහ (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ව්‍යාපාර වස්තු හා සුරැකුම්පත් ආඥාපනතේ විධිවිධාන සමග අනුකූලව කියවිය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ අවස්ථාවක දී එකී ආඥාපනත්වල විධිවිධාන බලපැවැත්විය යුතු ය.

7\. (1) සුරැකුම්පත් නියාදනය කිරීම, පිළිවෙලින් පැවරුම්කරුගේ සහ පැවරුම්ලාභියාගේ සුරැකුම්පත් ගිණුම්වල හර හා බැර සටහනක් කිරීමෙන් සිදු කරනු ලැබේ.

(2) නියාදනයක් කරනු ලැබූ විට, එම සුරැකුම්පතෙහි පැවරුම්කරුට තිබුණු හෝ පැවරීමට බලය තිබුණු හා පවරා දෙනු ලැබූ බැඳියාවේ ප්‍රමාණයට එම සුරැකුම්පතට අයිතිවාසිකම් පැවරුම්ලාභියාට අත් වේ. අත්කර ගත් සම්බන්ධතා සඳහා බැර සටහන් පැවරුම්ලාභියාගේ සුරැකුම්පත් ගිණුමෙහි ඇතුළත් කරනු ලැබූ සහ කිසි අහිතකර හිමිකම් පෑමක් පිළිබඳ දැනුම් දීමකින් තොරව පැවරුම්ලාභියා විසින් වටිනාකම් දෙනු ලැබ ඇති අවස්ථාවක එම සුරැකුම්පත කෙරෙහි පැවරුම්කරුට හිමි සම්බන්ධතාව අහිතකර හිමිකම්පෑමකින් නිදහස්ව පැවරුම්ලාභියාට අත්වන්නේ ය. මේ වගන්තියේ කාර්ය සඳහා—

(අ) පැවරුම්ලාභී ගනුදෙනුකරුගේ සුරැකුම්පත් ගිණුමෙහි ක්‍රියා කිරීමට බලය පවරනු ලැබ සිටින අලෙවිකාර සෘජු සහභාගිකරුගේ දැනුම්දීම ගනුදෙනුකරුට ආරෝපණය නොකළ යුතු ය ; තව ද

(ආ) පැවරුම්කරු ක්‍රියා කරනු ලබන්නේ භාරකරුවකු ලෙස, අනුයෝජිතයකු ලෙස හෝ නියෝජිත තත්ත්වයකින් බවට වූ දැනුම් දීමක් හෝ එම පැවරීම නාමෝද්දිෂ්ට සුරැකුම්පත් ගිණුමකින් බවට වූ දැනුම් දීමක් ඒ පමණින්ම විශ්වාසය හෝ අධිකාරී බලය කඩකිරීමක් බවට දැනුම් දීමක් නොවන අතර එය අහිතකර හිමිකම් පෑමක් පිළිබඳව දැනුම්දීමක් නොවන්නේ ය.

(3) ගනුදෙනුකරුවකුගේ අධිකාරය යටතේ සුරැකුම්පතක් සම්බන්ධයෙන් ගනුදෙනු කටයුතු කරන අලෙවිකාර සෘජු සහභාගිකරුවකු—

(අ) අහිතකර හිමිකම්පාන්නාගේ අයිතිවාසිකම් උල්ලංඝනය කළ යම් තැනැත්තකු සමග අපසහායකත්වයෙන් ක්‍රියා කළහොත් මිස ; හෝ

(ආ) එසේ ගනුදෙනු කිරීම වාරණය කරන, නිසි බලය ඇති අධිකරණයක් විසින් නිකුත් කරනු ලැබූ ඉන්ජන්ෂන් තහනමක්, වාරණ නියෝගයක් හෝ ණය හිමිකාර ක්‍රියාවලියක් භාර කරනු ලැබීමෙන් පසු එසේ ක්‍රියා කළේ නම් සහ අලෙවිකාර සෘජු සහභාගිකරුට ඉන්ජන්ෂන් තහනම, වාරණ නියෝගය හෝ වෙනත් අධිකරණ නියෝගය ප්‍රකාර ක්‍රියාකිරීමට ඉඩප්‍රස්ථාව තිබුණේ නම් මිස,

එම සුරැකුම්පත් කෙරෙහි අහිතකර හිමිකමක් ඇති තැනැත්තකුට වගකීමට බැඳී නොසිටින්නේ ය.

(4) සුරැකුම්පත් නියාදනයක් සම්බන්ධව කටයුතු කිරීමේ දී සහ එය සුරැකුම්පත් ගිණුම්වල වාර්තාගත කිරීමේ දී, ශ්‍රී ලංකා මහ බැංකුව, නිසි බලය ඇති අධිකරණයක් විසින් නිකුත් කරනු ලැබ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත නීත්‍යානුකූලව භාර කරන ලද බන්ධනීය හා බලසහිත ඉන්ජන්ෂන් තහනමකට, වාරණ නියෝගයකට හෝ ණයහිමිකාර ක්‍රියාවලියකට පටහැනිව ක්‍රියාකරන්නේ නම් මිස හෝ ශ්‍රී ලංකා මහ බැංකුව අසද්භාවයෙන් හෝ යම් වැරදිකරන්නකු සමග අපසහායකත්වයෙන් ක්‍රියා කරන්නේ නම් මිස, සෘජු සහභාගිකරුවකු, ගනුදෙනුකරුවකු, අහිතකර හිමිකම් දරන්නකු හෝ තුන්වන පාර්ශ්වකරුවකු ඇතුළු කවර වූ හෝ තැනැත්තකුට වගකීමේ බැඳීමක් ශ්‍රී ලංකා මහ බැංකුවට ඇති නොවන්නේ ය.

8\. (1) සුරැකුම්පත් ගිණුමකට බැරකරන ලද සුරැකුම්පතක් සුරැකුම්පත් ගිණුම් හිමියාගේ ණයහිමියකු විසින් හෝ ණයහිමියකුගේ ප්‍රතිලාභය පිණිස සුරැකුම්පත් ගිණුම් හිමියාට ඒ සුරැකුම්පතට ඇති බැඳියාවේ ප්‍රමාණයට සහ සුරැකුම්පත් ගිණුම් හිමියාගේ ණයක් පියවා ගැනීම පිණිස වූ අහිතකර හිමිකම්පෑමක ප්‍රමාණයට පමණක්, ණය හිමිකාර ක්‍රියාවලියකට, නීති ඇණවුම්කරණයකට හෝ වස්තුභංගත්වය පිළිබඳ නඩු කටයුත්තකට හෝ යටත් කරනු ලැබිය හැකි ය.

(2) පළමුවන උපවගන්තියේ ව්‍යාප්තියට අගතියක් නොමැතිව, ගනුදෙනුකරුවකු විසින් දරනු ලබන සුරැකුම්පත් ගිණුමකට බැරකරන ලද සුරැකුම්පතක්, එම ගනුදෙනුකරුගේ සුරැකුම්පත් ගිණුමේ කටයුතු කිරීමට බලය පවරා ඇති අලෙවිකාර සෘජු සහභාගිකරුවකුගේ ණයහිමියකු විසින් හෝ ඒ ණයහිමියකුගේ ප්‍රතිලාභය සඳහා හෝ එම අලෙවිකාර සෘජු සහභාගිකරුගේ යම් ණයක් පියවීම පිණිස ණයහිමිකාර ක්‍රියාවලියකට හෝ වස්තුභංගත්වය පිළිබඳ නඩුකටයුත්තකට හෝ යටත් කරනු ලැබිය නොහැකි ය.

(3) සුරැකුම්පතකට ණයකරුවකුට ඇති බැඳියාව අයකරගත හැක්කේ ණය හිමියකු සඳහා වූ ණය හිමිකාර ක්‍රියාවලියක් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යථා පරිදි භාර කිරීමෙන් පමණකි. තමන් වෙත යථා පරිදි භාර කළ ණය හිමිකාර ක්‍රියාවලියක් අනුව ශ්‍රී ලංකා මහ බැංකුව ක්‍රියා කළ යුතු ය.

9\. ගනුදෙනුකරුවකුගේ සුරැකුම්පත් ගිණුමේ කටයුතු කිරීමට බලය ලබා සිටින අලෙවිකාර සෘජු සහභාගිකරුවකු විසින් එම ගනුදෙනුකරුට විකුණනු ලැබූ, ඒ ගනුදෙනුකරුගේ සුරැකුම්පත් ගිණුමේ තිබෙන සුරැකුම්පතක වටිනාකම ගෙවීම ලබාගැනීමට එම අලෙවිකාර සෘජු සහභාගිකරු නමට ඇති කැප අයිතියට එම සුරැකුම්පත යටත් වන්නේ ය.

10\. මේ පරිච්ඡේදයෙහි, පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වේ නම් මිස—

"අහිතකර හිමිකම් පෑම" යන්නෙන්, හිමිකම් පාන්නා නොවන වෙනත් තැනැත්තකුගේ සුරැකුම්පත් ගිණුමකට බැර කර තිබෙන සුරැකුම්පතක, උකසක්, ඔඩපනයක් හෝ අයභාරයක් මත දී ඇති ණය මුදලක් ආපසු අය කර ගනු ලැබීමේ අයිතිවාසිකම හෝ ණය මුදලක් ආපසු ලබා ගැනීම සුරක්ෂිත කිරීම සඳහා ඇති කර ගන්නා ලද වෙනත් ගනුදෙනුවක් සහ භාරයක් යටතේ වූ ප්‍රතිලාභී අයිතියක් ඇතුළුව, සුරැකුම්පතෙහි දේපළ බැඳියාවක් සඳහා වූ හිමිකම් පෑමක් අදහස් වේ ;

"ණය හිමිකාර ක්‍රියාවලිය" යන්නෙන්, සුරැකුම්පතක් හෝ සුරැකුම්පත් ගිණුමකට අදාළව ණයහිමියකු හෝ වෙනත් හිමිකම් පාන්නකු වෙනුවෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් නිකුත් කරන ලද නියාදනයක් වළක්වන හෝ නියාදනයකට අවහිර කරන අධිකරණ නියෝගයක් ඇතුළත් අයකිරීමක්, තහනමක්, ගාහිෂි නියෝගයක්, කැප අයිතිය පිළිබඳ නොතීසියක්, දේපළ තහනමක්, හෝ ඒ සමාන අධිකරණ නියෝගයක් අදහස් වන නමුත් නාමෝද්දිෂ්ට සුරැකුම්පත් ගිණුමකට බැර කරනු ලැබූ සුරැකුමකට ඉදිරිපත් වූ අහිතකර හිමිකම් පෑමක් අහෝසි කිරීම පිණිස නාමෝද්දිෂ්ට සුරැකුම්පත් ගිණුමක සුරැකුම්පත් ගිණුම් හිමියකු විසින් ගන්නා ලද යම් ක්‍රියා මාර්ගයක් ඊට ඇතුළත් නොවේ ;

"ගනුදෙනුකරු" යන්න අලෙවිකාර සෘජු සහභාගිකරුවකු සම්බන්ධයෙන් යෙදෙන විට, නියාදනයක පැවරුම්කරු හෝ පැවරුම්ලාභියා වන, සෘජු සහභාගිකරුවකු නොවන, සුරැකුම්පත් ගිණුම් හිමියෙක් අදහස් වේ ;

"අලෙවිකාර සෘජු සහභාගිකරු" සහ "සෘජු සහභාගිකරු" යන්නෙහි, (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනතෙහි සහ (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ව්‍යාපාරවස්තු හා සුරැකුම්පත් ආඥාපනතේ ඒ යෙදුම්වලට දී තිබෙන අර්ථයම ඇත්තේ ය ;

"නාමෝද්දිෂ්ට සුරැකුම්පත් ගිණුම" යන්නෙන්, ගිණුමෙහි දරනු ලබන සුරැකුම්පත්වල හිමිකම ප්‍රතිවිරුද්ධ හිමිකම්පෑම්වලට යටත් බවට ප්‍රකාශිත සුරැකුම්පත් ගිණුමක් අදහස් වේ ;

"නියාදනය" යන්නෙන්, පැවරුම්කරුවකු සහ පැවරුම්ලාභියකු අතර සුරැකුම්පතක හිමිකම පරම වශයෙන් පැවරුමක් අදහස් වේ ;

"ස්වකීය සුරැකුම්පත් ගිණුම" යන්නෙන්, සුරැකුම්පත් ගිණුම හිමියා ලෙසට සෘජු සහභාගිකරුවකුගේ නමින් පවත්නා සුරැකුම්පත් ගිණුමක් අදහස් වේ ;

"සුරැකුම්පත් ගිණුම" යන්නෙන්, සුරැකුම්පත් බැර කරනු ලැබිය හැකි හා හර කරනු ලැබිය හැකි වූ ද සුරැකුම්පත් නියාදනයක් වාර්තාගත කරනු ලබන්නා වූ ද ශ්‍රී ලංකා මහ බැංකුවෙහි පවත්වාගෙන යනු ලබන්නා වූ ද, ගිණුමක් අදහස් වේ ;

"සුරැකුම්පත් ගිණුම් හිමියා" යන්නෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සුරැකුම්පත් ගිණුමක් පවත්වාගෙන යන්නේ යම් තැනැත්තකු නමින් ද ඒ තැනැත්තෙක් අදහස් වේ ;

"සුරැකුම්පත" යන්නෙන්—

(අ) (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව සහතිකපත් රහිත ස්වරූපයෙන් නිකුත් කරන භාණ්ඩාගාර බිල්පත් ;

(ආ) (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ව්‍යාපාරවස්තු හා සුරැකුම්පත් ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව සහතිකපත් රහිත ස්වරූපයෙන් නිකුත් කරන භාණ්ඩාගාර බැඳුම්කර ;

(ඇ) (422 වන අධිකාරය වූ) මුදල් නීති පනතේ විධිවිධාන වලට අනුකූලව සහතිකපත් රහිත ස්වරූපයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කරන සුරැකුම්පත්,

අදහස් වේ ;

"පැවරුම්ලාභියා" යන්නෙන්, නියාදනයක ප්‍රතිඵලයක් ලෙස සුරැකුම්පතක් තමන්ගේ නමට පවරනු ලබන්නා වූ සහ එය තමන්ගේ සුරැකුම්පත් ගිණුමට බැර කරනු ලබන්නා වූ නියාදනයක පාර්ශ්වකරු අදහස් වේ ;

"පැවරුම්කරු" යන්නෙන්, සුරැකුම්පතක් පවරා දෙන සහ ඒ නියාදනයේ ප්‍රතිඵලයක් ලෙස එම සුරැකුම්පත තමන්ගේ සුරැකුම්පත් ගිණුමට හර කරනු ලබන නියාදනයක පාර්ශ්වකරු අදහස් වේ.

## III වන පරිච්ඡේදය

## මුදල් සේවා හා ගෙවීමේ පද්ධති

11. මේ පරිච්ඡේදයේ විධිවිධාන අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සියලු සේවා සැපයුම්කරුවන් හෝ නිශ්චිතව සඳහන් යම් ගණයකට අයත් සේවා සැපයුම්කරුවන් අධීක්ෂණය, තත් කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් සාදනු ලැබිය හැකි නියෝගවලට අනුකූලව විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම සහ සමීක්ෂණය කරනු ලැබිය යුතු ය.

12. (1) යම් තැනැත්තකු විසින්—

(අ) යම් මුදල් සේවා සැපයීමෙහි හෝ ගෙවීමේ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමෙහි ලා යම් අනාරක්ෂිත, දුර්වල හෝ අසාධාරණ ක්‍රියා පිළිවෙතක යෙදී සිටින බව හෝ යෙදීමට සූදානමින් සිටින බව තම මතය වන ; හෝ

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ මතය අනුව මුදල් සේවා හෝ ගෙවීමේ පද්ධතිවලට නැතහොත් ඉන් යම් ගණයකට සම්බන්ධ, මේ පනතේ විධිවිධාන හෝ මේ පනත හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ සාදන ලද යම් රීතියක් හෝ නියෝගයක් හෝ දෙන ලද යම් උපදේශයක් හෝ කරන ලද විධානයක් හෝ නියමයක් උල්ලංඝනය කර ඇති බව හෝ ඒ විධිවිධාන පිළිපැදීම පැහැර හැර ඇති බව හෝ එසේ උල්ලංඝනය කිරීමට නැතහොත් පිළිපැදීම පැහැර හැරීමට ඉඩ තිබෙන බව ශ්‍රී ලංකා මහ බැංකුවේ මතය වන,

අවස්ථාවක ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවශ්‍ය යයි සලකනු ලබන කාලයක් ඇතුළත—

(i) ඒ ක්‍රියාවේ, නොකර හැරීමේ හෝ ක්‍රියා මාර්ගයේ යෙදීම නතර කරන ලෙස හෝ ඉන් වළකින ලෙස ; සහ

(ii) එම තත්ත්වය නිවැරදි කිරීම පිණිස ශ්‍රී ලංකා මහ බැංකුවේ මතය අනුව අවශ්‍ය කටයුතු කරන ලෙස,

ඒ තැනැත්තා වෙතට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විධානයක් නිකුත් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන සෑම විධානයක්ම, එය අරමුණු කළ සේවා සැපයුම්කරු වෙත භාර දිය යුතු අතර, එය භාරදෙනු ලැබූ දිනයේ සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ නිකුත් කරන සෑම විධානයක්ම එය නිකුත් කරනු ලබන්නේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා විෂයෙහි අනුගම්‍ය වන්නේ ය.

13. (1) ගෙවීමේ පද්ධතියක්, 14 වන හා 15 වන වගන්තිවල විධිවිධාන සලස්වා ඇති පරිදි අතිරේක නියෝගවලට සහ අධීක්ෂණයට යටත් කිරීම සඳහා නාමෝද්දේශනය කිරීම මහජන යහපත පිණිස වන බව ශ්‍රී ලංකා මහ බැංකුව සලකන්නේ නම්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එසේ නාමෝද්දේශනය කරනු ලැබිය හැකි ය.

(2) ගෙවීමේ පද්ධතියක් නාමෝද්දේශනය කිරීම මහජන යහපත පිණිස වන්නේ ද යන වග තීරණය කිරීමේ දී පහත සඳහන් සාධක සැලකිල්ලට ගත යුතු ය :—

(i) ගෙවීමේ පද්ධතියෙන් එහි සහභාගිකරුවන්ට සහ එය ප්‍රයෝජනයට ගන්නා වූ අයට සැලසෙන මූල්‍ය සුරක්ෂිතතා මට්ටම ;

(ii) ශ්‍රී ලංකාවේ ගෙවීම් පද්ධතිවල කාර්යක්ෂමතාව සහ තරගකාරීත්වය ; සහ

(iii) ගෙවීම් පද්ධතියේ සහභාගිකරුවන්ගේ සහ ඔවුන්ගේ ගනුදෙනුකරුවන්ගේ හෝ ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ හෝ වැඩිම යහපත.

(3) ගෙවීමේ පද්ධතියක් නාමෝද්දේශනය කිරීමට ප්‍රථම, එම නාමෝද්දේශනයේ බලපෑම පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එම පද්ධතියේ කළමනාකරුගේ සහ සහභාගිකරුවන්ගේ අදහස් විමසිය යුතු අතර, ඒ පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශ්වවල අදහස් විමසිය හැකි ය.

(4) අදාළ ගෙවීමේ පද්ධතිය නාමෝද්දේශනය කිරීම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එම පද්ධතියේ කළමනාකරුවන් හා සහභාගිකරු වෙත, යෝග්‍ය යයි බැංකුව සලකන යම් ආකාරයකින් දැනුම් දෙනු ලැබිය යුතු ය. නාමෝද්දේශනය ඒ දැනුම්දීමේ නිශ්චිතව සඳහන් දිනයේ සිට බලාත්මක විය යුතු ය. ඒ සෑම දැනුම්දීමක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

14. (1) නාමෝද්දිෂ්ට ගෙවීම් පද්ධතියේ කළමනාකරු හෝ කළමනාකරුවකු නොමැතිනම් පද්ධතියේ සහභාගිකරුවන් විසින්, එම නාමෝද්දිෂ්ට ගෙවීම් පද්ධතිය පාලනය වන සෑම ගෙවීම් පද්ධති රීතියකම පිටපතක් මෙහි මින් ඉදිරියට ගෙනහැර දැක්වෙන කාලසීමා ඇතුළත, එනම්—

(i) ගෙවීම් පද්ධති රීතිය සාදන ලද්දේ එම ගෙවීම් පද්ධතිය නාමෝද්දේශනය කිරීමට පූර්වයෙන් වන අවස්ථාවක, එසේ නාමෝද්දේශනය කරනු ලැබූ දිනයේ සිට දවස් තිහක් ඇතුළත ; සහ

(ii) ගෙවීම් පද්ධති රීතිය සාදන ලද්දේ එම ගෙවීම් පද්ධතිය නාමෝද්දේශනය කිරීමට පසුව වන අවස්ථාවක, එම රීතිය සාදනු ලැබූ දින සිට දවස් දහයක් ඇතුළත,

ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (i) වන ඡේදයේ සඳහන් ගෙවීම් පද්ධති රීතියක් නොවන ගෙවීම් පද්ධති රීතියක්, එහි පිටපතක් (1) වන උපවගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත එවීමෙන් පසු තිස්වන දිනයට පෙර ක්‍රියාත්මක නොවිය යුතු ය :

එසේ වුව ද එම ගෙවීම් පද්ධති රීතිය ඉහත සඳහන් කාලසීමාව ඉකුත්වීමට පෙර කවර හෝ වේලාවක දී බලාත්මක වන බවට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයක් කරනු ලැබිය හැකි ය.

(3) ගෙවීම් පද්ධති රීතියක් ප්‍රමාණවත්ව සමාලෝචනයට භාජනය කිරීමට ඉඩ සැලසීම පිණිස, (2) වන උපවගන්තියේ නිශ්චය කොට දැක්වෙන කාලසීමාව දීර්ඝ කිරීම අවශ්‍ය බව ශ්‍රී ලංකා මහ බැංකුවේ මතය වන අවස්ථාවක, එම ගෙවීම් පද්ධති එම රීතිය ලැබී දවස් දහයක් ඇතුළත එම රීතිය එවන ලද තැනැත්තාට ලිඛිත දැනුම්දීමක් කර, එම කාලසීමාව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දවස් තිහක් දක්වා දීර්ඝ කළ හැකි ය.

(4) නාමෝද්දිෂ්ට ගෙවීම් පද්ධතියක් පාලනය වන ගෙවීම් පද්ධති රීතියක් බලාත්මක වීමට පෙර හෝ බලාත්මක වීමෙන් පසු කවර හෝ වේලාවක හෝ බලාත්මකව පවතිද්දී හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එය සම්පූර්ණයෙන් නැතහොත් ඉන් කොටසක් ප්‍රතික්ෂේප කරනු ලැබූ විට, එම ප්‍රතික්ෂේප කිරීමේ තීරණය නාමෝද්දිෂ්ට ගෙවීම් පද්ධතියේ කළමනාකරුට හෝ සහභාගිකරුවකුට දැනුම් දෙනු ලැබූ මොහොතේ පටන් හෝ එම ගෙවීම් පද්ධති රීතිය ප්‍රතික්ෂේප කිරීමේ තීරණය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දැනුම් දීමේ දී උපදෙස් දෙන පරිදි ඉන්පසු කිසියම් වේලාවක සිට බලරහිත වන්නේ ය.

(5) (අ) බලාත්මක පවතින ගෙවීම් පද්ධති රීතියක්, සංශෝධනය කිරීමේ හෝ ප්‍රතියෝජනය කිරීමේ අවශ්‍යතාව මතුවන පරිදි, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් (4) වන උපවගන්තිය යටතේ එම ගෙවීමෙහි රීතිය, සම්පූර්ණයෙන් හෝ කොටසක් හෝ ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක, නාමෝද්දිෂ්ට ගෙවීම් පද්ධතිය අඛණ්ඩව මැනවින් ක්‍රියාත්මක වීමට පහසුවනු පිණිස, එම රීතිය ප්‍රතික්ෂේප කිරීමේ ශ්‍රී ලංකා මහ බැංකුවේ තීරණය 15 වන වගන්තිය ප්‍රකාර විධානයක ඇතුළත් කළ යුතු ය. ගෙවීම් පද්ධති රීතියේ සිදු කළ යුතු සංශෝධනය හෝ ප්‍රතියෝජනය ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, අදාළ නාමෝද්දිෂ්ට ගෙවීම් පද්ධතියේ කළමනාකරු වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය ;

(ආ) ගෙවීම් පද්ධති රීතියෙහි සංශෝධනයක් හෝ ප්‍රතියෝජනයක් එම ගෙවීම් පද්ධතිය විසින් සම්මත කරගන්නා තෙක් අදාළ කරගත යුතු තාවකාලික ගෙවීම් පද්ධති රීතියෙහි වචන මාලාව ඒ සෑම විධානයක් මගින්ම සපයනු ලැබිය යුතු ය. සංශෝධනය කිරීමට හෝ ප්‍රතියෝජනය කිරීමට නියමිත ගෙවීම් පද්ධති රීතිය බලරහිත වූ වහාම තාවකාලික ගෙවීම් පද්ධති රීතිය බලාත්මක විය යුතු ය.

(6) (2) වන උපවගන්තියේ නියමයක් අදාළවීමෙන් යම් නාමෝද්දිෂ්ට ගෙවීම් පද්ධතියක්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිදහස් කරනු ලැබිය හැකි ය.

15. (1) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙහි පහත සඳහන් කවර හෝ කාරණයක් හෝ කාරණා වැඩි සංඛ්‍යාවක් සම්බන්ධයෙන් හෝ නාමෝද්දිෂ්ට ගෙවීම් පද්ධතියක කළමනාකරු වෙත හෝ සහභාගිකරුවකු වෙත ලිඛිත විධානයක් නිකුත් කළ හැකි ය :—

(අ) නාමෝද්දිෂ්ට ගෙවීම් පද්ධතියකට ප්‍රවේශවීම හෝ පද්ධතියක සහභාගිකරුවකු වීම සඳහා යම් තැනැත්තකු විසින් සපුරා ලිය යුතු කොන්දේසි ;

(ආ) අනුගමනය කළ යුතු නිෂ්කාශන හා බේරුම් කිරීමේ ක්‍රියාමාර්ග ඇතුළුව, නාමෝද්දිෂ්ට ගෙවීම් පද්ධතියක ක්‍රියාකාරීත්වය ;

(ඇ) වෙනත් ගෙවීම් පද්ධති සමග, නාමෝද්දිෂ්ට ගෙවීම් පද්ධතියක අන්‍යෝන්‍ය ක්‍රියා පිළිවෙත ;

(ඈ) නාමෝද්දිෂ්ට ගෙවීම් පද්ධතියක් හා එහි සහභාගිකරුවන් අතර සබඳතා.

(2) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් (1) වන උපවගන්තිය යටතේ යම් ලිඛිත විධානයක් නිකුත් කිරීමට ප්‍රථම එහි අන්තර්ගත කරුණු සහ එම විධානයේ බලපෑම් පිළිබඳව එය යවනු ලබන්නේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තාගේ අදහස් විමසිය යුතු වන අතර, සහ එහි අන්තර්ගත කරුණු හා එහි බලපෑම පිළිබඳව උනන්දුවක් දක්වන තැනැත්තන්ගේ අදහස් විමසිය හැකි ය.

(3) නාමෝද්දිෂ්ට ගෙවීම් පද්ධතියේ කළමනාකරු හෝ ඒ පද්ධතියක සහභාගිකරුවකු විසින්, අවශ්‍ය යයි ශ්‍රී ලංකා මහ බැංකුව සලකන යම් කාලයක් ඇතුළත—

(i) යම් ක්‍රියාවක හෝ ක්‍රියා මාර්ගයක යෙදීම නතර කළයුතු බවට හෝ යෙදීමෙන් වැළකිය යුතු බවට ;

(ii) මහජන යහපත පිණිස අවශ්‍ය බව ශ්‍රී ලංකා මහ බැංකුවේ මතය වන යම් ක්‍රියා ඉටු කළ යුතු බවට ; හෝ

(iii) ගෙවීම් පද්ධති රීතියක් සෑදිය යුතු, සංශෝධනය කළ යුතු හෝ ඉවත් කළ යුතු බවට,

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලිඛිත විධානයක් මගින් නිශ්චිතව නියම කරනු ලැබිය හැකි ය.

(4) විධානයක් ක්‍රියාත්මක කිරීමෙන් සහ ඒ සම්බන්ධව කිරීමට නියමිත ක්‍රියා ඉටු කිරීම සම්පූර්ණ කිරීමෙන් පසු එම විධානය ක්‍රියාත්මක කළ බව සහ ක්‍රියා සම්පූර්ණයෙන් ඉටු කළ බව, එම විධානය ලැබූ තැනැත්තා විසින් ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මණින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත දැනුම් දිය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ නිකුත් කරන ලද සෑම විධානයක්ම, එය අරමුණු කර ඇත්තේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තාට දැනුම් දිය යුතු අතර නිකුත් කරනු ලැබූ දින සිට එම විධානය ක්‍රියාත්මක වන්නේ ය. යම් විධානයක්, එය අරමුණු කරනු ලැබූ තැනැත්තා විෂයෙහි අනුගම්‍ය වන්නේ ය.

16. (1) ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, සේවා සැපයුම්කරුවන් සහ සේවා සැපයුම්කරුවකු බවට ශ්‍රී ලංකා මහ බැංකුව තීරණය කරන යම් තැනැත්තකු හෝ මේ පරිච්ඡේදය යටතේ නාමෝද්දේශනය කරන ගෙවීම් පද්ධතියක් විගණනය කිරීම හා පරීක්ෂා කිරීම සහ ඒ සේවා සැපයුම්කරුවකුට හෝ තැනැත්තකුට ගිණුම්, වාර්තා, සහ ලිපි ලේඛන ඉදිරිපත් කරන ලෙස නියම කිරීම, ඔවුන්ගේ කාර්යාල පරීක්ෂා කිරීම සහ තොරතුරු ඉල්ලා සිටීම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් අනුව ක්‍රියා කිරීම එසේ ඉල්ලීමක් කරනු ලැබූ තැනැත්තකුගේ හෝ ඒ තැනැත්තකුගේ සේවා නියුක්තයකුගේ, අනුයෝජිතයකුගේ හෝ කළමනාකරුවකුගේ කාර්යය විය යුතු ය.

(3) අවශ්‍ය යයි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සලකනු ලබන අවස්ථාවක දී (1) වන උපවගන්තිය යටතේ විගණන සහ පරීක්ෂණ, සම්පූර්ණයෙන්ම හෝ කොටසක් හෝ ශ්‍රී ලංකා මහ බැංකුව වෙනුවෙන් සුදුසුකම් ලත් විගණකවරුන් විසින් කරනු ලැබිය යුතු බවට සහ ඔවුන්ගේ වාර්තාව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කළ යුතු බවට නියම කළ හැකි ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණක" යන්නෙහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ (8) වන ඡේදයේ ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය.

(5) මේ පරිච්ඡේදය යටතේ ගෙවීම් පද්ධතියක කළමනාකරුවකු වෙත නියමිත සියලු කාර්යයන් සෑම සහභාගිකරුවකු විසින්ම ඉටු කළ යුතු වන්නේ ය.

(6) මේ පරිච්ඡේදය යටතේ ගෙවීම් පද්ධතියක කළමනාකරු විසින් ඉටු කළ යුතු යයි නියමිත කාර්ය ඉටුකිරීම ඒ පද්ධතියක කළමනාකරු පැහැර හැරියහොත්, සහභාගිකරුවන් එක්ව සහ වෙන් වෙන්ව එම කාර්ය ඉටු කළ යුතු අතර, එම උල්ලංඝනය සම්බන්ධයෙන් කළමනාකරු බැඳී සිටින ආකාරයටම හා ප්‍රමාණයටම සහභාගිකරුවන් ද බැඳීමට යටත් වන්නේ ය.

(7) මේ වගන්තියට අනුකූලව යම් විගණනයක් හෝ පරීක්ෂණයකට අදාළව දිවුරුම /ප්‍රතිඥාව මත සාක්ෂි ලබා ගැනීමේ කාර්යය සඳහා (17 වන අධිකාරය වූ) දිවුරුම් ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව දිවුරුම් හෝ ප්‍රතිඥා ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුවට බලය ඇත්තේ ය.

17. (1) මේ පරිච්ඡේදයේ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්යය සඳහා, මේ පරිච්ඡේදය යටතේ නියම කළ යුතු යම් කාරණයක් සම්බන්ධයෙන් හෝ නියෝග සැදිය යුතු යයි මේ පරිච්ඡේදය යටතේ නියමිත හෝ බලය දී ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් හෝ අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) විශේෂයෙන් හා (1) වන උපවගන්තියෙන් පැවරී තිබෙන බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව, අමාත්‍යවරයා විසින් පහත සඳහන් කරුණු සඳහා නියෝග සැදිය හැකි ය :—

(අ) මුදල් සේවා සැපයිය හැක්කේ සහ ගෙවීම් පද්ධති ක්‍රියාත්මක කළ හැක්කේ හා නාමෝද්දේශනය කළ හැක්කේ යම් කොන්දේසි, නියමයන් සහ ප්‍රමිති යටතේ ද ඒ කොන්දේසි, නියමයන් හා ප්‍රමිති සඳහා විධිවිධාන සැලසීම ;

(ආ) සේවා සැපයුම්කරුවන්ට ලියාපදිංචි වන ලෙස හෝ බලපත්‍ර ලබා ගන්නා ලෙස නියම කිරීම සහ එම ලියාපදිංචි කිරීමේ හෝ බලපත්‍ර ලබා ගැනීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය නියම කිරීම ; එසේ ලියාපදිංචිවීම හෝ බලපත්‍ර ලබා ගැනීම සඳහා කොන්දේසි සහ අවශ්‍යතා නියම කිරීම සහ එම ලියාපදිංචිය හෝ බලපත්‍රය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවලංගු කළ හැක්කේ කවර අවස්ථාගත කරුණු යටතේ ද යන වග නියම කිරීම ;

(ඇ) සේවා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සහ සේවා සැපයුම්කරුවන්ට බලපත්‍ර දීම සඳහා ගාස්තු අයකිරීම පිණිස සහ එම අයකිරීම් හා ගාස්තු මුදල් ප්‍රමාණය සඳහා විධිවිධාන සැලැස්වීම ;

(ඈ) සේවා සැපයුම්කරුවන් විධිමත් කිරීම, අධීක්ෂණය සහ සමීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය කාර්ය පටිපාටිය නියම කිරීම ;

(ඉ) නියෝග මගින් වර්ග කරන ලද පරිදි විවිධ ගණවල සේවා සැපයුම්කරුවන්ට බලපත්‍ර දීම, ඔවුන් ලියාපදිංචි කිරීම හෝ ඔවුන් නාමෝද්දේශනය කිරීම, ඔවුන් සඳහා නියම කළ යුතු ගාස්තු සහ අයකිරීම් ඇතුළුව මෙම පරිච්ඡේදය යටතේ කවර හෝ කාරණයකට අදාළ කොන්දේසි, නියමයන්, මාර්ගෝපදේශ, කාර්ය පටිපාටි, ක්‍රියා මාර්ග සහ ඒ යටතේ විධිවිධාන සලසා ඇති ප්‍රමිති නිශ්චය කොට දැක්වීම ;

(ඊ) සේවා සැපයුම්කරුවන් වෙනුවෙන් මුල්‍ය සේවාවක හෝ ගෙවීම් පද්ධතියක යම් කොටසක් ඉටුකිරීම හෝ ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබන හෝ ඒ සඳහා බලය පවරනු ලැබ සිටින යම් තැනැත්තකුට මේ පරිච්ඡේදය යටතේ කොන්දේසි, නියමයන්, මාර්ගෝපදේශ, කාර්ය පටිපාටි, ක්‍රියා මාර්ග හා ප්‍රමිති අදාළ වන ආකාරය නිශ්චය කොට දැක්වීම ;

(උ) මුදල් ප්‍රේෂණ සේවා සපයන්නන් ඇතුළුව තැනැත්තන් ගෙවීම් පද්ධතියකට සහභාගි විය හැක්කේ හෝ ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ගිණුම් හා තැන්පතු පවත්වා ගෙන යා හැක්කේ කවර කොන්දේසි හා නියමයන් යටතේ ද යන්න නිශ්චය කොට දැක්වීම ;

(ඌ) ගිණුම් තැබීමේ හා වාර්තා කිරීමේ අවශ්‍යතා ඇතුළුව සේවා සැපයුම්කරුවන්ට අදාළව විචක්ෂණ අවශ්‍යතාවයන් අවශ්‍යකරන දෑ, නිශ්චයකොට දැක්වීම ;

(එ) සේවා සැපයුම්කරුවන් සංස්ථාගත කිරීමේ ස්වරූපය හෝ සේවා සැපයුම්කරුවන්ගේ සංවිධානය, පරිපාලනය, කළමනාකරණය, හැසිරවීම, පාලනය, ප්‍රාග්ධනයේ ප්‍රමාණවත් බව හා වෙනත් ප්‍රාග්ධන නියමයන්, අයිතිකාරත්වයේ ව්‍යුහය, කොටස්කරුවන්ගේ සහ පරිපාලකයන්ගේ තත්ත්වය හා ව්‍යාපාරික හා ආයෝජන බලතල ඇතුළුව සේවා සැපයුම්කරුවන්ගේ සංස්ථාමය කාරණාවලට අදාළ අවශ්‍යතා, ප්‍රමිති සහ මාර්ගෝපදේශ නිශ්චය කොට දැක්වීම ;

(ඒ) නිශ්චය කරනු ලබන විස්තර හා ආකෘතියකට අනුකූලව සේවා සැපයුම්කරුවන්ගේ ගනුදෙනුකරුවන් හෝ සහභාගිකරුවන් පිළිබඳව සහ ඔවුන්ගේ ගනුදෙනු හෝ යම් ගණයක ගනුදෙනුවලට අදාළ නිශ්චිත කාරණා සම්බන්ධ තොරතුරු එක්රැස් කිරීම, තොරතුරු වාර්තා පවත්වා ගැනීම සහ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වාර්තා කිරීමට අදාළ නියමයන්, ප්‍රමිති හා මාර්ගෝපදේශ ඇතුළුව, සේවා සැපයුම්කරුවන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පරීක්ෂා කරනු ලැබීම පහසු කරවනු පිණිස සැලසුම් කළ සේවා සැපයුම්කරුවන් සඳහා වූ අවශ්‍යතා, ප්‍රමිති හා මාර්ගෝපදේශ නිශ්චයකොට දැක්වීම ; සහ

(ඔ) ගනුදෙනුකරුවන් හා සහභාගිකරුවන්ගේ හෝ ඔවුන්ගේ යම් ගණයක ආරක්ෂාව සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග නිශ්චය කොට දැක්වීම සහ විශේෂයෙන්, හෙළිදරව් කිරීමේ නියමයන් නිශ්චය කොට දැක්වීම හා මුදල් සේවා සැපයුම්කරුවන්ගේ සහ ඔවුන්ගේ ගනුදෙනුකරුවන්ගේ හා ගෙවුම් පද්ධතිවල සහ ඒවායේ සහභාගිකරුවන්ගේ ගිවිසුම්ගත නියමයන් විධිමත් කිරීම.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලැබූ දිනයේ සිට හෝ නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලබන යම් පසු දිනයක සිට ක්‍රියාත්මක වන්නේ ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ පසු අනුමතය සඳහා හැකිතාක් ඉක්මණින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක්ම, ඒ යටතේ ඊට පූර්වයෙන් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව, එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සැලකිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් පරිච්ඡින්න වූ දිනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

18. පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වෙනම් මිස, මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා –

"චෙක්පත් මුදල් කිරීම" යන්නෙන්, ගෙවීම් සාධන පත්‍රයක් හෝ රාශිගත අගය භාරදෙන්නකු වෙත ඒ සඳහා හුවමාරු ලෙස මුදල් ගෙවීම් සාධන පත්‍ර හෝ රාශිගත අගයක් දෙමින්, පළමු සඳහන් ගෙවීම් සාධන පත්‍රය හෝ රාශිගත අගය භාර ගැනීම සඳහා හිලව් අගයක් ලබා ගැනීම අදහස් වේ ;

"ව්‍යවහාර මුදල් හුවමාරුව" යන්නෙන්, එක් ආණ්ඩුවක් නිකුත් කළ, තහවුරු කළ බලය දුන් හෝ පිළිගත් මුදල් හෝ ඒ ආණ්ඩුවේ මුදල් ඒකකවලින් දැක්වෙන මූල්‍ය අගයක් වෙනත් ආණ්ඩුවක් විසින් නිකුත් කළ, තහවුරු කළ, බලය දෙන ලද හෝ පිළිගත් මුදලකට හෝ ඒ ආණ්ඩුවේ මුදල් ඒකකවලින් දැක්වෙන මූල්‍ය අගයට හුවමාරු කිරීමෙන් අය ලැබීම අදහස් වේ ;

"නාමෝද්දිෂ්ට ගෙවුම් පද්ධතිය" යන්නෙන්, මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ නමෝද්දිෂ්ට ගෙවුම් පද්ධතියක් අදහස් වේ ;

"කළමනාකරු" යන්නට සේවා සැපයුම්කරුවන්ගේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ඇතුළත් වන අතර, එම පදයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මතය අනුව, සේවා සැපයුම්කරුවකුගේ ව්‍යාපාරය සහ කටයුතු අධීක්ෂණය හා ඒ ව්‍යාපාරය හා කටයුතු කළමනාකරණය සම්බන්ධයෙන් වගකිව හැකි තත්ත්වයක් දරන යම් තැනැත්තෙක් අදහස් වේ. (මේ පරිච්ඡේදය යටතේ කළමනාකරුවකු වෙතට කරනු ලැබිය යුතු දැනුම් දීම්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙනත් තැනැත්තකු කළමනාකරු ලෙස නිශ්චිතව නම් කළහොත් මිස, එම සේවා සැපයුම්කරු ශ්‍රී ලංකා මහ බැංකුව වෙතට කළමනාකරු බවට දැනුම් දෙන තැනැත්තා වෙත යවනු ලැබිය යුතු ය.) ;

"මුදල් අගය" යන්නෙන්, රාශිගත අගයක්, ගෙවීම් සාධන පත්‍රයක් හෝ ගිණුමට බැර කිරීමක් ඇතුළුව මුදල් මගින් බේරුම් කරගත හැකි වුව ද, නොවුව ද, විනිමය මාධ්‍යයක් අදහස් වේ ;

"මුදල්" යන්නෙන්, ශ්‍රී ලංකාව විසින් හෝ විදේශීය ආණ්ඩුවක් විසින් හෝ නිකුත් කළ, තහවුරු කළ, බලය දුන් හෝ පිළිගත් මුදල් ඒකකයක් හෝ විනිමය මාධ්‍යයක් අදහස් වේ. එම යෙදුමට අන්තර් ආණ්ඩු සංවිධානයක් විසින් හෝ ආණ්ඩු දෙකක් හෝ වැඩි සංඛ්‍යාවක් අතර ගිවිසුමක් මගින් හෝ නිකුත් කළ, තහවුරු කළ, බලය දුන් හෝ පිළිගත් මුදල් ඒකකයක් හෝ විනිමය මාධ්‍යයක් ඇතුළත් වේ ;

"මුදල් සේවා" යන්නෙන්, මුදල් සුරැකිව තබා ගැනීම, මුදල් ප්‍රේෂණය, චෙක්පත් මුදල් කිරීම හෝ ව්‍යවහාර මුදල් හුවමාරුව සහ ඒ හා සමාන යම් සේවා ඇතුළුව මුදල් පිළිබඳ වූ වෙනත් සේවයක් අදහස් වේ ;

"මුදල් ප්‍රේෂණය" යන්නෙන්, මුදල් හෝ මුදල් අගයක් ප්‍රේෂණය සම්බන්ධව මුදල් හෝ මුදල් අගයක් ප්‍රේෂකගෙන් හෝ ප්‍රතිලාභියකු සඳහා හෝ විකිණීම හෝ මුදල් අගයක් නිකුත් කිරීම හෝ මුදල් හෝ මුදල් අගයක් ලැබීම අදහස් වන අතර එයට ගිණුම් අතර මුදල් අගයක් මාරු කිරීම සඳහා හෝ තුන්වන පාර්ශ්වයන්ට මුදල් අගයක් ගෙවීම සඳහා මුදල් ආපසු ලබා ගැනීමේ පහසුකමක් සඳහා විධිවිධාන සැලැස්වීම ඇතුළත් වේ. මෙම යෙදුමට ප්‍රේෂක හෝ ප්‍රතිලාභියා පාර්ශ්වකරුවකු හෝ සෘජු සහභාගිකරුවකු නොවන්නා වූ නමුත් ප්‍රේෂකගෙන් ප්‍රතිලාභියා වෙත ප්‍රේෂණය කිරීමක් සිදුවන යම් ගනුදෙනුවකට හෝ වැඩ පිළිවෙලකට සහභාගි වීම ඇතුළත් වේ. මුදල් ප්‍රේෂණය ශ්‍රී ලංකාව හෝ වෙනත් යම් රටක් ඇතුළත, ශ්‍රී ලංකාවට හෝ වෙනත් යම් රටකට ශ්‍රී ලංකාවෙන් හෝ වෙනත් යම් රටකින් එක් ස්ථානයක සිට වෙනත් ස්ථානයකට විය හැකි ය ;

"සහභාගිකරු" යන්නෙන්, ගෙවීමේ පද්ධතියක් පිළිබඳ වැඩ පිළිවෙලක පාර්ශ්වයක් අදහස් වේ. එය බැංකුවක්, මුදල් ප්‍රේෂණ සේවා සැපයුම්කරුවකු හෝ වෙනත් යම් තැනැත්තකු විය හැකි නමුත්, ගෙවීම් ක්‍රමය ඔස්සේ ගෙවීම් සඳහා උපදෙස් දෙන හෝ ගෙවීම් ලබන පාරිභෝගිකයකු හෝ සහභාගිකරුවකුගේ ගනුදෙනුකරුවකු ඊට ඇතුළත් නොවේ ;

"ගෙවීම් කාඩ්පත" යන්නෙන්, මුදල් ලබා ගැනීම හෝ ගෙවීම් කිරීම පිණිස වරින්වර ප්‍රයෝජනයට ගනු ලැබිය හැකි සංකේතයක් හෝ වෙනත් උපක්‍රමයක් ඇතුළු යම් ගිණුමකට හෝ රාශිගත අගයකට හෝ ණය මුදලකට ප්‍රවේශය ලබාගත හැකි යම් කාඩ්පතක්, තහඩුවක්, කූපන් පොතක් හෝ වෙනත් උපක්‍රමයක් අදහස් වන අතර හර අයකිරීම, අයභාර, ණය සහ රාශිගත අගය කාඩ්පතක් ද ඊට ඇතුළත් වේ ;

"ගෙවීම් සාධන පත්‍රය" යන්නෙන්, මුදල් හෝ මුදල් අගයක් ප්‍රේෂණය සඳහා හෝ ගෙවීම පිණිස වන, ගනුදෙනු කළ හැකි වුව ද නොහැකි වුව ද යම් චෙක්පතක්, අණකරයක්, මුදල් ඇණවුමක්, සංචාරක චෙක්පතක්, ගෙවීම් කාඩ්පතක් හෝ වෙනත් සාධන පත්‍රයක් අදහස් වේ. නිකුත් කරන්නා විසින් භාණ්ඩ හෝ සේවාවලින් බේරුම් කරගත හැකි ක්‍රෙඩිට් කාඩ් වවුචරයක්, ණයවර ලිපියක් හෝ සාධන පත්‍රයක් එම යෙදුමට ඇතුළත් නොවේ ;

"ගෙවීමේ පද්ධතිය" යන්නෙන්, ගෙවුම් අණකර සහ ගෙවීම් සිදු කරන,ගෙවීමට අණකරන, ගෙවීම් සඳහා හැකියාව ලබාදෙන හෝ ගෙවීම් කිරීමට, මුදල් ප්‍රේෂණයට, මුදල් ආපසු ගැනීමට හෝ මුදල් අගය අන්සතු කිරීමට පහසුකම සලසන ගෙවුම් අණකර සහ වෙනත් පණිවුඩ, සංනිවේදනය, සැකසුම්, හුවමාරුව, නිෂ්කාශනය හෝ බේරුම් කිරීම සඳහා වූ විධික්‍රමයක් හෝ පිළිවෙලක් අදහස් වේ ;

"ගෙවීමේ පද්ධති රීතිය" යන්නෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කළ රීතියක් නොවන සහ කවර නමකින් හැඳින්වුවද, ගෙවීමේ පද්ධතියක ක්‍රියාකාරිත්වය, නිෂ්කාශනය සහ බේරුම් කිරීම ඇතුළුව ගෙවීමේ පද්ධතියක් පාලනය වන රීතියක් අදහස් වේ. එයට ගෙවීම් පද්ධති රීතියක් සංශෝධනය හෝ ඉවත් කිරීම ඇතුළත් වේ ;

" තැනැත්තා" යන්නෙන්, පුද්ගලයෙක්, සංස්ථාවක්, ව්‍යාපාරික භාරයක්, බූදලයක්, භාරයක්, හවුල් ව්‍යාපාරයක්, සීමිත වගකීම් සහිත සමාගමක්, සංගමයක්, හවුල් ව්‍යවසායක්, ආණ්ඩුවක්, ආණ්ඩුවක අතුරු කොට්ඨාසයක්, නියෝජිත ආයතනයක්, උපකරණීයත්වයක්, රාජ්‍ය සංස්ථාවක් හෝ වෙනම නෛතික පෞරුෂයක් ඇති හෝ නොමැති වෙනත් යම් පොදු, පෞද්ගලික හෝ වාණිජ පුද්ගල මණ්ඩලයක්, ඒකකයක් හෝ සංවිධානයක් අදහස් වේ ;

" වාර්තාව" යන්නෙන්, ස්පර්ශනීය මාධ්‍යයක සටහන් කර තිබෙන නැතහොත් විද්‍යුත් හෝ වෙනත් මාධ්‍යයක ගබඩා කර තිබෙන සහ ඉන්ද්‍රියයන්ගෙන් ග්‍රහණය කර ගත හැකි ආකාරයෙන් නැවත ලබාගත හැකි තොරතුරු අදහස් වේ ;

"සේවා සැපයුම්කරු" යන්නෙන්, මුදල් සේවා සපයන යම් තැනැත්තෙක් හෝ ගෙවීම් පද්ධතියක් ක්‍රියාත්මක කරන තැනැත්තෙක් අදහස් වේ ;

"රාශිගත අගය" යන්නෙන්, විද්‍යුත් වාර්තාවක් මගින් සාක්ෂි දරන මුදල් අගය අදහස් වේ.

## IV වන පරිච්ඡේදය

## නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධති

19. (1) නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතියක් ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියට අවදානමක් අභිමුඛ වන ආකාරයකින් පවත්වාගෙන යා හැකි බව ශ්‍රී ලංකා මහ බැංකුවේ මතය වන අවස්ථාවක, එම නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතිය මේ පරිච්ඡේදයේ විධිවිධානවලට යටත් ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියට වැදගත් නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතියක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නාමෝද්දේශනය කරනු ලැබිය හැකි ය.

(2) එම නාමෝද්දේශනය පිළිබඳව, ශ්‍රී ලංකා මහ බැංකුව ඒ නාමෝද්දිෂ්ට නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතියක නිෂ්කාශනාගාරයක් වෙත ලිඛිතව දැනුම් දී එම නාමෝද්දේශනයේ පිටපතක් ගැසට් පත්‍රයේ පළ කිරීමට සැලැස්විය යුතු ය. එම අදාළ නිවේදනය කළ දිනයේ සිට එම නාමෝද්දේශනය බලාත්මක වන්නේ ය.

(3) නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතියක් පනතේ මේ කොටසේ IV වන පරිච්ඡේදය යටතේ ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියට වැදගත්කමක් ඇති පද්ධතියක් බවට නාමෝද්දේශනය කිරීම, එම පද්ධතියම මේ පනතේ III වන පරිච්ඡේදය යටතේ අමතර විධිමත් කිරීමකට, අධීක්ෂණයකට සහ සමීක්ෂණයකට යටත් ගෙවීමේ පද්ධතියක් බවට නාමෝද්දේශනය කිරීමට අමතරව කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද, ඉහත කී පරිදි පනතේ පරිච්ඡේද දෙක අනුව නාමෝද්දේශනය කිරීමක් පවතින අවස්ථාවක, එම පරිච්ඡේද දෙකෙහිම විධිවිධාන අනුව ක්‍රියා කිරීම මේ පනතේ III වන හා IV වන පරිච්ඡේදවල විධිවිධානවලට යටත් තැනැත්තන්ගේ යුතුකම වන්නේ ය.

20. (1) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙහි පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් නිෂ්කාශනාගාරයකට හෝ නාමෝද්දිෂ්ට නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතියක සහභාගිකරුවකුට රීති උපදෙස් සහ විධාන නිකුත් කිරීම හා නිෂ්කාශනාගාරයක් හෝ නාමෝද්දිෂ්ට නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතියක් සමඟ යම් ගිවිසුමකට ඇතුළත් වීම හෝ ඒ දෙකම හෝ කරනු ලැබිය හැකි ය :—

(අ) ශුද්ධ අගය යෙදීමේ වැඩපිළිවෙලවල් ;

(ආ) අවදානම හවුලේ බුක්තිවිඳීමේ සහ අවදානම පාලනය කිරීමේ යාන්ත්‍රණ ;

(ඇ) බේරුම් කිරීමේ නියතභාම සහ ගෙවීමේ සමාප්තිය ;

(ඈ) සහභාගිකරුවන් අතර මූල්‍ය වැඩපිළිවෙලවල ස්වභාවය ;

(ඉ) නිෂ්කාශනාගාරයේ මෙහෙයුම් ක්‍රියාමාර්ග සහ මූල්‍ය ස්ථාවරත්වය ;

(ඊ) මුදල් මණ්ඩලයේ අදහස අනුව ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියක අවදානම සම්බන්ධව වෙනත් යම් කරුණු.

(2) (1) වන වගන්තියේ (අ) සිට (ඊ) දක්වා සඳහන් සෑම කරුණක් හෝ ඒ කිසියම් කාරණයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයාට නියෝග සෑදිය හැකි ය. යම් රීතියක්, උපදේශයක් හෝ විධානයක් හෝ ගිවිසුමක් සහ තත් කාර්යය සඳහා මේ පනත යටතේ සාදන ලද නියෝගයක් අතර විරෝධතාවක් වුවහොත් ඒ නියෝගය බලපැවැත්විය යුතු ය.

21. (1) ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියට අවදානම ප්‍රමාණවත්ව පාලනය නොවීමේ ප්‍රතිඵලය ගෙන දෙන හෝ එම ප්‍රතිඵලය ගෙන දීමට ඉඩ ඇති ආකාරයෙන්—

(i) නාමෝද්දිෂ්ට නිෂ්කාශන සහ බේරුම් කිරීමේ පද්ධතියක් සඳහා වූ නිෂ්කාශනාගාරයක් යම් ක්‍රියාවක, පැහැර හැරීමක හෝ ක්‍රියා මාර්ගයක යෙදෙන්නේ නම් හෝ යෙදීමට සූදානමින් සිටින්නේ නම්;

(ii) නාමෝද්දිෂ්ට නිෂ්කාශන සහ බේරුම් කිරීමේ පද්ධතියක සහභාගිකරුවකු එහි සහභාගිත්වයට අදාළව යම් ක්‍රියාවක, පැහැර හැරීමක හෝ ක්‍රියාමාර්ගයක යෙදී සිටින්නේ නම් හෝ යෙදීමට සූදානම්ව සිටින්නේ නම් ;

(iii) නාමෝද්දිෂ්ට නිෂ්කාශන සහ බේරුම් කිරීමේ පද්ධතියක් ක්‍රියාත්මක වන්නේ නම් හෝ ක්‍රියාත්මක වීමට සූදානමින් සිටින්නේ නම්,

අවශ්‍ය යයි ශ්‍රී ලංකා මහ බැංකුව සලකන යම් කාලසීමාවක් ඇතුළත –

(i) ඒ ක්‍රියාවේ, පැහැර හැරීම හෝ ක්‍රියා මාර්ගයේ යෙදීම නතර කරන ලෙස හෝ එයින් වළකින ලෙස හෝ සහභාගිකරුවන්ට ඒ ක්‍රියාවේ, පැහැර හැරීමේ හෝ ක්‍රියාමාර්ගයේ යෙදීම නතර කරන ලෙස හෝ වළකින මෙන් නියම කරන ලෙස ;

(ii) එම තත්ත්වයට පිළියම් වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මතය අනුව අවශ්‍ය යම් ක්‍රියා ඉටු කරන ලෙස හෝ සහභාගිකරුවන් ලවා ඒ ක්‍රියා ඉටු කරවන ලෙස,

නියම කරන ලියවිල්ලකින් වූ විධානයක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එම නිෂ්කාශනාගාරයට නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියට අවදානමක් ප්‍රමාණවත්ව පාලනය නොවෙමින් පවතින බව (1) වන උපවගන්තියට අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ මතය වන්නේ නම් සහ—

(i) (1) වන උපවගන්තියට අනුව නිකුත් කරන ලද විධානයක් අනුව, ක්‍රියාකිරීම නිෂ්කාශනාගාරය විසින් පැහැර හරින බව ;

(ii) නාමෝද්දිෂ්ට නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතියට ශ්‍රී ලංකාවේ ස්ථානගත නිෂ්කාශනාගාරයක් නොමැති බව,

ශ්‍රී ලංකා මහ බැංකුවට පෙනී යන්නේ නම් ; හෝ

(iii) (අ) මූල්‍ය පද්ධතියක අවදානම ප්‍රමාණවත්ව පාලනය නොවෙමින් පවතින්නේ නාමෝද්දිෂ්ට නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතියෙහි සහභාගිත්වයට අදාළව සහභාගිකරුවකුගේ යම් ක්‍රියාවක්, පැහැර හැරීමක් හෝ ක්‍රියා මාර්ගයක් නිසා බව ; සහ

(ආ) එම ක්‍රියාව, පැහැර හැරීම හෝ ක්‍රියා මාර්ගය නාමෝද්දිෂ්ට නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතියක් හා සම්බන්ධ යම් ගිවිසුමකට, රීතියකට, කාර්ය පටිපාටියකට, මාර්ගෝපදේශයකට හෝ වෙනත් ලේඛනීකරණයකට අනුකූල නොවන බව,

ශ්‍රී ලංකා මහ බැංකුවේ මතය වන්නේ නම්, අවශ්‍ය යයි ශ්‍රී ලංකා මහ බැංකුව සලකන යම් කාලසීමාවක් ඇතුළත—

(i) නාමෝද්දිෂ්ට නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතියෙහි සහභාගිකරුගේ සහභාගිත්වයට අදාළ ක්‍රියාවෙහි, පැහැර හැරීමේ හෝ ක්‍රියාමාර්ගයෙහි යෙදීම නතර කරන ලෙස හෝ එහි යෙදීමෙන් වළකින ලෙස ; සහ

(ii) එම තත්ත්වයට පිළියම් වශයෙන් අවශ්‍ය යයි ශ්‍රී ලංකා මහ බැංකුව සලකන, එම සහභාගිත්වයට අදාළ යම් ක්‍රියා ඉටු කරන ලෙස,

නියම කරන ලියවිල්ලකින් වූ විධානයක් යම් සහභාගිකරුවකු වෙත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ විධානයක්, නාමෝද්දිෂ්ට නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතියක සහභාගිත්වයට සෘජුවම සම්බන්ධ කවර හෝ කාරණයක් පිළිබඳව කරනු ලැබිය හැකි ය. මේ වගන්තිය යටතේ විධානයක් පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් නොකළ යුතු ය :—

(i) සහභාගිකරුවකුගේ ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය ;

(ii) එහි ආයෝජන කළමනාකරණය ;

(iii) එහි සංස්ථාගත පාලනය ;

(iv) නාමෝද්දිෂ්ට නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතියේ සහභාගිකරුවන් නොවන ගනුදෙනුකරුවන් සමඟ අන්‍යෝන්‍ය සබඳතා ; හෝ

(v) එහි ස්වාමීත්ව ව්‍යුහය.

(4) නාමෝද්දිෂ්ට නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතිය ඇතුළත නිෂ්කාශනය කිරීමෙන් උද්ගත වන ගෙවීමේ බැඳීම්, සහභාගිකරුවන් එක් කෙනකුගේ හෝ වැඩි සංඛ්‍යාවකගේ ශ්‍රී ලංකා මහ බැංකුවේ තිබෙන ගිණුමක හෝ ගිණුම්වල ගැළපීම් මඟින් බේරුම් කළ යුතු බව එම විධානයකින් නියම කරනු ලැබිය හැකි ය.

(5) කවර හෝ ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලද නාමෝද්දිෂ්ට නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතියකට එකී විධානයක් අදාළ වන බවට එමඟින් විධිවිධාන සලස්වා ඇත්නම්, එය එසේ එම පද්ධතියකට අදාළ විය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ නිකුත් කරන විධානයක් අරමුණු කර ඇත්තේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තාට ඒ විධානය දැනුම් දිය යුතු අතර ඒ විධානය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය. එසේ නිකුත් කරනු ලැබූ විධානයක් එය නිකුත් කළ දිනයේ සිට ක්‍රියාත්මක වන්නේ ය.

(7) විධානයක් එය නිකුත් කරනු ලැබූ තැනැත්තා විෂයයෙහි අනුගම්‍ය වන්නේ ය.

22. (1) නාමෝද්දිෂ්ට නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතියකට සහ එහි නිෂ්කාශනාගාරයකට අදාළව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පහත සඳහන් කර්තව්‍ය සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ ඉටු කරනු ලැබිය හැකි ය :—

(අ) සහභාගිකරුවන් විසින් බේරුම් කිරීමේ ආරක්ෂිත හෝ අනාරක්ෂිත ඇපකරයක් සඳහා විධිවිධාන සැලසීම ;

(ආ) නිෂ්කාශනාගාරයට සහ මධ්‍යම ප්‍රති-පාර්ශ්වය සඳහා ද්‍රවශීල ණය සැපයීම; සහ

(ඇ) සහභාගිකරුවන් සඳහා මධ්‍යම ප්‍රති-පාර්ශ්වය ලෙස ක්‍රියා කිරීම.

(2) නාමෝද්දිෂ්ට නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතියක සහභාගිකරුවකුගේ සහභාගීත්වය කරණකොට ගෙන, භාරගත නොහැකි ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය අවදානමකට මුහුණ පාන බව හෝ මුහුණ පෑමට සිදුවීමට ඉඩක් පවතින බව හෝ භාරගත නොහැකි අවදානමක් ශ්‍රී ලංකා මහ බැංකුවට සිදුවන බව ශ්‍රී ලංකා මහ බැංකුවේ මතය වන අවස්ථාවක, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් -

(අ) සහභාගිකරුගේ සහභාගිත්වය අත්හිටුවීම ;

(ආ) ඒ සහභාගිකරු සහභාගිකරුකුව සිටීම තහනම් කිරීම; හෝ

(ඇ) අවශ්‍ය යයි ශ්‍රී ලංකා මහ බැංකුව සලකන, සහ ඒ සහභාගිකරුගේ සහභාගිත්වය පිළිබඳ වූ යම් කොන්දේසිවලට අනුව ක්‍රියා කරන ලෙස ඒ සහභාගිකරුට නියම කිරීම,

කරනු ලැබිය හැකි ය.

23. (1) 23 වන සහ 24 වන වගන්තිවල, වස්තුභංගත්ව නීති කෘත්‍ය යන්නෙන්, (81 වන අධිකාරය වූ) වස්තුභංගත්ව ආඥාපනත යටතේ පවරනු ලැබූ වස්තුභංගත්ව නීති කෘත්‍ය ඇතුළුව, ස්වේච්ඡාවෙන් වුව ද සිය කැමැත්තෙන් නොකරන ලද වුවද සහභාගිකාර ආයතනය ගණන් බේරා වසා දැමීමට හෝ ප්‍රතිසංවිධානය කිරීමට හෝ එහි ව්‍යාපාරය අත්හිටුවීමට හෝ යම් අදාළ නීතියක විධිවිධාන සලසා තිබෙන ක්‍රියා මාර්ගවලට, ගෙවීම් අණකර සහ ගෙවීම් තාවකාලිකව අත්හිටුවීම හෝ ඒවාට සීමා පැනවීම ඇතුළත් අවස්ථාවක දී ඒ යම් සාමූහික ක්‍රියාමාර්ගයක් අදහස් වන්නේ ය.

(2) නාමෝද්දිෂ්ට නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතියක සහභාගිකරුවකුට එරෙහිව වස්තු භංගත්වය පිළිබඳ නීති කෘත්‍ය ආරම්භ කර තිබුණේ වී නමුත්, එම වස්තු භංගත්ව නීති කෘත්‍ය ආරම්භ කිරීමට පෙරාතුව පද්ධතියට ගෙවුම් අණකර ඇතුළත් කර ඇත්නම්, එම ගෙවුම් අණකර සහ එම ගෙවුම් අණකරහි ශුද්ධ අගය යෙදීම තුන්වන පාර්ශ්වයක් විෂයයෙහි නීත්‍යානුකූලව බලාත්මක කළ හැකි හා අනුගම්‍ය වන්නේ ය.

(3) වස්තුභංගත්ව නීති කෘත්‍ය ආරම්භ කිරීමෙන් පසුව ගෙවීම් අණකර නාමෝද්දිෂ්ට නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතියකට ඇතුළත් කර එම නීති කෘත්‍ය ආරම්භ කළ දිනයේ දී ම ඒවා සඳහා ගෙවීම් කර තිබෙන අවස්ථාවක, එම නීති කෘත්‍ය ආරම්භ කළ බව තමන් දැන නොසිටියේ හෝ දැන සිටිය යුතුව තිබුණේ හෝ නොමැති බවට අධිකරණය සෑහීමට පත්වන පරිදි සාක්ෂි සැපයීමට එම බේරුම් කිරීම සිදු කළ වේලාවෙන් පසුව මධ්‍යම ප්‍රති පාර්ශ්වයට හෝ නිෂ්කාශනාගාරයට හෝ හැකි වුවහොත් පමණක්, එකී ගෙවුම් අණකර තුන්වන පාර්ශ්වයක් විෂයයෙහි නීත්‍යානුකූලව බලාත්මක කළ හැකි හා අනුගම්‍ය විය යුතු ය.

(4) නාමෝද්දිෂ්ට නිෂ්කාශන සහ බේරුම් කිරීමේ පද්ධතියකට ගෙවුම් අණකරයක් ඇතුළත් කරනු ලැබූ නිශ්චිත මොහොත, එම පද්ධතියේ රීති මඟින් තීරණය කළ යුතු ය.

(5) මේ වගන්තියේ කාර්ය සඳහා, වස්තුභංගත්ව නීති කෘත්‍ය ආරම්භ කල වේලාව වන්නේ, වස්තුභංගත්වයට පත්වීමේ, ගණන් බේරා වසා දැමීමේ හෝ අත්හිටුවීමේ නඩු තීන්දුව හෝ ආඥාව ප්‍රකාශයට පත් කළ හෝ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමේ එළදායී යෝජනාවක් සම්මත කළ මොහොත වේ.

(6) (5) වන උපවගන්තියේ විධිවිධාන සලසා තිබෙන පරිදි නඩු තීන්දුවක් හෝ ආඥාවක් ප්‍රකාශයට පත්කරනු ලබන්නේ හෝ යම් සහභාගිකරුවකුට විරුද්ධව ද නැතහොත් ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමේ එළදායී යෝජනාවක් සම්මත

කරනු ලබන්නේ යම් සහභාගිකරුවකු විසින් ද ඒ නඩු තීන්දුව හෝ ආඥාව ප්‍රකාශයට පත්කරනු ලැබූ හෝ යෝජනාව සම්මත කරනු ලැබූ දිනයේ දී සහභාගිකරු විසින් ඒ නඩු තීන්දුව, ආඥාව හෝ යෝජනා සම්මතය පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සහ අවස්ථාවෝචිත පරිදි මධ්‍යම ප්‍රතිපාර්ශ්වය වෙත හෝ නිෂ්කාශනාගාරය වෙත අදාළ අවස්ථාවල දී දැනුම් දිය යුතු ය.

(7) නාමෝද්දිෂ්ට නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතියක් වෙත එකී නීතිකෘත්‍ය ආරම්භ වීමට පූර්වයෙන් වූ ගෙවීමේ බැඳීම් නිෂ්කාශනයෙන් හා බේරුම් කිරීමෙන් උද්ගත වන සහභාගිකරුවකුගේ අයිතිවාසිකම් හා බැඳීම් කෙරෙහි අතීතයේ සිට බලපෑමක් වස්තුභංගත්ව නීති කෘත්‍යවල නොමැති විය යුතු ය.

24. (1) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද—

(i) නාමෝද්දිෂ්ට නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතියක බේරුම් කිරීමේ රීති, නිෂ්කාශනාගාරයක්, සහභාගිකරුවන්, මධ්‍යම ප්‍රති පාර්ශ්වය සහ ශ්‍රී ලංකා මහ බැංකුව කෙරෙහි අනුගම්‍ය වන්නේ ය. යම් ක්‍රියාවලියක් බලසහිතව ආරම්භ කිරීම හෝ යම් ගෙවීමක් කිරීම එම බේරුම් කිරීමේ රීතිවලට අනුකූලව බලසහිතව කරනු ලැබිය හැකි ය ;

(ii) සහභාගිකරුවකුට ගෙවීම් කිරීමට සහභාගිකරුවකුගේ, නිෂ්කාශනාගාරයක හෝ මධ්‍යම ප්‍රතිපාර්ශ්වයක පවත්නා බැඳීම්වල සහ සහභාගිකරුවකුගෙන් ගෙවීම් ලැබීමට සහභාගිකරුවකුට, නිෂ්කාශනාගාරයකට හෝ මධ්‍යම ප්‍රතිපාර්ශ්වයකට ඇති අයිතිවාසිකම ශුද්ධ ලෙස ගණනය කිරීමට සහ ශුද්ධ ලෙස බේරුම් කිරීමක් හෝ අවසානාත්මක මුදල් ප්‍රමාණය හෝ තීරණය කිරීම සඳහා නාමෝද්දිෂ්ට නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතියේ රීතිවලින් විධිවිධාන සලසා තිබේනම් එය එම රීතිවලට අනුකූලව තීරණය කළ යුතු ය ; තව ද

(iii) සහභාගිකරුවකුගේ, නිෂ්කාශනාගාරයක හෝ මධ්‍යම ප්‍රතිපාර්ශ්වයක ගෙවීමේ බැඳීම් බේරුම් කිරීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්නා සහභාගිකරුවකුගේ, නිෂ්කාශනාගාරයක හෝ මධ්‍යම ප්‍රතිපාර්ශ්වයක ගිණුමේ සටහනක් මගින් හෝ ඒ ගිණුමෙන් කරන ගෙවීමක් මගින් සිදු කිරීම අවසානාත්මක සහ අවලංගු කළ නොහැකි බවට, නාමෝද්දිෂ්ට නිෂ්කාශන සහ බේරුම් කිරීමේ පද්ධතියක බේරුම් කිරීමේ රීතිවලින් විධිවිධාන සලස්වා තිබෙන අවස්ථාවක එම සටහන හෝ ගෙවීම ප්‍රතිවර්තනය කිරීම, ආපසු ගෙවීම හෝ අවලංගු කිරීම නොකළ යුතු ය.

(2) ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්නා, සහභාගිකරුවකුගේ, නිෂ්කාශනාගාරයක හෝ මධ්‍යම ප්‍රතිපාර්ශ්වයක ගිණුමකින් නාමෝද්දිෂ්ට නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතියකට ඇති වූ ගෙවීමේ බැඳීමක් බේරුම් කිරීම සඳහා කළ සටහනක් හෝ ගෙවීමක්, ඒ ක්‍රියාකාරකම තහනම් කිරීමක් වශයෙන් ක්‍රියාකාරී වන යම් විධිවිධානයකට හෝ ආඥාවකට විෂය නොවිය යුතු ය.

(3) නාමෝද්දිෂ්ට නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතියක ඇති වූ ගෙවීමක් හෝ බැඳීමක් ඉටු කිරීමේ වගකීම සුරක්ෂිත කිරීම පිණිස සහභාගිකරුවකුට, නිෂ්කාශනාගාරයකට, මධ්‍යම ප්‍රතිපාර්ශ්වයකට හෝ ශ්‍රී ලංකා මහ බැංකුවට සපයා ඇති සුරැකුම සම්බන්ධයෙන් ඇති අයිතිවාසිකම් සහ ප්‍රතිකර්මවලට, වස්තුභංගත්ව නීතිකෘත්‍යය නිසා බලපෑමක් නොවිය හැකි ය. විශේෂයෙන්, එම අයිතිවාසිකම් හා ප්‍රතිකර්ම, එම සුරැකුම කෙරෙහි ණය හිමියන්ගේ අයිතිවාසිකම් ඔවුන් විසින් ක්‍රියාවේ යොදනු ලැබීම කෙරෙහි බලපවත්වන යම් අත්හිටුවීමේ විධිවිධානවලට හෝ ආඥාවකට එම අයිතිවාසිකම් සහ ප්‍රතිකර්ම විෂය නොවිය හැකි ය.

(4) නාමෝද්දිෂ්ට නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතියක පරිපාලනය හෝ ක්‍රියාකාරිත්වය සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරනු ලැබීම හෝ ඒ පද්ධතියේ බේරුම් කිරීමේ රීති විදේශීය අධිකරණ බලයක රීති මගින් පාලනය වීම නොතකා, ඒ නාමෝද්දිෂ්ට නිෂ්කාශන සහ බේරුම් කිරීමේ පද්ධතියේ ක්‍රියාකාරිත්වය තුළින් හෝ ඒ හා සම්බන්ධව මතුවන යම් තැනැත්තකුගේ අයිතිවාසිකම් සහ බැඳීම් මුළුමණින් හෝ ඉන් කොටසක් ශ්‍රී ලංකාවේ නීතියෙන් පාලනය වන බව ශ්‍රී ලංකාවේ අධිකරණයක් විසින් තීරණය කළහොත්, එකී අයිතිවාසිකම් හා බැඳීම් නිශ්චය කිරීමේ දී ශ්‍රී ලංකාවේ නීතිය යම්තාක් දුරට අදාළ වන්නේ ද, ඒ තාක්දුරට මේ වගන්තියේ විධිවිධාන ඊට අදාළ වන්නේ ය.

(5) මේ වගන්තියේ "බේරුම් කිරීමේ රීති" යන්නෙන්, කවර ආකාරයකින් සාදනු ලැබුව ද, ගෙවීමේ බැඳීම් ආගණනය කිරීමේ, ශුද්ධ බැඳීම්වලට පත්කිරීමේ හෝ බේරුම් කිරීමේ පදනම සඳහා විධිවිධාන සලසන සක්‍රිය රීති අදහස් වන අතර, පිළිවෙලින් නිෂ්කාශනාගාරයකට, මධ්‍යම ප්‍රතිපාර්ශ්වයකට හෝ වෙනත් සහභාගිකරුවකු වෙතට පවත්නා ස්වකීය බැඳීම් ඉටු කිරීම සහභාගිකරුවකු විසින් පැහැර හැරි හෝ සහභාගිකරුවකුට ස්වකීය බැඳීම් ඉටු කිරීමට අසමත් වීමට ඉඩ ඇති අවස්ථාවක දී ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳ රීති ඊට ඇතුළත් වේ.

25. (1) සෑම නිෂ්කාශනාගාරයක් විසින්ම, එහි නාමෝද්දිෂ්ට නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතිය සම්බන්ධව සිදු කිරීමට අදහස් කරන වැදගත් වෙනස්කම් පිළිබඳව එම වෙනස් කිරීම් සිදු කිරීමට සාධාරණ කාලයකට පූර්වයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත තොරතුරු සැපයිය යුතු ය. මෙහි ඉහතින් දැක්වුණු කාරණාවල ව්‍යාප්තිය සීමා කිරීමෙන් තොරව, පහත සඳහන් කිසිවක් කෙරෙහි බලපෑමක් සහිත යම් වෙනස් කිරීමක් පිළිබඳව නිෂ්කාශනාගාරය විසින් දැනුම්දීමක් කළ යුතු ය ; එනම්—

(i) නිෂ්කාශනාගාරයේ සංගමික සංස්ථාපත්‍රය සහ නිෂ්කාශනාගාරයේ නිර්මාණය, එය පිහිටුවීම, එහි ව්‍යවස්ථා මාලාව, පාලනය, පරිපාලනය සහ ක්‍රියාකාරිත්වයට අදාළ හා ඒ හා සම්බන්ධ යෝජනා සම්මත, ගිවිසුම්, රීති හා කාර්ය පටිපාටි ඇතුළුව ඕනෑම ලේඛනයක් ;

(ii) නාමෝද්දිෂ්ට නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතියේ ක්‍රියාකාරිත්වය ; හෝ

(iii) නාමෝද්දිෂ්ට නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතිය පාලනය වන්නාවූ ගිවිසුම්, රීති, කාර්ය පටිපාටි, මාර්ගෝපදේශ හෝ වෙනත් ලියවිලි,

පිළිබඳව දැනුම්දීමක් කළ යුතු ය.

(2) නාමෝද්දිෂ්ට නිෂ්කාශන සහ බේරුම් කිරීමේ පද්ධතියට සම්බන්ධව වෙනත් යම් වෙනස් කිරීමක් සිදු කිරීමෙන් පසුව සෑම නිෂ්කාශනාගාරයක් විසින්ම, එම වෙනස් කිරීම් පිළිබඳව අප්‍රමාදව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලිඛිත දැනුම් දීමක් කළ යුතු අතර, ඉහතින් සඳහන් කරුණුවල ව්‍යාප්තිය සීමා කිරීමකින් තොරව, එම දැනුම්දීම මගින්,

(i) ඉල්ලා අස්වීමෙන් හෝ අන්‍යාකාරයකින් වුව ද, අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය ; හෝ

(ii) නිෂ්කාශනාගාරයේ පත්කළ විගණකවරයා කෙරෙහි බලපෑමක් සහිත යම් වෙනස් කිරීමක්,

පිළිබඳව තොරතුරු සැපයිය යුතු ය.

(3) සෑම නිෂ්කාශනාගාරයක් විසින්ම, එහි නාමෝද්දිෂ්ට නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතිවලට අදාළව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලියවිල්ලක් මගින් නියම කරනු ලබන පරිදි, එසේ නියම කරන වේලාවන්හි දී සහ ආකෘතියට අනුව, ඉල්ලා සිටි යම් තොරතුරු සැපයිය යුතු ය.

26. (1) මේ පරිච්ඡේදය යටතේ ස්වකීය කර්තව්‍ය ඉටුකිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිෂ්කාශනාගාරයක විගණන සහ පරීක්ෂා කිරීම් සිදු කළ හැකි ය.

(2) අවශ්‍ය යයි ශ්‍රී ලංකා මහ බැංකුව සලකන අවස්ථාවක දී (1) වන උපවගන්තිය යටතේ විගණන සහ පරීක්ෂණ, තමන් වෙනුවෙන් සුදුසුකම්ලත් විගණකවරුන් විසින් සම්පූර්ණයෙන් හෝ කොටසක් පැවැත්විය යුතු යයි සහ ඔවුන්ගේ වාර්තාව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කළ යුතු යයි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කළ හැකි ය.

(3) ශ්‍රී ලංකා මහ බැංකුවට සහ විගණන හා පරීක්ෂණ පැවැත්වීම සඳහා පත්කළ සෑම සුදුසුකම්ලත් විගණකවරයකුටම, නිෂ්කාශනාගාරයේ තොරතුරු, පොත්පත් සහ වාර්තාවලට ප්‍රවේශය ලබාගත හැකි විය යුතු ය. මේ වගන්තිය යටතේ ස්වකීය කාර්ය ඉටුකිරීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුවට හෝ සුදුසුකම්ලත් විගණකවරයාට නිෂ්කාශනාගාරය විසින් සහාය විය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා "සුදුසුකම්ලත් විගණකවරයා" යන යෙදුමට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවෙන් ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය.

(5) මේ වගන්තිය යටතේ විගණනයක් සහ පරීක්ෂණයක් සම්බන්ධව දිවුරුම යටතේ සාක්ෂි ලබා ගැනීමේ කාර්යය සඳහා (17 වන අධිකාරය වූ) දිවුරුම් ආඥාපනතට අනුකූලව දිවුරුම් හෝ ප්‍රතිඥා ලබා ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුවට බලය ඇත්තේ ය.

27. ශ්‍රී ලංකා මහ බැංකුවට, නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතියකට සහ නිෂ්කාශනාගාරයකට අදාළව පහත දැක්වෙන ක්‍රියා සියල්ල හෝ ඉන් කිසිවක් හෝ කිරීමට බලය තිබිය යුතු ය :—

(i) පාඩුවක් හවුලේ දැරීමේ යාන්ත්‍රණයක් ඇතුළුව සහභාගිකරුවකු වීම, සහභාගි වීම සහ මධ්‍යම ප්‍රතිපාර්ශ්වකරුවකු ලෙස ක්‍රියා කිරීම ;

(ii) මුල්‍ය වත්කම්වල භාරකරුවකු ලෙස හෝ බේරුම් කිරීමේ අනුයෝජිතයකු ලෙස හෝ ඒ දෙආකාරයෙන්ම හෝ ක්‍රියා කිරීම; සහ

(iii) නිෂ්කාශනාගාරයකින්, සහභාගිකරුවකුගෙන් හෝ මධ්‍යම ප්‍රතිපාර්ශ්වයෙන් තැන්පතු භාර ගැනීම හා ඒ සඳහා පොලිය භාර ගැනීම සහ ගෙවීම.

28. මුල්‍ය ආයතනයක් හෝ ශ්‍රී ලංකා මහ බැංකුව හෝ ශුද්ධ අගය යෙදීමේ ගිවිසුමක පාර්ශ්වකරුවකු වන අවස්ථාවක, වස්තුභංගත්වය හෝ බංකොලොත්භාවය පිළිබඳ වෙනත් යම් නීතියක නැතහොත් පරිපාලන හෝ ප්‍රතිසංවිධාන වැඩපිළිවෙළක් හෝ බංකොලොත්භාවය ඇතුළත්වන ලැබුම්කාරත්වයක් ප්‍රකාරව කරන ලද අධිකරණ ආඥාවක කවර විධිවිධානයක් තිබුණ ද, මුල්‍ය ආයතනය හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගිවිසුම බලාත්මක කර, එමගින් පාලනය වන යම් බැඳීම් උද්ගත කරන කොන්ත්‍රාත්තුව සමාපනය කර ගිවිසුමේ විධිවිධානවලට අනුකූලව ශුද්ධ සමාපන අගය හෝ බේරුම් කිරීමේ ශුද්ධ මුදල් ප්‍රමාණය නිශ්චය කරනු ලැබිය හැකි අතර, එවැනි අවස්ථාවක ශුද්ධ සමාපන අගයට හෝ බේරුම් කිරීමේ ශුද්ධ මුදල් ප්‍රමාණයට හෝ හිමිකම ඇති පාර්ශ්වය, අවස්ථාවෝචිත පරිදි එම අගය හෝ මුදල් ප්‍රමාණය සඳහා, එම ශුද්ධ සමාපන අගය හෝ ශුද්ධ බේරුම් කිරීමේ මුදල ගෙවිය යුතු පාර්ශ්වයේ ණයහිමියා බවට පත්විය යුතු ය.

29. (1) ගෙවීමේ බැඳීම් නිෂ්කාශනය හෝ බේරුම් කිරීම සඳහා පද්ධතියක් හෝ වැඩ පිළිවෙලක් පවතින බව විශ්වාස කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට සාධාරණ හේතු ඇති අවස්ථාවක නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතියක් පවත්නා බව නිශ්චය කිරීම පිණිස, එම පද්ධතිය හෝ වැඩපිළිවෙලට අදාළ හා ශ්‍රී ලංකා මහ බැංකුවට අවශ්‍ය වියහැකි වැඩිදුර තොරතුරු, වාර්තා සහ ලිපිලේඛන ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සපයන ලෙස, එම පද්ධතියේ හෝ වැඩපිළිවෙලෙහි පාර්ශ්වකරුවකු වන තැනැත්තකුගෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

(2) තොරතුරු, වාර්තා සහ ලිපිලේඛන සපයන ලෙස (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකුගෙන් ඉල්ලා සිටිනු ලැබූ විට, ඒ තැනැත්තා ඒ අනුව ක්‍රියා කළ යුතු ය.

(3) සෑම නිෂ්කාශනාගාරයක් විසින්ම, එහි නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධති මගින් පොදු මූල්‍ය පද්ධතියට අවදානමක් අභිමුඛ වන්නේ ද යන වග නිශ්චය කිරීමට හැකිවනු පිණිස ශ්‍රී ලංකා මහ බැංකුව වරින් වර ඉල්ලා සිටින තොරතුරු සහ ලිපි ලේඛන ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සැපයිය යුතු ය. ඉහත දැක්වුණු කරුණුවල ව්‍යාප්තිය සීමා කිරීමකින් තොරව, නිෂ්කාශනාගාරය විසින් නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතිය සම්බන්ධව —

(අ) එහි සහභාගිකරුවන්ගේ නම් ;

(ආ) නිෂ්කාශනාගාරයේ සාංගමික සංස්ථාපත්‍රයේ, අතුරු ව්‍යවස්ථාවල, සහ අදාළ යෝජනා සම්මත ගිවිසුම් රීති හා කාර්ය පටිපාටි ද ඇතුළුව නිෂ්කාශනාගාරය නිර්මාණය, පිහිටුවීම, එහි ව්‍යවස්ථාවලිය, පාලනය සහ නිෂ්කාශනාගාරයේ ක්‍රියාකාරිත්වයට අදාළ සියලු ලියකියවිලි පිටපත් ;

(ඇ) නිෂ්කාශනාගාරයේ අධ්‍යක්ෂවරයන්ගේ, කාරක සභා සාමාජිකයන්ගේ සහ විගණකවරුන්ගේ නම් ;

(ඈ) ආණ්ඩුවේ නියෝජිත ආයතන හෝ නියාමක මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට නියමිත වාර්තා, ප්‍රකාශ හෝ වෙනත් ලේඛනවල පිටපත් ; සහ

(ඉ) මූල්‍ය ප්‍රකාශවල පිටපත්,

ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සැපයිය යුතු ය.

(4) නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතියක වෙනත් සහභාගිකරුවකු පිළිබඳ, තොරතුරු කිසිවක්, ඒ තොරතුරු එහි සියලු සහභාගිකරුවන් වෙත සපයා නොමැති නම්, ඒ තොරතුරු මේ පරිච්ඡේදය යටතේ කිසියම් සහභාගිකරුවකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සැපයීම අවශ්‍ය නොවිය යුතු ය.

30. (1) නිෂ්කාශනාගාරයක් විසින් මේ පරිච්ඡේදය යටතේ එහි නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතිය සම්බන්ධයෙන් ඊට පැවරී තිබෙන බැඳීම් ඉටුකිරීම පැහැර හරිනු ලැබූ හෝ මේ පරිච්ඡේදයේ විධිවිධාන අන්‍යාකාරව උල්ලංඝනය කරනු ලැබූ අවස්ථාවක එහි සහභාගිකරුවන් එක්ව සහ වෙන් වෙන් ව එම බැඳීම් ඉටු කළ යුතු අතර එම බැඳීම් උල්ලංඝනය සම්බන්ධයෙන් නිෂ්කාශනාගාරය වගකිව යුතු ආකාරයටම සහ ප්‍රමාණයටම සහභාගිකරුවන් ද වගකීමට යටත් වන්නේ ය.

(2) නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතියට ශ්‍රී ලංකාවේ ස්ථානගත නිෂ්කාශනාගාරයක් නොමැති අවස්ථාවක ශ්‍රී ලංකාවේ ස්ථානගත සහභාගිකරුවන් පිළිවෙලින් මේ පරිච්ඡේදය යටතේ බැඳීම් පනවනු ලැබ සහ අයිතිවාසිකම් හිමිව සිටින නිෂ්කාශනාගාරය වූවාක් සේ ඒ ආකාරයටම හා ප්‍රමාණයටම–

(i) නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතියක් පිළිබඳව මේ පරිච්ඡේදය යටතේ නිෂ්කාශනාගාරයක් වෙත පැනවී තිබෙන බැඳීම් අනුව ක්‍රියා කළ යුතු ය ; සහ

(ii) නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතියක් පිළිබඳව මේ පරිච්ඡේදයෙන් නිෂ්කාශනාගාරයක් වෙත පැවරී ඇති සියලු අයිතිවාසිකම් හිමිවිය යුතු ය,

නිෂ්කාශනාගාරයක් සම්බන්ධව ශ්‍රී ලංකා මහ බැංකුව ගන්නා යම් ක්‍රියාමාර්ගයක් ශ්‍රී ලංකාවේ ස්ථානගත සහභාගිකරුවන් සම්බන්ධයෙන් පමණක් ගනු ලැබිය යුතු ය.

මේ උපවගන්තියේ කාර්ය සඳහා, ශ්‍රී ලංකාව තුළ බලපාන නීතියක් යටතේ සංස්ථාගත කර ඇති සහභාගිකරුවකු ශ්‍රී ලංකාවේ ස්ථානගතව ඇතැයි කියනු ලැබේ.

31. නාමෝද්දිෂ්ට නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතියක සහභාගිකරුවකු වන හෝ සහභාගිකරුවකු වීමට අපේක්ෂා කරන විදේශීය බැංකුවක් විසින්, එම විදේශ බැංකුවට විදේශීය නීති අදාළ වීම පිළිබඳව අවශ්‍ය යයි ශ්‍රී ලංකා මහ බැංකුව සලකන යම් තොරතුරු වරින් වර ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සැපයිය යුතු ය.

32. මේ පරිච්ඡේදයෙහි, අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස–

"මධ්‍යම ප්‍රතිපාර්ශ්වය" යන්නෙන්, නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතියක පාර්ශ්වකරුවන්ගේ ගෙවීම් ලැබීමට ඇති අයිතීන් හා ගෙවීම් කිරීමට ඇති බැඳීම් ශුද්ධ පදනමකට ගෙන ඒමෙන් එම මධ්‍යම ප්‍රතිපාර්ශ්වය හා එක් එක් පාර්ශ්වකරු අතර ගෙවීමට ඇති තනි ප්‍රමාණයක් ලෙස බිහි කර ගනු ලබන නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතියකට හවුල් වී ඇති සංස්ථාවක්, සංගමයක්, හවුල් ව්‍යාපාරයක්, නියෝජිත ආයතනයක් හෝ වෙනත් සේවා සැපයුම්කරුවෙක් අදහස් වේ ;

"නිෂ්කාශන හා බේරුම් පද්ධතිය" යන්නෙන්, යටත් පිරිසෙයින් එක් පාර්ශ්වකරුවකු හෝ මූල්‍ය ආයතනයක් වන හා අවම ලෙස පාර්ශ්වකරුවන් තුන්දෙනෙකුගෙන් සංයුක්ත වන මූල්‍ය පද්ධතිය තුළ ගෙවීමේ බැඳුම් නිෂ්කාශනය හෝ බේරුම් කිරීමට ඇති පද්ධතියක් හෝ විධික්‍රමයක් අදහස් වන අතර, එයට ශ්‍රී ලංකාවේ නිල ව්‍යවහාර මුදලින් නිෂ්කාශනය හෝ බේරුම් කිරීමේ පද්ධතියක් හෝ විධික්‍රමයක් හෝ සුරැකුම්පත් ගනුදෙනු, විදේශ විනිමය ගනුදෙනු හෝ වෙනත් ගනුදෙනු හෝ මූල්‍ය ගිවිසුම්, ඒ මත ඇති වන්නා වූ ගෙවීමේ බැඳීම් ද ඇතුළුව, නිෂ්කාශනය හෝ බේරුම් කිරීමේ පද්ධති හෝ විධික්‍රම ද ඇතුළත් වේ ;

"නිෂ්කාශනාගාරය" යන්නෙන්, නිෂ්කාශන සහ බේරුම් කිරීමේ පද්ධතියක් සඳහා නිෂ්කාශන හෝ බේරුම් කිරීමේ සේවා සපයන සංස්ථාවක්, සංගමයක්, හවුල් ව්‍යාපාරයක්, නියෝජිත ආයතනයක් හෝ සංවිධානයක් නැතහොත් වෙනත් අස්තිත්වයක් හෝ තැනැත්තෙක් අදහස් වන නමුත් ඊට ශ්‍රී ලංකා මහ බැංකුව ඇතුළත් නොවේ ;

"නාමෝද්දිෂ්ට නිෂ්කාශන සහ බේරුම් කිරීමේ පද්ධතිය" යන්නෙන්, මේ පරිච්ඡේදය යටතේ නම් කරනු ලැබූ නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතියක් අදහස් වේ ;

"මූල්‍ය ආයතනය" යන්නෙන්–

(i) 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූල බලපත්‍රලත් වාණිජ බැංකුවක්,

(ii) මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා මූල්‍ය ආයතන බවට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නම් කරනු ලබන මූල්‍ය සේවා සැපයීමේ ව්‍යාපාරයෙහි මූලික වශයෙන් නිරත වෙනත් යම් තැනැත්තෙක්, අස්තිත්වයක් හෝ තැනැත්තෙක්, පංතියක් ඇතුළත හෝ සේවා සැපයුම්කරුවන් පංතියක් ඇතුළත අස්තිත්වයක්,

අදහස් වේ ;

"මූල්‍ය ක්‍රමය" යන්නෙන්, ශ්‍රී ලංකාවේ මූල්‍ය ක්‍රමය අදහස් වේ ;

"ශුද්ධ අවසායී අගය" යන්නෙන්, ශුද්ධ අගයන් තීරණය කිරීම සඳහා ඇති කරගන්නා ලද ගිවිසුමක පාර්ශ්වකරුවන් අතර, එම ගිවිසුම අනුව බැඳීම් හිලව් කිරීමෙන් හෝ අන්‍යාකාරව ශුද්ධ අගයන් තීරණය කිරීමෙන් පසු ඒ ගිවිසුමේ විධිවිධානවලට අනුකූලව ලබාගත් ශුද්ධ අගය අදහස් වේ ;

"ශුද්ධ අගය තීරණය කිරීමේ ගිවිසුම" යන්නෙන්, මූල්‍ය ආයතන දෙකක් හෝ වැඩි සංඛ්‍යාවක් අතර හෝ ශ්‍රී ලංකා මහ බැංකුව සහ මූල්‍ය ආයතන එකක් හෝ වැඩි සංඛ්‍යාවක් අතර ගෙවීම් ලැබීමට පවත්නා වර්තමාන හෝ අනාගත අයිතිවාසිකම් හා වර්තමානයේ පවත්නා හෝ අනාගත ගෙවීමේ බැඳීම් ශුද්ධ ලෙස ගණනය කිරීම හෝ හිලව් කිරීම සඳහා විධිවිධාන සලසන, ගිවිසුමක් අදහස් වේ ;

"සහභාගිකරු" යන්නෙන්, නිෂ්කාශනාගාරයක සාමාජිකයකු හෝ නිෂ්කාශන සහ බේරුම් කිරීමේ විධික්‍රමයක් පිහිටුවා ගැනීමේ වැඩ පිළිවෙලක පාර්ශ්වයක් අදහස් වේ ;

"ශ්‍රී ලංකාවේ පොදු මූල්‍ය පද්ධතියට අවදානම" යන්නෙන්, නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතියක් තුළ වූ බැඳීම් ඉටුකළ යුතු අවස්ථාවේ දී ඒවා ඉටුකිරීමට සහභාගිකරුවකු අපොහොසත් වීමෙන් හෝ නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතියක මූල්‍ය ගැටළු පොදු පද්ධතියට ප්‍රේෂණය වීම හේතුවෙන් ක්‍රියාකාරිත්වය කඩාකප්පල් වීමෙන් හෝ—

(i) නිෂ්කාශන හා බේරුම්කිරීමේ පද්ධතියේ සෙසු සහභාගිකරුවන්ට බැඳීම් ඉටුකළ යුතු වූ විට ඒවා ඉටුකිරීමට නොහැකි වීම ;

(ii) ශ්‍රී ලංකාවේ මූල්‍ය ක්‍රමයේ අනෙකුත් කොටස්වල මූල්‍ය ආයතනවලට ඒවායේ බැඳීම් ඉටුකළ යුතු වූ විට ඒවා ඉටුකිරීමට නොහැකි වීම ; හෝ

(iii) නිෂ්කාශන හා බේරුම්කිරීමේ පද්ධතියේ නිෂ්කාශනාගාරයකට හෝ ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය තුළ ඇති වෙනත් නිෂ්කාශන හා බේරුම් කිරීමේ පද්ධතියක නිෂ්කාශනාගාරයකට ඔවුන්ගේ බැඳීම් ඉටුකළ යුතු වූ විට ඒවා ඉටුකිරීමට නොහැකි වීම,

අදහස් වේ.

### III වන කොටස

### විද්‍යුත් ක්‍රම මගින් චෙක්පත් ඉදිරිපත් කිරීම

33. (1) ගෙවීම් සඳහා බැංකුකරුවකු විසින් චෙක්පතම ඉදිරිපත් කරනු වෙනුවට, චෙක්පත අණකර ඇත්තේ යම් බැංකුවකට ද ඒ බැංකුව වෙත චෙක්පතෙහි ප්‍රතිබිම්බයක් විද්‍යුත් ගෙවීම් සඳහා සැපයීමට නියමිත චෙක්පතෙහි තොරතුරු ද සමග, විද්‍යුත් ක්‍රමයකින් ප්‍රේෂණය කිරීමෙන් චෙක්පතක් ගෙවීම් සඳහා ඉදිරිපත් කළ හැකි ය.

(2) චෙක්පත් (1) වන උපවගන්තිය යටතේ විද්‍යුත් ක්‍රම මගින් ඉදිරිපත් කිරීමේ දී බැංකුකරුවකු විසින් සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් වෙනත් බැංකුකරුවකු හෝ නිෂ්කාශනාගාරයක් ඇතුළුව තුන්වන පාර්ශ්වය සේවා සැපයුම්කරුවකු මගින් ක්‍රියා කළ හැකි අතර එම සේවා සැපයුම්කරු බැංකුකරුගේ අනුයෝජිතයකු ලෙස සැලකෙන්නේ ය.

(3) (1) වන උපවගන්තියේ කෙසේ සඳහන්ව තිබුණ ද එමෙන්ම (5) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, චෙක්පතක් අණකර ඇත්තේ සහ විද්‍යුත්ව ඉදිරිපත් කිරීමක් කර ඇත්තේ යම් බැංකුකරුවකුට ද එම බැංකුකරු විසින් ගෙවීම් සඳහා චෙක්පතම ඉදිරිපත් කරන ලෙස එම ඉදිරිපත් කිරීම සිදුකළ බැංකුකරුගෙන් ඉල්ලා සිටිය හැකි ය.

(4) (1) වන උපවගන්තිය යටතේ විද්‍යුත් ඉදිරිපත් කිරීම නිවාරණය කර හෝ සම්පූර්ණයෙන් අසාර්ථක වී ඇති හෝ (3) වන උපවගන්තිය යටතේ වලංගු ඉල්ලීමක් කරනු ලැබ ඇති අවස්ථාවක, (1) වන උපවගන්තිය යටතේ වූ ඉදිරිපත් කිරීම නොසලකා හැරිය යුතු අතර, ඉන් පසුව චෙක්පතම ඉදිරිපත් කරනු ලැබීමේ දී මේ වගන්තියේ විධිවිධාන ඊට අදාළ නොවිය යුතු ය. චෙක්පත පසුව ඉදිරිපත් කිරීම නිසි කාලය ඇතුළත සිදුකර තිබේ ද යනාවග සලකා බැලීමේ දී, එම චෙක්පත, (3) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ලැබුණු වේලාවේ දී නැතහොත් අවස්ථාවෝචිත පරිදි විද්‍යුත්ව ඉදිරිපත් කිරීම නිවාරණය කර තිබීම හෝ එම ඉදිරිපත් කිරීම සම්පූර්ණයෙන් අසාර්ථක වී තිබීම එය ඉදිරිපත් කරන බැංකුකරු දැනගත යුතුව තිබුණු වේලාවේ දී, එම චෙක්පත ගෙවීම් සඳහා ඉදිරිපත් කිරීම පිණිස, එය ඉදිරිපත් කරන බැංකුකරුට ලැබුණු ලෙස සලකනු ලැබේ.

(5) (අ) ගෙවීම් කිරීමට ප්‍රථම ; සහ

(ආ) විද්‍යුත්ව ඉදිරිපත් කිරීම අසාර්ථක වී තිබෙන හෝ එම චෙක්පත අණකර ඇත්තේ යම් බැංකුවකට ද ඒ බැංකුව විසින් එම චෙක්පතට ගෙවීම් කිරීමේ දී එම චෙක්පතෙහි අණකරු ලෙස ප්‍රකාශිත ගනුදෙනුකරුගේ උපදෙස් පිළිපදින්නේ ද යන වග ප්‍රමාණවත් නියතභාවයකින් නිගමනය කිරීමට එම විද්‍යුත් ඉදිරිපත් කිරීම අනුව හැකියාවක් නොමැති අවස්ථාවක ; සහ

(ඇ) එම චෙක්පත අණකර ඇත්තේ යම් බැංකුවකට ද ඒ බැංකුවට, එම චෙක්පතම ඉදිරිපත් කරනු ලැබූ විට එහි පදනම මත එකී නිගමනයට එළඹීමට වැඩි අවකාශයක් ලැබෙන බැව් විශ්වාස කිරීමට සාධාරණ හේතු පවත්නා විට,

පමණක්, (3) වන උපවගන්තිය යටතේ වලංගු ආකාරයෙන් ඉල්ලීමක් කරනු ලැබිය හැකි අතර, එම ඉල්ලීම සමග එය ඉදිරිපත් කිරීම පිළිබඳ පැහැදිලි කිරීමක් එවිය යුතු සහ එය (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව විද්‍යුත්ව ඉදිරිපත් කරනු ලැබූ දිනට පසුදින බැංකුවේ ව්‍යාපාර කටයුතු නිමකිරීමට ප්‍රථම එම චෙක්පත ඉදිරිපත් කරන බැංකුකරු වෙත ලැබිය යුතු ය.

(6) චෙක්පත ඉදිරිපත් කිරීම සඳහා (3) වන උපවගන්තිය යටතේ කරන වලංගු ඉල්ලීමක් එම චෙක්පතට ගෙවීම් නොකිරීමෙන් චෙක්පත අගරු කිරීමක් ලෙස නොසැලකිය යුතු ය.

(7) චෙක්පතක ප්‍රතිබිම්බයක් සහ විද්‍යුත් ගෙවීම් තොරතුරු (1) වන උපවගන්තියට අනුකූලව ඉදිරිපත් කරනු ලැබූ විටක කරනු ලැබූ කවර හෝ ගෙවීමක්, බැංකුවේ සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රියාවලියෙන් බාහිරව, අසද්භාවයෙන් හෝ නොසැලකිලිමත්ව කරනු ලැබ ඇති ලෙස නොසැලකිය යුතු බව සැක දුරුකිරීම සඳහා ප්‍රකාශ කර ඇත.

(8) මේ වගන්තියේ කාර්ය සඳහා—

(අ) චෙක්පතක ප්‍රතිබිම්බයක් එම චෙක්පතේ ඉදිරිපස හා පසුපිටෙහි දර්ශනයකින් සංයුක්ත විය යුතු ය ; තව ද

(ආ) චෙක්පතක විද්‍යුත් ගෙවුම් තොරතුරුවල–

(i) චෙක්පතෙහි අනුක්‍රමික අංකය ;

(ii) එම චෙක්පත අණකර ඇත්තේ යම් බැංකුවකට ද එම බැංකුවේ හඳුනා ගැනීමේ සංකේතය ;

(iii) චෙක්පතෙහි අණකරුගේ ගිණුම් අංකය ;

(iv) චෙක්පතෙහි අණකරු විසින් ඇතුළත් කර ඇති පරිදි එය කවර මුදල් ප්‍රමාණයක් සඳහා ද යන වග ; සහ

(v) නියෝග මගින් කලින් කල නියම කරනු ලැබිය හැකි වෙනත් කරුණු,

අඩංගු විය යුතු ය.

34. (1) 33 වන වගන්තියේ (1) වන උපවගන්තියට අනුව ගෙවීම් සඳහා ඉදිරිපත් කළ චෙක්පතකට මුදල් නොගෙවා අගරු කළ අවස්ථාවක, මුදල් අයකිරීම පිණිස චෙක්පතෙහි ධාරක විසින් එය භාර දෙනු ලැබූ බැංකුකරු විසින් එම චෙක්පත එහි ධාරකට ආපසු දීම හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, ගෙනහැර දක්වන සියලු නියමයන්ට අනුකූලව එම ප්‍රතිබිම්බය ආපසු එවීමේ ලේඛනයක් නිකුත් කිරීම හෝ කළ යුතු ය.

(2) ප්‍රතිබිම්බය ආපසු එවීමේ ලේඛනයක්, එය අදාළ වන චෙක්පත ලෙස සැලකිය යුතු ය.

35. (1) 33 වන වගන්තියේ (1) වන උපවගන්තියට අනුව විද්‍යුත් මාර්ගයෙන් ඉදිරිපත් කිරීමක් සිදු කරන බැංකුකරුවකු, එම ප්‍රතිබිම්බය මුල් චෙක්පතෙහි සත්‍ය, පූර්ණ හා නිවැරදි ප්‍රතිබිම්බයක් බවට සහ නියමිත විද්‍යුත් ගෙවීම් තොරතුරු චෙක්පතෙහි තොරතුරුම බවට සහතික වන්නේ ය. එය ඉදිරිපත් කිරීම, චෙක්පතම ඉදිරිපත් කිරීම වෙනුවට විද්‍යුත් ක්‍රම මගින් සිදුකිරීමේ හේතුවෙන් දරන්නට සිදුවන යම් අලාභයක් වෙනුවෙන් බැංකුකරු විසින් අණකරුව හානිපූරණය කළ යුතු ය.

(2) 34 වන වගන්තියේ (1) වන උපවගන්තියට අනුව ප්‍රතිබිම්බය ආපසු එවීමේ ලේඛනයක් නිකුත් කරන බැංකුකරුවකු, එම ලේඛනය, එය අදාළ චෙක්පතෙහි සත්‍ය පිටපතක් බවට සහතික විය යුතු සහ එම චෙක්පත මතම ගෙවීම් කරනු ලැබුවහොත් හෝ ඒ මත නඩු පවරනු ලැබුවහොත් සිදුවන යම් අලාභයක් වෙනුවෙන් අණකරුට හානිපූරණය කළ යුතු ය.

(3) මේ වගන්තිය යටතේ වගකීමට යටත් සහතික වීම් සහ හානිපූරණ, අදාළ චෙක්පත අණකර ඇත්තේ යම් බැංකුවකට ද ඒ බැංකුවේ වාසියට, එම චෙක්පතේ අණකරු ලෙස ප්‍රකාශිත එම බැංකුවේ ගනුදෙනුකරුගේ වාසියට, චෙක්පත ඉදිරිපත් කළ බැංකුවට මුදල් ලබා ගැනීම සඳහා එය භාරදුන් ධාරකගේ වාසියට සහ එම චෙක්පතෙහි යම් පූර්ව පිටසන්කරුවකුගේ වාසියට විය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ කවර විධිවිධානයක් තිබුණ ද, මේ වගන්තිය යටතේ සහතික කිරීමක් හෝ හානිපූර්ණ බැඳීමක් කඩ වූ විටක, චෙක්පතේ අණ ලත් බැංකුකරුගෙන් එම චෙක්පතේ අණකරු බවට ප්‍රකාශිත තැනැත්තා විසින් සිය හිමිකම්පෑම සෘජුවම අයකරගත හැකි අතර ඒ බැංකුකරු, සහතික වූ හෝ හානිපූරණ බැඳීමට යටත් වූ බැංකුකරුට විරුද්ධව ඉහත කී තැනැත්තාගේ හිමිකම් පෑමට ආදේශ විය හැකි ය.

36. (1) (82 වන අධිකාරය වූ) විනිමය බිල්පත් ආඥාපනතේ 52 වන වගන්තියේ (4) වන උපවගන්තියේ විධිවිධාන—

(අ) 33 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ගෙවීම සඳහා චෙක්පතක් ඉදිරිපත් කිරීමට ;

(ආ) 33 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලැබීමෙන් අනතුරුව ගෙවීම් කරනු ලැබූ චෙක්පතකට,

අදාළ නොවිය යුතු ය.

(2) බැංකුකරුවකු විසින් 33 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ චෙක්පතක්, ගෙවීම් සඳහා ඉදිරිපත් කරනු ලැබූ විට, (82 වන අධිකාරය වූ) විනිමය බිල්පත් ආඥාපනතේ 45 වන වගන්තියේ විධිවිධාන ඊට අදාළ වන ලෙස සහ එම ඉදිරිපත් කිරීම නිසි ස්ථානයේ දී හෝ ව්‍යාපාර කටයුතු සිදුකෙරෙන දිනක යුක්තිසහගත වේලාවක දී සිදුකළ යුතු යයි නියම කෙරෙන ලෙස අර්ථකථනය නොකළ යුතු ය.

(3) මේ පනතේ මේ කොටසේ විධිවිධාන, හැකිතාක් දුරට, (82 වන අධිකාරය වූ) විනිමය බිල්පත් ආඥාපනතේ විධිවිධානම වූවාක් සේ කියවා අර්ථකථනය කළ යුතු ය.

37. (1) නිෂ්කාශනාගාර රීති හෝ ඒ හා සමාන වැඩපිළිවෙලවල් ඇතුළුව බැංකුකරුවන් අතර ගිවිසුම් මගින් මේ කොටසේ ගෙනහැර දැක්වෙන සියලු කාරණා ක්‍රියාත්මක කිරීම පාලනය විය හැකි අතර ඒවා එහි පාර්ශ්වකරුවන් අතර අනුගම්‍ය විය යුතු ය :

එසේ වුව ද, මේ පනත යටතේ කාර්ය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කරන යම් රීති, විධාන හෝ උපදෙස්, අවස්ථාවෝචිත පරිදි යම් ගිවිසුම් හෝ වැඩපිළිවෙලවල් අභිභවා බලපැවැත්විය යුතු ය.

(2) මේ කොටස ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ රීති, විධාන හා උපදෙස්, බලපැවැත්වෙන චෙක්පතක් මත වගකීමක් පැවරෙන හා චෙක්පතක් බලාත්මක කිරීමට හිමිකම තිබෙන පාර්ශ්ව කෙරෙහි ඒ රීති, විධාන හා උපදෙස් බන්ධනීය සහ ප්‍රතිලාභදායක ලෙස සලකනු ලැබිය යුතු ය.

## IV වන කොටස

## විවිධ විධිවිධාන

38. මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ මීට ඉහතින් වූ විධිවිධානවලට අදාළ යම් කාරණයක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කළ මග පෙන්වීමක්, විධානයක්, උපදේශයක් හෝ රීතියක් අනුව ක්‍රියා කිරීම හෝ මේ පනත යටතේ යම් තොරතුරු, වාර්තා හෝ ලේඛන සඳහා යොමු කරනු ලැබූ ඉල්ලීමක් අනුව ක්‍රියා කිරීම යම් තැනැත්තකු විසින් පැහැර හරිනු ලැබූ විට, අවස්ථාවෝචිත පරිදි, මේ පනතේ විධිවිධාන, නියෝග, රීති, උපදෙස්, මග පෙන්වීම්, හෝ ඉල්ලීම් අනුව ක්‍රියාකරන ලෙස විධාන කරන ආඥාවක් කරන ලෙසට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිසි බලය ඇති අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

39. (1) මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද නියෝගයක් හෝ ඒ විධිවිධාන යටතට ගැනෙන යම් කාරණයක් සම්බන්ධව ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කළ මග පෙන්වීමක්, විධානයක්, උපදේශයක් හෝ රීතියක් හෝ මේ පනත යටතේ යම් තොරතුරු, වාර්තා හෝ ලේඛන සඳහා යොමු කරනු ලැබූ නීත්‍යානුකූල ඉල්ලීමක් උල්ලංඝනය කරන හෝ පිළිපැදීම පැහැර හරින සෑම තැනැත්තෙක්ම වරදක් කරන අතර—

(i) ස්වභාවික තැනැත්තෙක් වන අවස්ථාවක, ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන එකක් නොඉක්මවන දඩයකට හෝ එක් අවුරුද්දකට නොඅඩු සහ අවුරුදු තුනකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේ ය ; නැතහොත්

(ii) වෙනත් යම් අස්තිත්වයක් වන අවස්ථාවක, ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් හත්ලක්ෂ පණස් දහසක් නොඉක්මවන දඩයකට යටත් වන්නේ ය.

(2) මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද නියෝගයක් ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කළ මහ පෙන්වීම්, විධාන, උපදෙස් හෝ රීති සංස්ථාවක් විසින් හෝ පුද්ගලයකු නොවන වෙනත් නෛතික අස්තිත්වයක් විසින් හෝ සංස්ථාගත නොකළ යම් පුද්ගල මණ්ඩලයක් හෝ සංවිධානයක් විසින් උල්ලංඝනය කරනු ලැබූ අවස්ථාවක, එහි සෑම අධ්‍යක්ෂවරයකුම හා සාමාජිකයකුම අවස්ථාවෝචිත පරිදි එකී සංස්ථාව, නෛතික අස්තිත්වය හෝ සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලය හෝ සංවිධානය යටත්වන ආකාරයෙන්ම හා ප්‍රමාණයටම එම උල්ලංඝනය සඳහා වගකීමට යටත් වන්නේ ය.

40. (1) මේ පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබාගන්නා යම් තොරතුරු හා ලේඛන, රහස්‍ය තොරතුරු හා ලේඛන ලෙස සැලකිය යුතු ය.

(2) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් යම් තොරතුරු හෝ ලේඛන ආණ්ඩුවේ යම් නියෝජිත ආයතනයකට හෝ මූල්‍ය ආයතන විධිමත් කිරීම භාර නියාමන පුද්ගල මණ්ඩලයකට හෙළිදරව් කිරීම, ඒ තොරතුරු හෝ ලේඛන හෙළිදරව් කරනු ලැබූ නියෝජිත ආයතනයට, පුද්ගල මණ්ඩලය හෝ තැනැත්තා විසින් ඒවා රහස්‍ය ලෙස සලකනු ඇති බවට ශ්‍රී ලංකා මහ බැංකුව සෑහීමට පත්වන්නේ නම්, (1) වන උපවගන්තියේ අන්තර්ගත කිසිවකින් එය වළක්වනු නොලබන්නේ ය.

(3) යම් තොරතුරක් හෙළිදරව් කරන ලෙස අධිකරණයක් විසින් නියම කරනු ලැබුවහොත් එසේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එම තොරතුරු හෙළිදරව් කිරීම, (1) වන උපවගන්තියේ විධිවිධානවල අන්තර්ගත කිසිවකින් එය නොවළක්වන්නේ ය.

41. මේ පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාවේ යෙදිය යුතු බවට හෝ ඉටු කළ යුතු බවට අදහස් කර හෝ බලය දී තිබෙන යම් බලතල, කාර්ය හෝ කර්තව්‍යයන් පරිපාලනයේ දී හෝ ඉටු කිරීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ විධානය යටතේ ක්‍රියා කරමින් නීත්‍යානුකූලව සද්භාවයෙන් කරන ලද හෝ නොකර හරින ලද කිසිවක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවට, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයට හෝ එහි සාමාජිකයකු ට, ශ්‍රී ලංකා මහ බැංකුවේ නිසි නිලධරයකුට, සේවා නියුක්තිකයකුට හෝ අධ්‍යක්ෂවරයකුට විරුද්ධව කිසි නඩුවක් පැවරිය නොහැකි විය යුතු ය.

42. මේ පනත යටතේ කරන ලද නාමෝද්දේශනයක් හෝ ඒ යටතේ නිකුත් කරන ලද මහපෙන්වීමක් අධිකරණ සමාලෝචනයට පාත්‍ර කිරීම සඳහා ඉල්ලීමක් කරනු ලැබූ විටක, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව එම නාමෝද්දේශනය හෝ මහ පෙන්වීම එම ඉල්ලීම පිළිබඳ කටයුතු අවසන් වන තෙක් අත්හිටුවීමක් නොකළ යුතු ය.

43. (1) මේ පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන බලාත්මක කිරීමේ කාර්යය සඳහා නියම කළ යුතු යයි මේ පනතේ නියමිත හෝ නියෝග සෑදීමට මේ පනතින් නියමිත හෝ බලය දී තිබෙන යම් කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) විශේෂයෙන් සහ (1) වන උපවගන්තියෙන් අමාත්‍යවරයා වෙත පැවරී තිබෙන බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව, පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඉන් කිසිවක් සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය :—

(අ) ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීම සහ ශ්‍රී ලංකාවේ ගෙවීම් පද්ධතිවල විශ්වාසීභාවය සහ සංවර්ධනය ;

(ආ) නාමෝද්දිෂ්ට ගණවල ගිණුම් හා තැනැත්තන්ගේ ගෙවීම් අණකර පාවිච්චිය කෙරෙහි පරිසීමා, සීමාකිරීම් හෝ තහනම් කිරීම් පැනවීම සහ එම පාවිච්චිය පාලනය වන කොන්දේසි නිශ්චිතව නියම කිරීම ;

(ඇ) පෞද්ගලික හෝ ගෘහස්ථ හා ව්‍යාපාරික නොවන කාර්ය සඳහා මූලික වශයෙන් ප්‍රයෝජනයට ගන්නා ගිණුම්වලට හෝ ගිණුම්වලින් කෙරෙන ගෙවීම් සම්බන්ධ තැනැත්තන්ගේ වගකීම් පිළිබඳව පරිසීමා සහ පූර්ව කොන්දේසි නියම කිරීම මගින් තැනැත්තන්ගේ වගකීම් පිළිබඳ පරිසීමා පැනවීම ;

(ඈ) පනත යටතේ කාර්ය සාධනය මනිනු ලැබිය හැකි ප්‍රමිති නිශ්චය කිරීම ;

(ඉ) සියලු හෝ නිශ්චිත ගණවල පාර්ශ්ව, සහභාගිකරුවන්, සුරැකුම්පත්, පැවරීම් හෝ ගෙවීම් ගනුදෙනු සඳහා මේ පනතින් නිශ්චිතව නියමිත යම් ක්‍රියා හෝ නොකර හැරීම් සඳහා කාලය සීමා කිරීම් හෝ අවසාන දින නිශ්චය කිරීම සහ ඒවා සුළු වශයෙන් වෙනස් කිරීම;

(ඊ) මූල්‍ය පද්ධතිය කෙරෙහි සම්පූර්ණයෙන් හෝ කොටසකට බලපෑමක් සහිතව පරිගණක අක්‍රියවීම හෝ වෙනත් හදිසි අවස්ථාවල කාර්ය පටිපාටි නියම කිරීම, කාල සීමා නියම කිරීම සඳහා විධිවිධාන හා අයිතිවාසිකම් සහ ප්‍රතිකර්ම නියම කිරීම;

(උ) මේ පනතේ පරිපාලනය මෙහෙයවීමේ සම්පූර්ණ පිරිවැය අයකර ගැනීම පිණිස අය කළ යුතු ගාස්තු හා කළ යුතු වෙනත් අයකිරීම් නිශ්චය කිරීම.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන අතර එසේ පළ කරනු ලැබූ දිනයේ සිට හෝ නියෝගයේ නිශ්චිතව සඳහන් යම් පසු දිනයක සිට ක්‍රියාත්මක වන්නේ ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමෙන් පසු අනුමතය සඳහා හැකිතාක් ඉක්මණින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, ඒ යටතේ එතෙක් කරන ලද කිසිවකුට අගතියක් නොමැතිව, අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ දිනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

44. මේ පනතේ විධිවිධාන නිසිපරිදි හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම, පරිපාලනය සහ බලාත්මක කිරීම සම්බන්ධයෙන් සහ විශේෂයෙන් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පොදු විධාන, උපදෙස් හා මාර්ගෝපදේශක නිකුත් කළ යුතු ය :—

(අ) එහි ගෙවීම් ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදීම, ගෙවීමේ පද්ධති අවදානම පාලනය කිරීම සහ බේරුම් කිරීමේ නියතභාවය අත්කර ගැනීම ;

(ආ) මේ පනතින් පාලනය වන සුරැකුම්පත් නියාදනය සඳහා උපදෙස් ආකෘතිය ;

(ඇ) මේ පනතින් පාලනය වන සුරැකුම්පත් නියාදනය සඳහා උපදෙස් සංනිවේදනය කිරීමේ ප්‍රමිති ;

(ඈ) බැංකු සහ වෙනත් මූල්‍ය ආයතන විසින් ශ්‍රී ලංකා මහ බැංකුවට සැපයිය යුතු මූල්‍ය ප්‍රතිපත්ති නිසි පරිදි හා කාර්යක්ෂමව පවත්වා ගැනීම පිණිස අවශ්‍ය සංඛ්‍යාලේඛන තොරතුරු ;

(ඉ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ පොත්පත්වල පවත්වාගෙන යන ගිණුම් හරහා ක්‍රියාත්මක කෙරෙන සියලු ගෙවීමේ, නිෂ්කාශනය කිරීමේ සහ බේරුම් කිරීමේ පද්ධති අධීක්ෂණය ;

(ඊ) මූල්‍ය සේවා සැපයුම්කරුවන්, ගෙවීම් පද්ධති හා නාමෝද්දිෂ්ට පද්ධති විධිමත් කිරීම, ඒවාට බලපත්‍ර දීම සහ අධීක්ෂණය ;

(උ) චෙක්පත් විද්‍යුත් ක්‍රම මගින් ඉදිරිපත් කිරීම සහ වලංගු ඉදිරිපත් කිරීම්, මුදල් අයකර ගැනීම්, චෙක්පත් රඳවා ගැනීම් එසේ ඉදිරිපත් කළ චෙක්පත් අගරු කිරීම් සඳහා නියමයන් හා බැංකුකරුවන්ගේ යුතුකම් ඇතුළුව, ඒ හා සම්බන්ධ සියලු කාරණා ; සහ

(ඌ) මේ පනතේ නිශ්චිතව සඳහන් වෙනත් කාරණා.

45. (1) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක්ම සහ අවස්ථාවෝචිත පරිදි මේ පනත යටතේ නිකුත් කරන සෑම රීතියක්, උපදේශයක්, මගපෙන්වීමක්, විධානයක් සහ මාර්ගෝපදේශයක්ම, ගෙවීමේ අණකරයක් පිළිබඳ කටයුතු කිරීමෙහි හෝ සුරැකුම්පතක් නියාදනය කිරීමෙහි නියුක්ත සියලු පාර්ශ්ව කෙරෙහි බන්ධනීය වන අතර, ඒවාට අනනුකූල අන්තර් බැංකු නිෂ්කාශන රීති සහ වෙනත් ගිවිසුම් ඇතුළු යම් ගිවිසුමක් ඒ අනනුකූලතාවයේ ප්‍රමාණයට අභිබවා බලපවත්වන්නේ ය.

(2) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී අමාත්‍යවරයා සහ ශ්‍රී ලංකා මහ බැංකුව, හැකිතාක් දුරට ජාත්‍යන්තර ප්‍රමිති අනුමනය කළ යුතු ය.

46. ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති සම්බන්ධව වෙනත් යම් නීතියක කවර විධිවිධානයක් තිබුණ ද මේ පනතේ විධිවිධාන සහ වෙනත් යම් ලිඛිත නීතියක් අතර අනනුකූලතාවක දී, මේ පනතේ නිශ්චිතව විධිවිධාන සලසා ඇති අවස්ථාවක හැර, මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

47. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 2005 අංක 39 දරන විසර්ජන පනත

[සහතිකය සටහන් කළේ 2005 දෙසැම්බර් මස 30 වන දින]

2006 මුදල් වර්ෂයේ සේවා වියදම් සඳහා විධිවිධාන සැලසීම සඳහා ද, ඒ සේවා කාර්යය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර හෝ ණය ලබා ගැනීමට බලය දීම සඳහා ද, ඒ මුදල් වර්ෂය තුළ ආණ්ඩුවේ ඇතැම් කටයුතු වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන සැපයීම සඳහා ද, එම කටයුතු වෙනුවෙන් ඒ මුදල් වර්ෂය තුළ වියදම් සඳහා අවශ්‍ය වන මුදල් ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් යම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ඉඩ සැලසීම සඳහා ද, ඒකාබද්ධ අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම සහ ඉහත කී කරුණු හා සම්බන්ධ හෝ එයට ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලසීම සඳහා ද වූ පනතකි.

1. මේ පනත 2005 අංක 39 දරන විසර්ජන පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) යම් වියදමකට බලය දෙන්නා වූ වෙනයම් නීතියකට හානියක් නොමැතිව, මේ පනතෙහි "2006 මුදල් වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන, 2006 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී 2006 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාවේ සේවා වියදම් සඳහා අවශ්‍ය වේ යයි ඇස්තමේන්තු කර ඇති රුපියල් හැට දහස් නවසිය විසිහය කෝටි හැටලක්ෂ අසූතුන් දහසක් විය යුතු ආණ්ඩුවේ වියදම—

(අ) ඒකාබද්ධ අරමුදලෙන් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් යම් අරමුදලකින් හෝ මුදල් වලින් හෝ ගෙවීම සඳහා මෙයින් බලය දෙනු ලබන ගෙවීම් වලින් ; හා

(ආ) ණය වශයෙන් ලබා ගන්නා මුදල්වල සමස්තය රුපියල් පනස් හතර දහස් අටසිය හතලිස් හත් කෝටි පනස් ලක්ෂයක් නොඉක්මවන සේ ආණ්ඩුව සඳහා හා ආණ්ඩුව වෙනුවෙන් ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර හෝ ලබා ගැනීමට මෙයින් බලය දෙනු ලබන ණය වශයෙන් ගන්නා මුදල් වලින්,

පියවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කළ රුපියල් හැට දහස් නවසිය විසිහය කෝටි හැටලක්ෂ අසූතුන් දහසක් වූ මුදල, මේ පනතේ පළමුවන උපලේඛනයේ නියමිත පරිදි වැය කළ හැකි ය.

(3) මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි විධිවිධාන, ආණ්ඩුව සඳහා හා ආණ්ඩුව වෙනුවෙන් ණය ලබා ගැනීමට බලය දෙනු ලබන වෙන යම් ලිඛිත නීතියක විධිවිධානවලට හානියක් නොමැතිව බලපැවැත්විය යුතු ය.

3. (1) 2006 මුදල් වර්ෂය තුළ දී මේ පනතෙහි දෙවන උපලේඛනයේ I වන තීරයෙහි නිශ්චිතව දැක්වෙන එක් එක් කටයුත්තෙන් ආණ්ඩුව ලබන ලැබීම්, ඒ කටයුත්තේ ගිණුමට බැර කළ යුතු අතර, එසේ බැර කරනු ලැබූ ලැබීම්වල එකතුව, ඒ උපලේඛනයේ III වන තීරයෙහි අනුරූපී සටහනෙහි නිශ්චිතව දැක්වෙන අවම සීමාවට අඩු නොවිය යුතු ය. ඒ කටයුත්තෙන් ලබන ශුද්ධ අතිරික්තයක් වේ නම්, එය 2006 මුදල් වර්ෂය අවසන් වී මාස හයක් ඉකුත්වීමට පෙර ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ශුද්ධ අතිරික්තය නිශ්චය කිරීමේ කාර්යය සඳහා, පහත දැක්වෙන ගෙවීම්, එනම් —

(අ) යම් කටයුත්තක ආදායමට අයවිය යුතුව, නිසි අයුරින් ගෙවනු ලැබූ හෝ උපචිත වූ හෝ එම කටයුත්තේ කාර්ය සාධන, සංස්ථාපන හා වෙනත් වියදම් ; සහ

(ආ) යම් කටයුත්තක චංචල හා නිශ්චල දේපළ ක්ෂයවීම ආවරණය සඳහා ප්‍රතිපාදන,

ඒ එක් එක් කටයුත්තේ ආදායමින් අඩු කළ යුතු ය.

(3) මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහි නිශ්චිතව දැක්වෙන එක් එක් කටයුත්ත සම්බන්ධයෙන්, 2006 මුදල් වර්ෂය තුළ ආණ්ඩුව විසින් දරනු ලබන වියදම, ඒ මුදල් වර්ෂය තුළ දී ඒ කටයුත්තෙන් ආණ්ඩුව ලබන ලැබීම්වලින් ගෙවිය යුතු ය. එහෙත් ඒ වියදම් ඒ උපලේඛනයේ II වන තීරයෙහි අනුරූපී සටහනේ නිශ්චිතව දැක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතු ය.

(4) මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහි නිශ්චිතව දැක්වෙන යම් කටයුත්තක් සම්බන්ධයෙන්, 2006 මුදල් වර්ෂය අවසානයේ දී හිඟව ඇති හර ශේෂය, ඒ උපලේඛනයේ IV වන තීරයෙහි අනුරූපී සටහනේ නිශ්චිතව දැක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතු ය. තව ද, ඒ මුදල් වර්ෂය අවසානයේ දී ඒ කටයුත්තේ මුළු බැරකම්, ඒ උපලේඛනයේ V වන තීරයෙහි අනුරූපී සටහනේ නිශ්චිතව දැක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතු ය.

4. 2006 මුදල් වර්ෂය තුළ යම් අවස්ථාවක, මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහි නිශ්චිතව දැක්වෙන යම් කටයුත්තකින් ආණ්ඩුව ලබන ලැබීම්, ඒ කටයුත්ත සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් දරනු ලැබූ වියදම් පියවීමට ප්‍රමාණවත් නොවේ නම්, ඒ

වියදම් පියවීම සඳහා අවශ්‍ය යයි අමාත්‍යවරයා සලකන මුදල්, ඒකාබද්ධ අරමුදලෙන් හෝ, ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල් වලින් අත්තිකාරම් වශයෙන් ගෙවිය යුතු යයි ඔහු විසින් නියමයක් මගින් කලින් කල විධාන කරනු ලැබිය හැකි ය. එසේ වුවද, එසේ දෙනු ලබන අත්තිකාරම් මුදල්වල එකතුව ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූපී සටහනේ නිශ්චිතව දැක්වෙන උපරිම වියදම් සීමාව නොඉක්මවිය යුතු ය. ඒ කටයුත්ත වෙනුවෙන් අත්තිකාරම් වශයෙන් එසේ දෙන ලද මුදල් කිසිවක්, අමාත්‍යවරයා විසින් නියමයක් මගින් විධාන කරනු ලබන ආකාරයට ඒකාබද්ධ අරමුදලට ආපසු ගෙවිය යුතු ය.

5. (1) මේ පනතේ පළමුවන උපලේඛනයේ සඳහන් යම් ශීර්ෂයක් යටතේ දැක්වෙන යම් වැඩ සටහනක් යටතේ වූ පුනරාවර්තන වියදම්වලට ඒ උපලේඛනයෙහි විධිවිධාන ප්‍රකාර වෙන් කරනු ලැබුවා වූ ද, එහෙත් වියදම් නොකරන ලද්දා වූ හෝ මතුවට වියදම් නොකරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි වූ ද මුදල් කිසිවක්, ඒ වැඩ සටහනේම මූලධන වියදමේ මුදල් වෙන් කිරීමකට හෝ ඒ ශීර්ෂයේම වෙන යම් වැඩ සටහනක් යටතේ පුනරාවර්තන වියදමේ හෝ මූලධන වියදමේ හෝ මුදල් වෙන් කිරීමකට හෝ, භාණ්ඩාගාරයේ ලේකම්වරයාගේ හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් නිලධරයකුගේ හෝ නියමය අනුව මාරු කළ හැකි ය.

(2) මේ පනතේ පළමුවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් යම් ශීර්ෂයක් යටතේ දැක්වෙන යම් වැඩ සටහනක් යටතේ වූ මූලධන වියදමට වෙන් කරන ලද කිසිම මුදලක්, එකී වැඩ සටහනෙන් පිටතට මාරු කිරීමට හෝ එකී වැඩ සටහනේ පුනරාවර්තන වියදම් සඳහා වූ මුදල් වෙන් කිරීමකට හෝ මාරු කරනු නොලැබිය යුතු ය.

6. "ජාතික අයවැය දෙපාර්තමේන්තුව" ශීර්ෂයෙහි "රාජ්‍ය සම්පත් කළමනාකරණය" වැඩ සටහන යටතේ, පළමු උපලේඛනයෙහි දැක්වෙන පුනරාවර්තන වියදම් හෝ මූලධන වියදම් සඳහා වෙන් කර ඇති මුදල් භාණ්ඩාගාරයේ ලේකම්ගේ හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ වෙනත් ඕනෑම නිලධරයකුගේ නියමය මත උපලේඛනයේ වෙනත් ඕනෑම ශීර්ෂයක් යටතේ ඕනෑම වැඩ සටහනකට මාරු කළ හැකි ය. එසේ මාරු කළ මුදල් අදාළ අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරනු ලබන පරිපූරක ඇස්තමේන්තුවකින් ආවරණය වූ අයුරින් සැලකිය යුතු ය.

7. (අ) බලය දෙනු ලැබූ වියදම දැරීමට බදුවලින් සහ වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන ලැබීම්, බලාපොරොත්තු වූ මුදල්වලට වඩා අඩු විය හැකි බවට ; හෝ

(ආ) යම් විශේෂ කාර්යයක් හෝ කාර්ය සඳහා මුලින් විසර්ජිත මුදල් තවදුරටත් අවශ්‍ය නොවන බවට,

අමාත්‍යවරයා සෑහීමකට පත්වන අවස්ථාවක, ඒකාබද්ධ අරමුදලින් හෝ බලය දෙනු ලැබූ වියදම් දැරීම සඳහා වූ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින්, තමා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ වියදම් කිරීම සඳහා කලින් මුදා හරින ලද මුදල් සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් හෝ ඉවත් කර ගැනීම, අමාත්‍යවරයා විසින් ආණ්ඩුවේ අනුමතය ඇතිව කරනු ලැබිය හැකි ය.

8. (1) අමාත්‍යවරයා විසින් ආණ්ඩුවේ අනුමතය ඇතිව, මේ පනතේ දෙවන උපලේඛනයේ —

(අ) II වන තීරයෙහි, IV වන තීරයෙහි සහ V වන තීරයෙහි දැක්වෙන උපරිම සීමා අතුරෙන් කිසිවක් ;

(ආ) III වන තීරයෙහි දැක්වෙන අවම සීමා,

නියමයක් මගින්, 2007 මැයි මස 31 වන දින හෝ එදිනට පෙර වෙනස් කිරීම හෝ විචර්තනය කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද කිසිම නියමයක්, යෝජනා සම්මතයක් මගින් පාර්ලිමේන්තුව විසින් එය අනුමත කර ඇත්නම් මිස, බල නොපැවැත්විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ එවැනි යම් නියමයක් කරනු ලබන්නේ යම් දිනයක ද, ඒ දිනයට පෙරාතුව ම වූ දිනයක සිට එය බලාත්මක විය යුතු යයි එහි ප්‍රකාශිතව ම සඳහන් වන්නේ නම්, එසේ ප්‍රකාශිතව සඳහන් වන දින සිට එය බලාත්මක වූ ලෙස සැලකිය යුතු ය.

9. පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් මගින්, මේ පනතේ දෙවන උපලේඛනයෙහි උචිත තීරවලට යම් කටයුත්තක් එකතු කිරීමෙන් සහ —

(අ) ඒ කටයුත්ත සම්බන්ධයෙන් වූ සියලුම උපරිම සීමා හෝ ඉන් යම් සීමාවක් ;

(ආ) ඒ කටයුත්ත සම්බන්ධයෙන් වූ අවම සීමාව,

සඳහා විධිවිධාන සැලසීමෙන් ඒ උපලේඛනය සංශෝධනය කළ හැකි ය.

10. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.